DESERT CHILDREN WARIS DIRIE

කාන්තාරයේ දරුවෝ



පරිවර්තනය
රංජිත් කුරුප්පු

අසීමිත ප්‍රසාදය දිනාගනිමින් අලෙවි වාර්තා පිහිටවූ



දෙවැනි කොටස

කාන්තාරයේ දරුවෝ

කාන්තාරයේ දරුවෝ

වාරිස් ඩයරි
සහ කොරින්නා මිල්බෝන්

පරිවර්තනය
රංජිත් කුරුප්පු

සුරස පොතක්

ප්‍රකාශනය
ෆාස්ට් පබ්ලිෂින් (ප්‍රයිවට්) ලිමිටඩ්
165, දේවානම්පියතිස්ස මාවත, කොළඹ 10.
දුරකතන : 2682223 / 5833323 ෆැක්ස් : 2682224

©සියලුම හිමිකම් ඇවිරිණි.

එක්සත් රාජධානියේ ලන්ඩන් නුවර ලිට්ල් බ්‍රවුන් බුක් ගෲප් ලිමිටඩ් ප්‍රකාශන ආයතනයේ නීත්‍යානුකූල අවසරය මත ශ්‍රී ලංකාවේ ප්‍රකාශන අයිතිය ලබා ඇති, කොළඹ 10, දේවානම්පියතිස්ස මාවතේ, 165 දරන තැන පිහිටි ෆාස්ට් පබ්ලිෂින් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනයේ ලිඛිත අවසරයකින් තොර ව "කාන්තාරයේ දරුවෝ" ග්‍රන්ථයේ කිසිවක්, කිසිදු ආකාරයකින් උපුටා දැක්වීම හෝ ප්‍රතිනිර්මාණය කිරීම හෝ සපුරා තහනම් ය.

Copyright © 2005 Waris Dirie

First published in Great Britain in 2005 by Virago Press

little brown

කාන්තාරයේ දරුවෝ

ප්‍රථම මුද්‍රණය - 2009 සැප්තැම්බර්
දෙවැනි මුද්‍රණය - 2009 ඔක්තෝබර්

ISBN 978-955-1822-66-8

පරිවර්තනය
රංජිත් කුරුප්පු

කවර නිර්මාණය
ප්‍රේම දිසානායක

පිටකවරයේ පරිවර්තකගේ ඡායාරූපය
උපුල් ප්‍රියන්ත ගුණසේකර

ප්‍රකාශනය
ෆාස්ට් පබ්ලිෂින් ප්‍රයිවට් ලිමිටඩ්

මුද්‍රණය
ෆාස්ට් ප්‍රින්ටරි ප්‍රයිවට් ලිමිටඩ්
165, දේවානම්පියතිස්ස මාවත, කොළඹ 10.
දුරකථනය : 2682223

පරිවර්තකගෙන්

හද පිරී ගිය සතුටින් මම ඔබට "කාන්තාරයේ දරුවෝ" පරිවර්තන කෘතිය පිළිගන්වමි. ම විසින් පරිවර්තනය කරන ලද "කාන්තාරයේ කුසුම" පරිවර්තන කෘතිය සඳහා ලැබුණ අති විශාල පාඨක ප්‍රතිචාරය මෙම කෘතිය සිංහල බසට පරිවර්තනය කිරීමට මට මහත් දිරියක් වූ බව නොවලහා කිව යුතුය.

මෙම කෘතියේ සෝදුපත් කියවා ඊට නිර්මාණාත්මක දායකත්වයක් ලබා දුන් ෆාස්ට් පබ්ලිෂින් ආයතනයේ ධර්මදාස ජයලත් මහතාට මම ස්තූතිවන්ත වෙමි.

ෆාස්ට් පබ්ලිෂින් ආයතනයේ ක්‍රියාශීලි සේවක මණ්ඩලය මේ මොහොතේ කෙසේ නම් අමතක කරම්ද.... ඔබ සැමට තුති.

ෆාස්ට් පබ්ලිෂින් ආයතනයේ මාධ්‍ය සහ ව්‍යාපාර සම්බන්ධ කළමනාකාර ධූරය හොබවන යසසිරි ජනක කුමාර මහතා

"කාන්තාරයේ කුසුම" පරිවර්තන කෘතියට මෙන්ම "කාන්තාරයේ දරුවෝ!" කෘතිය සඳහා ද ලබා දුන් දායකත්වය ගැන එතුමන්ට මම ස්තුතිවන්ත වෙමි.

මා හට ලියන්නට, කියන්නට අවැසි නිදහස ලබා දෙමින් ඒ සඳහා මා දිරිමත් කරන මේ සංසාර ගමනේ මගේ සගයා වන මා දයාබර බිරිඳ ඇග්නස් මේ මොහොතේ ඉමහත් බැතියෙන් සිහිපත් කරමි.

මෙවැනි දුර්ලභ ගණයේ කෘති සිංහල පමණක් කියවන පාඨකයාට කියවීමට අවස්ථාව සලසා දෙමින් "කාන්තාරයේ දරුවෝ!" මුද්‍රණය කොට ප්‍රකාශයට පත් කිරීමට නොපැකිළව ඉදිරිපත් වූ ෆාස්ට් පබ්ලිෂින් ආයතනයේ අධිපති මා මිතු ප්‍රේම දිසානායක මහතාට මම හෘදයාංගමව ස්තුතිවන්ත වෙමි.

පරිවර්තන ක්ෂේත්‍රයට මා කැඳවාගෙන ආ පූජ්‍ය මිණ්ඩාවල පඤ්ඤාවංශ හිමියන් මේ මොහොතේ කෘතවේදීව සිහිපත් කරමි.

රංජිත් කුරුප්පු

Konrad - Adenauer Str. 8A
53343 - Wachtberg
GERMANY.

පිදුම

කිවියකු, නවකතාකරුවකු මෙන්ම
'සිළුමිණ' පුවත්පතේ වර්තමාන කර්තෘ ධුරය හොබවන
මා මිතු කරුණාදාස සූරියආරච්චි සොහොයුරාට
මහත් බැතියෙන්.

කවිතා ගේ වෙනත් පරිවර්තන කෘති

මරණයේ දොරටුව
ලුද්‍රයේ අනුරු සහායක්
හිට්ලර්ගේ අවසානය
කාන්තාරයේ කුසුම
මිනී මැදූ සන්මෙන

1

මගේ ජීවිතයේ තුන්වෙනි අදියර

එකවර ම මම නින්දෙන් අවදි වුණෙමි. මගේ මුළු ගත ම දහඩියෙන් නැහැවී ගොස් ඇති බැව් මට දැනෙන්නට විය. තවමත් හරි හැටි එළිය වැටී නැත. පසුගිය රාත්‍රිය කෙටි රාත්‍රියක් වූවා මෙන් ම වෙහෙසකර විය. රාත්‍රියේ මා දුටු ඒ භයංකාර සිහිනයේ මතකය තුළින් ක්‍රම ක්‍රමයෙන් මම පියවි ලොවට එමින් සිටියෙමි. නැවතත් මා මගේ දෙනෙත් පියා ගත් විට පසුගිය රාත්‍රියේ මා දුටු සිහිනයේ රූප මා ඉදිරිපිට මැවෙන්නට පටන් ගත්තේ ය. කහපාට කොළ ඇලවා තිබූ ලාභ හෝටල් කාමරයේ වූ සයනය මත අවුරුදු දහයක තරම් සිඟිති දැරියක් නිරුවතින් ම වැතිර සිටියා ය. නෑහැඳුනන් හතර දෙනකු විසින් දැරියට හෙළවෙන්නට හෝ ඉඩක් නොදී, ඇය ඒ සයනයට තද කරගෙන සිටි අතර, ඇයගේ සිඟිති දෙපා දෙපසට විහිදුවා තිබුණි. දෙපසට විහිදුවන ලද දෙපා මැද රුධිරය වැගිරෙන මස් කැබැල්ලක් අතින් ගත් පටන් ගැහැනියක්

ඉඳගෙන සිටි අතර, දරාගත නො හැකි වේදනාවකින් දැරිය යටි හිරියෙන් කෑ ගසන්නට වූවා ය. ඒ වේදනාකාරී හඬ මගේ හදවත පසාරු කරගෙන ගියේ ය.

යටි හිරියෙන් කෑ ගසන දැරියගේ හඬින් මම අවදි වූයෙමි. හරියට ම ඒ විලාපය මගේ නිදන කාමරයෙන් ඇසෙන්නාක් මෙන් මට දැනෙන්නට විය. සයනයෙන් නැගී සිටි මම මුළුතැන් ගෙට ගොස් වතුර වීදුරුවක් පානය කළෙමි. ජනේලය තුළින් එළිය බැලූ කල ආකාශය එළිය වන අයුරු මම දුටුවෙමි. මා සිටින්නේ වියානා නගරයේ වූ මගේ නිවසේ බවත්, මා දැක ඇත්තේ සිහිනයක් බවත්, ඒ මොහොතේ මම පසක් කළෙමි.

සති අන්තය ගත කිරීම සඳහා වේල්ස්හි කාඩිෆ් නගරයට ගොස් සිටි මා පෙරළා වියානා නගරයට පැමිණියේ පෙරදින සවස් වරුවේ ය. වියානා නගරයේ පදිංචියට එන්නට පෙර මම වේල්ස්හි අගනුවර වන කාඩිෆ් නගරයේ වසර දෙකක් පදිංචි වී සිටියෙමි. මෙවර කාඩිෆ් නගරයට මා ගියේ මගේ පැරණි මිතුරු-මිතුරියන් කීප දෙනකු හමු වන්නටය. ඒ සමගම කෙටි නිවාඩුවක් ගත කිරීම අරමුණු කරගෙන වූ නමුත් එය වඩා වෙනස් දෙයක් සිදුවිය. එදින සැන්දෑ වරුවේ කාඩිෆ්වලින් පිට වන්නට නියමිත ව තිබුණි. මගේ මිතුරන් විසින් මට දිවා භෝජන සංග්‍රහයකට ආරාධනා කරන ලදී. අපිට කතාබහ කරන්නට බොහෝ දේ තිබුණ බැවින්, අපි විහිළු තහළු කරමින් සිනාසෙමින් භෝජන සංග්‍රහය භුක්ති වින්දෙමු. ඒ අතර කිසි ම කතාබහකින් තොර ව නිසොල්මනේ සිටි එක්තරා පුද්ගලයෙක් මගේ අවධානයට ලක්විය. ඔහු නමින් මාරියමේ (Mariame) විය.

අපි ආහාර ගන්නා අතර තුර ඔහු මා දෙස මහත් සිනා කැමකින් බලා සිටින්නට විය. ඔහු මේ අයුරින් බලා සිටින්නේ කිනම් කරුණක් නිසාදැයි මා හට මහත් ප්‍රහේලිකාවක් විය. මගේ මිතුරු-මිතුරියන්ට සමු දෙන්නට කාලය පැමිණ තිබුණ බැවින්, මම සැවොමගෙන් සමුගෙන එතැනින් පිට වී යන්නට සූදානම් වූයෙමි. මෙතෙක් මහත් අවධානයකින් මා දෙස බලා සිටි මාරියමේ

මා සමග දොර ළඟට පැමිණි අතර, මා ගැන මොහු මෙතරම් උනන්දුවක් දක්වන්නේ කුමන කරුණක් නිසාදැයි දැන ගැනීමට මම එය අවස්ථාව කර ගතිමි.

"වාරිස්... මම ඔබගෙ ධෛර්යය ඇත්තෙන් ම අගය කරනවා... මම දැනගෙන හිටියෙ නෑ ස්ත්‍රී චර්මච්ඡේදනය මෙතරම් වේදනාකාරීයි කියලා... බොහොමයක් දෙනාට මේව ගැන කිසි ම අවබෝධයක් නෑ... කාලයක් තිස්සෙ කරගෙන ආපු විදියට මේව කරනවා... එත් ඒ අයට මේ ක්‍රියාවේ ආදීනව ගැන කිසි ම හැඟීමක් නෑ" ඔහු කීවේ ය.

මම සිනාසුණෙමි. දැරියන්ට සිදු කරන මෙම ම්ලේච්ඡ ක්‍රියාව මවුනට කරන අසාධාරණයක් බැව් ක්‍රම ක්‍රමයෙන් පුරුෂ පක්ෂය අවබෝධ කර ගන්නට පටන් ගෙන ඇති අතර, නව වාතාවරණය මා තුළ නැවුම් බලාපොරොත්තු ඇති කරන්නට සමත් විය.

එක වර ම මාරියමේගේ ඉරියව් වෙනස් වන්නට විය. "වාරිස්... මට ඔබට කියන්නට කාරණයක් තියෙනවා... දැනට දින කීපයකට ඉස්සෙල්ලා තමයි මට මේ භයානක කතාව අහන්නට ලැබුණෙ. කාඩිෆ් නගරයේ ජීවත් වන එක්තරා අප්‍රිකානු පවුලක් අවුරුදු දහයක් වයසැති සිය දියණියගේ චර්මච්ඡේදනය සිදු කළ කතාව ඔහු මට විස්තර කරන්නට පටන් ගත්තේ ය. හෝටලයක කාමරයක් වෙන් කරවා ගෙන ඇති ඔවුන් ලිබියානු ගැහැනියකට පවුම් 200 ගෙවා ඒ ම්ලේච්ඡ ක්‍රියාව සිදු කර ඇත. ඒ කර්තව්‍ය තුළ දී ඒ සඳහා පාවිච්චි කරන ලද පිහිය ගැහැනියගේ අතින් ලිස්සා යාම හේතුකොටගෙන දැරියගේ යෝනිය භයානක ලෙස තුවාල වී ඇති අතර, එයින් අධික ලෙස රුධිරය වහනය වන්නට වූ නිසා ඇය ව වෛද්‍යවරයකු වෙත ගෙන යන්නට ඔවුන්ට සිදු වී ඇත.

"ඉතින් කවුරුත් මේ ගැන පොලීසියට දන්වලා නැත්ද... ඒ පවුලෙ නම දන්නවා ද? කොහෙද ඔය කියන පවුල පදිංචි වෙලා ඉන්නෙ... දැන් ඒ ගෑනු ළමයට සනීප ද?" මම දිගින් දිගට ම ප්‍රශ්න කළෙමි.

ඇත්තෙන් ම යුරෝපයේ මෙවැනි සිද්ධියක් ගැන මා හට අසන්නට ලැබුණ පළමුවෙනි වතාව මෙය නො වේ. ස්ත්‍රී චර්මඡේදනය සම්බන්ධ ව මා රචනා කොට ඇති පොත්පත් මගින් ඊට විරුද්ධ ව ගෙන යන සටනේ ජීවමාන සංකේතය බවට මා පත් වී සිටින බැවින්, යුරෝපයේ ජීවත් වන අරාබි සහ අප්‍රිකානු පවුල්වල සිදුවන මේ අති භයානක චාරිත්‍රය ගැන බොහෝ දෙනා මා වෙත දැනුම් දෙන්නට පුරුදු වී ඇත. කාඩිෆ් නගරයේ දී මට අසන්නට ලැබුණ සිද්ධිය ගැන නියම තතු සොයා ඒ සම්බන්ධ ව පොලිසියට දන්වන්නට උත්සාහ කළ නමුදු, ඒ සඳහා කිසිවකුගෙන් මට කිසි සහයෝගයක් නො ලැබිණි. එහෙත්, කාඩිෆ් නගරයේ තිබෙන ආරෝග්‍ය ශාලාවක් හෝ නගරයේ පදිංචි ව සිටින කිසි යම් වෛද්‍යවරයෙක් හෝ මෙයට සම්බන්ධ ව සිටිය යුතු ය. එබැවින් සහතිකෙන් ම මේ සම්බන්ධ ව වැඩි දුර කරුණු සොයා ගැනීමට මා හට අවකාශය ලබා ගැනීමට හැකි වනු ඇත.

කාඩිෆ් සිට වියානා බලා යන ගුවන්යානය පිටත් වන්නට වැඩි කාලයක් නො තිබුණ බැවින්, ඒ කෙටි කාලය ප්‍රයෝජනයට ගත් මම, මේ සම්බන්ධ ව මා දන්නා ස්ථානවලට සහ පුද්ගලයින්ට දුරකතනයෙන් කතා කරමින් මා හට දැන ගන්නට ලැබුණ සිද්ධිය සම්බන්ධ ව කරුණු විමසුවෙමි. එහෙත්, කිසිවකු ඒ ගැන කිසිවක් දැන නො සිටියා පමණක් නො ව, ඔවුහු ඒ විෂය සම්බන්ධ ව මා සමඟ කතා කිරීම ද ප්‍රතික්ෂේප කළහ. පෙරළා ආපසු වියානා බලා ගුවනින් ආ ගමන පුරා ම මා දුටු සිහිනය මගේ මනස තුළ හොල්මන් කරන්නට විය.

ගෙදර පැමිණි මා හට ගමන් මහන්සිය තිබුණ ද නිදා ගන්නට තරම් මනස සන්සුන් ව නො තිබුණ බැවින්, එළියට බැස රවුමක් දුවන්නට තීරණය කළෙමි. කිසි යම් හෝ මානසික ගැටලුවක් ඇති වූ විට දිවීමෙන් සහනයක් ලැබෙන බැව් මම අත්දැකීමෙන් දැන සිටියෙමි.

එදින සීතාධික දිනයක් විය. ඩැනියුබ් ගංඉවුර දිගේ දිව යන විට උදෑසන පාසල් යන ළමුන් මට හමුවිය. ඔවුන් දැකීමෙන් මෙතෙක් මා

තුළ වූ මානසික කලබගෑනිය පහ ව ගියේ ය. නැවතත් මම වියානා නගරයට පැමිණ සිටීම ගැන ඒ මොහොතේ මා තුළ සතුටක් ඇති විණ. දෙවියන්ට පින්සිදු වන්නට මේ රටේ දැරියන්ට ආරක්ෂාව තිබේ. කිසිවකු ඔවුනට හානියක් කිරීමට නොපැමිණෙනු ඇත.

එහෙත්, ඔවුනට ආරක්ෂාව ඇති බවට තිබෙන සහතිකය කුමක්ද? ස්ත්‍රී චර්මඡේදනය ගැන කාඩිෆ් නගරයේ දී මට අසන්නට ලැබුණ සිද්ධිය කාඩිෆ් නගරයට පමණක් සීමා කළ හැකි ද? එසේ නම් එය යුරෝපයේ පමණක් නො ව, වියානා නගරයේ වුව ද සිදුවිය නො හැකි ද? මා දුටු නපුරු සිහිනය නැවතත් මගේ මනස තුළ හොල්මන් කරන්නට වූ අතර, යුරෝපයේ කිසි යම් නාගරික නගරයක සිට දැරියක් විලාප නගන හඬ මගේ මනස තුළ දෝංකාර දෙන්නට විය.

මගේ ජීවිත කතාව පොතක් වශයෙන් ප්‍රකාශයට පත් වීමෙන් අනතුරු ව එක්සත් ජාතීන්ගේ සංවිධානයේ විශේෂ තානාපතිවරියක් වශයෙන් මා මුහුණ දුන් සම්මුඛ සාකච්ඡා මතු නො ව. නොයෙකුත් සම්මේලනයන්ට පවා සහභාගි වූ අයුරු ඒ මොහොතේ මගේ මතකයට ගලා එන්නට විය. ඒ සෑම අවස්ථාවක ම අපගේ සාකච්ඡාවලට විෂය වූයේ අප්‍රිකාව වූ අතර, ඔවුන් නිරන්තරයෙන් සෝමාලියාව ගැන මගෙන් ප්‍රශ්න කළහ. එවැනි අවස්ථාවක යුරෝපය තුළ සිදුවන ස්ත්‍රී චර්මඡේදනය සම්බන්ධ විශේෂඥයෙක් මට හමු වී තිබේ ද? නැත. එසේ හමු වූවා නම් එය කිසි දිනක මට අමතක නො වේ. යුරෝපයේ සිදුවන ස්ත්‍රී චර්මඡේදනය සම්බන්ධ ව සංඛ්‍යාලේඛනයක් හෝ සැලැකිය යුතු අධ්‍යයනයක් හෝ මෙතෙක් සිදු වී ඇතැ යි මම නො සිතමි. මෙම ම්ලේච්ඡ ක්‍රියාවට ගොදුරු වූවන් තවත් ඇත්ද? ගඟ අසල වූ බංකුවක් මත හිඳ ගත් මම, මට ම මෙසේ කියා ගතිමි. 'වාරිස්... මේ සම්බන්ධයෙන් ඔබට කරන්නට දෙයක් තිබේ... මේ ප්‍රශ්නයට ඔබ පිළිතුරක් සෙවිය යුතු ය' ඒ මොහොතේ මා තුළ ඇති වී තිබූ භීතියට සදහටමත් නොමැකී බවත්, එය හුදු භීතියක් බැව් සිතුණත්, යුරෝපය තුළ කෙරීගෙන යන ස්ත්‍රී චර්මඡේදනය ගැන එදා මා

උපකල්පනය කළ ආකාරය නිවැරදි බවත් අද මම දනිමි. එහෙයින්, ස්ත්‍රී චර්මඡේදනයට විරුද්ධ ව කටයුතු කිරීමට මා ගත් තීරණය මගේ ජීවිතය පූර්ණ වෙනසකට භාජනය කළේ ය. ඒ උදෑසන මගේ ජීවිතයේ තුන්වන අදියර ආරම්භ විය.

"මෙලොවට බිහි වූ සෑම මනුෂ්‍යයකුට ම ගෞරවාන්විත ව එමෙන් ම නිදහසේ ජීවත්වන්ට සම්පූර්ණ අයිතියක් ඇත. ඔවුන් සිය හෘදය සාක්ෂියට එකඟ ව එකිනෙකාට සහෝදරත්වයෙන් ක්‍රියා කළ යුතු ව ඇත."

(එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් 1948 දෙසැම්බර් 10 දින අත්සන් කරන ලද විශ්වව්‍යාපී ප්‍රකාශනයෙන් උපුටා ගත් කොටසකි.)

සතියකට පසු මා වියානා නගරයේ විත්ස් විදියේ වූ කෝපි හලක ඉඳගෙන සිටියෙමි. මා අවට ඉඳගෙන සිටි බොහොමයක් දෙනා පුවත්පත් කියවමින්, කෝපි පානය කරමින් සිටියහ. සමහරුන් එක කෝපි කෝප්පය තොල ගාමින් එහි පැය තුන හතරක් රැඳී සිටියහ. එහෙත්, ඒ ගැන කිසිවකු කිසි ම තැකීමක් නො කළ අතර, ඇත්තෙන් ම එය වියානා නගරයට ආවේණික ගති ලක්ෂණයක් විය. මා වියානා නගරයේ පදිංචියට පැමිණ වසරක් ගත වී තිබුණ අතර, පදිංචිය සඳහා වියානා නගරය තෝරා ගත්තේ මන්දැයි මම මගෙන් ම විමසීමි. ඒ පැනයට මට ලැබෙන පිළිතුර නම් වියානා නගරය අති රමණීය නගරයක් වීම යි. මිතුරු-මිතුරියන් සෑහෙන පිරිසක් මෙහි දී මා හඳුනාගෙන ඇති අතර, වියානා නගරය මගේ ජීවිතයට මහත් සේ සමීප විය.

පසුගිය වසර කීපය තුළ මා එක්සත් ජාතීන්ගේ විශේෂ තානාපතිවරියක් වශයෙන් ලෝකය පුරා දේශන පවත්වමින්, ආධාර ලබා ගැනීම සඳහා සංවිධානය කෙරුණු නොයෙකුත් සාදවලට සහභාගි වූ නමුදු, මා මෙතෙක් කර ඇති සේවය ගැන මම එතරම් සෑහීමකට පත් නො වෙමි. එහෙයින්, ස්ත්‍රී චර්මඡේදනයට විරුද්ධ ව සටන් කිරීම සඳහා මම වියානා නගරයේ වාරිස් ඩයරි නමින් පදනමක් ස්ථාපිත කළෙමි. මගේ මවුබිම වන සෝමාලියාවේ කෙරීගෙන යන ස්ත්‍රී චර්මඡේදනය නවතා දැමීම සඳහා නව

වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම අරමුණු කරගෙන අපි කුඩා කණ්ඩායමක් එක් වී එම ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීමට අවශ්‍ය ආධාර එකතු කිරීමට පටන් ගත්තෙමු.

කෝපි හලේ සිට මම මගේ මිතුරිය කොරින්නා එන තුරු බලා සිටියෙමි. කොරින්නා වෘත්තියෙන් දේශපාලන විද්‍යාව සම්බන්ධ ලේඛිකාවක් මෙන් ම මාධ්‍යවේදිනියක් ද වූවා ය. බොහෝ අවස්ථාවල අපි එකට එක් වී කටයුතු කර ඇති අතර, ඇය මා වෙනුවෙන් නොයෙකුත් පර්යේෂණාත්මක ගවේෂණ කරමින් අප්‍රිකාවේ ගැහැනුන් සම්බන්ධ ව දත්ත එකතු කර දෙමින් ස්ත්‍රී චර්මඡේදනය නවතා දැමීම සඳහා මා විසින් කරගෙන යන ව්‍යාපෘතියට එක් වූවා ය. මෙතෙක් ඇය කරගෙන යමින් සිටි සියලු ම පර්යේෂණ නවතා දමා යුරෝපයේ ජීවත් වන අප්‍රිකානු ගැහැනුන් ගැන හැකි තරම් තොරතුරු සොයා දෙන මෙන් පසුගිය සතියේ ඇයට මම දැන්වූයෙමි. ඇය තරමක් ප්‍රමාද වී පැමිණි නමුදු වේලාවට වැඩ කිරීම පිළිබඳ මා තුළ ද දුර්වලකම් ඇති හෙයින් ඇයගේ ප්‍රමාදය මට එතරම් ප්‍රශ්නයක් නො වූ අතර, මා ඇයට භාර දෙන ලද රාජකාරිය කෙතරම් දුරට සාර්ථක වී ඇත්දැයි යන්න දැන ගැනීම සඳහා ඒ මොහොතේ මම මහත් උද්‍යෝගයකින් පසු වුණෙමි.

මා අසලින් අසුන් ගත් කොරින්නා කොළ පාට පෙට්ටියක බහා තිබූ ලිපි ගොනුවක් එළියට ගත්තා ය. "මේ තමයි මට සොයා ගන්නට හැකි වුණ තොරතුරු" ඇය ලිපි ගොනුව මේසය මත තබන ගමන් කෝපි කෝප්පයක් ඇණවුම් කරමින් කීවා ය. අනතුරු ව ඇය ලිපි ගොනුව විවෘත කළ අතර, එහි සිය ගණනක් කොළ තිබෙන බැව් මම දුටුවෙමි. එයින් එක් කොළයක් අතට ගත් ඇය, මා දෙසට නැඹුරු වූවා ය. "වාරිස් ඔයා හරි... බොහොමයක් දෙනා හිතාගෙන ඉන්නෙ ස්ත්‍රී චර්මඡේදනය ක්‍රමයෙන් අඩු වෙලා යනවා කියලා... නමුත් සත්‍ය ඒක නො වෙයි. අප්‍රිකාවෙ නැත්නම් ආසියාවෙ පමණක් නො වෙයි, යුරෝපයේ රටවල්වලත් ස්ත්‍රී චර්මඡේදනය කෙරීගෙන යනවා... නමුත්, ඒ සම්බන්ධ ව තොරතුරු සොයා ගැනීම ඒ තරම් ලේසි නෑ."

"අරාබි රටවල්වල පමණක් නො වෙයි යේමන් සහ පකිස්තානයේත් දහස් ගණනක් තරුණ ගැහැනු ළමයි මෙම සැහැසි ක්‍රියාවට ගොදුරු වෙලා තියෙනවා. ඒ විතරක් නෙමෙයි මලයාසියාව, ඉන්දුනීසියාව වැනි රටවලිනුත් දැන් ආරංචි ලැබෙන්නට පටන් ගෙන තිබෙනවා. දැන් යුරෝපයේත් ඒ දේ ම සිදු වෙනවා."

"මම හිතන්නෙ වාරිස් ඔයා ම මේක කියෙව්ව නම් හොඳයි... එතකොට ඔයාට ම තේරුම් ගන්න පුළුවන් යුරෝපයේ ම තත්ත්වය කොච්චර භයානක ද කියලා" කොරින්නා ලිපි ගොනුව මා අත තබමින් කීවා ය.

ලිපි ගොනුව විවෘත කළ මම එහි පළමුවෙනි පිටුව දෙසට අවධානය යොමු කළෙමි. කොළයේ එක් පැත්තක කොරින්නා විසින් සටහන් තබා ඇති බව මම දුටු අතර, යම් කිසි වැදගත් යමක් මගේ නෙත ගැටිණ. ස්ත්‍රී චර්මච්ඡේදනය නමැති සැහැසි ක්‍රියාවට ගොදුරු වූවන්ගේ නාම ලේඛනයක් එහි තිබුණි. එහි සඳහන් තවත් යමක් මම ඉතා උනන්දුවෙන් කියවන්ට වීමි. "සුන්නත් කිරීම" (Khafd) යනුවෙන් එහි අරාබි වචනය ද සඳහන් කර තිබෙනු මම දුටුවෙමි. කොරින්නාගේ කටුසටහනේ මෙසේ ලියා තිබුණි. "ප්‍රවේසම් වන්න!! මෙම සැහැසි ක්‍රියාවට ගොදුරු වී ඇති බොහොමයක් දෙනා 'සුන්නත් කිරීම' නමැති වචනය භාවිත කරනවාට සම්පූර්ණයෙන් විරුද්ධ ය. ඊට හේතුව ස්ත්‍රී චර්මච්ඡේදනය මගින් ස්ත්‍රියට සිදු වන හානිය 'සුන්නත් කිරීම' යන වචනය යෙදීමෙන් අවම කෙරෙන බව අවධාරණය කර ඇති බැවිනි."

"ඔව් මට තේරෙනවා කොරින්නා... සුන්නත් කරනවා කිව්වහම හරියට පුරුෂ ලිංගය සුන්නත් කරනවා වගේ අදහසක් ගම්‍ය වෙනවා ඇති... ඒත් ස්ත්‍රී චර්මච්ඡේදනය කියන්නෙ ඊට වඩා හාත්පසින් ම වෙනස් දෙයක්."

ස්ත්‍රී චර්මච්ඡේදනය නමැති මිනීමරු ක්‍රියාව හැඳින්වීමට සුමට වචනයක් භාවිත කරන්නේ ද යන්න අවංකව ම මට අදාළ නැත. මට උවමනා කරන්නේ මේ මිලේච්ඡ සැහැසි ක්‍රියාව නවතා දැමීමට ය. ස්ත්‍රී චර්මච්ඡේදනය යනු ගැහැනියට විරුද්ධ ව කරන ප්‍රචණ්ඩ ක්‍රියාවක් මිසක් නො වේ. මිනිස් අයිතිවාසිකමක් උල්ලංඝනය කිරීමක් බැව් එක්සත් ජාතීන්ගේ සංවිධානය අවධාරණය කර ඇත. කොරින්නා ලිපිගොනුව සිසාරා ගොස් වර්ෂ 1993 එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ප්‍රකාශයට පත් කරන ලද ප්‍රකාශනයක පිටපතක් එළියට ගත්තා ය. එක්සත් ජාතීන්ගේ සංවිධානය සහ ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් කරන ලද අධ්‍යයනයකට අනුව මේ වනවිට මෙම සැහැසි ක්‍රියාවට ගොදුරු ව ඇති ස්ත්‍රීන්ගේ සංඛ්‍යාව මිලියන 150කි. ස්ත්‍රී චර්මච්ඡේදනයට ගොදුරු වී ඇති දැරියන් සහ ස්ත්‍රීන්ගේ සංඛ්‍යාව සත්‍ය වශයෙන් ම මිලියන 150කට වැඩි බවට කිසි ම සැකයක් නැත. මන්ද, මෙම ක්‍රියාව කෙරීගෙන යන සමහර රටවල් ඉතා නො දියුණු බැවින්, මේ සම්බන්ධ නිසි තතු සොයා ගැනීමට කිසි යම් හෝ අවකාශයක් නොමැති වීම ඊට හේතුවයි. මිලියන 150ක් යනු ජර්මනිය, ස්විට්සර්ලන්තය, ඔස්ට්‍රියාව, බෙල්ජියම, නෙදර්ලන්තය සහ ඩෙන්මාර්කය වැනි රටවල ස්ත්‍රී ජනගහනය එකට එකතු කළ විට ලැබෙන සංඛ්‍යාවටත් වඩා වැඩි ප්‍රමාණයකි. මෙම ක්‍රියාවට ගොදුරු වූවන් අතර සතියක් පමණ වයසැති ළදරුවන්, වැඩිවියට පා තැබූ ගැහැනු ළමුන් සහ වයස තිහක පමණ ස්ත්‍රීන් ද වේ.

ස්ත්‍රී චර්මච්ඡේදනය ගැන මා කතා කරන සෑම අවස්ථාවක දී ම නිරායාසයෙන් මගේ සිහියට නැඟෙන්නේ ඒ භයංකාර අත්දැකීමට මා මුහුණ දුන් අවස්ථාව ය. එවකට මා වයස අවුරුදු පහක පමණ කුඩා දැරියක් වූ අතර. මම මගේ මවුබිම වන සෝමාලියාවේ කාන්තාරයක ගල් පොත්තක් මත දිගා වී සිටියෙමි. පාන්දර ජාමය වූවත් තවමත් හරිහැටි එළිය වැටී නො තිබුණි. ඒ මොහොතේ මා තුළ අතිශය බියක් ඇති වී තිබුණි. මා මගේ අම්මාගේ උකුළ මත ඇල වී සිටි අතර, ඇය සිය දෙපා මගේ බඳ වටා යවා මා තදින් අල්ලාගෙන සිටියා ය. ඇය මගේ දත් ඇඳී සඳහා අතර, ලී කැබැල්ලක් තබා එය තදින් විකා ගන්නා ලෙස සැල කළා ය. "වාරිස්... දිගට ම ඔයා ව මට මෙහෙම අල්ලගෙන ඉන්න බෑ... හොඳ ළමයා වගේ දඟලන්නෙ නැති ව ඉන්න... ඕක විනාඩියෙන් ඉවරයි" ඇය කීවා මට මතක ය.

ඒ අවලක්ෂණ, රළු පරුෂ ගැහැනිය ඒ මොහොතේ මා දෙස බලා සිටි හපුරු බැල්ම දැනුදු මට මැවී පෙනේ. කිසි යම් සත්ත්ව හමකින් සාදන ලද මල්ලක් තුළින් මළ බැඳුණ බ්ලේඩ් තල කැබැල්ලක් එළියට ගත් ඇය, එය සිය දිගු ඇඟිලි මත රඳවා ගත්තා ය. බ්ලේඩ් තල කැබැල්ල මත වියළී ගොස් තිබුණ ලේ පැල්ලම් මම දුටුවෙමි. අම්මා මගේ දෙනෙත් වැසෙන සේ රෙදි කඩමල්ලක් බැන්දා ය. එකවර ම මගේ යෝනියේ කොටස් කැපී යනු මට දැනෙන්නට විය. ඇත්තෙන් ම ඒ වේදනාව වචනවලින් විස්තර කරන්නට නො හැකි ය. මළ බැඳුණ බ්ලේඩ් තල කැබැල්ල නැවත නැවතත් මගේ යෝනිය මත දිව යන්නට විය. ඒ මොහොතේ මගේ දෙපා වෙව්ලන්නට වූ සැටිත්, මගේ යෝනිය මතින් රුධිරය ගලා ගිය අයුරුත්, එපමණක් නො ව, මා නොසැලී ඉඳගෙන සිටීමට දැරූ උත්සාහයත් මගේ මතකයට නැඟෙයි. අවසානයේ දී මට සිහි නැති විය. නැවතත් මට සිහිය ලැබෙන විට දෙවියන්ට පින් සිදු වන්නට සියල්ල අහවර වී ඇතැ යි යන්න මගේ පළමුවෙනි සිතුවිල්ල විය. මගේ දෙනෙත් වැසෙන සේ අම්මා විසින් බඳින ලද රෙදි කඩමල්ල ද ගැලවී ගොස් තිබුණි. මා ඉදිරිපිට වාඩි වී සිටින ගැහැනිය දැන් මට හොඳින් දිස් වුණ අතර, ගැහැනිය ආකාසියා ගසකින් කඩා ගත් උල් වූ ආකාසියා කටු තෝරන්නට විය. නූලක් ආකාසියා කටුවක දවටා ගත් ගැහැනිය, ඒ මඟින් යෝනිය මත වූ කැපුම් තුවාල මසන්නට පටන් ගත් විට දැනුණ ඉවසිය නො හැකි වේදනාවත් සමඟ මගේ දෙපා පණ නැති විය. වේදනාව දරා ගන්නට නො හැකි ව සිටි මම මරණය ප්‍රාර්ථනා කර සිටියෙමි. ඒ මොහොතේ සතුට උතුරා ගිය මගේ අම්මාගේ මුහුණ මට දැනුදු මැවී පෙනේ. ඈ මා හට කරන ලද කර්තව්‍යයේ නිරවද්‍ය භාවය ඇගේ මුහුණෙන් මොනවට පැහැදිලි විය.

“මැඩම් තව මොනවා හරි බොන්නට ගෙනෙන්න ද?” සුදු කමිසයකින් සහ කළු කලිසමකින් සැරසී සිටි ප්‍රියශීලී වේටර්වරයා මගෙන් ඇසුවේ ය. අතීත මතකයන් අතර සැරිසරමින් සිටි මම එකවර ම තිගැස්සී අවදි වුණෙමි. ඔහු දෙස මොහොතක් බලා සිටි මම දොඩම් යුෂ වීදුරුවක් ඇණවුම් කළෙමි. කොරින්නා ලිපි

ගොනුව පිරික්සමින් සිටියා ය. එහෙමත්, නැති නම් ඇය ලිපිගොනු පිරික්සන බවක් අඟවන්නට උත්සාහ කරනවා ද? කෙසේ වෙතත් ඒ මොහොතේ මා ඇඳී වී සිටි ප්‍රශ්නය ගැන විපරම් නො කිරීමට තරම් ඇය බුද්ධිමත් බව මම දනිමි. අසල මේසයක සිය දෙමවුපියන් සමඟ වාඩි වී සිටි සිඟිති දැරිය මා දෙස බලා සිනාසුණා ය.

කොරින්නාගේ ලිපි ගොනුවෙන් තවත් කොළයක් මම අතට ගතිමි. ස්ත්‍රී චර්මච්ඡේදනයෙන් ගැහැනියකගේ සෞඛ්‍යයට සිදු වන්නට හැකි හානි පිළිබඳ එහි සඳහන් වී තිබුණි. ඒ සම්බන්ධ ව නැවත කියවන්නට මට අවශ්‍ය නැත. ඒ සියල්ල ම මම හොඳින් දනිමි. ගැහැනියකට ජීවිත කාලය තුළ දී ආදරය වෙනුවෙන් විඳින්නට සිදු වන වේදනා තුනක් ගැන සෝමාලියාවේ ප්‍රචලිත පැරණි කියමනක් ඒ මොහොතේ මගේ මතකයට ගලා එන්නට විය. එම වේදනා තුන පිළිවෙළින් මෙසේ ය: ස්ත්‍රී චර්මච්ඡේදනයේ දී දැනෙන වේදනාව, විවාහ වූ දින පළමු සම්භෝගයේ දී දැනෙන වේදනාව සහ දරු ප්‍රසූතියේ දී දැනෙන වේදනාව යනුවෙනි. චර්මච්ඡේදනයෙන් පසු එම තුවාල මසා දමන අතර, විවාහ දින රාත්‍රියේ දී සහ දරු ප්‍රසූතියට පෙර ඒ මසා දමන ලද ස්ථානවල කැපුම් කපා දමනු ලැබේ. කිසිවකු නො දන්නා එමෙන් ම පොත් පත්වල හෝ ලියැවී නොමැති එහෙත්, අප්‍රිකාවේ පවතින අඳෝනාමය නීතියට අනුව චර්මච්ඡේදන හා සම්බන්ධ ව ඇති අනෙක් භයානක කරුණ නම් ඔවුන්ට විඳින්නට සිදුවන වේදනාව ගැන කිසිවකුට පැවසීම තහනම් කොට පනවා ඇති නීතිය යි.

මම තවත් දොඩම් යුෂ උගුරක් බී මොහොතක විරාමයක් ගතිමි. මෙම රපෝර්තුවල තිබෙන බොහොමයක් කරුණු මම අත්විඳ ඇත්තෙමි. 'යුරෝපයේ සිදුවන චර්මච්ඡේදනයන් සම්බන්ධ ව කරුණු ඔබට සොයා ගන්නට හැකි වුණා ද?" මම කොරින්නාගෙන් ප්‍රශ්න කළෙමි.

ඇය ලිපිගොනුවෙන් තවත් කොළයක් එළියට ගෙන මා අත තැබුවා ය. එහි මෙසේ සඳහන් වී තිබුණි. ප්‍රංශයේ 70,000, එංගලන්තයේ 80,000, ඉතාලියේ 35,000, අරාබි සහ අප්‍රිකානු රටවල

චර්මඡේදනයට ගොදුරු වූවන්ගේ ප්‍රතිශතයන් පහතින් සඳහන් කර තිබුණි. ඊටත් යටින් 500,000 යනුවෙන් සඳහන් විය.

“කොරින්නා මොකක්ද මේ 500,000... මේක නම් ඇත්තක් වෙන්නට බෑ” පුදුමයට පත් වූ මම ඇසුවෙමි. කොරින්නා ඊට පිළිතුරු දෙන්නට සූදානම් වන විට මම ඇයට බාධා කරමින් මෙසේ ප්‍රශ්න කළෙමි. “500,000 කියන්නෙ මිලියන භාගයක්... ඒ කියන්නෙ යුරෝපයේ මිලියන භාගයක් ගැහැනුන් චර්මඡේදනයට ගොදුරු වෙලා... මට නං මේක කොහෙත්ම විශ්වාස කරන්නට බෑ... කොහෙන් ද ඔබ මේ දත්ත සොයා ගත්තෙ... මේක ඔප්පු කරන්න ඔබට සාක්ෂි තියෙනවා ද?”

කොරින්නාගේ විග්‍රහයට අනුව සංස්කෘතික අංගයක් වශයෙන් ස්ත්‍රී චර්මඡේදනය කෙරීගෙන යන රටවල සිට පැමිණෙන සංක්‍රමණිකයන් සම්බන්ධ ව සංඛ්‍යාලේඛන බොහොමයක් යුරෝපීය රටවල්වල තිබෙන අතර, එවැනි රටවල චර්මඡේදනයට ගොදුරු වී ඇති ස්ත්‍රීන්ගේ ප්‍රතිශතයන් සම්බන්ධ දත්ත ලෝක සෞඛ්‍ය සංවිධානයේ වාර්තාවල සඳහන් ව ඇත. “වාරිස්... ඒ හැම රටවල්වල ම දත්ත අපි ළඟ නෑ... ඒ වගේ ම අප්‍රිකානු, අරාබි සහ ආසියානු ගැහැනුන් බොහොමයකට හැඳුනුම්පතක්වත් නෑ... ඒ නිසා එවැනි අය සංඛ්‍යාලේඛනවලට ඇතුළත් වෙන්නෙ නෑ... ඒ කියන්නෙ වාරිස් ඔය මිලියන භාගය පටන් ගැන්මක් පමණයි.” ඇය ගොත ගසමින් කීවා ය.

මම දිගු සුසුමක් හෙළුවෙමි. බලාපොරොත්තු සුන් වී ගියාක් මෙන් මට දැනෙන්නට විය. මිලියන භාගයක් ගැහැනු ළමුන් සහ ස්ත්‍රීන් දැනටමත් මේ ව්‍යසනයට ගොදුරු වී හමාර ය. මෙවැනි ම්ලේච්ඡ ක්‍රියාවකට අනුබල දෙන්නෝ කවුරුන් ද? මේ සම්බන්ධ බොහෝ දේ දැන ගැනීමට මට උවමනා විය. මේ ස්ත්‍රීන් කවුරුන් ද? යුරෝපය තුළ ඔවුන්ගේ ජීවන පසුබිම කුමක්ද? චර්මඡේදනයට ගොදුරු වූවන්ට උදව් කිරීමට යුරෝපය තුළ නීතියෙන් සරණක් ලබාගත හැකි ද? මිලියන භාගයක් ස්ත්‍රීන් යනු මිලියන භාගයක් මවුවරුන් වන්නට වරම් ලද ගැහැනුන් නො වේ ද? කෙසේ හෝ ඔවුන් සොයා ගෙන ගොස් අප ඔවුනට උදව් කළ යුතු ය.

ලිපිගොනුව වසා දැමූ මම තීරණයකට එළඹුණෙමි. යුරෝපයේ කෙරීගෙන යන ස්ත්‍රී චර්මඡේදනයට විරුද්ධ ව සටන් කිරීමට මම අධිෂ්ඨාන කර ගතිමි. සෑම දැරියකගේ ම මෙන් ම ස්ත්‍රියකගේ ම ආරක්ෂාව සහතික වන තෙක් මේ සටන මම ගෙන යමි. ස්ත්‍රී චර්මඡේදනය යනු සාංස්කෘතික අංගයක් නො වේ. මහත් වේදනාකාරී හිංසාවක් බව උසස් බලධාරීන් අවබෝධ කරගන්නා තෙක් මම ඉදිරියට යමි.

එහෙත්, මා තෝරා ගත් මඟ කටුක එමෙන් ම දිගු ගමනක් බැව් ඒ මොහොතේ මට එතරම් තේරුමක් නො වී ය. එදින මා කොරින්නාගෙන් සමුගත් මොහොතේ ඇය මට මෙසේ පැවසුවා ය. “වාරිස් අන්තර්ජාලයට ගිහින් බලන්න... මේ විෂය ගැන අන්තර්ජාලයට ඕනෑ ම අයකුට නිර්නාමික ව අදහස් දක්වන්න පුළුවන්... ඒ නිසා බොහෝ අය මේ සම්බන්ධ ව ඒ අයගෙ අදහස් අන්තර්ජාලයට එවනවා... මොන තරම් ගැහැනු මේ සම්බන්ධ ව ප්‍රසිද්ධියේ ම කතා කරලා තියෙනවා ද... ඒවා දැක්ක ම ඔයාට පුදුම හිතේවි.”

“කොරින්නා ඔයා දන්නවා මා ළඟ පරිගණකයක් නැති බව... අනෙක මට ඕක ගැන වැඩි අවබෝධයකුත් නෑ... ඒත් මට අන්තර්ජාලයේ මේ සම්බන්ධ ව තියෙන කරුණු දැන ගන්නට ඕනෑ... ඒ නිසා ඔයාට බැරි ද හෙට මගේ කාර්යාලයට ඇවිල්ල මේ ගැන දැන ගන්න මට උදව් කරන්න.”

මගේ ඉල්ලීම පිළිගත් කොරින්නා පසු දින මගේ කාර්යාලයට පැමිණියා ය. අපි දෙදෙන පරිගණකය ඉදිරිපිට වාඩි වුණෙමු. කාර්යාලයේ ජනේලය තුළින් පෙනෙන වැහිපුබ ගඟ සහ කඳුගැට පෙළ ඇත්තෙන් ම රමණීය දර්ශනයකි. එහෙත්, මා දැන් ඇතුළු වන්නට සූදානම් වන්නේ ඊට හාත්පසින් ම වෙනස් ලෝකයකට ය.

කොරින්නා වෙබ් අඩවියක ලිපිනයක් පරිගණකයට ලබා දුන්නා ය. මොහොතකින් නොයෙකුත් ලිපිනයන් සඳහන් නිල් පාට පිටුවක් පරිගණක මත දිස්විය. මම එයින් පළමුවෙනි ලිපිනය

විවෘත කළෙමි. ස්ත්‍රී චර්මඡේදනයට ගොදුරු වූ තරුණියන් සිය ප්‍රථම දරු ප්‍රසූතියේ දී ඇයට විඳින්නට වූ වේදනාව එහි සඳහන් ව තිබුණි. චර්මඡේදනයේ දී භගශිශ්නිකාව (Clitoris) සහ යෝනි තොල් කපා ඉවත් කරන ලද ස්ථාන මසා දැමීම හේතුකොටගෙන දරුවා ප්‍රසූත කිරීමේ දී යෝනි විවරය අවශ්‍ය ප්‍රමාණයට ප්‍රසාරණය නො වීම නිසා ඇයට විඳින්නට සිදු වූ වධනයෙන් විස්තර කළ නො හැකි ඒ වේදනාව ගැන ඇය ලියා තිබුණා ය. එය කිය වූ පසු මගේ සර්වාංගයම හිරිවැටී යන්නා සේ මට දැනෙන්නට විය. මේ සම්බන්ධ ව මෙතරම් සෘජු ව කතා කර තිබූ අවස්ථාවක් නම් මා මීට පෙර කිසි ම දිනක අත්දැක නො තිබුණි. මම එහි අඩංගු ව තිබූ සෑම පිටුවක් ම විවෘත කොට කියවූයෙමි.

මෙඩියානා - මට චර්මඡේදනය සිදු කළේ අවුරුදු එකොළහේ දී. දැන් මගේ වයස අවුරුදු දහනවය යි. ඒ කෲර සිද්ධිය ඊයේ සිදු වූ දෙයක් මෙන් මට මතක ය. එයින් පසු ජීවිතය මට සම්පූර්ණයෙන් ම එපා විය. මම කීප වතාවක් ම සිය දිවි හානි කර ගැනීමට උත්සාහ කළෙමි. පිරිමි පක්ෂය ගැන මා තුළ ඇත්තේ ද්වේෂයකි. කිසි ම දිනක පිරිමියකු සමග සම්භෝගයක් නො පැවැත්වීමට මම තීරණයක් ගතිමි. කරුණාකර මා හට පිහිට වන්න. මේ සම්බන්ධ ව මා ප්‍රසිද්ධියේ කතා කළ පළමු වන වතාව මෙය යි. ඇත්තෙන් ම ඒ ගැන කතා කිරීම වේදනාකාරී ය.

මායා - මම මාලි රටේ සිට ප්‍රංශයට සංක්‍රමණය වූ අයෙක්මි. දැන් මම ප්‍රංශයේ පුරවැසියෙක්මි. මා මාලි රටට රැගෙන ගොස් චර්මඡේදනයට ලක් කරන විට මගේ වයස අවුරුදු දහතුනකි.

මාරියම් - මා මගේ පෙම්වතා සමග සංවාස කළ ද මට එයින් කිසි යම් හැඟීමක් හෝ තෘප්තියක් හෝ නොලැබුණි. එහෙත්, ඒ අවස්ථාවල ඔහුගේ හැඟීම් උද්දීපනය වන ආකාරයට හැසිරීමෙන් යටත් පිරිසෙයින් මගේ පෙම්වතා හෝ එයින් තෘප්තියක් ලබන බැවින් මම එසේ කරමි. ආදරය කරන පුද්ගලයා සමග සංවාසයේ යෙදීමෙන් කිසි යම් හෝ තෘප්තියක් ලබන්නට නො හැකි වීම දරා ගන්නට නො හැකි මානසික වේදනාවකි.

සාමියා - මා හට චර්මඡේදනය සිදු කර ඇත්තේ මා ඉතා කුඩා අවධියේ දී ය. එහෙයින්, ඒ ගැන කිසිවක් මට මතක නැත. මා දැන් තරුණියක් වන අතර, පිරිමියකු සමග මා ශාරීරික සම්බන්ධයක් පැවැත්වුව ද මට නම් එයින් කිසි යම් හෝ තෘප්තියක් ලබන්නට නො හැකි ය.

මඩියා - ඉතා කුඩා අවධියේ දී චර්මඡේදනයට භාජනය වී ඇති මම, චර්මඡේදනය පිළිබඳ ව කිසිවක් නො දනිමි. දිනක් මගේ අම්මා මේ සම්බන්ධ ව මා දැනුවත් කළා ය. විවාහ වූ දිනක පිරිමියකු සමග ඇති වන සම්භෝගයෙන් තෘප්තියක් ලබන්නට නො හැකි බැව් බොහෝ දෙනා මා සමග පවසා ඇත. එය ඇසූ මා තුළ මහත් බියක් හට ගෙන තිබේ. එමතු ද නො ව, පිරිමියකු සමග එක් ව සම්භෝගයේ තෘප්තිය ලබන්නට නො හැකි බැවින්, පිරිමි පාර්ශ්වය ගැන මා තුළ බියක් ඇති වී ඇත. එබැවින් ස්ත්‍රීන්ට කරන මෙම ම්ලේච්ඡ ක්‍රියාවට අනුබල දීම මට කොහෙත්ම තේරුම් ගන්නට නො හැකි ය. උප්පත්තියෙන් ම ගැහැනුන් වන අප සතු ඉන්ද්‍රියන් කපා ඉවත් කිරීමට ඔවුන්ට ඇති බලය කුමක්ද?

ඒ කාන්තාවන්ගේ දැරියන්ගේ හඬ ය. වෙබ් අඩවියකට ඕනෑ ම අයකුට නිර්නාමික ව අදහස් ප්‍රකාශ කරන්නට හැකි හෙයින් ඔවුන්ගේ කතාව වෙබ් අඩවියකට ඉදිරිපත් කරති. ස්ත්‍රී චර්මඡේදනය ගැන නොයෙකුත් මත දරන ලිපි බොහොමයක් මම කියවූයෙමි. සමහර ස්ත්‍රීන්ට ඔවුන්ගේ ප්‍රශ්නය ගැන කතා කිරීමට කිසිවකු නොමැති හෙයින් ඔවුනු ඔවුන්ගේ ප්‍රශ්න වෙබ් අඩවිය වෙත ඉදිරිපත් කරති. කිසිවෙක් මෙම සැහැසි ක්‍රියාව සම්බන්ධ ව ප්‍රසිද්ධියේ කතා නො කරන්නේ මන්ද?

මේ ව්‍යසනයට ගොදුරු වී ඇති ස්ත්‍රීන්ට කඩිනමින් උපකාර අවශ්‍ය වී ඇති බැව් මම තේරුම් ගතිමි. හුදකලා වී සිට මෙවැනි සංකීර්ණ ප්‍රශ්නයකට පිළිතුරු සපයන්නට නො හැකි ය. වෙබ් අඩවියට යොමු කර ඇති ලිපි දිගට ම කියවාගෙන යන අතර "සඩ්" නමැත්තියක් එවා තිබූ ලිපියක් මගේ නෙත ගැටිණ. අහම්බෙන් මෙන් මා දුටු ලිපිය විවෘත කළ මම එය එක හුස්මට කියවූයෙමි.

"කරුණාකර මට උපකාර වන්න. මා චර්මඡේදනයට ලක් කර ඇත්තේ වයස අවුරුදු හතරේ දී ය. ඒ සඳහා මගේ දෙමව්පියන් විසින් මා අපගේ මවුබිම වෙත රැගෙන ගොස් ඇත. පිරිමියකු සමඟ සම්බන්ධයක් ඇති කර ගැනීමට මට කිසි යම් හෝ අවශ්‍යතාවයක් නැත. මෙය කියවන ඔබත් මා මුහුණ දී ඇති ඒ ම්ලේච්ඡ ක්‍රියාවට මුහුණ දුන් අයෙක් ද? ඒ සම්බන්ධ ව ඔබගේ අදහස් සහ හැඟීම් දන්වන්න. වෛද්‍යවරුන් මේ සම්බන්ධ ව දක්වන අදහස්වල සත්‍යයක් ඇත් ද? මා බලාපොරොත්තු සුන් කරගෙන සිටින තරුණ යුවතියක්මි. කවුරුන් හෝ මා හට පිහිට වන්නේ නම් ඒ සැමට මම ස්තූති වන්ත වෙමි."

ඇගේ ලිපියේ අන්තර්ගතය මා තුළ ප්‍රශ්නයක් ඇති කිරීමට සමත් විය. ඇගේ ලිපියෙන් විස්තර කර තිබූ තරුණි ඇත්ත වශයෙන් ම මා කුඩා කල මුහුණ දුන් ඒ බියකරු අත්දැකීම මගේ මතකයට ගලා එන්නට විය. එහෙයින්, ඇය ව අන්තර්ජාලය මඟින් සම්බන්ධ කර ගැනීමේ අරමුණ පෙරදැරි කරගෙන මම ඇයට ලිපියක් ලිව්වෙමි.

"ඔබ වෙබ් අඩවියට එවා තිබූ ලිපිය මම කියවූයෙමි. ඔබ විසින් එහි සඳහන් කරන ලද කරුණු මා තුළ මහත් ආන්දෝලනයක් ඇති කිරීමට සමත් විය. මෙම ප්‍රශ්නයත් සමඟ ඔබ තනි වී නොමැති බැව් දන්වන අතර, ඔබට මගෙන් උපකාරයක් අවශ්‍ය නම් කරුණාකර මේ ලිපියට පිළිතුරක් එවන්න."

දින කීපයකට පසු නැවත මා වෙත ලිපියක් එවා තිබුණි. එතැන් පටන් අප දෙදෙන අන්තර්ජාලය මඟින් නිරන්තරයෙන් සම්බන්ධ වීමු. ඇගේ ජීවිතයේ සියලු ම තොරතුරු ඇය මා වෙත දන්වූ අතර, ස්ත්‍රී චර්මඡේදනයට විරුද්ධ ව මා ගෙන යන්නට සැලසුම් කර ඇති වැඩපිළිවෙළ මම ඇයට දන්වා යැව්වෙමි. කඩි ඇගේ විස්තර මා වෙත මෙසේ ලියා එවා තිබුණි.

මා ජන්ම ලාභය ලබා ඇත්තේ පැරිසියේ 14හි ඇරොන්ඩිස්මන්ට් නමැති ස්ථානයේ දී ය. මගේ දෙමව්පියන් මාලි රටේ ජන්ති බම්බාරා නමැති ප්‍රාන්තයේ සිට ප්‍රංශයේ පැරිස් නගරයට සංක්‍රමණය වූ අය වෙති. මගේ පියාගේ විවාහය බහු විවාහක (Polygamous) නමැති සම්ප්‍රදායට අනුව සිදු වූ එකකි. ඔහුට භාර්යාවන් තිදෙනකු සිටි අතර, හෙතෙම දරුවන් විසිහතර දෙනකුගේ පියෙකි. මගේ මව මා ප්‍රසූත කිරීමේ දී වෛද්‍යවරයා අතින් සිදු වූ වරදක් හේතුකොටගෙන මියගොස් ඇත. ඇගේ මරණය ගැන මෑතක දී මා හට දැන ගන්නට ලැබුණ අතර, එය අසා මම කම්පා වුණෙමි. ඇය ස්ත්‍රී චර්මඡේදනයට ලක් වූ අයකු නො වුණා නම් කිසිසේත් ම ඇය එසේ අකල් මරණයකට ගොදුරු නො වන බව මම හොඳාකාරව ම දනිමි.

මගේ පියා බහු විවාහක සම්ප්‍රදායට අනුව විවාහ සංස්ථාවට ඇතුළත් ව සිටින අයකු වීම ගැන ඔහු කෙරෙහි මා තුළ ඇත්තේ ගෞරවයකි. ඔහු භාර්යාවන් තිදෙනකු සමඟ විවාහ වී සිටීම ද මට එතරම් ප්‍රශ්නයක් නො වේ. මගේ ඥාති සහෝදරිය විවාහ වී පැරිසියේ පදිංචි ව සිටින්නී ය. ඇගේ ස්වාමිපුරුෂයාට වෙනත් භාර්යාවක් නොමැති වීම ගැන ඇය නිතර ම ඔහුට දොස් පවරන්නී ය. මට ඇය ව තේරුම් ගන්නට නො හැකි ය. ඇය නිතර ම මෙසේ පවසන්නී ය. "හදිසියෙන් මා මළොත්... මගේ මහත්තයාට බලා ගන්නෙ කවුද?"

මගේ පියාට දියණියන් දහතුන් දෙනෙක් සිටින අතර, ඔවුන්ගෙන් එකොළොස් දෙනකුට දැනටමත් චර්මඡේදනය සිදුකර ඇත. ඔහුගේ වැඩිමහලු දියණියන් දෙදෙනා උප්පත්තිය ලබා ඇත්තේ මාලි රටේ බැවින් ඒ සංස්කෘතියට අනුව ඔවුන්ගේ චර්මඡේදනය සිදු කිරීමට කිසි ම බාධාවක් තිබුණේ නැත. තුන්වෙනි දියණිය උප්පත්තිය ලබා ඇත්තේ ප්‍රංශයේ දී ය. වර්ෂ 1983 ස්ත්‍රී චර්මඡේදනය ප්‍රංශය තුළ නීතියෙන් තහනම් කිරීමට පෙර ඇයගේ චර්මඡේදනය ප්‍රංශයේ දී සිදුකර ඇති අතර, එය කවුරුන් විසින් කිනම් ස්ථානයක දී කරන ලද්දේ දැ යි මම නො දනිමි. චර්මඡේදනය සඳහා මගේ වාරය පැමිණි අවස්ථාවේ මගේ අම්මා මා මාලි රටේ මගේ පියාගේ ගමේ සිට බොහෝ දුර වනාන්තරයකට ගෙන ගොස්, එහි දී මට චර්මඡේදනය සිදු

කර ඇත. චර්මච්ඡේදනය කළ අවස්ථාවේ දී මට මහත් වේදනාවක් දැනුණු බැවි මගේ මතකයේ තවමත් රැඳී තිබේ. එහෙත්, එහි දී ඔවුන් මා හට කුමක් කළේ දැ යි යන්න ගැන මට නිශ්චිත අවබෝධයක් නො තිබුණ අතර, පසු කලෙක චර්මච්ඡේදනයට ලක් වූ යුවතියකගේ ඡායාරූපයක් දැක ගැනීමට ලැබුණි. එමතු ද නො ව, ඒ සම්බන්ධ ව ලියවුණු ලිපියක් ද කියවීමට අවස්ථාවක් ලදිමි. ඒ මගින් ඒ කෲර ක්‍රියාවේ නියම තතු දැන ගැනීමට ලැබීම නිසා මම අද දරුණු මානසික කම්පනයකට මුහුණ පා සිටිමි.

මා හට චර්මච්ඡේදනය සිදු කර ඇත්තේ වයස අවුරුදු පහේ දී පමණ ය. චර්මච්ඡේදනයෙන් පසු නො නවත්වා රුධිරය වහනය වූ බවින්, මා මරණාසන්නයට ගොස් ආපසු පැමිණි බැවි පසු කලෙක මගේ ඥාති සහෝදරියක් මා හට පැවසුවා ය. අප පෙරළා ප්‍රංශයට පැමිණි පසු මගේ චර්මච්ඡේදනය සිදු කළ ගැහැනියට තවදුරටත් ඒ වෘත්තියේ නිරත ව කටයුතු කිරීමේ අවස්ථාව අහිමි ව ගොස් ඇත. ඊට හේතුව වී ඇත්තේ මගේ චර්මච්ඡේදනයෙන් පසු අසාමාන්‍ය ලෙස රුධිරය වහනය වීමෙන් මා පත්ව සිටි භයානක තත්ත්වය හේතුකොටගෙන ඇය කෙරෙහි මෙතෙක් තිබූ විශ්වාසය පලුදු වී යාම ය. මේ සිද්ධියෙන් පසු මා හට නිතර නිතර නපුරු සිහින පෙනෙන්නට විය. මෙතෙක් චර්මච්ඡේදනයට ලක් නො වූ මගේ කුඩා නැගණියන් දෙදෙනා ගැන දැන් මා තුළ මහත් බියක් ඇති වී ඇත.

මා තුළ නැඟී එන වේදනාව කියා සිටින්නට කිසිවකු නොමැති වූ කල, මනෝ විද්‍යාඥයෙක් හමු වන්නට ද මම උත්සුක වීමි. අපගේ පවුල් ඇතුළත ස්ත්‍රී චර්මච්ඡේදනය යන වචනය පවා තහනම් වචනයකි. මගේ පියා මේ සම්බන්ධ ව නිකමට හෝ අප සමඟ කතා නො කළා පමණක් නො ව, ඔහු වෙන කිසි යම් අයකු සමඟ හෝ මේ සම්බන්ධ ව කතා කරනවා මා කිසි දිනක අසා නැත.

අද මා අංගවිකලයකුගේ තත්ත්වයට පත් ව ඇතැ යි යන්න මගේ හැඟීම යි. පිරිමි පක්ෂය ගැන මා තුළ ඇත්තේ මහත් බියකි.

ඔවුන් සමඟ කිසි දිනක ශාරීරික සම්බන්ධයක් නො පැවැත්වීමට මම තීරණයකට එළඹ සිටිමි. මා එක ම එක පෙම්වතකු සමඟ බොහෝ කලක සිට සම්බන්ධයක් පවත්වාගෙන යන්නෙමි. එහෙත්, ශාරීරික වශයෙන් අප අතර කිසි ම සම්බන්ධයක් නැත. මා මුස්ලිම් ජාතිකාවක් බැවින් ශාරීරික එක් වීමක් සඳහා විවාහ වන තුරු සිටීම මගේ කැමැත්ත සහ ඉල්ලීම බැවි මම ඔහුට පැවසුවෙමි. ඇත්තෙන් ම ඊට හේතුව එය නො වේ. මාලි රටේ සිට ප්‍රංශයට සංක්‍රමණය වී සිටින පවුලකට අයත් මගේ පෙම්වතා ස්ත්‍රී චර්මච්ඡේදනය ගැන කිසිවක් නො දන්නා අතර, ඔහුට එය පැහැදිලි කර දෙන්නේ කෙසේ දැ යි යන්න මම නො දනිමි. ඒ ගැන මේ මොහොතේ ඔහුට පැහැදිලි කිරීමක් කරන්නට මා අකැමැති වුවත්, මතු යම් දිනක මා විවාහ වන්නට බලාපොරොත්තු වන පුද්ගලයාට ඒ පැහැදිලි කිරීම අනිවාර්යයෙන් ම මට කරන්නට සිදුවනු ඇත.

ප්‍රංශයේ දී උපත ලබා ඇති පිරිමින්, තමුන්ගේ මවුබිමේ සිටින සහෝදරියන් හට සිදුවන මෙම විපත ගැන කිසිවක් නො දන්නේ ය. මගේ සහෝදරයින්ට ද මේ සම්බන්ධ ව අබමල් රේණුවක තරම් හෝ වැටහීමක් ඇතැ යි මම නො සිතමි. මේ සියල්ල ඔබට ලියා යවන්නට මා ලද අවස්ථාව ගැන මම සතුටු වෙමි.

පසුගිය මාස කීපය තුළ ඛදී විසින් ඉලෙක්ට්‍රොනික් තැපැලෙන් මා වෙත එවන ලද සියලු ම ලිපි මම නැවත නැවතත් කියවූයෙමි. චර්මච්ඡේදනයට විරුද්ධ ව මා ගෙන යන සටනට ඒ ලිපි මහත් ධෛර්යයක් වූවා පමණක් නො ව, ඛදී මගේ සටනේ නියමුවා මතු නො ව. මගේ මාර්ගය ආලෝක කරන පහන් ටැඹ ද විය. ශෛශවයට අනුව ඇයට විඳින්නට සිදු වූ වේදනාවන් ඇගේ ජීවිතයට එල්ල වූ අනතුරු ඇඟවීමක් පමණක් නො ව, අභියෝගයක් බැවි මම කල්පනා කරමි. ස්ත්‍රී චර්මච්ඡේදනයට ලක් ව යුරෝපයේ ජීවත් වන කතුන්ට, අප්‍රිකානු සංස්කෘතියට අදාළ ගති පැවතුම් පවත්වාගෙන යන පිය දෙමවුපියන් සහ තමුන් උප්පත්තිය ලබා ඇති යුරෝපයේ සංස්කෘතියට අනුව ජීවත් වීම යනු පරස්පර විරෝධී ලෝක දෙකක ජීවත් වීමක් බවත්, ඒ නිසා ම ඔවුනට මුහුණ දෙන්නට සිදුවන ප්‍රශ්න ගැන මම ඛදීගෙන් උගත්තෙමි.

අවාසනාවකට මෙන් මගේ මවුරට වන සෝමාලියාවේ ස්ත්‍රී චර්මඡේදනය සාමාන්‍ය සිද්ධියකි. චර්මඡේදනය හේතු කොටගෙන සෝමාලි ස්ත්‍රීන්ට නොයෙකුත් ප්‍රශ්නවලට මුහුණ දෙන්නට සිදු වී තිබුණ ද, ඊට වෙනස් ලෝකයක් ගැන ඔවුන් කිසිවක් නො දන්නා බැවින් ඒ සඳහා ඔවුනට විකල්පයක් ද නොමැත. පැමිණෙන ඕනෑ ම ප්‍රශ්නයකට මුහුණ දෙමින් ජීවත් වීමට ඔවුනට සිදු වී ඇත. එහෙත්, යුරෝපයේ උපත ලබා හැදුණ වැඩුණ, ස්ත්‍රී චර්මඡේදනයට ලක් වූ අප්‍රිකානු, අරාබි තරුණියන් අන් තරුණියන්ට වඩා ශාරීරික වශයෙන් වෙනසක් ඇති බැව් දැනගෙන යුරෝපයේ ජීවත් වීම ඔවුනට මහත් හිරිහැරයකි. එහෙත්, මේ සම්බන්ධ ව ඔවුන්ට කිසිවකු සමඟ කතා කිරීමට අවකාශයක් නැත. ඊට හේතුව එසේ කළහොත් තමුන්ගේ සංස්කෘතියට සහ පවුලට නිරායාසයෙන් ම අවමානයක් සිදුවන බැවිනි. යුරෝපය පුරා නොයෙකුත් පාසල්වල මේ සම්බන්ධයෙන් මා දේශන පවත්වා ඇත. ඒ අවස්ථාවන්ට සහභාගි වූ තරුණ-තරුණියන් ස්ත්‍රී චර්මඡේදනය ගැන අසා මවිතයට පත් වූ අවස්ථා මම එමට අත්දැක ඇත්තෙමි.

යුරෝපයේ කෙරීගෙන යන ස්ත්‍රී චර්මඡේදනය ගැන ගවේෂණයක් කිරීම සඳහා මිතුරු-මිතුරියන් කීපදෙනෙක් එකට එක් වී කණ්ඩායමක් වශයෙන් කටයුතු කරන්නට අපි පටන් ගත්තෙමු. කොරින්නා හැරුණුකොට තවත් මාධ්‍යවේදිනියන් දෙදෙනකු වන ලී සහ ජුලියා අප සමඟ එක් විය. මානව අයිතිවාසිකම් පිළිබඳ මනා දැනුමක් ඔවුන් තිදෙනා සතු විය. ස්ත්‍රී චර්මඡේදනය යුරෝපය තුළ සැලැකිය යුතු ප්‍රශ්නයක් බවට පත් වී ඇති බැව් අප තිදෙනාට ම එත්තු ගොස් තිබුණි. සෑම යුරෝපීය රටක ම චර්මඡේදනයට ලක් වූවන් දහස් ගණනින් ජීවත් වෙන බවත්, ස්ත්‍රී චර්මඡේදනය කෙරෙන ස්ථාන සහ එය කෙරීගෙන යන ආකාරය ගැන දන්නා අය දහස් ගණනක් යුරෝපයේ සිටින බවත් අපි දැන සිටියෙමු.

වියානා නගරයේ වෙළෙඳපොළ තුළ වූ මාළු ව්‍යංජන සඳහා විශේෂත්වයක් දරන ආපනශාලාව, ජුලියා සහ කොරින්නා හමු වන්නට මම යොදා ගත්තෙමි. වෙළෙඳ සංකීර්ණයේ වූ නොයෙකුත් වෙළෙඳ සල් ඉදිරිපිට ගොඩගසා ඇති නොයෙකුත් වර්ණ පලතුරු සහ එළවළු වර්ගත් වැල නො කැඩී එන පාරිභෝගිකයින් දුටු විට මගේ මතකයට නිරායාසයෙන් ම ගලා ආවේ මගේ මවුරට වන සෝමාලියාවේ වෙළෙඳ සල් ය. අප්‍රිකානු රටවල විශේෂ ආහාරයක් වන මිස්සොත්තා සහ කෙසෙල් ආදිය මෙම වෙළෙඳ පොළෙන් ලබාගත හැකි ය. මා එහි යන විට ජුලියා සහ කොරින්නා පැමිණ සිටි අතර, ඔවුන් දෙදෙනා ලිපිගොනු දිග හැරගෙන බැරෑරුම් සාකච්ඡාවක නිරත ව සිටියහ.

පළමුවෙන් ම ආහාර ගෙන සිටිය යුතු යයි මම යෝජනා කළෙමි. ඒ මොහොතේ ලී ද පැමිණ අප හා එක් විය. ලී ඔස්ට්‍රියාවේ ස්ත්‍රී චර්මඡේදනය සම්බන්ධ ව ගවේෂණයක් කර තිබුණි. ඔස්ට්‍රියාවේ ස්ත්‍රී චර්මඡේදනය සම්බන්ධ නීති යුරෝපයේ අනෙකුත් රටවල මෙන් ව්‍යාකූල නො වී ය. වර්ෂ 2002 සිට ක්‍රියාත්මක වන ආකාරයට ඔස්ට්‍රියාවේ දණ්ඩ නීති සංග්‍රහයට මෙම විෂය සම්බන්ධ ව විශේෂ වගන්තියක් ඇතුළත් කරන ලදී. ඒ අනුව ස්ත්‍රී චර්මඡේදනය මනුෂ්‍ය ශරීරයට හානි පමුණුවන බැවින්, එය, නීති විරෝධී ක්‍රියාවක් වන බවත්, ඒ සඳහා වැරැදිකරුවකු බවට පත් වන අයකුට උපරිම වසර දහයක සිරදඬුවමක් ලැබිය හැකි බවත් එම වගන්තියෙන් අවධාරණය කර ඇත. ඔස්ට්‍රියාවේ ප්‍රොෆිල් නමැති සඟරාව විසින් වර්ෂ 2001 දී මේ සම්බන්ධ රහසිගත ගවේෂණයක් කරන ලදී. එමඟින් ඔස්ට්‍රියන් වෛද්‍යවරුන් මෙම කර්තව්‍ය කිරීමට ඉදිරිපත් වන්නේ ද යන්න සොයා බැලීම එහි අරමුණ වී ඇත.

"එක සිද්ධියක් ගැන මට දැන ගන්නට ලැබුණි... ඒ සිද්ධියට සම්බන්ධ ව සිටින පුද්ගලයන් කෙසේ හෝ සොයාගෙන ඔවුන්ට කතා කළ යුතුයි..." ලී පැවැසුවා ය. ජුලියා, කොරින්නා සහ මම ඇය පවසන්නට සූදානම් වන්නේ කුමක් ද යන්න ගැන කුතූහලයට පත් වීමු.

අල (මේ ඇයගේ හරි නම නො වේ) ඔස්ට්‍රියාවේ උපත ලද ගැහැනු ළමයෙකි. ඇයගේ පියා අරාබි ජාතිකයෙක් වන අතර, ඇගේ මව ඔස්ට්‍රියානු කාන්තාවක් වූවා ය. වෛද්‍යවරයකු වෙත ගිය අල තමා අරාබි ජාතික කාන්තාවක් බවත්, ඊජිප්තු ජාතිකයකු සමඟ

ඇය විවාහ වන්නට සූදානම් වන බවත් වෛද්‍යවරයාට පවසා ඇත. තමා කන්‍යාවියක් නො වන බැවින්, සිය පෙම්වතාගේ ඉල්ලීම පරිදි චර්මඡේදනය කර ගැනීමට අවශ්‍ය බැව් පවසා ඇත. වෛද්‍යවරයා කිසි ම පැකිළීමකින් තොර ව ශල්‍යකර්මය කිරීමට ඉදිරිපත් වී ඇති අතර, ශල්‍යකර්මය කිරීම සඳහා උවමනා කරන උපකරණ සහ ඖෂධ ආදිය රැගෙන ඒමට ද ඔහු එකඟ වී ඇත. සමහර උපකරණ වියානා නගරයේ වූ රෝහලකින් ලබාගෙන ඇති අතර, ඉතිරි උපකරණ හෙතෙම වෙළෙඳ පොළේ සාමාන්‍ය කඩයකින් රැගෙන විත් ඇත. "බය වෙන්නට කාරණයක් නැහැ... මේවා මිල අඩු කබල් පිහි නෙමෙයි" වෛද්‍යවරයා එසේ ද පවසා ඇත.

ශල්‍යකර්මයෙන් පසු පැය කීපයක් විවේක ගත යුතු බැවින් පුද්ගලික නිවසක දී මෙම ශල්‍යකර්මය සිදු කිරීමට වෛද්‍යවරයා ඇයට යෝජනා කොට ඇත. තමාට ම ශල්‍යාගාරයක් නොමැති බවත්, අවශ්‍ය නම් සිය මිතුරකුට අයත් ශල්‍යාගාරයක් පැය ගණනකට ලබාගත හැකි බවත් වැඩිදුරටත් කියා ඇත. එසේත් නැතිනම් ඔහු දන්නා වෛද්‍යවරියකට අයත් කාමරයක් යොදවා ගැනීමට හැකි බැව් ද පවසා ඇත. ශල්‍යකර්මයෙන් පසු ඔහුගේ පුද්ගලික රථයෙන් ඇය ව සිය නිවසට ඇරලවීමට ද වෛද්‍යවරයා එකඟ වී ඇත. ඊට පසු සිව් වතාවක් ම වෛද්‍යවරයා අල. සමඟ මූලික සාකච්ඡා පැවැත්වීමෙන් අනතුරු ව ශල්‍යකර්මය සඳහා ඇයට දිනයක් දෙන ලදී. එතැන් සිට අල. වෛද්‍යවරයා සමඟ තිබූ සම්බන්ධය නවතා දමා ඇති අතර. වෛද්‍යවරයා ඇය ව දුරකතනයෙන් සම්බන්ධ කර ගන්නට උත්සාහ කර ඇත. සුළු මුදලකට හෝ ශල්‍යකර්මය කර දීමට සූදානම් බැව් දන්වා ඇති වෛද්‍යවරයා අවසානයේ දී ශල්‍යාගාරයට ගෙවිය යුතු මුදල පමණක් අය කර ශල්‍යකර්මය කිරීමට එකඟ වී ඇත.

සතියකට පමණ පසු ප්‍රොෆිල් සඟරාවේ කණ්ඩායම තමුන් කළ රහස් අධ්‍යයනයේ ප්‍රතිඵල ද සමඟ වෛද්‍යවරයා මුණ ගැසී මේ සම්බන්ධ ව ප්‍රශ්න කර ඇත. වෛද්‍යවරයා වෙත ඉදිරිපත් කර ඇති චෝදනාවන්ට ඔහුගේ පිළිතුර වී ඇත්තේ තමා පවතින නීතියට අනුව ඒ ශල්‍යකර්මය කරන්නට ඉදිරිපත් වූ බවත්. යම් හෙයකින් අල. වෙනත් වෛද්‍යවරයකු ලවා මෙම ශල්‍යකර්මය කර ගැනීමට යාමෙන් ඇති විය හැකි උපරිම අනතුරු අවම කර ශල්‍යකර්මය කර දීම ඔහුගේ බලාපොරොත්තුව වූ බවයි. එනම් වෙනත් වෛද්‍යවරයකු ලවා මෙම ශල්‍යකර්මය කරවා ගැනීමට ගොස් තිබුණා නම් බොහෝ විට භගශිශ්නිකාව සම්පූර්ණයෙන් ම අහිමි වීමේ අනතුරට ඇයට මුහුණ පාන්නට සිදු වන්නට ඉඩකඩ තිබූ බවත්, එසේ වූවා නම් එය මහත් විපතක් වන බවත් ඔහු පවසා ඇත.

එම වෛද්‍යවරයා තවදුරටත් වෛද්‍ය වෘත්තියේ නියැලී සිටිය ද මෙම පුවත හේතුකොටගෙන ස්ත්‍රියකගේ කැමැත්ත මත හෝ චර්මඡේදනය සිදු කිරීම ඔස්ට්‍රියාවේ නීතිය මගින් සම්පූර්ණයෙන් ම තහනම් කරන ලදී.

"පටන් ගැන්මක් වශයෙන් එය හොඳ පියවරක්" මම කීවෙමි.

"නීති පොත්වල චර්මඡේදනය තහනම් බැව් සඳහන් වී තිබුණත්... යථාර්ථය ඊට වඩා වෙනස්... මේ කරුණ සම්බන්ධ ව මෙතෙක් කිසි ම වෛද්‍යවරයකුට විරුද්ධ ව නීතිමය වශයෙන් කටයුතු කරලත් නෑ... ව්‍යසනයට ගොදුරු වී ඇති කිසි ම ගැහැනියක් සමඟ මේ සම්බන්ධ ව සාකච්ඡා කරලත් නෑ... ඒ විතරක් නො වෙයි කිසි ම වෛද්‍යවරයකුට දඬුවම් ලබා දීලත් නෑ" ලී තවදුරටත් කීවා ය.

"වෙන්ඩ බෑ" මම කීවෙමි.

"එහෙම නම් මම ඔබට තවත් උදාහරණයක් අරගෙන පෙන්වන්නම්" ලී කීවා ය. තම දැරියන් අප්‍රිකාවේ දී ස්ත්‍රී චර්මඡේදනයට භාජනය කරන දෙමවුපියන් ගැන නීතිය ක්‍රියාත්මක වෙන්නෙ නැහැ... මෙතෙක් එවැනි කිසිවකුට නීතියෙන් දඬුවමක් ලැබිලා නැහැ... අනෙක බොහොමයක් දැරියන් නිවාඩු ගත කිරීම සඳහා ඔවුන්ගේ මවු රටවල්වලට යන ගමනේ දී ඔවුන් චර්මඡේදනයට ලක් වෙනවා."

"මේ සම්බන්ධ ව දැනුවත් සංවිධාන තිබිය දී ඇයි එවැනි අයට විරුද්ධ ව නීතිය ක්‍රියාත්මක නො කරන්නෙ" මම ඇසුවෙමි.

"ඒකට හේතුව එවැනි අයට විරුද්ධ ව නීතියෙන් කටයුතු කරන්නට ගියහොත් ඒ සංවිධාන සහ අප්‍රිකානු ප්‍රජාව අතර තිබෙන සුහද සම්බන්ධතා නැති ව යයි කියන බිය ඔවුන්ට තිබෙනවා."

මෙසය මත වූ ලිපි ගොනුව තුළින් මම වියානා නගරය තුළ ක්‍රියාත්මක වන අප්‍රිකානු කාන්තා සංවිධානයක් සම්බන්ධ වාර්තාවක් එළියට ගතිමි. අප්‍රිකානු රටවල සිට ඔස්ට්‍රියාවට පැමිණෙන සංක්‍රමණිකයන් සම්බන්ධව කරන ලද අධ්‍යයනයක වැදගත් ප්‍රතිඵල දක්වන සාරාංශය ලී මා ඉදිරියේ තැබුවා ය. සංක්‍රමණිකයින් අතරින් 30.5%ක් දෙනා ඔවුන්ගේ දැරියන් චර්මච්ඡේදනයට භාජනය කොට ඇත. එම ප්‍රතිශතයෙන් තුනෙන් දෙකක් දෙනා සිය දැරියන් චර්මච්ඡේදනයට භාජනය කර ඇත්තේ එය ඔවුන්ගේ සංස්කෘතියට අනුව සම්ප්‍රදායක් වන බැවිනි. ඉතිරි කොටස ඒ සඳහා යොමු වී ඇත්තේ එය ස්ත්‍රියගේ සදාචාරාත්මක වර්ධනයට රුකුලක් වන බැව් ඔවුන් පිළිගන්නා නිසා සහ චර්මච්ඡේදනය මගින් ස්ත්‍රීන්ගේ ලිංගිකත්වය පාලනය වන බැව් ඔවුහු විශ්වාස කරන බැවිනි. මේ සම්බන්ධ ව කරන ලද අධ්‍යයනයකට මුහුණ දුන් බොහොමයක් දෙනා පවසා ඇත්තේ ඔවුන් සිය දැරියන් අප්‍රිකාවට රැගෙන ගොස් එහි දී එය සිදු කරන බව ය. යුරෝපය තුළ මෙම ශල්‍යකර්මය සිදු වන්නේ 11.5%ක් පමණි. ඒ අතරින් 1.9%ක චර්මච්ඡේදනය ඔස්ට්‍රියාවේ දී සිදු කරන අතර, ඉතිරි කොටස ජර්මනිය සහ ඕලන්දය වැනි රටවල දී සිදු කෙරෙනු ඇත.

දෙන ලද සංඛ්‍යාවන් සම්බන්ධ ව නැවත වරක් පරීක්ෂා කර බැලීමේ දී මා හට වැටහී ගිය කරුණ නම් දහස් ගණනක් දැරියන්ගේ චර්මච්ඡේදනය යුරෝපය තුළ දී සිදුවන බවයි. ඒ ගැන පුදුමයට පත් වූ මා හට ඉබේට ම කෑ ගැසුණි. ඇත්තෙන් ම මෙය විශ්වාස කළ හැකි ද? සත්‍ය වශයෙන් ම මෙහි සත්‍යයක් තිබේ ද? දහස් ගණනක් දරුවන් බිලි ගනිමින් ස්ත්‍රී චර්මච්ඡේදනය නමැති කෲර ක්‍රියාව කිසිවකුගේ අවධානයට යොමු නො වී, රහසිගත ව අපගේ ගේ දොරකඩ ම සිදුවන බව මෙම කරුණුවලින් අනාවරණය වන සත්‍යය නො වේ ද? මෙම කෲර ක්‍රියාවට සම්බන්ධ ව සිටින්නන් කවුරුන් ද? මෙයට වෛද්‍යවරුන් හෙදියන් සහ වෛද්‍ය විද්‍යාව හදාරන අයගේ සම්බන්ධයක් තිබේ ද?

අප්‍රිකානු කාන්තා සංවිධානයේ වාර්තාවට අනුව චර්මච්ඡේදනයට ලක් වූ ස්ත්‍රීන් 8,000කට ආසන්න ප්‍රමාණයක් ඔස්ට්‍රියාව තුළ පමණක් ජීවත් වෙති. ස්ත්‍රී චර්මච්ඡේදනය ගැන නො දන්නා මෙවැනි සමාජයක් ඒ සඳහා දක්වන ආකල්පය කුමක් විය හැකි ද? තමුන්ට විඳින්නට සිදු වූ මෙම කෲර ක්‍රියාව තම දරුවන්ට සිදු කිරීම වැළැක්වීම සඳහා ඔවුන්ගේ දෙමවුපියන් දැනුවත් කරන්නේ කෙසේ ද? ඇත්තෙන් ම යුරෝපය තුළ මෙම ශල්‍යකර්මය කරගෙන යන පුද්ගලයන් ගැන සෙවීම මෙන් ම යුරෝපයට සංක්‍රමණය වන්නට පෙර ස්ත්‍රී චර්මච්ඡේදනයට ලක් වූවන් ගැන සොයා බැලීම එක සේ ම වැදගත් බැව් ක්‍රමයෙන් මට අවබෝධ වන්නට පටන් ගැනිණ. මගේ මවුබිම වන සෝමාලියාවේ චර්මච්ඡේදනය සාමාන්‍ය සිද්ධියක් වශයෙන් සැලකීම ගැන මා තුළ ඇත්තේ ඉමහත් කනගාටුවකි. එහෙත්, යුරෝපය තුළ මෙම සැහැසි ක්‍රියාව ගැන සඳහන් කළ පමණින් යුරෝපීයයන් පිළිකුලෙන් ඉවත බලා ගන්නා අයුරු මම දැක ඇත්තෙමි.

මා හට මුහුණ දෙන්නට සිදු ව ඇති අප්‍රියජනක දෙය නම් කොහේ ගියත් ඔවුන් මා ස්ත්‍රී චර්මච්ඡේදනයට ලක් වූ අයකු වශයෙන් හඳුනා ගැනීම යි. එමතු ද නො ව, පළමුවෙන් ම ඔවුන් මා ස්ත්‍රියක් වශයෙන් හඳුනා නො ගන්නා අතර, ඔවුන් මා දෙස බලන්නේ චර්මච්ඡේදනයට අසු වූ ගැහැනියකු ලෙසට යි. මගේ පළමු කෘතිය වන "කාන්තාරයේ කුසුම" තුළින් මා චර්මච්ඡේදනයට ලක් වූ අයුරු විස්තර කර තිබූ බැවින්, මා මුණ ගැසෙන බොහොමයක් දෙනා පළමුවෙන් ම මා වෙත ඉදිරිපත් කරන ප්‍රශ්නය නම් මගේ යෝනියේ පෙනුම කොයි ආකාර ද? නැතිනම් මට සම්භෝගයෙන් සතුටක් ලැබීමට හැකියාවක් ඇත් ද? යන ප්‍රශ්නය යි. සමහරක් දෙනා මගේ නග්නත්වය ඉතා හොඳින් වටහාගෙන කතා කරන අවස්ථා ද නැතුවා නො වේ.

මා හට මුහුණ දෙන්නට සිදු ව ඇති සමහර අවස්ථා ගැන මනා වැටහීමක් ලබා ගැනීමට මම ඔබට එක උදාහරණයක් ඉදිරිපත් කිරීමට කැමැත්තෙමි. දැනට වසරකට පමණ පෙර ඔස්ට්‍රියාවේ පවත්වන ලද පොත් ප්‍රදර්ශනයකට මගේ පොත් ද ඉදිරිපත් කෙළෙමි. එම ප්‍රදර්ශන ශාලාවට ඇතුළු වූ මා හට දැක ගන්නට ලැබුණේ දැරියක් වර්ණභේදනයට ලක් කරන දර්ශනයක් යුත් බිත්තියක එල්ලා ඇති පෝස්ටරයකි. පෝස්ටරය මත මෙසේ ලියා තිබුණි. "කාරුණිකව පැමිණ වර්ණභේදනයට ලක් ව සිටින පාටිස් වයයි හමු වන්න" මේ ආකාරයෙන් කතා කිරීමට ඔවුන්ට ඇති අයිතිය කුමක්ද? ඕනෑ ම අයකුගේ පුද්ගලික ජීවිතයට ගරු කිරීම ශිෂ්ට සම්පන්න සමාජයක වැදගත් ලක්ෂණයක් බැව් අමතක නො කළ යුතු ය.

සමහර අවස්ථාවල බොහෝ දෙනා අප නො දියුණු රටවල්වල මිලේච්ඡ සමාජවලින් පැමිණ ඇති බැව් ප්‍රකාශ කරති. එවැනි අය පළමුවෙන් ම අපට යුරෝපය තුළ සලකන නින්දිත ආකාරය ගැන දැනුවත් විය යුතු යි. ඉෂරග හම්ඩ් මහත්මිය හමු වන්නට යන අතරමඟ දී මේ සියල්ල මට මතක් විය. මා ඉෂරග හම්ඩ් මහත්මිය වියානා නගරයේ වූ ඇගේ නිවෙස්නේ දී හමු වූ අවස්ථාවේ දී ඇය මා හරසරින් පිළිගත්තා ය.

ඇගේ සම්පූර්ණ නම ඉෂරග හම්ඩ් මුස්තෆා ය. ජනසන්නිවේදනය පිළිබඳ උපාධිධාරිනියක් වූ ඇය, සුඩාන් ජාතික කාන්තාවකි. අවුරුදු හතළිස් තුනක් වයසැති ඉෂරග, සුඩානයේ අගනුවර වන කාර්ටූම් නගරයේ විශ්වවිද්‍යාලයක සහ ඔස්ට්‍රියාවේ විශ්වවිද්‍යාලයක ජනසන්නිවේදනය සහ දේශපාලන විද්‍යාව සම්බන්ධ කථිකාචාර්යවරියක් වශයෙන් කටයුතු කරන්නී ය. වර්ෂ 1997 සිට 2004 දක්වා කාලය තුළ ඇය වියානා නගරයේ වෙසෙන අප්‍රිකානු, අරාබි සහ මුස්ලිම් ප්‍රජාවන් ගැන දීර්ඝ අධ්‍යයනයක් කර ඇත. එහෙයින්, යුරෝපයේ ජීවත් වන අප්‍රිකානු ගැහැනියකගේ තත්ත්වය කෙබඳුදැයි ඇය දැන සිටියා ය. ඉතා නිපුණ කතා විලාසයක් ඇති හීන්දෑරි සිරුරකින් හෙබි මේ යුවතිය වෙත මගේ සිත ඇදී ගියේ නිරායාසයෙනි. ඇය විවෘත ව මෙන් ම සුහදශීලී ව ද

කතා කළා ය. ඇ විසින් කරන ලද අධ්‍යයනය මඟින් සොයා ගන්නා ලද දත්ත දෙස බලන විට ඒවා සම්බන්ධ ව කෙනකුට සැක ඇති විය හැකි බවක් පෙනෙන්නට තිබුණි. එම අධ්‍යයනය සඳහා සම්මුඛ සාකච්ඡාවන්ට භාජනය කරන ලද අප්‍රිකානු ගැහැනුන්ගෙන් 3%කට ඔවුන්ගේ අධ්‍යාපන සුදුසුකම්වලට අනුව රැකියා ලබා ගැනීමේ අවස්ථා ලැබී තිබුණි. ඔවුන් අතරින් 80%ක් පාසල් අධ්‍යාපනය ලබා සිටි අතර 20%ක් විශ්වවිද්‍යාල උපාධිධාරීන් විය.

"වියානාවට මා පැමිණි මුල් කාලයේ දී ගෙවල් පිරිසිදු කරන රැකියාවකුයි මට ලැබුණේ" ඇය පැවැසුවා ය.

"ඒක නම් එච්චර සුබවාදී ලකුණක් නො වෙයි" මම කීවෙමි.

වියානා නගරයේ ජීවත් වන සියයට අසූවක් පමණ අප්‍රිකානු ගැහැනුන් කියා සිටින්නේ ඔවුන්ගේ හමේ වර්ණය නිසා ඔවුන් පහත් කොට සලකන බව යි. අප්‍රිකානු ගැහැනුන් ගැන යුරෝපීයයන් දරන ආකල්පය බොහෝ විට ඒකාන්තික ආකල්පයකි. ඇත්තෙන් ම එය කාමුක මෙන් ම වර්ගවාදී දෘෂ්ටියකි. වර්ෂ 2001 දී මේ සම්බන්ධ කරන ලද අධ්‍යයනයකින් හෙළි වී ඇති පහත සඳහන් නිගමනයෙන් ඔස්ට්‍රියාවේ පුරුෂ පක්ෂය අප්‍රිකානු ගැහැනුන් වෙත දක්වන ආකල්පය මොනවට පැහැදිලි වේ. "යුරෝපීය ගැහැනුන් කාර්යාල රැකියාවන්ට සුදුසු අතර, අප්‍රිකානු ගැහැනුන් සම්භෝගයට සුදුසු බව ය."

ඉෂරග විසින් ගැහැනුන්ගේ ශෝෂණය ගැන කරන ලද අධ්‍යයනයකට ස්ත්‍රී වර්ණභේදනය ද ඇතුළත් ව ඇත. "සමාජ - දේශපාලන විග්‍රහයකින් තොර ව ස්ත්‍රී වර්ණභේදනය දෙස බැලීම මම තරයේ ප්‍රතික්ෂේප කරනවා" ඉෂරග කීවා ය.

"ස්ත්‍රී වර්ණභේදනය සම්පූර්ණයෙන් ම නතර කර දැමීමට හැකි වන්නේ සමස්තයක් වශයෙන් ස්ත්‍රියගේ සමාජ සහ දේශපාලන පසුබිම මැනවින් අවධාරණයකට ලක් කළහොත් පමණයි."

"ස්ත්‍රී චර්මඡේදනය පිළිබඳ පුරුෂ පක්ෂයේ කාර්යභාරය කුමක් විය යුතු ද? මම හිතන විධියට මූලික වශයෙන් අවධාරණය කළ යුතු කරුණ ඒකයි."

"මට අපගේ මවු රටවල්වල පුරුෂ පක්ෂයෙන් බොහොමයක් දෙනා ස්ත්‍රී චර්මඡේදනයට විරුද්ධයි... නමුත් පුරුෂ පක්ෂයෙන් වැඩි කොටස මේ සම්බන්ධයෙන් දක්වන ආකල්පය දැන ගැනීමට මෙතෙක් කිසි ම විද්‍යාත්මක ගවේෂණයක් සිදු වෙලා නැහැ... මෙතෙක් සිදු කර ඇති සියලු ම ගවේෂණ සිදු කරලා තියෙන්නෙ ස්ත්‍රී පක්ෂය ගැන පමණයි. පුදුමයට කරුණ නම් එවැනි ගවේෂණයකින් සොයා ගෙන ඇති දත්තවලට අනුව ඒ රටවල ස්ත්‍රී පක්ෂය ස්ත්‍රී චර්මඡේදනයට අනුබල දෙන බවයි කියවෙන්නෙ" ඉෂරග විස්තර කළා ය.

"ඔව් ඒ ගැන මම දන්නවා... ස්ත්‍රී චර්මඡේදනය කියන්නෙ මොන තරම් වේදනාකාරී දෙයක් ද? ඊට මුහුණ දුන් ස්ත්‍රීන් වශයෙන් ඒ ගැන අපි දන්නවා... එහෙම තිබියදීත් මේ ගැහැනුන් මෙයට අනුබල දීම නම් මට කොහෙත්ම තේරුම් ගන්නට බැහැ" මම කීවෙමි.

"මම දකින විධියට... අපේ රටවල ස්ත්‍රී පක්ෂය ස්ත්‍රී චර්මඡේදනයට අනුබල දෙන්නට හේතුව ඔවුන් ආර්ථික වශයෙන් පිරිමින්ගෙන් යැපෙන නිසා... ගැහැනුන්ට සිය ලිංගිකත්වය මගින් තම ස්වාමිපුරුෂයන් තෘප්තිමත් කරන්නට සිදුවෙලා තිබෙනවා."

"මම හිතනවා ද නීතිය මගින් ස්ත්‍රී චර්මඡේදනය නවතා දමන්නට පුළුවන් කියලා..."

"අප්‍රිකානු රටවල පවතින නීතියෙන් නම් ඒ දෙය කරන්නට බැහැ... නමුත්, ස්ත්‍රී චර්මඡේදනය නවතා දැමීමට කරන අරගලය ඒතැනින් ආරම්භ කරන්නට පුළුවන්... දැනට වසර ගණනාවක ඉඳලා සුඩානයේ නීතියෙන් ස්ත්‍රී චර්මඡේදනය තහනම් කරලා තියෙන්නෙ... නමුත්, ඒ නීතිවලින් කිසි ම වැඩක් නැහැ... චර්මඡේදනය අදටත් සුඩානයේ කෙරීගෙන යනවා... මම හිතන විධියට ඒ රටවල ස්ත්‍රී පක්ෂය අධ්‍යාපනික වැඩසටහන් මගින් මේ සම්බන්ධ ව දැනුවත් කළ යුතුයි. චර්මඡේදනය ගැන ඔවුන් දැනුවත් කළාට මදි, ගැහැනියකට ඇති අයිතිවාසිකම් පිළිබඳ ව ද ඔවුන් දැනුවත් කළ යුතුයි. උදාහරණයක් වශයෙන් පවුලක් දරුවන් කී දෙනෙකුගෙන් සමන්විත විය යුතු ද යන්න තීරණය කිරීමටත් දරුවකු උපදිනවා ද නැත්ද යන්න ගැන තීරණ ගැනීමේ අයිතියත් ඔවුන් සතු විය යුතුයි."

"මම සඳහන් කළ කරුණු මත පදනම් ව දැනටමත් චර්මඡේදනයට විරුද්ධ ව ක්‍රියා කරන සංවිධාන තිබෙනවා" මම කීවෙමි.

"චර්මඡේදනය නමැති විෂය පමණක් නො වෙයි ඉන් ඔබ්බට ගිය ඊට අදාළ අනෙකුත් විෂයයන් ද ඔවුන්ගේ අධ්‍යාපන වැඩ සටහනට ඇතුළත් කළ යුතුයි" ඉෂරග පැහැදිලි කළා ය.

මුල දී මා සැලසුම් කර තිබුණේ චර්මඡේදනයට විරුද්ධ ව ක්‍රියා කරන කණ්ඩායම් සමග එක් වී කටයුතු කිරීමට වුව ද ඉෂරගගේ අදහස්වලට අනුව දැනට ක්‍රියාත්මක වන කණ්ඩායම් තුළ විෂයය පිළිබඳ නිසි දැනුමක් නොමැති බැවින්, මේ සම්බන්ධ ව නිසි හඬක් නැගීමට එවැනි කණ්ඩායම් ශක්තිමත් නො වන බව මම වටහා ගතිමි.

ඉෂරග හමීඩ් මහත්මියගෙන් සමුගෙන ඇගේ නිවෙස්තැනින් එළියට ආ මට සීතලක් දැනෙන්නට විය. හේමන්ත සෘතුව ළඟ ළඟ ම එමින් තිබුණි. මම මගේ ජැකට්ටුව ඇඟලා ගතිමි. "වාරිස්... ස්ත්‍රී චර්මඡේදනය නවතා දැමීම සඳහා යමක් කිරීමට දැන් ඔබට කාලය පැමිණ ඇත" මම මට ම කියා ගතිමි.

ඔස්ට්‍රියාවේ මහමග දී ඔබට අප්‍රිකානු ස්ත්‍රීන් හමු වන්නේ ඉතාමත් කලාතුරකිනි. ඉෂරග හමීඩ් මහත්මියත් සමග කරන ලද සාකච්ඡාවෙන් මා උගත් කරුණ නම්, අප්‍රිකානු ස්ත්‍රීන් මවුබිම අතහැර මෙහි පැමිණ සිටියත්, ඔවුන් ජීවත් වන්නේ සතුටකින් නම් නො වන බවයි. මගේ මවුබිම වන සෝමාලියාවේ මිනිසුන්

බොහෝ දෙනා කල්පනා කරන්නේ සිය බිරින්දෑවන් ඔවුන්ගේ පුද්ගලික දේපොළක් වශයෙනි. අවශ්‍ය වූ විට ගැහැනුන් ලබාගෙන ගවයන් මෙන් අනවශ්‍ය වූ විට විකුණා දැමීමට හැකි බවයි. කරුණු එසේ වුව ද, දෛනික ජීවිතයේ ප්‍රශ්නවලට උර දෙන්නේ ගැහැනුන් ය. එහෙත්, ඔවුනට ගැහැනියක් වශයෙන් මොන යම් හෝ අයිතිවාසිකමක් නොමැත. ඔවුනට කියා කිසි යම් දේපොළක් නොමැති අතර, විශ්‍රාම වැටුපක් හෝ සමාජ දීමනාවක් හෝ නො ලැබේ. එපමණ ද නො වේ. මේ ගැහැනුන් ද සෝමාලියාව ඇතුළු මුළුමහත් අප්‍රිකාව තුළ නිරන්තරයෙන් ඇති වන සිවිල් යුද්ධවල ගොදුරු බවට පත්වෙති. සාමකාමී කාලවල දී ගැහැනියට විරුද්ධ ව සැලසුණු යුද්ධයක් ඇති වන අතර, ඔවුන් පුරුෂයන්ගේ නායකයන් වධ බන්ධනවලට ගොදුරු වේ. අවසානයේ ස්ත්‍රී චර්මඡේදනයේ ගොදුරු බවට ද ඔවුහු පත්වෙති.

අප්‍රිකානු ගැහැනු දුර්වල යයි කිව නො හැකි ය. බොහොමයක් දෙනා තමුන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් ඉදිරිපත් වී සටන් කරති. ඇත්තෙන් ම වෙනසක් ඇති වන්නට පටන් ගෙන ඇත. මෙතෙක් සනිටුහන් වී තිබූ පාෂාණය ඉරිතලා යමින් පවතී. එහෙත්, මූලික වෙනස්කම් සිදු වන්නට කාලයක් ගත වනු ඇත. එනෙක් මේ සමාජ ක්‍රමයට ගොදුරු වූවන්, එයින් ගැලවීමට රට අත හැර යති. එහෙත් බොහොමයක් ස්ත්‍රීන්ට ඒ ආකාරයට පලා යන්නට අවකාශයක් නැත. කෙසේ හෝ පලා එන ස්ත්‍රීන් ලෝකයේ පොහොසත් ම රටක් වන ඔස්ට්‍රියාවට පැමිණෙති. මෙහි ආපන ශාලාවක ආහාර වේලක් භුක්ති විඳීම සඳහා වැය වන මුදලින් අප්‍රිකානු පවුලක් සතියක් නැති නම් සමහර විට මාසයක් ජීවත් කිරීමට ප්‍රමාණවත් වනු ඇත.

ස්ත්‍රී චර්මඡේදනයෙන් ගැලවීම සඳහා ඔස්ට්‍රියාවට පලා එන ස්ත්‍රීන්ට එහි දී දේශපාලන රැකවරණ ලබා ගැනීමට බාධාවක් නැත.

"ඇත්තෙන් ම එහි සත්‍යයක් තිබේ ද?" ලී ප්‍රශ්න කළා ය.

ලීට අනුව ස්ත්‍රී චර්මඡේදනය ඔස්ට්‍රියාවේ දේශපාලන රැකවරණ ලබා ගැනීමට ප්‍රමාණවත් කරුණක් වශයෙන් නො සැලකේ. මේ සම්බන්ධ ව මා එක්තරා නිලධාරියකුගෙන් ප්‍රශ්න කළ විට ඔහු කියා සිටියේ, මෙම කරුණ මත දේශපාලන රැකවරණ ඉල්ලා සිටින ස්ත්‍රීන් පවසන කරුණුවල කෙතරම් සත්‍යයක් ඇත් ද යන්න දැන ගැනීමට අපහසු බව ය.

ස්ත්‍රී චර්මඡේදනය මත දේශපාලන රැකවරණ ඉල්ලා සිටි ස්ත්‍රීන්ගෙන් දේශපාලන රැකවරණ ලැබී ඇත්තේ දහයකටත් අඩු කොටසකට ය. වර්ෂ 2002 මැයි 21 දින පළමු වරට කැමරන් ජාතික කාන්තාවකට ඔස්ට්‍රියාව තුළ දේශපාලන රැකවරණ ලැබී ඇත. ඇගේ කතාව මෙසේ ය: ඇයගේ අනුදැනුමක් නොමැති ව ඇයේ පියා ඇය ව මහලු මිනිසකුට සරණපාවා දෙන්නට කතිකා කරගෙන ඇත. එහෙත්, ඇය කන්‍යාවියක් නො වීම හේතුකොටගෙන විවාහයට පෙර ඇයට Infibulation නමැති ස්ත්‍රී චර්මඡේදනයේ ඇති භයානක ශල්‍යකර්මයට මුහුණ දීමට සිදු වී ඇත (මෙහි දී ස්ත්‍රී යෝනියේ ඇති අවයවයන් අතරින් භගමනිය නැතහොත් භගශිශ්නිකාව සහ යෝනි තොල් සම්පූර්ණයෙන් ම කපා ඉවත් කරනු ලැබේ). එවැනි ව්‍යසනයකට ගොදුරු වූ අයකු යුරෝපයට පැමිණ උපකාරයක් ඉල්ලා සිටි අවස්ථාවක නිසි බලධාරීන් එයට ප්‍රතික්‍රියා දක්වන්නේ කෙසේදැයි දැන ගැනීමට මට අවශ්‍ය විය. එවැනි අවස්ථාවකට මුහුණ දුන් අයකු මම හමු වූයෙමි. ඇයගේ නියම නම පාවිච්චි කිරීමට නො හැකි බැවින් අපි ඇය ජෝයි නමින් හඳුන්වමු. නයිජීරියාව ඇගේ මවුබිම වන අතර, ඇය යුරෝපයේ රටක දේශපාලන රැකවරණ ඉල්ලුම්කරුවන් සඳහා වූ නේවාසිකාගාරයක නවාතැන් ගෙන සිටියා ය. කැමරන් රටේ සිටින ඇයගේ පවුලට යුරෝපයත් සමඟ සම්බන්ධකම් තිබෙන බැවින් ඇය ජීවත් වන යුරෝපීය රට නම් කිරීමට නො හැකි ය.

ජෝයි වචනයේ පරිසමාප්ත අර්ථයෙන් ම ඉතාමත් සුරුබුහුටි කාන්තාවක් වූවා ය. සින්දෑරි උස කාන්තාවක් වූ ඇය එක්තරා ලතාවකට හිස පීරා සිටියා ය. ජෝයි උගත් පවුලකින් පැවැත එන

අයකු වූ අතර, ඇමෙරිකාවේ විශ්වවිද්‍යාලයකින් අධ්‍යාපනය ලබා ඇති ඇය, ඉතා චතුර ව ඉංග්‍රීසි බස හැසිරැවූ ය. ඇය නැවතී සිටි නේවාසිකාගාරයේ සිටි අනෙකුත් නිවැසියන්ගේ ප්‍රශ්න ගැන කිසිවක් දැන නො සිටියා ය. එකිනෙකාගේ ප්‍රශ්න ගැන කිසිවිටකත් ඔවුන් කතා නො කරන බව නේවාසිකාගාරයේ උඩුමහලට යන්නට ඇති තරප්පු පෙළ නගින ගමන් ඇ මා සමඟ කීවා ය.

එහි සිටි නිවැසියන් එකිනෙකට වෙනස් ප්‍රශ්න හේතුකොටගෙන යුරෝපයට පැමිණ සිටි අය වූවා පමණක් නො ව, ඔවුහු එකිනෙකට වෙනස් සංස්කෘතික පදනම් ඇති රටවල්වල සිට පැමිණි අය වූහ. නේවාසිකාගාරයේ උඩුමහලට යන උතුරුතුරු තරප්පු පෙළියේ දී එහි නවාතැන් ගෙන සිටින තවත් ගැහැනුන් තිදෙනෙක් අපට මුණ ගැසුණි. ඉච්ඡාභංගත්වයට පත් ව සිටි ඔවුන් තුළින් දෘශ්‍යමාන වූ දිළිඳුකම මම පැහැදිලි ව ම දුටුවෙමි. මෙවැනි හුදකලා වාතාවරණයක සිඟිති දරුවන් නගන මිහිරි හඬ කා හට වුව ද ගෙන දෙන්නේ මහත් සහනයකි. නේවාසිකයන් බැහැ දැකීමට එන අමුත්තන් සඳහා තද නීති-රීති පනවා ඇති බැවින්, ඒ අවස්ථාවේ නිවස භාර ව කටයුතු කරන නිලධාරිනිය හමු වූ ජෝයි, ඇය සමඟ කිසිවක් කතා කර ගත්තා ය. නිවැසියන්ට අමුත්තන් හමු වීම සඳහා විශේෂ කාමරයක් පිළියෙල කර තිබුණ අතර, ඔවුන් නිවසට ඇතුළුවන විට සහ ආපසු නිවස හැර යන විට පොතක අත්සන් තැබිය යුතු විය. අමුත්තන් හමු වීම සඳහා වෙන් කර තිබූ කාමරය සම්පූර්ණයෙන් ම ජරාවාස වී ගොස් තිබුණ අතර, වාඩි වීම සඳහා කාමරයේ කොනක වූ මේසයක් අසල ප්ලාස්ටික් පුටු කීපයක් සහ ඉරී ගිය සෝෆාවක් තිබුණි.

කාමරයේ කොනෙන් තබා තිබුණ මේසය අසල අපි අසුන් ගතිමු. ජෝයි කතාව ආරම්භ කළා ය. ඇය හස්ත මුද්‍රාව ද පාවිච්චි කරමින් කතා කරන්නට වූ අතර, වරෙක මිට මොළවා මේසයට තඩි බාමින් ඇස් තරකවා කතා කරමින් ඇ තුළ වූ කේන්තිය සහ ඉච්ඡාභංගත්වය ප්‍රකාශ කරන්නට වූවා ය. රැකියාවක් කරන්නට හෝ නිදහසේ ගමනක් බිමනක් යන්නට හෝ ඇති නො හැකියාව

අවධාරණය කරමින් බලධාරීන්ට දොස් පැවරුවා ය. එපමණක් ද නො ව, ඇගේ දියණිය යන පාසලේ අනෙකුත් ළමුන් සතු සමහර දේවල් සිය දියණියට ලබා දීමට හැකියාවක් නොමැති බැව් ඇය ප්‍රකාශ කළ අතර, මාසයකට වරක් ලැබෙන යූරෝ 300 දීමනාව කෑම බීම මිල දී ගැනීමටවත් ප්‍රමාණවත් නො වන බැව් පැවසුවා ය. මෙම නිර්භීත ගැහැනිය දේශපාලන රැකවරණ ඉල්ලා ඉදිරිපත් කරන ලද ඉල්ලුම් පත්‍රයට පිළිතුරක් ලබා ගැනීම සඳහා වසර එකහමාරක් බලා සිටීමට සිදු ව ඇත. ඇයට ලැබී ඇති පළමුවෙනි පිළිතුරට අනුව දේශපාලන රැකවරණ සඳහා කළ ඉල්ලීම බලධාරීන් විසින් ප්‍රතික්ෂේප කර ඇති අතර, ඇය ඒ සඳහා බලධාරීන් වෙත අභියාචනයක් ඉදිරිපත් කර ඇත.

"ඇයි ඔබ මේ රටට පැමිණ දේශපාලන රැකවරණ ඉල්ලා සිටියේ?" මම ප්‍රශ්න කළෙමි.

ඇගේ කතාව තරමක් දිගු. එමෙන් ම ශෝචනීය එකකි. ජෝයි, නයිජීරියාවේ ස්ත්‍රී චර්මච්ඡේදනය ක්‍රියාත්මක නො වන ප්‍රාන්තයක ඉපදී හැදී වැඩුණ අයෙකි. ඇය නයිජීරියාවේ වෙනත් ප්‍රාන්තයකට අයත් අයකු සමඟ පෙම් සබඳකමක් ඇති කර ගන්නා ලදු ව, සිය පෙම්වතා සමඟ ඇය ඔහුගේ ගමට ගොස් ඔහුත් සමඟ එහි පදිංචි වී ඇත. එම ග්‍රාමයෙහි ස්ත්‍රී චර්මච්ඡේදනය ක්‍රියාත්මක වන බව ඇයට දැන ගන්නට ලැබී ඇතත්, ඇයගේ ස්වාමිපුරුෂයා ඒ සම්බන්ධ කිසිවක් ඇයට නො කියා ඇත. ජෝයිට චර්මච්ඡේදනය සිදු නො කර තිබීම ඔහුට කිසි ම ප්‍රශ්නයක් නො වී ය. එහෙත්, ඇය ගැබ් ගැනීමත් සමඟ ප්‍රශ්න මතු වන්නට පටන්ගෙන ඇත. ඇයට ලැබෙන්නට සිටින දරුවා ගැහැණු දරුවකු වුවහොත් ඇගේ ස්වාමිපුරුෂයාගේ පාර්ශ්වයේ අය දරුවාට චර්මච්ඡේදනය සිදු කළ යුතු බවට බල කෙරෙනු ඇතැ යි ඇය තුළ මහත් බියක් හටගෙන ඇත. ස්ත්‍රී චර්මච්ඡේදනයට සම්පූර්ණයෙන් ම විරුද්ධ මතයක් දැරූ ජෝයි ඇති වී ඇති වාතාවරණය ගැන මහත් කනස්සල්ලකින් පසු වී ඇති අතර, දිනක් ජෝයි තමා තුළ හටගෙන ඇති මානසික කලබලකාරිත්වය ගැන සිය ස්වාමිපුරුෂයාට දන්වා ඇත. ඒ ගැන තම

ස්වාමිපුරුෂයා දක්වා ඇත්තේ අනුකම්පා සහගත ප්‍රතිචාරයක් පමණි. දරුවා රැකබලා ගැනීම මවට අයත් කාර්යයක් බැව් ඔහු තවදුරටත් පවසා ඇත. එපමණ ද නො ව, ඔවුනට ගැහැනු දරුවකු ලැබුණහොත් දරුවා මොන යම් තත්ත්වයක් යටතේ වුව ද චර්මච්ඡේදනයට ලක් කිරීමට ඉඩ නො දෙන බැව් ප්‍රකාශ කරමින් කෝරානය මත අත තබා දිවුරා ඇත. ඔවුනට ගැහැනු දරුවකු ලැබී ඇති අතර, මෙතෙක් තිබූ වාතාවරණය සම්පූර්ණයෙන් ම වෙනස් වන්නට පටන් ගෙන ඇත. මෙතෙක් අනුමාන වශයෙන් ජෝයි බලාපොරොත්තුවෙන් සිටි වාතාවරණය මෝදු වන්නට පටන් ගෙන ඇත. ස්වාමිපුරුෂයාගේ පවුලේ සාමාජිකයින් එකහෙළාම දරුවාට චර්මච්ඡේදනය කළ යුතු බව පවසා ඇත. ජෝයි තම ස්වාමිපුරුෂයාට මේ සම්බන්ධ ව කියා ඇති අතර, ඔහුගේ පිළිතුරු වී ඇත්තේ ගැහැනුන්ගේ ප්‍රශ්න ගැහැනුන් අතර ම විසඳා ගතයුතු බව යි.

දරුවා මෙලොවට බිහි වී සතළිස් වන දිනයේ දී ඇයට චර්මච්ඡේදනය සිදු කිරීමට ජෝයිගේ වැඩිමහලු නැන්දා සූදානම් වී ඇත. ඒ අවස්ථාවේ ජෝයි අසනීපයෙන් පසු වී ඇති බැවින් එය සිදු වී නැත. දරුවාට අවුරුදු දෙක ලබන තෙක් ඔවුන් දරුවාට චර්මච්ඡේදනය සිදු කිරීමට උත්සුක වී ඇති අතර, ජෝයි නොයෙකුත් කරුණු ඉදිරිපත් කරමින් දරුවා එම ව්‍යසනයෙන් බේරා ගන්නට සමත් ව ඇත. එහෙත්, දිනෙන් දිනට ම තම ස්වාමිපුරුෂයාගේ පාර්ශ්වයෙන් බලපෑම් එල්ල වන්නට වී ඇති අතර, ජෝයි දරුවාත් සමඟ පලා යන්නට තීරණය කර ඇත. එසේ පලා යන්නට ඇය තීරණය කර ඇත්තේ තම ස්වාමිපුරුෂයා ගැන ඇති වූ ද්වේෂයක් නිසා නො ව, සිය පවුලට විරුද්ධ ව නැඟී සිටින්නට ඔහුට තිබූ නොහැකියාව හේතුවෙනි. දරුවා බිල්ලට දී ස්වාමිපුරුෂයා සමඟ කල් ගෙවනවා ද එසේත් නැතිනම් තම දරුවට අත් වන්නට යන ව්‍යසනයෙන් දරුවා බේරා ගන්නවා ද යන්න තීරණය කරන්නට ඇයට සිදු වී ඇත. අවසානයේ ස්ත්‍රී චර්මච්ඡේදනය නමැති ව්‍යසනයෙන් සිය දරුවා බේරා ගැනීමට ඇය තීරණය කර ඇත.

අප්‍රිකානු රටක සිට යුරෝපයට යෑම ලේසිපාසු කාර්යයක් නො වේ. මෙතෙක් ඇය ඉතිරි කරගෙන තිබූ සියලු ම මුදල් ඒ සඳහා වැය කිරීමට ඇයට සිදු ව ඇත. නයිජීරියාවේ දැරියන්ට චර්මච්ඡේදනය සිදු කරන ආකාරය ගැන තමා සිහියෙන් දුටු ඇඟ කිලිපොළා යන අත්දැකීමක් ඈ මා සමඟ පැවසුවා ය. බොහෝ අවස්ථාවල මහලු ගැහැනුන් විසින් සිදු කරනු ලබන මෙම ක්‍රියාව සඳහා කිසි ම නිර්වින්දනයක් ඔවුන් පාවිච්චි නො කරන බවත්, ඒ අවස්ථාවල දී දැරියන් නගන විලාපය පියවි සිහියෙන් සිටින යමකුට බලා සිටින්නට තරම් නො හැකි බවත් ඇය මා සමඟ පැවසුවා ය.

“ඔබ යුරෝපයට පා තැබූ අවස්ථාවේ ඔබට මොන වගේ හැඟීමක් ද ඇති වුණේ...? ඔබ පළමු වරට මෙහි පැමිණි අවස්ථාවේ බලධාරීන් ඔබට සැලකුවේ කෙසේ ද?” මම ප්‍රශ්න කළෙමි.

මෙහි පැමිණ ජෝයි දේශපාලන රැකවරණ ඉල්ලා ඉල්ලුම් පත්‍රයක් බලධාරීන් වෙත ඉදිරිපත් කර ඇත. ජෝයි වර්තමානයේ ජීවත් වන රටට පැමිණ ඇත්තේ එංගලන්තය හරහා බැවින් බලධාරීන් විසින් ඇයගේ ඉල්ලුම්පත ප්‍රතික්ෂේප කොට ඇය නැවතත් එංගලන්තයට යවන්නට සූදානම් වී ඇත. ඇය එංගලන්තයේ නො රැඳී මෙහි පැමිණීමට හේතු වී ඇත්තේ වෙන කිසිවක් නිසා නො ව, එංගලන්තයේ ජීවත් වන ඇගේ ස්වාමිපුරුෂයාගේ සහෝදරයාගෙන් සිය දියණිය චර්මච්ඡේදනයට ලක් කළ යුතු බවට ජෝයිට බලපෑම් එල්ල වන්නට ඉඩ ඇති බැවිනි. ඇය එකවර ම සිය අත්බෑගය විවර කොට කිසියම් කොළයක් ඉන් ඉවතට ගෙන මා අත තැබුවා ය. එය ඊමේල් පණිවුඩයක් වූ අතර, එවා තිබුණේ එංගලන්තයේ පදිංචි ව සිටින ජෝයිගේ නැන්දා විසිනි. තම නැන්දා ඇයගේ ඊමේල් ලිපිනය සොයා ගත්තේ කෙසේ ද යන්න ජෝයිට ප්‍රහේලිකාවකි. මම ඊමේල් පණිවුඩය කියවූයෙමි. එහි මෙසේ සඳහන් වී තිබුණි. අපගේ චාරිත්‍රයට අනුව ඔබ ඔබගේ දියණියට චර්මච්ඡේදනය සිදු නො කරන්නේ නම් ඔබට කිසි දිනක මුස්ලිම් භක්තික කාන්තාවක වන්නට නො හැකි වනු මෙන් ම, ඔබට සතුටුදායක ජීවිතයක් ද

ගත කිරීමට නො ලැබෙනු ඇත. එමතු ද නො ව, චර්මච්ඡේදනය ඔවුන්ගේ ගෝත්‍රයේ ඉතා වැදගත් චාරිත්‍රයක් බැවින් එය කෙසේ හෝ සිදු කළ යුතු බවට තර්ජනය කර තිබුණි.

ඊමේල් පණිවුඩය මම නැවත වරක් කියවූයෙමි. ජෝයිගේ නෑදෑ පරපුරට ඇය ව සොයා ගන්නට නො හැකි ස්ථානයක ජීවත් වෙමින් හොර ව ඇගේ දියණිය වෙත එල්ල වී ඇති තර්ජනයෙන් ගැලවීමට නො හැකි ය. යම් හෙයකින් ජෝයි සහ දියණිය එංගලන්තයට හෝ අප්‍රිකාවට හෝ පිටුවහල් කළහොත් අනිවාර්යයෙන් ම ඇගේ දියණියට මේ කියන අනතුරට මුහුණ පාන්නට සිදු වනු ඇත. බලධාරීන්ට මෙය තේරුම් ගැනීමට නො හැක්කේ මන්ද? යුරෝපා රටවලට පැමිණ දේශපාලන රැකවරණ ඉල්ලා ඇති ගැහැනුන්ගේ ජීවන තත්ත්වයන් කෙබඳු ද? දුරකතනය මඟින් කොරින්නා සම්බන්ධ කර ගත් මම අනෙකුත් සාමාජිකයින්ගේ ආධාරය ද ඇති ව මේ සම්බන්ධ ව හැකි තාක් තොරතුරු මා වෙත ලබා දෙන මෙන් ඉල්ලා සිටියෙමි. ඉදිරි දින කිහිපය තුළ දී මගේ කාර්යාලයේ දී ඔවුන් හමු වන්නට ද මම යොදා ගතිමි.

“ස්ත්‍රී චර්මච්ඡේදනය දේශපාලන රැකවරණ ලබා දීම සඳහා අවධාරණයට ගත යුතු කරුණක් වශයෙන් යුරෝපයේ කිසි ම රටක් සලකන්නේ නෑ... ඔස්ට්‍රියාවේ තත්ත්වයත් ඕක ම තමයි” අප හමු වූ අවස්ථාවේ කොරින්නා කතාවට මුල පුරමින් පැවසුවා ය.

“ඇයි ඒ... ස්ත්‍රී චර්මච්ඡේදනයේ දී ඇති වන වේදනාව සහ හිංසාව අඩුවෙන් තක්සේරු කරන්නට බෑ” මම ප්‍රශ්න කළෙමි.

තමුන්ගේ මවුරටේ දී තමුන්ට විඳින්නට සිදු වූ දේශපාලන වධ හිංසා සාක්ෂි ඇති ව ඔප්පු කර පෙන්වීමට හැකි නම් යුරෝපය තුළ දේශපාලන රැකවරණ ඉල්ලීමට ඔබට අයිතියක් ඇත. එහෙත්, කිසි යම් හෝ රටක සංස්කෘතියට අනුව ගැහැනියට විඳින්නට සිදු වන වධ බන්ධන යුරෝපය තුළ දේශපාලන රැකවරණ ඉල්ලා සිටීමට අදාළ කරුණක් වශයෙන් කොහෙත්ම පිළි ගන්නේ නැත.

ජර්මනියේ තත්ත්වය ගැන සඳහන් කරමින් ලී, වාර්තාවක් එවා තිබුණි. ස්ත්‍රී චර්මච්ඡේදනය පිළිබඳ ජර්මන් නීතියේ ව්‍යාකූලත්වයක් තිබෙන බව එහි සඳහන් කර තිබුණි. ස්ත්‍රී පාර්ශ්වයට ජර්මනිය තුළ දේශපාලන රැකවරණ ඉල්ලා සිටීමට අයිතියක් ඇති බැව් ජර්මන් නීති සංග්‍රහයේ සඳහන් වී තිබුණ ද එහි ස්ථිර පදනමක් නොමැති වීම හේතුකොටගෙන ජර්මනිය තුළ දේශපාලන රැකවරණ ලබා ගැනීම සුදුවකට සමාන කළ හැකි බැව් ඇය අවධාරණය කර තිබුණා ය.

ජර්මනියේ ආකෙන් (Aachen) නගරයේ ජීවත් වන නයිජීරියානු ජාතික අවුරුදු තිස්හයක් වයසැති ස්ත්‍රියකට සහ ඇයගේ අවුරුදු තුනක් වයසැති දියණියට ස්වකීය මවුබිමේ දී මුහුණ දෙන්නට සිදු වී ඇති දේශපාලන වධ බන්ධන හේතුකොටගෙන 2002 දී දේශපාලන රැකවරණ ලැබී ඇති බැව් ලීගේ වාර්තාවේ තවදුරටත් සඳහන් කොට තිබුණි. ස්ත්‍රී චර්මච්ඡේදනයට විරුද්ධ ව නයිජීරියානු රජය නිසි පියවර නො ගැනීම කාරණකොටගෙන නයිජීරියාවේ ස්ත්‍රී පක්ෂයට මුහුණ පාන්නට සිදු වී ඇති අවදානම් තත්ත්වය, ජර්මන් උසාවියේ සාකච්ඡාවට භාජනය වී ඇත.

වර්ෂ 2003 දී ගිනියා (Guinea) ජාතික ස්ත්‍රියකට ජර්මනියේ බර්ලින් නගරයේ දී දේශපාලන රැකවරණ ලැබී ඇති අතර, ඒ නඩුව අසන ලද විනිශ්චයකරුවන් විසින් ස්ත්‍රී චර්මච්ඡේදනය සම්බන්ධ ව මෙවැනි කතිකාවක් කර ඇත.

“ස්ත්‍රී චර්මච්ඡේදනය ඒ රටවල සෑම සමාජ කොටසක් තුළ මෙන් ම ආගම් සහ ගෝත්‍ර අතර ද නියාමයක් වශයෙන් පවතී. චර්මච්ඡේදනය නො කරන ලද ස්ත්‍රියකට විවාහ වීමට ඇති අවස්ථාව ඉතාමත් විරල ය. එහෙයින්, ඇය රටේ කුමන ප්‍රදේශයකට ගියත් එයින් බේරී සිටීමට අවකාශයක් නැත. චර්මච්ඡේදනයේ දී ස්ත්‍රියකට විඳින්නට සිදු වන වේදනාව කිසිසේත් ම අවතක්සේරු නො කළ යුතු ය.”

ස්ත්‍රී චර්මච්ඡේදනය වචනයේ පරිසමාප්ත අර්ථයෙන් ම වධ හිංසාවක් බැව් ඉහත ඡේදයෙන් ඉතා පැහැදිලි බැව් මම ලී සහ කොරින්නාට කීවෙමි.

එහෙත්, ස්ත්‍රී චර්මච්ඡේදනය සම්බන්ධ ව ජර්මනියේ ඇති සෑම උසාවියක ම ස්ථාවරය එක ම නො වන බැව් ලී සිය වාර්තාවෙන් පෙන්වා දී තිබුණි. ඇගේ වාර්තාව මම දිගට ම කියවන්නට වීමි. ගිනියා ජාතික ස්ත්‍රියක විසින් දේශපාලන රැකවරණ සඳහා ෆ්‍රයිබර්ග් - බැඩෙන්වර්ට් අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද ඉල්ලුම් පත්‍රය වර්ෂ 2003 දෙසැම්බර් මස 2 වන දින එම අධිකරණය මගින් ප්‍රතික්ෂේප කර ඇත. එමෙන් ම ටෝගෝ රාජ්‍යයෙහි සිට පැමිණි ස්ත්‍රියකගේ ඉල්ලුම් පත්‍රය මැග්ඩෙන්බර්ග් අධිකරණය ප්‍රතික්ෂේප කර ඇත. ඊට හේතුව වශයෙන් අධිකරණය ඉදිරිපත් කර ඇත්තේ ඉහත සඳහන් ස්ත්‍රිය පසුවන වයසට අනුව ස්ත්‍රී චර්මච්ඡේදනයේ අවදානමක් ඇයට නොමැති බව ය. වාසනාවකට මෙන් ඇය ජර්මනියෙන් පිටුවහල් නො කර ඇති බැව් ලීගේ වාර්තාවේ සඳහන් වී තිබීම මා හට මහත් අස්වැසිල්ලක් විය. එහෙයින්, ඇයට අධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට අවස්ථාවක් ඇත. ඊ ළඟට සියරාලියොන් සිට පැමිණි ස්ත්‍රියකගේ ඉල්ලුම් පත්‍රය ෆ්‍රැන්ක්ෆර්ට් අධිකරණය ප්‍රතික්ෂේප කර ඇත. ස්ත්‍රී චර්මච්ඡේදනය දේශපාලන වධ හිංසා ගණයට ඇතුළත් නො වන බවත්, එය චාරිත්‍රයක් බවත්, එහි අරමුණ වන්නේ ඒ දැරියන් සිය ගෝත්‍රයේ පූර්ණ සාමාජිකාවන් බවට පත් කිරීම බවත්, එම දෘෂ්ටිකෝණයෙන් ස්ත්‍රී චර්මච්ඡේදනය දෙස බැලිය යුතු බවත් ෆ්‍රැන්ක්ෆර්ට් අධිකරණය අවධාරණය කර ඇත. එයින් පැහැදිලි ව ගම්‍ය වන අදහස නම් ස්ත්‍රී චර්මච්ඡේදනයට දේශපාලන පසුබිමක් නොමැති බැවින්, එම කරුණ පෙරදැරි කරගෙන දේශපාලන රැකවරණ ඉල්ලීම අර්ථ විරහිත බවයි.

"මොකක්ද ඒ විස්සු කතාව... ඒ කියන්නෙ මේ ගැහැනු ජර්මනියෙ එක එක විනිශ්චයකරුවන්ගේ රූකඩ බවට පත්වෙලා" මම කෑ ගැසුවෙමි.

"චර්මච්ඡේදනය සම්බන්ධ ව එංගලන්තයේ තත්ත්වයත් මීට වඩා වෙනසක් නෑ... බොහොමයක් අවස්ථාවල ස්ත්‍රී චර්මච්ඡේදනය මත දේශපාලන රැකවරණ ඉල්ලා සිටි ගැහැනුන් එංගලන්තයෙන් පිටුවහල් කරලා තියෙනවා" කොරින්නා පැවසුවා ය.

ජෙෆ් රොකර් නමැති රාජ්‍ය අමාත්‍යවරයා වර්ෂ 2001 දී පාර්ලිමේන්තුවේදී මෙසේ ප්‍රකාශ කොට තිබෙනවා. "ස්ත්‍රී චර්මච්ඡේදනය මත එංගලන්තයේ දේශපාලන රැකවරණ ඉල්ලා සිටින ඉල්ලුම්කරුවන්ගේ මවුබිම්වල පවතින ආණ්ඩු නීත්‍යානුකූල ව ස්ත්‍රී චර්මච්ඡේදනයට අනුබල දෙන වාතාවරණයක් නොමැති බැවින් ස්ත්‍රී චර්මච්ඡේදනය දේශපාලන රැකවරණ ලබා දීමට තරම් කරුණක් වශයෙන් පිළිගැනීමට නො හැකි ය."

"දහස් ගණන් ගැහැනුන්ගෙ ජීවිත අන්තරාවට මුහුණ දීලා තියෙන තත්ත්වයක් ඇතුළත ඒ ඒ ආණ්ඩු චර්මච්ඡේදනයට අනුබල දෙනවා ද නැද්ද කියන එක මට ප්‍රශ්නයක් නෙමෙයි... අනෙක සංඛ්‍යා ලේඛන දෙස බලපුවා ම මොන තරම් ප්‍රමාණයක් මේ ව්‍යසනයට දැනටමත් ගොදුරු වෙලා ද කියන එක ඔප්පු වෙනවා... සෝමාලියාවේ සියයට අනූනවයක් ස්ත්‍රීන් මේ ව්‍යසනයට ගොදුරු වෙලා තියෙනවා... මම අහන්නෙ මේකයි... මේ ව්‍යසනයෙන් තම එක ම දියණිය බේරා ගන්නට වෙර දරන එක ම එක ගැහැනියකට ඒ සඳහා තිබෙන අවස්ථා මොනව ද?" මම ප්‍රශ්න කළෙමි.

ජිනීවා සම්මුතියට අනුව ස්ත්‍රී චර්මච්ඡේදනය දේශපාලන රැකවරණ ලබා දීමට කරුණක් නො වන බැව් කොරින්නාගෙන් මම දැනගත්තෙමි.

"ඒ විතරක් නෙමෙයි... දැන් බ්‍රිතාන්‍ය රජයේ නිලධාරියෙක් මේ සම්බන්ධ ව තවත් මතයක් ඉදිරිපත් කරලා තියෙනවා. ස්ත්‍රී චර්මච්ඡේදනය පෙරදැරි කරගෙන දේශපාලන රැකවරණ ලබා ගැනීම සඳහා බ්‍රිතාන්‍යයට එන ඉල්ලුම්කරුවන්ගේ මවු රටවල ස්ත්‍රී චර්මච්ඡේදනය ක්‍රියාත්මක නො වන ප්‍රාන්ත තිබෙන අතර, ඔවුන්ට එවැනි ප්‍රාන්තවලට ගොස් අන්තරාවෙන් ගැලවීමට හැකි බැවින් ඉල්ලුම්කරුවන් නැවත ඒ රටවලට යැවීම සාධාරණ බව ඔහු පෙන්වා දී තිබෙනවා."

ජෝයි සමග මා කළ සාකච්ඡාවේ දී ඇගේ ස්වාමිපුරුෂයාගේ පවුලේ අයට ඇය යුරෝපයේ සිටියත් බලපෑම් කිරීමට තරම් හැකියාවක් ඇති බැව් සඳහන් කළා මට මතක ය. මෙවැනි

ව්‍යාජාවරණයක් තුළ ඇය සිය දියණියන් සමඟ පෙරළා මවුරටට ගොස් චර්මච්ඡේදනය ක්‍රියාත්මක නො වන ප්‍රාන්තයකට ගියත්, ඇයට ඉන් ගැලවීමක් ඇත් ද?

එදින සාකච්ඡාව අහවර කොට නිවස බලා යන විට මා හට නො සන්සුන්තාවයක් දැනෙන්නට විය. මෙවැනි අයට ආධාරයක් උපකාරයක් කරන්නට හැකි බොහෝ කාරුණික භවතුන් යුරෝපයේ සිටිය දී මෙවැනි ගැහැනුන් පිටුවහල් කරන්නේ මන්ද? එකල මට නීත්‍යානුකූල ව එංගලන්තයේ රැඳී සිටීමට වීසා බලපත්‍රයක් ලබා ගැනීම සඳහා මා ආදරය නො කරන මිනිසකු සමඟ විවාහ වීමට සිදුවිය. එමතු ද නො ව, යුරෝපය තුළ සංචාරය කිරීම සඳහා අදටත්, මා යන්නට බලාපොරොත්තු වන රටේ වෙසෙන මිතුරකුගෙන් හෝ ආයතනයකින් හෝ ඔවුන් මා ගැන බලා ගන්නා බව දන්වා ලිපියක් ගෙන්වා ගත යුතු ව ඇත.

මේ සෑම දෙයක ම අර්ථය වන්නේ අප වැනි අයට යුරෝපයේ ජීවත් වීමට ඉඩක් නොමැති බව ද?

ස්ත්‍රී චර්මච්ඡේදනය සම්බන්ධයෙන් පුරුෂ පාර්ශ්වයේ තර්කනය කුමක්ද? ස්ත්‍රී චර්මච්ඡේදනය යනු සම්පූර්ණයෙන් ම ස්ත්‍රී පක්ෂයට පමණක් අයත් ප්‍රශ්නයක්ය යන තර්කයට ඇහුම්කන් දෙන්නට මා කොහෙත්ම සූදානම් නැත. මන්ද ඒ තර්කයට අර්ථයක් නොමැති බැවිනි. අප ජීවත් වන ලෝකයේ නීති සම්පාදනය කරනු ලැබ ඇත්තේ පුරුෂ පක්ෂය විසිනි. එමතු ද නො ව, ආගමික නායක පුරුෂයන් ය. ලෝක ආර්ථිකය සම්පූර්ණයෙන් ම රඳා ඇත්තේ පුරුෂ පක්ෂය අත ය. මෙනයින් බලන කල අප ජීවත් වන ලෝකයේ සෑම දෙයක් සම්බන්ධ ව ම තීරණ ගන්නේ පුරුෂයින් ය. කරුණු එසේ නම් ස්ත්‍රී චර්මච්ඡේදනය ඉදිරියේ දී පමණක් ඔවුන් මුනිවත රකින්නේ මන්ද? මට මෙතෙක් හමු වී ඇති බොහොමයක් පිරිමින් ස්ත්‍රී චර්මච්ඡේදනය ගැන කිසිවක් නො දන්නේ ය. ඊට හේතුව ඔවුන් ඒ සම්බන්ධ ව දක්වන නො සැලකීම හැර වෙන කුමක්ද?

මේ සෑම අත්දැකීමකින් ම මා හට ඒත්තු ගිය කරුණ නම් ස්ත්‍රී චර්මච්ඡේදනය සහමුලින් ම මිහිතලය මතින් සදහට ම තුරන් කර

දැමීමට නම් අපට පුරුෂ පක්ෂයේ සහයෝගය අනිවාර්යයෙන් ම අවශ්‍ය වන බව ය. මේ අරමුණ සඳහා අපට ඔවුන් උනන්දු කරලීමට හැකි නම් අප සියලු ම දෙනාට අපගේ අරමුණ වෙත ළඟා වන්නට හැකි වනු ඇත.

දින කීපයකට පසු ලී හමුවීමට මම ඇගේ නිවසට ගියෙමි. පෙරදින හැන්දෑවේ ඇය අප්‍රිකානු ජාතිකයකු සමඟ කතාබහක යෙදුණ බවත්, ඒ අවස්ථාවේ දී ඇය ඔහු සමඟ ස්ත්‍රී චර්මච්ඡේදනය සම්බන්ධ ව ද සාකච්ඡා කළ බවත් ඇය මා සමඟ පැවසුවා ය.

"ඇත්තෙන් ම වාරිස් ඒ සාකච්ඡාව හරි ම සිත්ගන්නාසුලු එකක්... ඒ වගේ ම මම ඒ සාකච්ඡාවෙන් හරි විනෝදයක් ලැබුවා" ඇගේ ඒ වචන මා තුළ දෝංකාර දෙන්නට විය. එසේ නම් එහි අර්ථය අප්‍රිකානු ජාතිකයා බටහිර රටක ජීවත් වන කාන්තාවක් සමඟ කාමය ගැන කතා කරන්නට සූදානම් වුවා කියන එක ද? මම සාවධාන ව ලීගේ කතාවට ඇහුම්කන් දුන්නෙමි.

ඔහුගේ නම තාරා ය (මෙය ඔහුගේ නියම නම නො වේ). වයස අවුරුදු තිහක් වූ හෙතෙම සියරාලියොන් ජාතිකයෙකි. කලක සිට මම ඔහු දැන හැඳිනගෙන සිටියෙමි. තාරා පදිංචි ව සිටියේ දේශපාලන රැකවරණ පතාගෙන වියානා නගරයට එන සරණාගතයන් සඳහා වෙන් කරන ලද පුද්ගලික තවාතැන්පොළක ය. පෙර දින මා ඔහු හමු වූ අවස්ථාවේ ඔහු මගේ වැඩ කටයුතු ගැන අසා සිටි අතර, මම ස්ත්‍රී චර්මච්ඡේදනය පිළිබඳ ගවේෂණයක් කරන බැව් ඔහුට කීවෙමි. මගේ පිළිතුරෙන් ඔහු තරමක් කැලඹීමට පත් වූ බවක් විද්‍යාමාන විය.

"ඔබගේ මවුබිමේත් මේ කියන ස්ත්‍රී චර්මච්ඡේදනය සිදු වෙනවා නේද?" මම ඇසුවෙමි.

"ඔව්... ඒක දරු ප්‍රසූතියට හොඳයි" ඔහු හිස වනමින් කීවේ ය.

ස්ත්‍රී චර්මච්ඡේදනය ගැන ඔහුට එතරම් අවබෝධයක් නොමැති බැව් මම තේරුම් ගතිමි. අප්‍රිකානු රටවල මේ සම්බන්ධ

ස්ත්‍රී පක්ෂය සමඟ කතා කිරීම ඔවුන්ගේ ගෞරවයට කැළලක් බැව් පෙනෙන්නට තිබෙන කරුණකි.

ස්ත්‍රී සහ පුරුෂ පක්ෂය අතර, කිසි දෙබසක් ඇති නො වීම, සියලු ම ප්‍රශ්නවලට මුල බැව් ලී කීවා ය. ප්‍රශ්න ඇසීම අනෙකාට කරන අගෞරවයක් බැව් කාරාට කුඩා කාලයේ දී කියා දී ඇති බව ඔහු කීවේ ය. කුඩා කාලයේ දී සෑම දරුවකු තුළ මෙන් ම කාරා තුළ ද වූ කුතුහලය මැඬ පවත්වා ඇත්තේ පියා විසින් ඔහුට පහර දීමෙනි. ගැහැනුන්ගේ ප්‍රශ්න සම්බන්ධ ව කතා කිරීම තහනම් වූ අතර, කාරා කිසි ම දිනක ගැහැනුන්ගේ සාමර්ථ්‍යය හඳුනාගෙන නොමැත.

බොහෝමයක් අප්‍රිකානු රටවල සංස්කෘතීන්ට අනුව කිසිවකුට අගෞරව කිරීම දඬුවම් ලැබිය යුතු වරදකි. එවැනි නීති කඩකළහොත් ඔබගේ ජීවිතය ම අනතුරෙන් ගෙවන්නට සිදුවන බව මම ලීට විස්තර කළෙමි.

“ස්ත්‍රී චර්මච්ඡේදනය ගැන කතා කරන්නට කාරා තුළ බියක් තිබුණා.” ලී පැවසුවා ය.

සාකච්ඡාවට කාරා සම්බන්ධ කර ගැනීමට ලීට පැය කාලක් පමණ ගත වී ඇත. දැරියක් ස්ත්‍රී චර්මච්ඡේදනයට ලක් කිරීමෙන් නිශ්චය වශයෙන් ම සිදු වන්නේ කුමක් ද යන්න කාරාට දැන ගැනීමට උවමනා වී ඇත. ස්ත්‍රී චර්මච්ඡේදනය ගැන මා කරන ලද පුළුල් විස්තරයෙන් පසු ඔහුගේ මුහුණ බියකින් පෙළී ගොස් තිබුණා. චර්මච්ඡේදනයේ දී ගැහැනියට විඳින්නට වන වේදනාව ගැන මම ඔහුට කීවෙමි. අප්‍රිකානු ගැහැනුන් කම් සැප විඳින බවත්, ඒ අනුව ඔවුන් දරුවන් ප්‍රසූත කරන බවත්, එහෙයින් මා කියූ දේ සත්‍යයක් වන්නට නො හැකි බැව් ඔහුගේ මතය විය.

“වාරිස් දන්නව ද... කාරා මට කියූ දෙයක්... අප්‍රිකානු ගැහැනුන්ට කාමය එතරම් වැදගත් නැහැ කියලා මිනිහා මට කිව්වා... ඒ විතරක් නෙමෙයි, ඒ සිද්ධිය සිදුවන්නෙ දරුවන් ලබා ගැනීමට උවමනා නිසාත්... අප්‍රිකන් ගැහැනුන් තම ස්වාමිපුරුෂයාට ඕනෑ දෙයක් කරගන්නට ඉඩ දී ඔවුන් සම්භෝගයේ දී ඔහේ වැතිර සිටින බවත් ඔහු කීවා... නමුත් යුරෝපීය ගැහැනුන් සම්භෝගයේ දී ක්‍රියාකාරී කොටසක් සිදු කරනවා...”

එවදන් මා හට තදින් ම බලපෑවේ ය. බලාපොරොත්තු අත් කරගත් ගැහැනුන් විසින් පළමුවන සම්භෝගයේ දී ඔවුන් ලද අත්දැකීම් විස්තර කරමින් අන්තර්ජාලයට එවා ඇති ලිපි ඒ මොහොතේ මගේ සිහියට නැගිණි. චර්මච්ඡේදනයට ලක් ව සිටින ඒ තරුණියන්ගේ අත්දැකීම් මොන තරම් කෘර ද?

ලී සමඟ පැවැති සාකච්ඡාවෙන් දින කීපයකට පසු මා මගේ කාර්යාලයේ ඉන්නා අතරතුර දොරේ සීනුව නාද විය. දොර විවෘත කළ විට කුඩා දරුවකු අතින් ගත් සිහින්දෑරි උස තරුණියක් දොර ඉදිරිපිට සිටගෙන සිටිනු මම දුටුවෙමි. අවුරුදු දාහතක් වයසැති ඇය වෙනත් එම වයසේ පසුවන දැරියකට ජීවිත කාලය තුළ දී ලබන්නට නො හැකි තරම් ජීවිතය පිළිබඳ අත්දැකීම් සම්භාරයක් දාහත් අවුරුද්ද තුළ ලබා ඇති අයකු බැව් මම ඉවෙන් මෙන් තේරුම් ගතිමි. ඇගේ නම වනීයා ය (මෙය ඇයගේ නියම නම නො වේ). ඈ සම්බන්ධ ව කටයුතු කරන සමාජ සේවිකාව ඇයට මගේ ලිපිනය දී තිබුණි.

“වාරිස්... මම කියන්න උත්සාහ කරන කාරණය ගැන ඔබ හොඳට ම දන්නවා... අපට ඒ චාරිත්‍රවලින් හැංගිලා ඉන්නට අවකාශයක් තිබුණේ නෑ” ඇය කතාව පටන් ගත්තා ය.

“ඇත්තෙන් ම වාරිස් පුංචි කාලෙ මම හිතුවෙ ඒ චාරිත්‍රය මනබඳින දෙයක් කියලා... දෙමව්පියො, වැඩිහිටියො අපට කිව්වෙ චර්මච්ඡේදනයෙන් පස්සෙ තමයි දැරියක් නියම ගැහැනියක් බවට පත්වෙන්නෙ කියලා.” ඇය මොහොතක් නිහඬ ව සිට නැවතත් කතාව පටන් ගත්තා ය.

“දවසක් පාන්දර මගේ අම්මා මාව අවදි කළා... මම දැන ගත්තා මොකක් හරි අමිහිරි දෙයක් සිද්ධ වෙන්නට යන බව... මම අම්මාගෙන් ඇහැව්වා මේ පාන්දර කොහෙ යන්ඩ ද ලෑස්ති වෙන්නෙ කියලා... මගේ ප්‍රශ්නයට ඇය උත්තරයක් දුන්නෙ නෑ.’

සෝමාලියාවේ චර්මඡේදනය සිදු කරන ආකාරය ගැන වාරිසා කියන්නට පටන් ගත්තා ය. ඇය කතාව කියාගෙන යන අතර, මා හට චර්මඡේදනය සිදු කළ අවස්ථාව මගේ මතකයට ගලා එන්නට විය. එතවර ම ඇය ඉකි ගසමින් හඬන්නට පටන් ගත්තා ය. මම ඈ මගේ තුරුලට ගෙන මගේ ඇඟිලි තුඩුවලින් ඇගේ ගන කළු කොණ්ඩය පිරිමදින්නට වූයෙමි. ඇය බලාපොරොත්තු නැති කරගෙන සිටින බවක් පෙනෙන්නට විය. මගේ කාමරයේ වූ සෝපාව වෙත ගොස් එහි දිග ඇදුණු ඇය හිස්බැල්මකින් එක එල්ලයක් දෙස බලා සිටින්නට විය. මඳ වෙලාවක් පසු නැවතත් ඇය කතාව කියන්නට පටන් ගත්තා ය.

"ඊට පස්සෙ මම ගැබිනි වුණා... මගේ පියා දැන ගත්ත නං මගේ දරුවට නියම පියෙකු නැති බව බොහෝ විට ඔහු මා නිවසින් පන්නා දමන්නට ඉඩ තිබුණා... මට ලැබෙන්නට ඉන්න දරුවා ගැහැනු දරුවෙකු උනොත් ඇයට චර්මඡේදනය සිදු කළ යුතු බව මගේ පවුලේ අනෙක් අය කිව්වා... ඒ වෙලාවෙ මම කල්පනා කළා මට විඳින්නට සිදු වූ දුක මම මගේ දරුවට විඳින්නට ඉඩ තියන්නෙ නෑ කියලා... මට වයස අවුරුදු හයයි චර්මඡේදනය සිදු කරනකොට... චර්මඡේදනය කරන්න මා අල්ලගෙන යන්නට එනවා මට නිතර ම සිහිනෙන් පෙනෙනවා... මම ඔවුන් සමඟ පොරබදනවා... එත් වැඩක් වෙන්නෙ නෑ, ඔවුන් මාව කුදලාගෙන යනවා... ඊට පස්සෙ මම දකිනවා ගැහැනියක් අඳුරේ ඉඳලා මා ගාවට එනවා. මට තේරෙනවා ඈ මට අනතුරක් කරන්නට එන බව... සිහිනයෙන් අවදි උනාම ජීවිතේ සියල්ල ම නැති උනා වගේ හැඟීමක් මට දැනෙනවා... ඒ සිහින මොන තරම් බියකරු සිහින ද නින්දෙන් අවදි වූ විට මා දැක ඇත්තේ සිහිනයක් බැව් වැටහුණා ම මට හරි ම සතුටක් ඇති වෙනවා."

"ඔබේ හැඟීම මට හොඳට තේරෙනවා... කොහොම හරි අන්තිමේ දී ඔබට ඔබේ දුව බේර ගන්න පුළුවන් උනානෙ... කොහොම ද ඔබ ඔස්ට්‍රියාවට ආවෙ?"

"ඇත්තෙන් ම ඒක මහා භයානක ගමනක්... මම පළමුවෙන් ම ඉතියෝපියාවට ගියා... එහෙදි තමයි මට මේ දුව ලැබුණෙ...

ඔහෙ ඉඳලා මම යුරෝපයට එන්න නැවකට නැග්ගා... දවස් ගොඩක් තිස්සෙ අපට කිසි ම තැනක් බිමක් නෑ... නැව ඉතාලියට ආවා... එතැනින් අපි ව ලොරියකට ගොඩ කරගත්තා... ඒ ලොරියෙ පුරවලා තිබුණ බෝංචි අස්සෙ හැංගිලා ඉන්නට අපිට සිදුවුණා. මම හරි බියකින් හිටියෙ මෙච්චර දුරක් ඇවිල්ලා පොලීසියට අහුවෙයි කියලා... අවසානයේ දී අපි ලින්ස් නගරයට ආවා... ලොරියෙන් බහින කොට ලොරිකාරයා මගෙන් යුරෝ 15,000ක් ඉල්ලුවා. මං ගැස්සිලා ගියා... මට දෙන්න සල්ලියක් තිබුණෙ නෑ. ඒ ගමන ඒ මිනිහ කිව්වා එහෙනං මුදල්වල හිලව්වට වැඩ කරන්න ඕනෑ කියලා... ඔහු මට ලොරියට නගින්න බල කළා... මට වෙන කරන්නට දෙයක් තිබුණෙ නෑ. මම දරුවත් අරගෙන ලොරියට නැග්ගා. පැය ගණනාවකට පස්සෙ අපි ඉතාලි - ජර්මන් කඩඉම් පහු කරලා ජර්මනියෙ බැවේරියාවෙ ගරා වැටුණ ගෙදරකට ආවා... ඒක ගණිකා මඩමක්... හැබැයි, පිටින් බැලුවට එහෙම දෙයක් පෙනෙන්නට නැහැ... නිවසෙ සාලයේ රතුපාට සෝපා දෙකක් තියලා තිබුණා. ඒ පාරිභෝගිකයින්ට වාඩි වෙන්න. ඒ අය ඇවිල්ලා වාඩි උනාම මැඩම් ඇවිත් කියනවා ඒ අය යා යුතු කාමරය. මං එනකොට ඒ ගෑනි මට කිව්වා උඹ හරි කැත ගෑනියක්... උඹට කවදාවත් ඇහට කනට පේන මිනිහෙක් ගන්නට ලැබෙන්නෙ නෑ... දැන් උඹට මෙතන ඕනෑ තරම් මිනිස්සු ඉන්නවා... ඇරත් උඹ සන්තෝෂ වෙන්න ඕනෑ මේ වගේ රස්සාවක් උඹට ලැබුණ එක ගැන."

ඇය සුසුමක් ඉහළට හෙළමින් නැවතත් කතා කරන්නට පටන් ගත්තා ය. "මට එතන අවුරුද්දක් ඉන්නට සිදු වුණා... ඒ අවුරුද්ද ඇතුළත මට මිනිස්සු දෙසීයක් පමණ දෙනා එක්ක ඉන්නට සිදු වුණා... චර්මඡේදනය කරපු ගැහැනියක් එක්ක ඉන්න එක ඔවුන්ට මහ අලුත්කමක්. ඒ නිසා ඔවුන් හරියට තෘප්තිමත් වුණා. ඒ නිවසෙ උඩු මහලෙ මට තරමක ලොකු කාමරයක් තිබුණා. ඒකෙ තිබුණා දෙන්නෙකුට නිදා ගැනීමට හැකි ප්‍රමාණයේ ඇඳක් සහ කණ්ණාඩි මේසයක්... මම ඔහේ වැතිරිලා හිටියා මිනිස්සුන්ට ඕනෑ දෙයක් කර ගන්නට ඇරලා... මට ඒ හැම අවස්ථාවක ම වගේ වේදනාව නිසා

ඇඬුණා. ඒත් ඒ මිනිස්සු ඒ ගැන කුට්ටුවකටවත් සැලකුවෙ නෑ... උන් උන්ගෙ වැඩය කරගෙන ගියා... එක ම එක වතාවක තරුණ ඉළන්දාරියෙක් ආවා... මම වේදනාවෙන් අඬන බව දැකලා ඔහු ඒ වැඩේ නතර කරලා මගෙන් සමාවත් අරගෙන යන්න ගියා."

වාණියාගේ දෙනෙතින් කඳුළු රූරා ගලා හැළෙන්නට විය. ඇය මේ කතාව මීට පෙර කිසි ම අයකුට පවසා නැත. "කොහොම ද ඔබ ඒ ගණිකා මඩමෙන් පැන ගත්තෙ" මම ඇසුවෙමි.

"දවසක් මැඩම් සුළු දෙයකට මගේ කම්මුලට පහර දුන්නා... එදා මම තීරණය කළා එතැනින් පැනලා යන්න... නිතර ම මා ළඟට ආපු මනුස්සයෙක් ඒකට මට උදව් කළා."

ඇගේ කතාව අසා මම ගොළු වුණෙමි. යුරෝපයේ රටක ජීවත් වන්නට නිසි බලපත්‍රයක් නො තිබීම හේතුකොටගෙන ඇයට හොරෙන් ජීවත් වීමට සිදු වී ඇති අතර, එවැනි බලපත්‍රයක් කිසිදිනක ලබා ගන්නට හැකි වේදැයි යන්න ගැන ඇයට කිසි ම බලාපොරොත්තුවක් තිබී නැත. මිනිසුන්ගෙන් ඇයට විඳින්නට සිදු වූ අතවර ගැන පැමිණිල්ලක් කරන්නට පොලීසියකට ගියා නම් අනිවාර්යයෙන් ම ඔවුන් ඇයත් සිඟිති දරුවාත් රටින් පිටුවහල් කරනු ඇත. සමාජයට ගියහොත් තමුන්ගේ පවුලේ සාමාජිකයන්ට ඇය හසු වේයයි ඈ තුළ මහත් බියක් ඇති වී තිබුණි.

එක වර ම මගේ කළමනාකරු දොරට තට්ටු කොට කාමරයට ඇතුළු විය. එයින් බියට පත් ඇය වහාම හුන් තැනින් නැගිට ගොස් දරුවා ද රැගෙන කාමරයෙන් පිට වීමට සූදානම් විය. "බයවෙන්න දෙයක් නෑ. ඒ කාමරයට ආවෙ මගේ මිත්‍රයෙක්" මම ඇයට කීවෙමි. ඇය මගේ කාර්යාලයේ දොරෙන් පිටතට ගොස් නැවතත් ඇතුළට අවුත් මෙසේ පැවසුවා ය. "වාරිස්... කොහොම හරි මේ ව්‍යසනය නවත්වන්න... අනේ කොහොම හරි නවත්වන්න."

නැවතත් ඇය මට කිසි දිනක හමු වී නැත. ඇය ව සොයා ගැනීමට මා දැරූ සියලු ම ප්‍රයත්නයන් නිරර්ථක විය. මට ඇය ව හමු වුවහොත් ඇය වෙනුවෙන් මට කරන්නට හැකි සෑම දෙයක් ම මම කරමි.

2

දෙවියන්ගේ ආශීර්වාද ලත් දූපත

පැරිස් නගරය මට හුරු පුරුදු එමෙන් ම සමීප ස්ථානයක් බව දැනෙන්නේ බොහෝ විට මා විලාසිතා නිරූපිකාවක් ලෙස කටයුතු කළ කාලයේ නිතර පැරිස් නගරයට ගොස් සිටි නිසා වන්නට පුළුවන. එසේත් නැතිනම් මා අප්‍රිකානු ගැහැනියක් වීම නිසා කිසිවකුගේ අවධානයක් මා වෙත යොමු නො වන නිසා වන්නට ඇත. පැරිස් නගරය තුළ සුදු ජාතිකයින්ට වඩා අප්‍රිකානු ජාතිකයින් ජීවත් වන ප්‍රදේශ ඇත. වියානා නගරය සමඟ සසඳන විට පැරිසියට මෙතරම් ඇල්මක් මා තුළ ඇති වී ඇත්තේ ඒ නිසා විය යුතු ය. පැරිස් නගරයේ ඇති චාම් බව සහ අලංකාරත්වය ඊට ම ආවේණික ලක්ෂණයකි. එහි ඇති අති ගාම්භීරත්වය මඟින් දුරස්ථතාවක් ඇති කර ඇති නමුදු, නගරයේ රමණීයත්වය මනබඳනසුලු ය. අතීත ශ්‍රී විභූතියත් සංස්කෘතිය සහ සම්ප්‍රදායත් නගරයේ දසතින් ම පෙනෙන්නට ඇත. පැරිස් නගරය තුළ වූ මාර්ගවල

පවතින කලබලකාරීත්වයට මම ඇලුම් කරමි. පැරිස් නගරයේ පූ මාවත් දිගේ ඇවිදිමින්, අලංකාර සාප්පුවල ප්‍රදර්ශන කරන දෑ නැරඹීමෙන් මට මහත් සතුටක් ගෙන දෙන්නකි.

පැරිසිය තරම් ස්ත්‍රී චර්මච්ඡේදනය නමැති විෂය විවෘත ව කතාබහට ලක්වන තවත් රටක් හෝ නගරයක් හෝ නොමැති තරම් ය. එහෙත්, ස්ත්‍රී චර්මච්ඡේදනයට විරුද්ධ ව මෙහි පනවා ඇති නීති අසල්වැසි රටවල්වල ක්‍රියාත්මක වන නීතිවලට වඩා වෙනසක් නොමැති නමුත්, ස්ත්‍රී චර්මච්ඡේදනය සම්බන්ධ නීති ප්‍රංශයේ අකුරට ම ක්‍රියාත්මක වේ. නීති උල්ලංඝනය කරන්නවුන් ඉතා ඉක්මනින් නීතිය ඉදිරිපිටට ගෙනැවිත් නිසි දඬුවම් පමුණුවන අතර, එයට ගොදුරු වූ ස්ත්‍රීන්ට රජයෙන් ආධාර දෙනු ලැබේ. වෛද්‍යවරුන්, හෙදියන් හෝ සේවනයම් අය හෝ මෙම නීති විරෝධී ක්‍රියාව කරන්නේ නම් ඔවුන් ගැන බලධාරීන්ට දැන්වීම කාගේත් යුතුකමක් වශයෙන් සැලැකේ. යමෙක් ඒ යුතුකම පැහැර හරින්නේ නම් එය ද නීත්‍යානුකූල ව දඬුවම් ලැබිය යුතු වරදකි.

ස්ත්‍රී චර්මච්ඡේදනය සම්බන්ධ නීති ප්‍රංශ අධිකරණය විසින් අකුරට ම ක්‍රියාත්මක කරන අතර, ඒ ශල්‍යකර්මය ක්‍රියාවට නගන අය පමණක් නො ව, තම දැරියන් චර්මච්ඡේදනයට ලක් කළ යුතු ය යන ආකල්පය දරන දෙමවුපියන් ද වරදකරුවන් වශයෙන් සලකනු ලැබේ. ඒ අනුව අධිකරණය මඟින් ඔවුන්ට නිසි දඬුවම් ලැබෙන අතර, සිය දියණියන්ට වන්දියක් ගෙවීමට ද සිදු වේ. මේ කියන කරුණු සත්‍ය වශයෙන් ම ප්‍රංශය තුළ සිදු වේ ද? ඇත්තෙන් ම ප්‍රංශය දෙවියන්ගේ ආශිර්වාදය ලද දූපත වශයෙන් හැඳින්විය හැකි ද?

ප්‍රංශයට ගොස් මේ කියන ලද තත්ත්වය මගේ දෙනෙතින් ම දැක බලා ගැනීමටත්, ස්ත්‍රී චර්මච්ඡේදනයට විරුද්ධ ව පෙරමුණේ සිට කටයුතු කරන පුද්ගලයන් හමු වී කතාබස් කරන්නටත් මට උවමනා විය. ස්ත්‍රී චර්මච්ඡේදනය හේතුකොටගෙන ස්ත්‍රීන්ට අහිමි වී ඇති භගශිෂ්නිකාව නැවත ප්‍රතිසංස්කරණය කරන්නට හැකි වෛද්‍ය විශේෂඥයෙක් පැරිසියේ සිටින බව මට දැන ගන්නට ලැබුණි.

මුළු යුරෝපය තුළ ම එවැනි කර්තව්‍යයක නිරත ව සිටින එක ම වෛද්‍යවරයා එම විශේෂඥයා බැව් කියනු ලැබේ. ඇත්තෙන් ම එවැනි ශල්‍යකර්මයක් ප්‍රායෝගික ද යන්න සොයා බලන්නට මා තුළ මහත් උනන්දුවක් ඇති විය.

මගේ කළමනාකරු වල්ටර්, වාරිස් ඩයිරි පදනමේ උප සභාපති යොහන්නා (Joanna) සහ ජූලියා, පැරිස් ගමනට මා සමඟ සම්බන්ධ විය. ඔවුන් තිදෙනා පැරිස් ගමනට සම්බන්ධ කරගත්තේ අන් කිසිවක් නිසා නො ව, මේ කියන ලද වෛද්‍යවරයා හමුවන්නට හුදකලාව යන්නට මා තුළ කිසි යම් සැකයක් ඇති ව තිබූ බැවිනි. වියානා සිට පැරිස් දක්වා ගුවන් ගමන අතරතුර මගේ කණ්ඩායම විසින් කරන ලද ගවේෂණ සම්බන්ධ රපෝර්තු උඩින් පල්ලෙන් මම කියවීමි. ස්ත්‍රී චර්මච්ඡේදනය සම්බන්ධ ව ප්‍රංශ ජාතිකයන්ගේ ආකල්ප සම්බන්ධ ඉතා වැදගත් දත්ත එම රපෝර්තුවල සඳහන් වී තිබුණි. එම දත්තයන් තදින් ම මා සිත් ගත්තේ ය. ප්‍රංශයට සංක්‍රමණය වී සිටින අප්‍රිකානු ජාතිකයින්ගෙන් වැඩි ප්‍රමාණයක් සහරා කාන්තාරය අසබඩ පිහිටා ඇති රටවල් වන සෙනගාල්, මාලි සහ මුරතානියන් වැනි රටවල සිට පැමිණි අය බැව් එම රපෝර්තු මඟින් මම උගත්තෙමි. ඔවුන් අතරින් විශාලතම කණ්ඩායම සෙනගාලයේ සිට පැමිණි සංක්‍රමණිකයන්ගෙන් සමන්විත වී ඇත. විෂය පිළිබඳ විශේෂඥයින්ට අනුව හැටපන්දාහක් ස්ත්‍රීන් සහ දැරියන් දැනටමත් ස්ත්‍රී චර්මච්ඡේදනයට ගොදුරු වී හෝ ගොදුරු වන්නට හෝ සිටින බැව් සඳහන් වේ.

“මට නං මේක හිතා ගන්නවත් බෑ” පුවත්පතක පළ වී තිබුණු ලිපියක් මම ජූලියාට පෙන්වමින් කීවෙමි. මේ සංක්‍රමණිකයින්ගේ මවුබිම්වල පවා ස්ත්‍රී චර්මච්ඡේදනය බොහෝ කලකට පෙර අවලංගු කොට ඇති වාතාවරණයක් තුළ ප්‍රංශයට සංක්‍රමණය වී ඇති මොවුන් මෙම අත්තනෝමතික ක්‍රියාව ප්‍රංශය තුළ පවත්වාගෙන යන බව පුවත්පතෙහි සඳහන් ව තිබුණි.

පැරිස් නැතහොත් ලන්ඩන් වේවා මේ සංක්‍රමණිකයින් ඒ රටවල්වල සමාජයෙන් කොන් වෙලා හුදකලා වී ජීවත් වන්නෙ.

එහෙයින් ඔවුන් ඔවුන්ගේ ම සමාජයන් ගොඩනගාගෙන ඒ තුළ ජීවත් වෙන්නෙ. එවැනි හුදකලා වූ වාතාවරණයක් තුළ ජීවත් වන ඔවුන්ට තමුන්ගේ චාරිත්‍රවල වැදගත්කම ඉස්මතු වීම තර්කානුකූල යි.

නැවතත් මම ලිපිගොනුවෙන් තවත් ලිපියක් එල්ටර්ට පෙන්නුවෙමි. එහි සිරස්තලය මෙසේ විය. "ස්ත්‍රී චර්මච්ඡේදනය සහමුලින් ම අහෝසි කිරීමට නිර්දේශ කෙරේ." එම ලිපිය සම්පාදනය කර ඇත්තේ ප්‍රංශයේ ජාතික වෛද්‍ය ආයතනය විසිනි (Academie Nationale Medecine). ලිපිය සම්පූර්ණයෙන් ම කියවූ එල්ටර් දෙපසට හිස වනමින් මෙසේ පැවසුවේ ය. "ස්ත්‍රී චර්මච්ඡේදනයට විරුද්ධ ව සාර්ථක ව සටන් කරන්නෙ කොහොම ද කියන එක මේ ලිපියෙ ගැඹුරින් විග්‍රහ කරලා තියෙනවා."

"හරියට ම හරි... දැන් ඒ සටන යුරෝපය පුරා ආරම්භ කර තිබෙනවා" මම කීවෙමි.

අප රැගත් ගුවන්යානය පැරිස් ගුවන්තොටුපොළට ගොඩබස්සවන විට ප්‍රදේශය ම මීදුමෙන් වැසී ගොස් තිබුණි. උෂ්ණත්වය සෙන්ටිග්‍රේඩ් දොළහක් වූ අතර , එය හේමන්තයේ පැහැබර දවසක් විය.

මම කුලී රථයකින් ලින්ඩා වයිල් කුරියල්ගෙ (Linda Weil Curiel) කාර්යාලයට ගියෙමි. ඇය ඉතා ප්‍රසිද්ධ නීතිඥවරියක වූ අතර. මීට පෙර මා ඇය සම්බන්ධ ව බොහෝ දේ අසා තිබුණි. වසර විස්සක් පුරා ඇය ස්ත්‍රී චර්මච්ඡේදනයට විරුද්ධ ව සටනක නියැළී සිටින්නී ය. ඇගේ කාර්යාලය තිබුණේ පැරිසියේ අති ප්‍රසිද්ධ ස්ථානයක් වූ St. Germain - de - Pres නමැති ස්ථානයේ ය. ලෝක ප්‍රසිද්ධ දාර්ශනිකයින් දෙදෙනකු වන සිමොන් ද බෝවා සහ ෂෝන් පෝල් සාත්‍රෙ නිතර ගැවසුණ "ලෙෆ්ට් බෑන්ක් කෝපිහල" ඇගේ කාර්යාලයට මදක් දුරින් වූ Les Deux Magots පිහිටා තිබුණි.

ඇගේ කාර්යාලයේ වූ සෑම කාමරයක එල්ලා තිබූ ඡායාරූප තුළින් ඇගේ වෘත්තීය ජීවිතය මනාව ප්‍රතිබිම්බනය විය. රාක්කවල වීඩියෝ පට අහුරා තිබුණ අතර, ස්ත්‍රී චර්මච්ඡේදනය සම්බන්ධ මා

දුටු විශාලතම වීඩියෝ පට එකතුව ඇය සතු විය. පළමු වරට ඇය දුටු මොහොතේ ඈනී ගිරාඩෙට් (Annie Giradet) නමැති ප්‍රංශ නිළිය මගේ මතකයට ගලා ආවේ නිරායාසයෙනි. ලින්ඩා, සිමොන් ද බෝවා සමඟ කටයුතු කර තිබුණි. ඈ සම්බන්ධ වී කටයුතු කරන නොයෙකුත් ව්‍යාපෘතිවලින් ස්ත්‍රී චර්මච්ඡේදනයට විරුද්ධ ව ඇය ගෙන යන ව්‍යාපෘතිය ප්‍රධාන තැනක් ගන්නේ ය.

"සුන්නත් කිරීම කියන්නෙ චර්මච්ඡේදනයට... චර්මච්ඡේදනය නමැති වචනය පැහැදිලි ව හඬ නගා කිව යුතුයි."

"අන්න ඒ නිසයි මම චර්මච්ඡේදනය කියන වචනය වෙනුවට ලිංග ඡේදනය යන වචනය පාවිච්චි කරන්නෙ... චර්මච්ඡේදනයෙ අරමුණ ගැහැනියගෙ ලිංගිකත්වය විනාශ කර දැමීම යි." ලින්ඩා කතාව පටන් ගනිමින් කීවා ය.

මා ඇයගේ මේසය ඉදිරිපස වූ සැප පහසු පුටුවක අසුන් ගත් අතර, ඇය ඇයගේ සුපුරුදු අසුනෙහි වාඩි ගත්තා ය. ඇගේ මේසය මත නොයෙකුත් ලිපි ගොනු තිබූ අතර, මෙතෙක් විවෘත නො කරන ලද ලිපි ද ඒ අතර විය.

"මම දන්නෙ නෑ මේ ඔක්කොම දේවල් ගැන බලන්න වෙලාව හොයා ගන්නෙ කොහොම ද කියලා... ඇත්තෙන් ම මගේ කාලය මිඩංගු වන්නෙ මාධ්‍යවේදීන්, ශිෂ්‍යයන් සහ රූපවාහිනී වැඩසටහන්වලට... දැන් නම් ඔවුන්ගෙ ඉල්ලීම් බැහැර කරලා මගේ කටයුතු ගැන අවධානය යොමු කරන්නට ඕනෑ කාලය ඇවිල්ලා තියෙන්නෙ... ඉතින් මේ ඔක්කොම ප්‍රශ්න මැද්දෙ මම කොහොම හරි මගේ වැඩ කටයුතුත් කරගන්නවා" ඇය කතාවට මුල පිරුවා ය.

ඇය CAMS නමැති සංවිධානය වෙනුවෙන් ස්ත්‍රී චර්මච්ඡේදනය අහෝසි කර දැමීමට කටයුතු කරන්නී ය. ඒ සම්බන්ධ ව ලින්ඩාගේ ප්‍රධාන කර්තව්‍ය වී ඇත්තේ ස්ත්‍රී චර්මච්ඡේදනය ක්‍රියාවට නගන පුද්ගලයන් නීතිය ඉදිරියට ගෙන ඒම ය. වර්ෂ 1983 සිට ස්ත්‍රී චර්මච්ඡේදනය සාපරාධී අපරාධයක් වශයෙන් ප්‍රංශ දණ්ඩ නීති

සංග්‍රහයට ඇතුළත් කර ඇත. ප්‍රංශය තුළ මෙම නීතිය අකුරට ම ක්‍රියාත්මක කරවීමට ඇය අධිෂ්ඨානයෙන් යුතු ව ක්‍රියා කරන්නී ය. මේ දක්වා වැරැදිකරුවන් තිස්නවයදෙනකු අධිකරණය වෙත පමුණුවන්නට ඇය සමත් වී ඇත.

ස්ත්‍රී චර්මඡේදනය පිළිබඳ බොහෝ අවස්ථාවල චෝදනාවට ලක් ව ඇත්තේ චර්මඡේදනයට ලක් වූ දැරියන්ගේ දෙමවුපියන් ය. චර්මඡේදනය සිදු කරන ගැහැනුන් නීතියට හසු කර ගැනීම ඇත්තෙන් ම ඉතා අපහසු කාර්යයකි. මන්ද ඔවුන් ගැන කිසි යම් හෝඩුවාවක් හෝ එළි කිරීමට කිසිවකු ඉදිරිපත් නො වන බැවිනි. මෙනයින් බලන කල චර්මඡේදනයට ලක් වූ දැරියන්ගේ දෙමවුපියන් නීතියට හසු කර ගැනීම අපහසු නො වේ. මන්ද සිය දියණියගේ යෝනිය පරීක්ෂා කළ විට සිදු ව ඇති ඡේද පැහැදිලි බැවින්, ඒ සම්බන්ධ ව දෙමවුපියන් වෙත එල්ල වන චෝදනා ප්‍රතික්ෂේප කිරීමට ඔවුනට කිසි ම පදනමක් නොමැති බැවිනි.

ස්ත්‍රී චර්මඡේදනය සාපරාධී ක්‍රියාවක් වශයෙන් ප්‍රංශයේ දණ්ඩ නීති සංග්‍රහයට ඇතුළත් කළ මුල් දිනවල වරදකරුවන් හට ලැබී ඇත්තේ ලිහිල් දඬුවම් වූ නමුදු, මෑතක සිට අධිකරණය විසින් දැඩි දඬුවම් පැමිණවීමට තීරණය කර ඇත. සිය ජීවිත කාලය ම කැප කරමින් ලින්ඩා ගෙන ගිය අරගලයේ එක් අරමුණක් සඵල විය.

“මෙවැනි අසාධාරණයක් යම් හෙයකින් සුදු ජාතිකයින්ගේ දුවරුන්ට සිදු වුවා නම් නිසැකයෙන් ම වැරැදිකරුවන් හට ජීවිත කාලය ම සිරබත් කන්නට සිදු වෙනවා” ඇය කීවා ය.

1983 දී පළමුවරට චර්මඡේදනය සම්බන්ධ චෝදනා ලද පියකුට ප්‍රංශ අධිකරණය විසින් සිර දඬුවමක් නියම කරන ලදී.

“දෙමවුපියන් සිරගෙට නියම වුවාට පසු දරුවන්ට යන කලදසාව කුමක්ද?” මම ප්‍රශ්න කළෙමි.

“ඊට පස්සෙ ඒ දරුවන් තමුන්ගෙ ඥාති පවුල් සමග ජීවත් වෙනවා” ලින්ඩා පිළිතුරු දුන්නා ය.

වරදකරුවන් හට මෙවැනි දඬුවම් ලබා දීම තුළින් අවම වශයෙන් අනෙකුත් දැරියන්ට ආරක්ෂාව සැලැසීම මෙහි මූලික අර්ථය වේ. කුඩා දැරියන්ට සිදු වී ඇති ශාරීරික අලාභහානි සඳහා වන්දි ලබා ගැනීම අරමුණු කරගෙන CAMS ආයතනය වෙනුවෙන් ලින්ඩා විසින් අධිකරණය වෙත නඩුවක් ගොනු කරන ලදු ව, වරදකරුවන් හට ඒ සඳහා යුරෝ 25,000ක පමණ වන්දියක් ගෙවීමට සිදු වී ඇත. එවැනි වන්දියක් ගෙවීම ඔවුනට සිර දඬුවමකට වඩා අපහසු කාර්යයකි.

ඒ සඳහා රජය විසින් ස්ථාපිත කර ඇති විශේෂ අරමුදලක් මඟින් පළමුවෙන් ම එම මුදල දැරියන් වෙත ලබා දෙන අතර, එම මුදල දෙමවුපියන් විසින් මාසික ව කොටස් වශයෙන් ආපසු ගෙවිය යුතු ය. අදාළ දැරියන් අඩු වයසේ පසු වන්නේ නම් ඔවුනට අයත් මුදල් අධිකරණය විසින් පත් කරනු ලබන භාරකරුවකු බාරේ තබන අතර, දැරියන් නිසි වයසට පැමිණි පසු භාරකරුවා විසින් ඔවුන්ට එම මුදල් ලබා දෙනු ඇත.

පළමුවෙනි නඩු විභාගවලින් දෙමවුපියන්ට දඬුවම් ලැබීම හේතුකොටගෙන සිය දියණියන් අප්‍රිකාවට යවා එහි දී ඔවුනට චර්මඡේදනය සිදුකොට නැවතත් ගෙන්වා ගැනීමට දෙමවුපියන් උත්සුක වන්නට පටන් ගෙන ඇත. එම දැරියන් ප්‍රංශයේ උපත ලබා ඇති හෙයින් නිසර්ගයෙන් ම ඔවුහු ප්‍රංශ ජාතිකයින් වන බැවින්, චර්මඡේදනය කිනම් රටක දී සිදු කළත් වැරැදිකරුවන්ට නීතියෙන් ගැලවීමක් නැත. මේ ආකාරයෙන් සිය දියණියන් හට චර්මඡේදනය සිදු කරන ලද දෙමවුපියන් අධිකරණය වෙත ප්‍රකාශ කර ඇත්තේ චර්මඡේදනය සිදු වී ඇත්තේ ඔවුන්ගේ අනුදැනුමක් නොමැති ව බව ය. සාමාන්‍යයෙන් මෙහි දී බොහෝවිට වරද පැටවෙන්නේ ආච්චි අම්මලාට ය.

මේ වනවිට ලින්ඩා සමඟ මා හෝරා දෙකක් පමණ සාකච්ඡා කර තිබුණි. සාකච්ඡාව අතරතුර ඇය තුළින් නිසර්ගයෙන් ම මතු වී ආ සෝන්තිය සහ භාවාත්මක හැඟීම් ඇගේ අව්‍යාජත්වය මොනවට පැහැදිලි කළා ය. ස්ත්‍රී චර්මඡේදනය සම්බන්ධ ව ඇය සිටින්නේ මා දරන ස්ථාවරයේ ම බැව් මම සැක හැර දැන ගතිමි.

"මෙම සැහැසි ක්‍රියාවට සම්බන්ධ පුද්ගලයන් නීතියේ රැහැනට හසු කර ගැනීමට ක්‍රියා කරනවා හැරුණු කොට මේ සම්බන්ධ ව රට අදාළ පිරිස් දැනුවත් කිරීමට කටයුතු කරන සංවිධාන ගැන ඔබගේ අදහස කුමක් ද?" මම ප්‍රශ්න කළෙමි.

දෙනෙත් කරකවා මා දෙස බැලූ ඇය, කිසි යම් නො සන්සුන්තාවයකට නැති නම් අපහසුතාවයකට පත් වූ බවක් පෙන්නුම් කළා ය. "අපි මේ සම්බන්ධ ව අවුරුදු විස්සක් පමණ සාකච්ඡා කරලා තියෙනවා" ඇය තරමක් උස් හඬින් කතා කරමින් මේසය හරහා මා වෙතට නැඹුරු ව මගේ දෙනෙත් දෙස එක එල්ලේ බලාගෙන නැවතත් කතා කරන්නට පටන් ගත්තා ය. "අවුරුදු විස්සක් අපි මේ ගැන කතා කරලා මොනව ද දිනාගෙන තියෙන්නෙ... කිසි ම දෙයක් නෑ... ඇත්තෙන් ම කිසි ම දෙයක් අපි දිනාගෙන නෑ..." නුරුස්සන ගතියකින් ඇය නැවතත් සිය පුටු ඇන්දට හේත්තු වූවා ය. "මම ඔබට එක දෙයක් කියන්නම්... මේ විදියට ගියොත් ස්ත්‍රී චර්මඡේදනය තව අවුරුදු සියයකටවත් නතර කරන්න පුළුවන්කමක් නෑ... මෙය සම්පූර්ණයෙන් ම අහෝසි කර දැමීමට නම් එක ම දෙයයි කරන්නට තියෙන්නෙ... ඒ සම්බන්ධ පුද්ගලයන් නීතිය ඉදිරි පිටට ගෙන එන එක පමණයි."

සංස්කෘතිය, ස්ත්‍රී චර්මඡේදනය සමඟ සම්බන්ධ කිරීම ලින්ඩා සහමුලින් ම ප්‍රතික්ෂේප කරයි. "සංස්කෘතිය, චාරිත්‍ර වාරිත්‍ර ආදී දෑ බොහොම හොඳ දේවල්... නමුත්, අපි ජීවත් වෙන්නෙ ප්‍රංශයෙ... යම් අයෙක් මේ රටේ ජීවත් වෙනවා නම් අනිවාර්යයෙන් ම ප්‍රංශ නීතියට ඒ අය අවනත විය යුතු බව පිළිගත යුතුයි... නීතිය සෑම අයකුට ම පොදුයි... ඒ ගැන තර්කයක් තියෙන්නට බැහැ... යම් හෙයකින් ස්ත්‍රී චර්මඡේදනය සුදු ජාතික දැරියන්ට එහෙම සිදු වුණා නම් මේ වෙනකොට ස්ත්‍රී චර්මඡේදනය කියලා දෙයක් නෑ... මේ සැහැසි ක්‍රියාවට ගොදුරු වෙන්නෙ කළු ජාතිකයින්ගෙ දරු දැරියන් නිසා කවුරුත් ඒක මග හරිනවා... මේකට තමයි වර්ග වාදය කියලා කියන්නෙ."

ලින්ඩාට අවශ්‍ය ව ඇත්තේ මෙම ප්‍රශ්නයට හැකි ඉක්මනින් විසඳුමක් සෙවීමට ය. "මේ සම්බන්ධ ව බහුතරය දැනුවත් කිරීමට ගියොත්... මම හිතන්නෙ ඒකට විශාල කාලයක් ගත වෙනවා විතරක් නො වෙයි කිසි ම දෙයක් සිද්ධ වෙන්නෙත් නෑ... ඉතිහාසය දෙස බැලුවා ම ඔබට හොඳින් තේරුම් ගන්නට පුළුවන් ලෝකයේ වෙනස්කම් ඇති කරලා තියෙන්නෙ තනි පුද්ගලයින්ගෙ ක්‍රියාකාරිත්වයෙන්... ඔවුන් තමයි විප්ලවීයො සහ වීරයො... දැන් මට මේ හමුවෙලා ඉන්නෙ ඒ වගේ කෙනෙක්" ඇය කතාව සමාප්ත කළා ය.

මගේ වැඩසටහනට අනුව ඊ ළඟට හමු වන්නට නියමිත ව තිබුණේ පැරිසියේ සෙන්ට් ඩෙනිස් නමැති ස්ථානයේ මවුවරුන් සහ කුඩා දරුවන් සඳහා වෛද්‍ය ආයතනයක් පවත්වාගෙන යන එමැනුවෙලා පියර් නමැති වෛද්‍යවරියකි. වෛද්‍ය එමැනුවෙලා සමඟ ඇයගේ වෛද්‍ය ආයතනයේ මුළුතැන්ගෙයි සිට තේ කෝප්පයක් පානය කරමින් මම කතාව ආරම්භ කළෙමි. එහි තිබූ රාක්කවල තබා තිබූ ලිපිගොනු මත අලවා තිබූ ලේබල් මත මෙසේ ලියා තිබුණි; බලහත්කාරයෙන් සිදු කරන ලද විවාහ, ළමා අපචාර, ස්ත්‍රී චර්මඡේදනය පිළිබඳ නඩු වාර්තා යනුවෙන් සඳහන් වී තිබුණි. ගැහැනියකට මුහුණ දෙන්නට සිදු ව ඇති දුක් කරදරවල ප්‍රමාණය ඒ ලේබල් දෙස බලන විට පැහැදිලි ව පෙනී යයි.

"මම මේ ආයතනය පටන් ගත්තෙ දැනට අවුරුදු තිහකට පමණ ඉස්සෙල්ලා... මම මේක ඉතා ම පුංචියෙන් තමයි ආරම්භ කළේ... මේ දිස්ත්‍රික්කෙ මිලියන 1.4 දෙනා වාසය කරනවා... මෙහි දී අපි ගර්භිණී මවුවරුන්ට වෛද්‍ය උපකාර ලබා දෙනවා... ඒ වගේ ම වයස අවුරුදු හය දක්වා ළමුන්ට අවශ්‍ය වෛද්‍ය ආධාර ලබා දෙනවා." ඇය කතාවට මුල පුරමින් කීවා ය.

ඩෙනිස් දිස්ත්‍රික්කය පැරිසියේ බොහොමයක් කම්කරු ජනතාව ජීවත් වන දිස්ත්‍රික්කයක් වශයෙන් සලකන්නට පුළුවන්. මෙහි පදිංචිව සිටින අයගෙන් බොහොමයක් හැටේ හැත්තෑවේ යන දශකවල දී බටහිර අප්‍රිකාවේ සහ සහරා කාන්තාරය අවට රටවල සිට පැරිසියට සංක්‍රමණය වන අය... මුල දී මේ ප්‍රදේශයට සංක්‍රමණය වී ඇත්තේ පුරුෂ පක්ෂය පමණයි... ඊට පස්සෙ තමයි ඔවුන්ගේ භාර්යාවන් සහ දූ දරුවන් පැමිණිලා තියෙන්නෙ..."

ස්ත්‍රී චර්මච්ඡේදනය ප්‍රංශ නීතියට අනුව දඬුවම් ලැබිය යුතු සාපරාධී ක්‍රියාවක් බවත්, එයින් දැරියන්ට සිදු විය හැකි භයානක ආපදා ගැන මුල දී අපි ඔවුන් දැනුවත් කිරීමට උත්සාහ කළත්, ඒ කිසිවක් සාර්ථක වූයේ නැහැ... ඒ නිසා අපි තීරණය කෙරුවා චර්මච්ඡේදනය සම්බන්ධව අපට දැන ගන්නට ලැබෙන සිද්ධි බලධාරීන් වෙත දන්වන්නට... ඊට හේතුව මෙම ක්‍රියාවට සම්බන්ධ ව සිටින කාන්තාවන් මේ සම්බන්ධ ව දක්වන ආකල්පය වෙනස් කිරීමෙන් පමණක් මේ ක්‍රියාව නවත්වන්නට බැහැ" එමැනුවෙලා කීවා ය.

අධිකරණය මඟින් වැරදිකරුවන්ට දඬුවම් ලබා දුන් පසු පෙර පැවැති වාතාවරණය ක්‍රමයෙන් වෙනස් වන්නට පටන් ගෙන ඇත.

"කොහොම ද ඔබ මේ කාන්තාවන්ට මේ කාරණය පැහැදිලි කරන්නෙ..."

"චර්මච්ඡේදනයට ලක් වුණ කාන්තාවන් නිතර ම මා ළඟට එනවා... මම ඔවුන්ගෙන් අසන පළමුවෙනි ප්‍රශ්නය තමයි චර්මච්ඡේදනය සිදු කළ දිනය ඔවුනට මතක ද කියන එක... ඇත්තෙන් ම බොහෝ දෙනකුට ඒ සිද්ධිය පමණක් නො වෙයි විඳින්නට සිදුවන වේදනාව ගැනත් හොඳට මතක තියෙනවා... ඒ අයගෙ පිළිතුර වන්නේ... ඔවුන්ට සිදු වුණ දේ ඔවුන්ගේ දියණියන්ට නම් සිදු වන්නට ඉඩ තියන්නෙ නෑ කියන එකයි. ඒ පිළිතුරෙන් ඔබට තේරුම් ගන්නට පුළුවන් ඔවුන් කිසි දිනක ඒ දෙය ඔවුන්ගේ දියණියන්ට සිදු වන්නට ඉඩ නො තබන බව... කවුරු හරි කාන්තාවක් මට ඇවිල්ලා සිටියොත් ඇයට චර්මච්ඡේදනය ගැන කිසිවක් මතක නෑ කියලා ඒ අය ගැන මම සැලකිලිමත් වෙනවා... මම එවැනි කාන්තාවන්ගෙන් අහනවා ඔබ ඔබගේ දියණියටත් චර්මච්ඡේදනය සිදු කරන්නට බලාපොරොත්තු වෙනව ද කියලා... තම දියණියට චර්මච්ඡේදනය සිදු කරන්න බලාපොරොත්තුවෙන් සිටින කාන්තාවක් පසුගිය වසර 15 තුළ නම් මට මුණ ගැසිලා නැහැ."

එමැනුවෙලා මට තවත් තේ කෝප්පයක් ප්‍රදානය කළා ය. සිහින් එමෙන් ම උස සිරුරකින් හෙබි නිහඬ කාන්තාවක් වූ

එමැනුවෙලා තුළ සටන්කාමීත්වයක් තිබුණ අතර, ඇගේ අරමුණ පිළිබඳ ඇයට මහා වැටහීමක් ද තිබුණි. පසුගිය වසරේ ඇය වෙත පැමිණි එක් අප්‍රිකානු කාන්තාවක්, තම දියණියට චර්මච්ඡේදනය සිදු කිරීම සඳහා ඇය ව අප්‍රිකාවට යවන්නට ඇගේ ස්වාමියා සූදානම් වන බවට පැමිණිල්ලක් කර ඇත.

"අපි ඒ සම්බන්ධ ව රජයේ නීතිඥයා හමු වන්නට ගොස් ඊට විරුද්ධ ව පැමිණිල්ලක් ඉදිරිපත් කළා... රජයේ නීතිඥයා ඇගේ ස්වාමිපුරුෂයා කැඳවලා ඔහුට කියලා තියනවා දියණියගෙ ලිංගේන්ද්‍රිය හොඳ සෞඛ්‍ය තත්ත්වයක තිබෙන බවට වෛද්‍ය රපෝර්තු තිබෙන බවත්, ඇය අප්‍රිකාවට ගොස් ආපසු පැමිණි පසු පරීක්ෂණයකට ලක් කරන බවත්, එහි දී ඇගේ ලිංගේන්ද්‍රියේ කිසි යම් වෙනසක් සිදු වී තිබුණහොත් ඔහුට හිරගෙට යන්නට සිදුවෙන බව."

උදාහරණයක් වශයෙන් මෙවැනි තවත් සිද්ධියක් ඇය මට විස්තර කළා ය. එක්තරා කුඩා පාසල් දැරියක් තම ගුරුවරිය සමඟ මෙසේ පවසා ඇත. "මේ සැරේ අපි නිවාඩුවට අප්‍රිකාවට ගියා ම අපේ අම්මා ඉපදුණ ගමටත් යනවා... එහෙදි මා වෙනුවෙන් ලොකු සාදයක් තියන්නට යන නිසා දින කීපයක් පහුවෙලා තමයි මට පාසලට එන්නට ලැබෙන්නෙ." ඒ මොහොතේ ම ගුරුවරිය එමැනුවෙලාට දුරකතනයෙන් විස්තරය දන්වා ඇති අතර, පාසලේ ගුරු මණ්ඩලයට ද සිද්ධිය පිළිබඳ ව දන්වා ඇත. ගුරු මණ්ඩලය විසින් දැරියගේ පියා පාසලට කැඳවනු ලදු ව, අප්‍රිකාවේ දී සිය දියණිය වෙනුවෙන් පවත්වන්නට යන සාදය ගැන ප්‍රශ්න කර ඇත. එයින් බියට පත් ව ඇති දැරියගේ පියා ඇයට චර්මච්ඡේදනය සිදු නො කරන බව පවසා ඇත. එහෙත්, දැරියගේ ආරක්ෂාව සඳහා දැරිය නාරී වෛද්‍යවරයකු ලවා පරීක්ෂා කොට ආපසු පැමිණි පසුව ද පරීක්ෂාවකට ලක් කරන බව සිය පියාට දැනුම් දී ඇත. දැරිය නිවාඩුව ගත කොට නිරුපද්‍රිත ව ආපසු ප්‍රංශයට පැමිණ ඇත.

"ඒ කියන්නෙ මේ අන්තරාවට මුහුණ පා සිටින දැරියන් රැක ගැනීමට අපට ක්‍රම තිබෙනවා... ඒ උනත් බොහෝ දෙනාගේ මතය

මෙක නවත්වන්නට බෑ කියන එකයි... විශේෂයෙන් ම ප්‍රංශයෙන් පිට දී චර්මඡේදනය සිදුවන එක කොහෙත්ම නවත්වන්නට නො හැකි බව යි බොහෝ දෙනාගෙ මතය."

"ඒ කියන අයට පිස්සු" එම්මැනුවෙලා තරමක කේන්තියකින් කීවා ය. "ප්‍රාදේශීය අධිකරණයට එවැනි අන්තරාවක හෝඩුවාවක් දැන ගන්නට ලැබුණහොත් අදාළ පවුලට මොන ම හේතුවකට හෝ රටින් පිට වන්නට නො හැකි විධියට නීත්‍යානුකූල පියවර ගන්නට අධිකරණයට හැකියාව තියෙනවා... ඒ විතරක් නෙමෙයි අප්‍රිකාවෙ සමහර රටවල ස්ත්‍රී චර්මඡේදනය නීතියෙන් තහනම් කරලා තියෙනවා... උදාහරණයක් වශයෙන් අයිවරි කෝස්ට් (Cote d Ivoire) කියන රටේ චර්මඡේදනය නීතියෙන් තහනම්... පැරිසියෙ සෙන්ට් ඩෙනිස්වල සිටින රජයේ නීතිඥයාට පුළුවන් එවැනි අවස්ථාවක අයිවරි කෝස්ට්වල සිටින රජයේ නීතිඥයාට දුරකතනය මගින් එවැනි සිද්ධියක් සිදු වීමට යන බව දන්වන්නට... එවිට එහි දී නීතිය ක්‍රියාත්මක කරනවා... එතකොට ඒ අනතුරට මුහුණ පාන්නට සිටි දැරියට නිරුපද්‍රිත ව ගෙදර යන්න පුළුවන්. ඒකයි උපාය අවශ්‍ය... සමහර අවස්ථාවල නීතියටත් හොරා චර්මඡේදනය සිදුවන අවස්ථා තියෙන්නට පුළුවන්... නමුත් සහතික වශයෙන් ම මේ දැරියන් චර්මඡේදනයෙන් වළක්වා ගැනීමට දැන් අපට ක්‍රමවේදයක් තියෙනවා."

මා එම්මැනුවෙලා සමග සාකච්ඡා කරමින් සිටි අතර, තවත් තරුණයකු පැමිණ අපත් සමග එක් විය. ඔහු අප්‍රිකානු ජාතිකයකු වූ අතර, පෙනුම අප්‍රිකානු පොප් ගීත ගායකයකුට සමාන විය. ජීන්ස් කලිසමකින් සහ ටයි සවිලන කමිසයකින් සැරසී සිටි ඔහු උරහිස් දක්වා වූ දිගු කොණ්ඩය මතට පීරා තිබුණි. ඔහුගේ නම බරින් කුල් වූ අතර, සත්‍ය වශයෙන් ම හෙතෙම සංගීතඥයකු විය. බරින් කුල් ඉතා සංවේදී මෙන් ම උද්‍යෝගිලී පුද්ගලයකු ද විය. වයස අවුරුදු විසි අටක් වූ හෙතෙම අප්‍රිකාවේ මාලි රටේ සිට පැමිණි අයකු විය. මානව අයිතිවාසිකම් සහ සමාජ අසාධාරණයට විරුද්ධ ව ඔහු ගී තනු නිර්මාණය කර ඇත. කුඩා ළමුන් වහල් සේවයේ යෙදවීම, ළමා සොල්දාදුවන් සහ දරිද්‍රතාවය ගැන ඔහු

සිය ගීත මගින් ලොවට එම පණිවුඩය දෙන්නට සමත් ව ඇත. ස්ත්‍රී චර්මඡේදනය ගැන ඔහුට දැන ගැනීමට ලැබුණෙයින් පසු ව ඔහු "දැරියන් චර්මඡේදනයට ලක් කිරීම වැරදියි" යන මැයෙන් ගීතයක් රචනා කොට රෙගේ නමැති සංගීත ආරයට අනුව ගීතය නිර්මාණය කර ඇත. එම ගීතය සති දෙකක් පමණ ගුවන්විදුලිය ඔස්සේ විසුරුවා හරින ලදු ව, එකවර ම ගීතය විසුරුවා හැරීම ගුවන්විදුලි මධ්‍යස්ථානය මගින් නවතා දමා ඇත. එයින් සතුටට පත් නො වූ බරින් ප්‍රසිද්ධ ගායකයන් දෙදෙනකු ද එකතු කරගෙන නැවතත් එම ගීතය පටිගත කර ඇත. එහෙත්, ගුවන්විදුලි ආයතන ගීතය ප්‍රචාරය කිරීම ප්‍රතික්ෂේප කර තිබේ.

මාලි රටේ 80% පමණ ස්ත්‍රීන් චර්මඡේදනයට ලක් වී ඇති බැව් බරින් පැවැසුවේ ය. චර්මඡේදනය නො කරන ලද ස්ත්‍රීන් අපිරිසිදු බැව් ඉස්ලාම් ආගමේ නායකයින් දේශනා කරන බැව් බරින් තවදුරටත් කියා සිටියේ ය. ඔහුගේ ගීත ඇතුළත් කොට සංයුක්ත තැටියක් නිෂ්පාදනය කිරීමට බරින් කටයුතු කර ඇති අතර, ස්ත්‍රී චර්මඡේදනයට විරුද්ධ ව ඔහු නිර්මාණය කර ඇති ගීතය එයට ඇතුළත් කිරීමෙන් වැළකී සිටින ලෙස ඔහුට දන්වා ඇත. එමතු ද නො වේ. එම ගීතය ප්‍රසිද්ධියේ ගායනා කිරීමෙන් වැළකී සිටින ලෙස ද ඔහුට දන්වා ඇත. ඔහුට මරණීය තර්ජන එල්ල වන්නට පටන් ගෙන ඇති අතර, එවැනි වාතාවරණයක් තුළ දිගටම වාසය කරන්නට නො හැකි බැවින් හෙතෙම ආරක්ෂාව පතා ප්‍රංශයට පැමිණ ඇත.

"ස්ත්‍රී චර්මඡේදනය පිළිබඳ මගේ අදහස නම්... ඇත්තෙන් ම එය කාන්තා පක්ෂයට විරුද්ධ ව කරන සැහැසි ක්‍රියාවක් පමණක් නො වෙයි. එය කාන්තා පක්ෂයට කරන බලවත් අසාධාරණයක්" ඔහු කීවේ ය.

"මට ඒ ගීතය දැන් අහන්න පුළුවන් ද?" මම ඇසුවෙමි.

ඔහු සිය ගිටාරය අතට ගෙන ගීතය ගායනා කරන්නට පටන් ගත්තේ ය. ඔහුට විශිෂ්ට කටහඬක් තිබුණ අතර, ගීතයේ තනුව

සුගායනීය මෙන් ම මිහිරි තනුවක් විය. අනතුරු ව මම ඔවුන්ගෙන් සමුගෙන යන්නට සූදානම් වුණෙමි.

“පාරිස් සෙන්ට් ඩෙනිස් ප්‍රදේශයේ තත්ත්වය හරියට ම තේරුම් ගැනීමට නම් ඔබ ඒ ස්ථානවලට ගිහිල්ලා ම බලන්න ඕනෑ” එමැනුවෙලා මට සමු දෙමින් කීවා ය. පසුදින ඒ ස්ථාන බලන්නට යන බවට එමැනුවෙලාට මම පොරොන්දු වුණෙමි.

ප්‍රංශයට සංක්‍රමණය වූ බොහොමයක් දෙනා වාසය කරන්නේ පැරිසියේ සෙන්ට් ඩෙනිස් දිස්ත්‍රික්කයේ ය. ලන්ඩන්, බර්ලින්, රෝම් සහ නිව්යෝර්ක් වැනි සෑම අගනුවරක ම මෙන් මෙවැනි සංක්‍රමණිකයන් වාසය කරන ප්‍රදේශ ඇත. පිටරටියෙකු හෝ වන කිසිවෙක් මෙවැනි ප්‍රදේශයක ජීවත් වන්නේ ඉතාමත් කලාතුරකිනි. මෙහි වෙසෙන බොහෝ දෙනාකුට රැකියා නොමැති අතර, අධ්‍යාපන සුදුසුකම් ද නැත. සෙන්ට් ඩෙනිස් පිහිටා ඇත්තේ උතුරු පැරිසියේ ය. උමං දුම්රියෙන් පිටතට ආ විගස ඔබට දැක ගන්නට ලැබෙන්නේ විශාල වෙළඳ සංකීර්ණයකි. මා යා යුතු ස්ථානයට යන්නට හැකි බස්රථයක් ගැන බැලීමට මම බස් නැවතුම්පොළට ගියෙමි. එහි පැමිණෙන බස්රථවලින් පිටවන සෑම මගියකුගේ ම ගමන් බලපත්‍ර ගමනාගමන මණ්ඩලයේ නිලධාරීන් විසින් සෝදිසි කරනු මම දුටුවෙමි. ගමනාගමන මණ්ඩලයේ නිලධාරීන් පිටුපසින් සිටි පොලිස් නිලධාරීන් විසින් මගීන්ගේ වීසා බලපත්‍ර සෝදිසි කරනු ලැබුහ. එක් බස්රථයකින් වීසා නොමැති මගීන් අඩු ම වශයෙන් තුන් හතර දෙනකු හසු වන බව එක් පොලිස් නිලධාරියෙක් මා සමඟ කීවේ ය.

එමැනුවෙලා මා හට දුන් ලිපිනයේ වූ මවුවරුන් සහ කුඩා දරුවන් සඳහා වූ ආයතනය වෙත යන්නට මම බස් රථයට ගොඩනැගුණෙමි. බස්රථය තුළ එතරම් මගීන් ප්‍රමාණයක් සිටියේ නැත. එක්තරා චතුරශ්‍රයක් වෙත බස්රථය සේන්දු වූ අතර, එතැනින් මම බැස්සෙමි. එහි තට්ටු තුනකින් සමන්විත ගොඩනැගිල්ලක් විය. ඒ ගොඩනැගිල්ලේ වූ බැල්කනි මත සෝදන ලද රෙදි පිළි වේලෙන්ට දමා තිබුණි. ගොඩනැගිල්ල තුළ වූ එම ආයතනයට

ඇතුළු වනවාත් සමඟ ම මට කුඩා ළමුන්ගේ ඝෝෂාව ඇසෙන්නට විය. ඒ සමඟ ම ආයතනය තුළ කෙළවරේ වූ කුඩා කාමරයක අප්‍රිකානු කාන්තාවක් සිටිනු මම දුටුවෙමි. ඇය මා දෙස බලා කාරුණික ව සිනාසුණා ය. ඇගේ නම එලනෝරා වූ අතර, ඇය ආයතනයේ පාලිකාවරිය විය.

“ස්ත්‍රී චර්මච්ඡේදනය ගැන මට ඔබත් සමඟ කතා කරන්නට අවශ්‍යයි” මම කෙළින් ම ප්‍රශ්නය ඇයට ඉදිරිපත් කළෙමි.

පිටරටවල සිට පැරිසියට සංක්‍රමණය වන කාන්තාවන් හට මෙහි දී නව ජීවිතයක් ආරම්භ කිරීමට අවැසි ප්‍රංශ දැනුම ලබා දීම තම ආයතනයේ මූලික අරමුණ බව එලනෝරා පැවැසුවා ය. “අපි කරන්නෙ මේ කාන්තාවන්ට එදිනෙදා වැඩ කටයුතු කරගෙන යාමට උවමනා ප්‍රංශ දැනුම ලබා දෙන එකයි... දැන් උදාහරණයක් වශයෙන් ඉල්ලුම් පත්‍රයක් වැනි දෙයක් තනි ව ම ලියා ගන්නට අවැසි දැනුම අපි ඔවුන්ට ලබා දෙනවා... එතකොට ඒ අයට එවැනි දෑ ස්වාධීන ව කර ගන්නට පුළුවන් නෙ...”

“කාන්තාවන් ස්ත්‍රී චර්මච්ඡේදනය නමැති සැහැසි ක්‍රියාවෙන් බේරා ගන්නට ඔබගේ ආයතනය මඟින් සිදුවන සේවය කුමක්ද?” මම ඇසුවෙමි.

“ඒ සම්බන්ධ ව කාන්තාවන් දැනුවත් කිරීම සඳහා අධ්‍යාපන වැඩපිළිවෙළක් සකස් කරලා තියෙනවා... අපි පාසල්වලට ගිහිල්ලා ඒ සම්බන්ධ ව පැය දෙකක පමණ දේශනයක් පවත්වනවා... පැරිසියේ ඉපදුණ ළමයින්ගෙ දෙමවුපියන් අප්‍රිකානු වුවත් ස්ත්‍රී චර්මච්ඡේදනය ගැන ඒ ළමයි කිසිවක් දන්නෙ නෑ... මේ සම්බන්ධ ව අපි අප්‍රිකානු ළමයින් පමණක් නො වෙයි පොදුවේ සෑම ළමයකු ම දැනුවත් කරනවා.”

සමහර අවස්ථාවල චර්මච්ඡේදනය කරන ලද ළමුන් ද ඇගේ දේශනවලට සහභාගි වන අතර, භගශිශ්නිකාව තවදුරටත් ඔවුන් සතු ව නොමැති බැවින් භගශිශ්නිකාව යනු කුමක්දැයි ඔවුහු නො දනිති.

"ඔබගේ දේශනවලට සහභාගි වන එවැනි ළමුන්ට චර්මඡේදනයේ යථාර්ථය කියා දෙන විට ඔවුන් මානසික කම්පනයකට පත් වෙන්නෙ නැද්ද?" මම ප්‍රශ්න කළෙමි.

"ඇත්තවශයෙන් ම ඒ ළමයින්ට තමන්ට සිදු වී ඇති දේ ගැන එක පාරට ම වටහා ගන්න බැහැ... අර ඔබ කිව්වා වගේ පළමුවෙන් ම ඔවුන් තුළ මානසික කම්පනයක් ඇති වෙනවා... එවැනි දැරුවන්ගෙ හැසිරීමෙන් ඒක අපිට තේරුම් ගන්න පුළුවන්... ඇත්තෙන් ම අප්‍රිකානු සංස්කෘතියට අනුව ලිංගිකත්වය ගැන කතා කිරීම තහනම්... ටික වෙලාවකට පස්සෙ ඒ අය ප්‍රශ්න අහන්නට පටන් ගන්නවා."

"ඔබ කොහොම ද චර්මඡේදනය කර ඇති ළමයින් ව හඳුනා ගන්නෙ."

"මේ සම්බන්ධ ව අප ලබා ඇති අත්දැකීම් එක්ක ඒක අපිට ඉවෙන් වගේ තේරෙනවා... මම මේ විෂය සම්බන්ධ ව කතා කරන්නට පටන් ගන්න කොට සමහර ළමයි තුළ පසුබෑමක් දක්නට ලැබෙනවා... එවැනි ළමයකු සාකච්ඡාවට සහභාගී කර ගැනීම එතරම් ලේසි නෑ... චර්මඡේදනය සිදු කරලා තියෙනව ද කියලා ළමයින්ගෙන් ප්‍රශ්න කළහොත් ඔවුන් කියන්නෙ නෑ... නැතිනම් දන්නෙ නෑ කියලා..."

"ඒ ළමුන්ගෙ දෙමව්පියෝ දන්නව ද ඔබ පාසල්වලට ගොස් මේ විෂය සම්බන්ධ ව කතා කරන බව..."

"නැහැ... නමුත් විෂය මාලාවට අනුව ලිංගිකත්වය ගැන පාසල්වල උගන්වන බව ඔවුන් දන්නවා."

එලනෝරා සිනහවක් මුවගට නගා ගත්තා ය. ඇය මුළු සාකච්ඡාව පුරා ම කතා කළේ සිනාසෙමිනි. අප අතර වූ සාකච්ඡාවට අවසානයේ දී ඇය මෙසේ පැවසුවා ය.

"මගෙත් චර්මඡේදනය කරලයි තියෙන්නෙ... දේශනවලදී මට චර්මඡේදනය සිදු කරලා තියෙන බව සඳහන් කිරීමෙන් ළමයින්ට විශාල ආත්ම ශක්තියක් ලැබෙනවා... ස්ත්‍රී චර්මඡේදනය හේතුකොටගෙන ඇති වන්නට හැකි ප්‍රතිවිපාක ගැන ඔවුන්ට මම කියලා දෙනවා" ඇය නැවතත් සිනාසෙමින් කීවා ය.

"මම හිතන්නෙ පාසල්වල ඉන්න කුඩා දැරියන් සමග මේ විෂය කතා කරන්නට ඒ තරම් අපහසුවක් නෑ කියලා... කොහොම ද ඔබ වැඩිහිටි කාන්තාවන් සමග මේ සම්බන්ධ ව කටයුතු කරන්නෙ?"

"ඒ අය සම්බන්ධවෙන් අපි වැඩසටහනක් හදලා තියෙනවා... එවැනි අය වෙනුවෙන් අපි මැහුම් පන්තියක් පවත්වාගෙන යනවා... ඒ අතරතුර අපි එකතු වෙලා කතා කරන අවස්ථාවල මම මේ විෂය සාකච්ඡාවට සම්බන්ධ කරනවා... ඒ ගැන කතා කරන්න මුලදී තරමක පසුබෑමක් තිබුණත්, ඊට පස්සෙ ඔවුන් [illegible] ඒ ගැන කතා කරන්නට පටන් ගන්නවා... චර්මඡේදනය නිසා මානසික වේදනාවන්ට පත් වී සිටින අයට මෙවැනි කතාබහෙන් ලොකු සහනයක් ලැබෙනවා."

"චර්මඡේදනයට විරුද්ධ ව පනවලා තිබෙන නීති ගැන ඔබ ඔවුන්ට විස්තර කරලා දෙන්නෙ නැද්ද?" මම ඇසුවෙමි.

"ඒ අයට නීතිය ගැන පහදලා දෙන්නට යාමෙන් වැඩක් නෑ... ඒ අය අහනවා මොකක්ද ඒ අයට නීතියෙන් ඇති වැඩේ කියලා... ඒ අය කියන්නෙ චර්මඡේදනය ඒ අයගෙ අම්මලාට, අත්තම්මලාටත් කරලා තියෙනවා... ඒක චාරිත්‍රයක් කියලා තමයි ඒ අය කියන්නෙ... ඒ නිසා තමුන්ගෙ දියණියන්ටත් ඒක කෙරුව ම ඇති වැරැද්ද මොකක් ද කියලා අහනවා."

ඒ මොහොතේ මට ලින්ඩා සමග කළ සාකච්ඡාව සිහියට නැගුණි. චර්මඡේදනය සඳහා වැරැදිකරුවන් වන ඇතැමුන්ට ලැබෙන දඬුවම ගැන මේ කාන්තාවන් දැනුවත් ද?

'මේ සම්බන්ධ ව නීතියෙන් වරදකරුවන් බවට පත්වුණු අය බොහොමයක් සිටිනවා... සමහර අවස්ථාවල අධිකරණය සමග

අපිත් සහයෝගයෙන් කටයුතු කරනවා... ඒ වුණත් මම අදහස් කරන හැටියට ගැහැනියක් නීතිය මඟින් හිරගෙට යැවීමෙන් ඇති පලක් නෑ... මම හිතන විදිහට වඩාත් ම ඵලදායී ක්‍රමය තමයි ඔවුන් සමඟ මේ සම්බන්ධ ව නිතර ම සාකච්ඡා කිරීම... ස්ත්‍රී චර්මඡේදනය නීතියෙන් තහනම් කරලා තියෙන එක හොඳ දෙයක්... එමගින් මේ රට ඇතුළෙ චර්මඡේදනය සිදු කරන්නට උත්සාහ ගන්න අය අඩු වෙනවා... නමුත් දැරියන් මෙරටින් පිටට ගෙනිහිල්ලා චර්මඡේදනය සිදු කිරීම නවත්වන්නට බැහැ."

"දැරියකට චර්මඡේදනය සිදු කළ බව ඔබට දැන ගන්නට ලැබුණොත් ඒ සම්බන්ධ ව ඔබ ගන්න ක්‍රියාමාර්ගය කුමක්ද?" මම ඇසුවෙමි.

"ප්‍රාථමික පාසල්වල සිටින දැරියන් අපි පරීක්ෂාවට ලක් කරනවා... චර්මඡේදනය කර ඇති දැරියක් හමුවුණොත් අපි වහාම ඒ සම්බන්ධ බලධාරීන්ට දැනුම් දෙනවා... වැඩිහිටි තරුණියන් සම්බන්ධයෙන් ඒ ආකාරයෙන් ක්‍රියා කරන්නට අපිට බෑ... එහෙම කළොත් ඔවුන්ට අපි ගැන තියෙන විශ්වාසය නැති ව යනවා."

එලනෝරා තුළ වූ කිසිවකින් නො සැලෙන සර්වඥවාදී ආකල්පය ඇත්තෙන් ම ප්‍රශංසනීය යි. මා ඇගෙන් සමු ගන්නා මොහොතක වන විට අප දෙදෙන හෝරා දෙකකට ආසන්න කාලයක් මේ සම්බන්ධ ව සාකච්ඡා කර තිබුණි.

සෙන්ට් ඩෙනිස්හි ජීවත් වන අප්‍රිකානු ජාතිකයින්ගේ මතකය කරපින්නාගෙන මම මගේ හෝටලය වෙත ගියෙමි.

පසු දින උදෑසන. ස්ත්‍රී චර්මඡේදනයට ගොදුරු වූ දහස් ගණනක් ස්ත්‍රීන් බලාපොරොත්තු තබා ඇති වෛද්‍ය පියා ෆොල්ඩ්ස් හමුවීමට එදිනට යෙදී තිබුණි. මා තුළ කිසි යම් නොසන්සුන්තාවයක් ඇති වන්නට විය. ස්ත්‍රී චර්මඡේදනයේ දී ස්ත්‍රියට අහිමි වී යන භගශිෂ්නිකාව නැතහොත් භගමනිය නැවත ප්‍රතිසංස්කරණය කිරීමට හැකි ශල්‍යකර්ම විධි ක්‍රමයක් වෛද්‍ය පියා ෆොල්ඩ්ස් සොයාගෙන ඇත.

"මේ කියන ශල්‍යකර්මය ඇත්තෙන් ම කළ හැකි දෙයක් ද...? මගේ ප්‍රශ්නය නිරාකරණය කර දීමට ඔහුට හැකි වේ ද...? ඇත්තෙන් ම මට ඔහුගෙන් එවැනි උපකාරයක් අවශ්‍ය ද?" මෙවැනි ප්‍රශ්න මා තුළ දෝංකාර වන්නට විය.

වෝල්ටර් සහ ජූලියා ද මා සමඟ ගමනට එක් වූයෙන් මා තුළ වූ නොසන්සුන්තාවය තරමක් මඟ හැරී යන්නට විය. මේ වන විට වෛද්‍ය පියා ෆොල්ඩ්ස් විසින් එවැනි ශල්‍යකර්ම තුන්සියයක් පමණ කර ඇති අතර, ශල්‍යකර්මය කරවා ගැනීම සඳහා තවත් සිය ගණනක් ස්ත්‍රීන් බලා සිටින බැව් මා හට දැනගන්නට ලැබුණි. මෙම ශල්‍යකර්මය කිරීමට හැකි එක ම වෛද්‍යවරයා පියා ෆොල්ඩ්ස් බවත්, ඔහු තවත් වෛද්‍යවරුන් මේ සඳහා පුහුණු කරමින් සිටින බැව් තවදුරටත් දැනගන්නට ලැබුණි. වෛද්‍ය පියා ෆොල්ඩ්ස් මුණ ගැසීමට මෙතෙක් මා පෙරුම් පුරමින් සිටි නමුදු ඒ මොහොතේ ඔහු හමුවීම පිළිබඳ මා තුළ දෙගිඩියාවක් ඇති විය. මා ඔහු හමුවීමට නියමිත ව තිබුණේ ඉතා පුද්ගලික කරුණක් වූ මීට වසර ගණනාවකට පෙර කපා දමන ලද මගේ භගශිෂ්නිකාව සහ මගේ ලිංගිකත්වය පිළිබඳ කතා කිරීමට වීම ඊට හේතු වූවා විය හැකි ය.

වෛද්‍ය පියා ෆොල්ඩ්ස් අප එනතුරු බලා සිටි අතර, මා ඔහු දුටු විගස මෙතෙක් මා තුළ වූ නොසන්සුන්තාවය පහ ව ගියේ ය. කිත්දැරි උස පුද්ගලයකු වූ හෙතෙම සිනාවක් මුවග රඳවාගෙන අප ව පිළි ගත්තේ ය. ඔහුගේ හැසිරීම මා තුළ විශ්වාසයක් ඇති කිරීමට සමත් විය. ඔහුගේ ශල්‍යාගාරය හොඳින් පිළියෙළ කර තිබුණ අතර, එක් බිත්තියක අප්‍රිකාවේ සිත්තුර එල්ලා තිබුණි.

වෛද්‍ය ෆොල්ඩ්ස් ඔහුගේ කාමරය තුළට පැමිණ අසුන් ගන්නා ලෙස මට ආරාධනා කළේ ය.

"මම ශල්‍ය වෛද්‍යවරයෙක් සහ මූත්‍රලිංගික රෝග විශේෂඥයෙක්. ඒ වගේ ම ආසියාවේ වෛද්‍යවරු වෙනුවෙන් ලෝක වෛද්‍යවරුන්ගේ කොමිටිය නියෝජනය කරන්නෙ මම... බුර්කිනා ෆාසෝවල දී අවුරුදු විස්සක් පමණ මම මේ විෂය

ගැන හැදෑරුවා... භගශිෂ්නිකාව ප්‍රතිසංස්කරණය කිරීමට හැකි ක්‍රමවේදයක් දැන් ප්‍රංශෙ තිබෙනවා... එම ක්‍රමවේදය ප්‍රංශයේ ජාතික වෛද්‍ය ඇකඩමිය සහ සෞඛ්‍ය රක්ෂණය අනුමත කරලා තිබෙනවා" ඔහු තමා හඳුන්වා දෙමින් විස්තර කළේ ය.

"ඒ ක්‍රමය බොහොම සරල ක්‍රමයක්... අපි කරන්නෙ ස්ත්‍රී චර්මච්ඡේදනයේ දී භගශිෂ්නිකාව කපා ඉවත් කරන ලද ස්ථානයේ කැළලට යටින් ඇති සියුම් හම කපා භගශිෂ්නිකාවේ තවමත් ඉතිරි ව ඇති නිරෝගී කොටස මතුකර ගැනීම යි... භගශිෂ්නිකාව සෙන්ටිමීටර් එකොළහක් පමණ දිගු ඉන්ද්‍රියක් නිසා එහි වැඩි කොටස තිබෙන්නෙ හමට යටින්" ඔහු තවදුරටත් විස්තර කළේ ය.

"ඒ කියන්නෙ චර්මච්ඡේදනයෙන් පසුවත් භගශිෂ්නිකාවෙ කොටසක් ඉතිරි වෙනවා... චර්මච්ඡේදනයෙන් පසු ගත හම ඉතිරි වෙනවා... අධික ලෙස රුධිරය වහනය වන විට ඒ ස්ථානයේ ඇති වී ඇති සිදුරට රුධිරය පිරීම හේතුකොටගෙන භගශිෂ්නිකා ඉතුරු කොටස ඇතුළට තල්ලු වෙනවා... ශල්‍යකර්මයේ දී අපි කරන්නෙ ඒ සියුම් හම කපා ඊට යටින් ඇති නිරෝගී ස්නායු සහ රුධිරය වහනය වන නළ මතුකර ගැනීම... ඊට පසු ව අපිට භගශිෂ්නිකාව ප්‍රතිසංස්කරණය කිරීමට හැකි වෙනවා."

"ශල්‍යකර්මයට කොපමණ වෙලාවක් ගත වෙනව ද?"

"පැය එකහමාරක්... ඒ කියන්නෙ විනාඩි අනූවකට පස්සෙ සාමාන්‍ය භගශිෂ්නිකාවක් ඔබට ලැබෙනවා" වෛද්‍යවරයා පිළිතුරු දුන්නේ ය.

වසර ගණනාවක් පුරා මා විඳින වේදනාව, මට මුහුණ පාන්නට සිදු වී ඇති ලජ්ජාව, නින්දාව සහ මානසික කම්පනය යන මේ සියල්ලෙන් ම ඔය තරම් ඉක්මනට මිදෙන්නට හැකි ද?

වෛද්‍යවරයා කළ විස්තරය අසා සිටි මා ගොළු වුණෙමි. පෙර තිබූ නො සන්සුන්තාවය නැවතත් මා තුළ හැඟී එන්නට විය. බ්ලේඩ් තලයක්, පිහියක් වැනි ආයුධයක් රැගෙන අවුත් මගේ යෝනිය පිරිමදින්නට නැවත විනාඩියක් ඉඩ දිය යුතු ද යන

සිතුවිල්ල ඒ මොහොතේ මා තුළ මහත් කම්පනයක් ඇති කිරීමට සමත් විය.

"චර්මච්ඡේදනයට මුහුණ දුන් ගැහැනියක් වශයෙන් එවැනි ශල්‍යකර්මයකට නැවත මුහුණ දීම එතරම් ලේසි කරුණක් ද?" අනෙක් අතට එදා මගෙන් උදුරා ගත් මගේ ගැහැනුකම නැවත ලබා දී ම යන හැඟීම... හොඳයි... මෙතෙක් මේ ශල්‍යකර්මයට මුහුණ දී ඇති කාන්තාවන්ගේ තත්ත්වය කුමක්ද? ඒ අය නැවත ඔබ හමුවීමට පැමිණිලා තිබෙනව ද?" මම ප්‍රශ්න කළෙමි.

"ඔව්... මා හමුවීමට නැවත පැමිණීම ඉතා වැදගත්... මේ ශල්‍යකර්මයට මුහුණ දුන් සෑම අයෙක් ම සති දෙකකින්, සති හතරකින්, මාස හයකින් සහ අවුරුද්දකට වරක් මා ළඟට පැමිණිය යුතුයි... එය ඉතා ම වැදගත්" වෛද්‍ය ෆෝල්ඩ්ස් විස්තර කළේ ය.

"වැදගත්?" ඒ වචනය ඉබේ ම මගේ මුවින් පිට විය.

"ඔව්... ඉතාමත් වැදගත්... ඊට හේතුව ඒ අයට ජීවිතයෙ මෙතෙක් අත් නො දුටු සංවේදිතාවයක් හැඟීමක් දැනෙන්නට පටන් ගන්නවා... ඒ අය මාව ම හමුවිය යුතු නෑ... මගේ වෛද්‍ය කණ්ඩායමේ සිටින වෛද්‍යවරයෙක් හමුවීම ප්‍රමාණවත්. මගේ වෛද්‍ය කණ්ඩායම මා වෙත ඉදිරිපත් කර ඇති වාර්තාවලට අනුව මෙම ශල්‍යකර්මයට මුහුණ දුන් සෑම කාන්තාවකට ම නැවතත් හැඟීම් දැනීම ඇති වන්නට පටන් ගෙන තිබෙනවා... මගේ තක්සේරුවට අනුව 80% පමණ කාන්තාවන් සාර්ථකත්වයක් ලබලා තිබෙනවා... අපි මේ සම්බන්ධ ව තවදුරටත් අධ්‍යයනයක් කරගෙන යනවා... තාම ඒ පර්යේෂණ ඉවර නැහැ."

එනම් සියයට අසූවකට තමුන්ට අහිමි වී ගිය ස්ත්‍රීභාවය නැවත ලැබෙනවා. මා තුළ බලාපොරොත්තුවක් ලියලා වැඩෙන්නට පටන් ගැනිණ.

"එවැනි ශල්‍යකර්මයක් මට බලන්නට පුළුවන්කමක් තියෙනව ද?" මම මහත් ප්‍රමෝදයකින් ඇසුවෙමි.

"ඔබ බලන්නට පුළුවන්... මොනව ද ඔබට බලන්නට අවශ්‍ය" වෛද්‍ය පෝල්ඩ්ස් ඇසුවේ ය.

"මට සම්පූර්ණ ශල්‍යකර්මය මුල ඉඳලා අවසානය දක්වා බලන්නට ඕනෑ... ශල්‍යකර්මයෙන් පස්සෙ භගශිශ්නිකාවෙ ස්වරූපය කොහොම ද කියන එකත් බලන්නට ඕනෑ" මම කීවෙමි.

"මට පුළුවන් සම්පූර්ණ ශල්‍යකර්මයක් වීඩියෝ මගින් ඔබට පෙන්වන්න" වෛද්‍යවරයා කීවේ ය.

වෛද්‍ය පෝල්ඩ්ස් වීඩියෝ යන්ත්‍රය ක්‍රියාත්මක කළේ ය. එකවර ම අඳුරු පසුබිම මත ගැහැනියකගේ නිරුවත් රූපයක් දෘශ්‍යමාන විය. ස්ත්‍රී යෝනිය එහි පැහැදිලි ව දිස්විය. "මේ තියෙන්නෙ භගශිශ්නිකාව සාමාන්‍යයෙන් පෙනෙන ආකාරය... මේ තියෙන්නෙ හමට යටින් ඇති කොටස... දැන් ඔබට පැහැදිලි ව පේනවා ඇති භගශිශ්නිකාවෙ සාමාන්‍යයෙන් පෙනෙන කොටස වඩා හමට යටින් ඇති කොටස දිග බව" වෛද්‍යවරයා විස්තර කළේ ය.

ස්ත්‍රී චර්මච්ඡේදනයේ දී භගශිශ්නිකාව කපා හරින ලද යෝනියක රූපයක් තිරය මත පතිත විය. "මේ රූපයෙන් දැක්වෙන්නෙ භගශිශ්නිකාව කපා හැරීමෙන් පසු පෙනෙන අයුරුයි... බටහිර අප්‍රිකාවෙ සහ නැගෙනහිර අප්‍රිකාවෙ මෙහි පෙන්නුම් කරනවට වඩා ටිකක් වැඩියෙන් කපා හරිනවා" ඔහු රූපය මත ඇඟිල්ල තබා පෙන්වා දෙමින් විස්තර කළේ ය.

වෛද්‍ය පෝල්ඩ්ස්ට නම් මෙම ශල්‍යකර්මය නුදෙක් යාන්ත්‍රික ක්‍රියාදාමයක් පමණි.

"මේ කහ පාටින් ඇති ස්ථානයේ යට තමයි නිරෝගී ස්නායු තියෙන්නෙ... අපි කරන්නෙ මේ සියුම් හම් පටලය කපා භගශිශ්නිකාවෙ නිරෝගී ස්නායු මතු කර ගැනීමයි. (තිරය මත දිස් ව ඇති යෝනියේ එක් ස්ථානයකට ඇඟිල්ල තබා පෙන්වමින්) ඊට පස්සෙ එම ස්නායු තරමක් දික්කර ගැනීම සඳහා මේ ස්ථානයේ හම කපන්නට සිදු වෙනවා... මෙන්න මේ ආකාරයට දැන් අපිට පුළුවන් ඒ නිරෝගී ස්නායු මතු පිටට අරගෙන නැවත භගශිශ්නිකාව ප්‍රතිසංස්කරණය කරන්නට."

වෛද්‍යවරයා ශල්‍යකර්මය සිදු වන ආකාරය විස්තර කිරීමෙන් පසු මා කුමක් කිව යුතුදැයි ඒ මොහොතේ මට සිතා ගන්නට නො හැකි විය. ඒ වන විට මෙතෙක් මා තුළ තිබූ උනන්දුව නැති වී ගොස් මා තුළ හිස් බවක් ඇති වීම ඊට හේතුව වුවා විය හැකි ය. වීඩියෝ තිරය මගින් මෙතෙක් මා දුටු රූපවල කිසි යම් කෘත්‍රිමත්වයක් ඇතැ යි මට සිතුණි. එහෙත්, ඒ මොහොතේ කිසි යම් දෙයක් මා පැවැසිය යුතු වූ බැවින් මම වෛද්‍යවරයාගෙන් මෙසේ ප්‍රශ්න කළෙමි.

"කොහොම ද ඔබ භගශිශ්නිකාවෙ ප්‍රමාණය දිගු කරන්නෙ?"

"අපි එහෙම දිගු කිරීමක් කරන්නෙ නැහැ... මේ බලන්න." ඔහු තවත් රූපයක් තිරය මත පතිත වීමට සලස්වමින් කීවේ ය.

"ඩොක්ටර්" මම ඔහුට බාධා කරමින් කතා කළෙමි.

ඔහු එකවර ම පුදුමයෙන් මෙන් මා දෙස බැලුවේ ය. ඔහුට මා මෙසේ බාධා කිරීම ඔහු බලාපොරොත්තු නො වූ බව වෛද්‍යවරයාගේ ඉරියව්වලින් මම දැන ගතිමි.

"ඩොක්ටර්... අපි මෙහෙම වාඩි වී කතා කළාට මට පමණක් නො වෙයි, ඕනෑ ම ගැහැනියකට මේවා තේරුම් ගැනීම එතරම් ලෙහෙසි නෑ."

"එක හරි" වෛද්‍යවරයා සිය නෙත් වීඩියෝ තිරය මතින් ඉවතට ගනිමින් කීවේ ය.

මා තුළ වූ නො සන්සුන්තාවය මැඩ පවත්වා ගත් මම සෘජු ව ඔහුගේ මුහුණ දෙස බැලුවෙමි. ඔහුගේ කෙස් ඉදී තිබුණ ද ඔහු අවුරුදු හතළිහක තරම් තරුණයකු විය. මා තුළ ඇති වී ඇති කලබගෑනිය ගැන ඔහුට තේරුණේ දැ යි මම නො දනිමි.

මා දිගට ම කතා කරනු ඇතැ යි ඔහු බලාපොරොත්තු වූවා විය හැකි ය. ස්ත්‍රී චර්මච්ඡේදනයට භාජන ව සිටින ගැහැනියකගේ හැඟීම් ගැන අවබෝධයක් ඔහුට ඇත් ද යි මම නො දනිමි. එකවර ම ඔහුගේ දෙනෙත් කිසි යම් බලාපොරොත්තුවකින් ආලෝකවත් වන්නට විය. එකවර ම මා තුළ ඔහු කෙරෙහි මහත් කෘතඥතාවක් ඇති විය. "වෛද්‍යවරයකු වශයෙන් ඔබ කරන සේවය මම අගය කරනවා" ඒ වචන මගේ මුවින් පිටවූයේ නිරායාසයෙනි.

"බොහොම ස්තූතියි" ඔහු සිය දෙඅත් දෙස බලා තරමක පැකිළීමකින් කීවේ ය.

"ඇත්තෙන් ම මේ ශල්‍යකර්මයෙන් කාන්තාවන්ට විශාල යහපතක් සැලසෙනවා... භගශිශ්නිකාව කපා දැමූ ස්ථානයේ කිසි ම සංවේදීත්වයක් නැහැ... සංවේදී ස්නායුන් ඊට යටින් තියෙන්නෙ... ඒ සම්බන්ධ ව විද්‍යුත් උත්තේජනයක් උපයෝගී කරගෙන ඒ සම්බන්ධව අපි කළ පරීක්ෂණයෙකින් ඒ බැව් ඔප්පු උනා... භගශිශ්නිකාව ප්‍රතිසංස්කරණය කරන ශල්‍යකර්මයක දී ගත්තු පින්තූර කීපයක් මා ළඟ තියෙනවා ඔබ කැමැති ද බලන්න."

"ඔව්" එම පින්තූර බලන්නට මා තුළ කැමැත්තක් නො තිබුණත් මම එසේ කීවෙමි.

ඔහු පරිගණකය මගින් පින්තූර ප්‍රදර්ශනය කරන්නට පටන් ගත්තේ ය. පළමුවන පින්තූරය චර්මච්ඡේදනය කරන ලද අප්‍රිකානු ගැහැනියකගේ යෝනියක පින්තූරයකි. එහි භගශිශ්නිකාව සහ යෝනි තොල් සම්පූර්ණයෙන් ම කපා ඉවත් කර තිබුණි. සමතලා වී ගිය හම හැරුණු කොට එහි කිසිවක් පෙනෙන්නට නො වී ය. එය මට හුරු පුරුදු චිත්‍රයකි. එම ඡායාරූපය දැකීමෙන් මා තුළ කිසි යම් දුර්වලත්වයක් ඇති වන්නට පටන් ගත්තේ ය. ඊ ළඟට පරිගණක තිරය මත දිස් වූයේ චර්මච්ඡේදනයේ දී භගශිශ්නිකාව කපා ඉවත් කරන ලද ස්ථානයේ හම කපා විවෘත කර තිබූ ඡායාරූපයකි. කළු හමට යටින් වූ රතු පාට මස් එහි පැහැදිලි ව පෙනෙන්නට තිබුණි. මගේ හෘද ස්පන්දන වේගවත් වන්නට වූයෙන් හුස්ම

ගැනීම ද තරමක් අපහසු විය. එකවර ම මා හට චර්මච්ඡේදනය සිදු කළ අවස්ථාව මගේ මනසට ගලා එන්නට වූයෙන් ඉබේට ම මට හැඬුණි. වෛද්‍ය ෆෝල්ඩ්ස් නිගැස්සී මා දෙස බලා සිටින්නට විය. මම ඔහුගෙන් අවසර ගෙන වැසිකිළියට ගියෙමි. වැසිකිළිය තුළ දී මට තද සීතලක් දැනෙන්නට විය. කොපමණ වේලාවක් මා වැසිකිළිය තුළ සිටියේ දැ යි මම නො දනිමි. මා තුළ හට ගත් භීතිය ක්‍රම ක්‍රමයෙන් පහ ව යන්නට විය. කඳුළු පිසදා ගත් මම වැසිකිළියෙන් එළියට පැමිණියෙමි.

වෛද්‍ය ෆෝල්ඩ්ස් නැවත පරිගණකය ක්‍රමයෙන් ක්‍රියාත්මක කොට මා හට තවත් යමක් පෙන්වන්නට සූදානම් විය.

"මේ ශල්‍යකර්මය සඳහා එන ස්ත්‍රීන් ශල්‍යකර්ම කීපයකට මුහුණ දෙන්නට සිදු වෙනව ද?" මම ප්‍රශ්න කළෙමි.

"නැහැ... එක ශල්‍යකර්මයයි කෙරෙන්නෙ" වෛද්‍යවරයා මා පත්වූ තත්ත්වය ගැන කිසි ම අවධානයක් නො දක්වා පිළිතුරු දුන්නේ ය.

මෙතෙක් හිඳගෙන සිටි අසුනින් නැගී සිටි මම වෛද්‍යවරයාට අතට අත දී සමු ගතිමි. සිනහවක් මුවග රඳවා ගත් වෛද්‍යවරයා අප යන දෙස බලා සිටින්නට විය. පසුදින උදෑසන අපි පැරිසියෙන් පිට වන්නට පෙර ලින්ඩාගෙන් මට දුරකතන ඇමතුමක් ලැබුණි. "වාරිස් ගැහැනු ළමයකු වන්දි ඉල්ලා සිය දෙමව්පියන්ට විරුද්ධ ව දමා ඇති නඩුවක් නොවැම්බර් මාසයේ අග දී අහන්නට පටන් ගන්නවා... ඒක බලන්නට එන්න." මම ඇගේ ඉල්ලීමට එකඟ වුණෙමි.

3

ස්ත්‍රී චර්මඡේදනය නැවැත්විය යුතුයි

වෛද්‍ය පියා ෆෝල්ඩ්ස් විසින් කරගෙන යනු ලබන ශල්‍යකර්මය ගැන කොහෙත්ම අවතක කර දැකීමට නො හැකි ය. ඔහු මේ කරනු ලබන්නේ අප වැන්නන්ට උපකාරයක් ද? එයින් මා වැනි ගැහැනුන්ට කිසි යම් හෝ සෙතක් සැලසේ ද? මේ සම්බන්ධ ව පුළුල් අවබෝධයක් ලබා ගැනීමට මම අපගේ කණ්ඩායමින් සමග සාකච්ඡා කිරීමට තීරණය කළෙමි. භගශිශ්නිකාව ප්‍රතිසංස්කරණය කිරීමේ ශල්‍යකර්මය පිළිබඳ පුළුල් අත්දැකීමක් ඇති වින්නඹු ස්ත්‍රියක් ලන්ඩන් නගරයේ සිටින බවත්, ඈ හමුවිය යුතු බැව් කොරින්නා යෝජනා කළා ය. ඇගේ නම Morroh බවත් ඇය කෙසේ හෝ හමුවිය යුතු බැව් කොරින්නා අවධාරණය කළා ය.

ලන්ඩන් නගරය ගැන ඇසීමෙන් මා තුළ මහත් ප්‍රබෝධයක් නැගී ආවේ නිරායාසයෙනි. මා පළමු වරට යුරෝපයේ පය තැබූ

නගරය ලන්ඩන් නගරය වීම ඊට හේතු වූවා විය හැකි ය. එවකට එංගලන්තයේ සෝමාලියානු තානාපතිවරයා වශයෙන් කටයුතු කළ මගේ මාමා ඇතුළු සිය පවුල ලන්ඩන් හැර යාමෙන් පසු ශිෂ්‍ය නිවාසයක නවාතැන් ගත් මම පසු ව මැක්ඩොනල්ඩ් ආපන ශාලාවක රැකියාවක් සොයා ගතිමි. මැක්ඩොනල්ඩ් ආපන ශාලාවේ රැකියාව කරමින් සිටින අතර, විලාසිතා නිරූපණ ශිල්පිනියක් වන්නට මට අවස්ථාව පෑදිණ. ඇත්තෙන් ම යුරෝපයේ අනෙකුත් නගර අතුරෙන් ලන්ඩන් නගරයට මා තුළ සුවිශේෂ ඇල්මක් ඇත.

මහා බ්‍රිතාන්‍යය, ප්‍රංශයට වඩා වෙනස් රටකි. බ්‍රිතාන්‍යයේ ජනගහනය මිලියන හැටක් වන අතර, එයින් මිලියන දෙකක් පිටරටවලින් බ්‍රිතාන්‍යයට සංක්‍රමණය වූවන් ය. එයින් තුන්ලක්ෂ පනස්දහසක් පමණ දෙනා සෝමාලියා, ඉතියෝපියා, නයිජීරියා, සුඩාන්, කෙන්යා සහ මාලි යන අප්‍රිකානු රටවලින් පැමිණි සංක්‍රමණිකයන් ය. ඉහත සඳහන් එක් එක් රටවලින් බ්‍රිතාන්‍යයට පැමිණ සිටි සංක්‍රමණිකයින්ගේ ප්‍රමාණය දැන ගන්නට ක්‍රමයක් නැත. බ්‍රිතාන්‍යයේ ජනලේඛන සකස් කරන්නේ ඒ ඒ සංක්‍රමණිකයන් පැමිණි රටවල් අවධානයට ගැනීමට වඩා සංක්‍රමණිකයින්ගේ සමේ වර්ණය සහ මානවංශිකත්වය පදනම් කරගෙන වීම ඊට හේතුවයි. ඇත්තෙන් ම ඔවුන් ඒ ආකාරයෙන් ක්‍රියා කරන්නේ කුමන හේතුවක් පෙරදැරි කරගෙන ද යි යන්න මට තේරුම් ගැනීමට නො හැකි ය. අප සියලු ම දෙනා මනුෂ්‍යයින් වන බැවින් මිනිසුන්ගේ සමේ පාට අනුව ඔවුන් වර්ගීකරණය කරන්නේ මන්ද?

බ්‍රිතාන්‍යයට සංක්‍රමණය වී සිටින පිටරටියන්ගෙන් වැඩි කොටසක් ජීවත් වන්නේ ලන්ඩන් නගරයේ වුව ද, මැන්චෙස්ටර්, කාඩිෆ් සහ ලිවර්පූල් යන නගර ස්ත්‍රී චර්මඡේදනය සම්බන්ධ ව ප්‍රසිද්ධියක් උසුලයි. වසරක පමණ කාලයක් මා කාඩිෆ් නගරයේ පදිංචි වී සිටි අතර, එහි සෝමාලියානු ජාතිකයන් විසිදහසක් පමණ වෙසෙති. ස්ත්‍රී චර්මඡේදනයට විරුද්ධ ව ක්‍රියා කරන "ෆොවර්ඩ්" නමැති සංවිධානය මගින් ගවේෂණය කර ඇති දත්තවලට අනුව අටදහසක් පමණ ස්ත්‍රීන් මෙම ව්‍යසනයට ගොදුරු වී ඇත. එහෙත්,

බ්‍රිතාන්‍යයේ උපත ලද හෝ එහි හැදී වැඩුණ දැරියන් කොපමණ සංඛ්‍යාවකට චර්මඡේදනය සිදුකර ඇත් ද යන්න සම්බන්ධ ව නිශ්චිත සංඛ්‍යාලේඛන නොමැත. එහෙත් තවත් හන්දාහක් පමණ දැරියන් මෙම අන්තරාවට මුහුණ දෙන්නට සිටින බැව් අනුමාන කෙරේ. බොහොමයක් දෙනාගේ චර්මඡේදනය සිදු කෙරෙන්නේ ඔවුන්ගේ මව් රටවල්වල වූ අතර, මෙම ශල්‍යකර්මය මහා බ්‍රිතාන්‍යය තුළ කොපමණ දෙනෙකුට සිදුකර ඇත් දැ යි යන්න කිසිවකු නො දනී. ස්ත්‍රී චර්මඡේදනයට විරුද්ධ ව කටයුතු කරන සියලු ම සංවිධානවල මතයට අනුව අනෙකුත් යුරෝපීය රටවල මෙන් ම මහා බ්‍රිතාන්‍යය තුළ ද චර්මඡේදනය සිදු වේ. ස්ත්‍රී චර්මඡේදනය බ්‍රිතාන්‍යය තුළ නීති විරෝධී ක්‍රියාවක් වුවත් නීතිය ක්‍රියාත්මක වන්නේ ඉතාමත් මන්දගාමී ව ය. තරුණ ගැහැනු ළමුන් චර්මඡේදනයෙන් බේරා ගැනීමට නිසි ක්‍රමවේදයක් බ්‍රිතාන්‍යය තුළ පෙනෙන්නට නොමැත. බ්‍රිතාන්‍ය ජනතාව පොලීසියේ ලියාපදිංචි කිරීමක් සිදු නො වන අතර, වෛද්‍ය පරීක්ෂණයන්ට පෙනී සිටීම ද අනිවාර්ය කරුණක් වශයෙන් නො සැලකේ.

සංක්‍රමණිකයන් ප්‍රධාන සමාජ ප්‍රවාහයට අවශෝෂණය කර ගැනීම සඳහා ප්‍රංශ රජය දැඩි ලෙස උත්සාහ කරන අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන් ප්‍රංශය තුළ උපත ලබන සංක්‍රමණිකයින්ගේ දරුවන්ට නිතැතින් ම ප්‍රංශ පුරවැසි භාවය ලැබේ. එහෙත්, බ්‍රිතාන්‍යයේ උපදින පකිස්තාන්, ඉන්දියන් හෝ සෝමාලියන් ආදි රටවල දරුවන්ට එවැනි වරප්‍රසාදයක් බ්‍රිතාන්‍යය තුළ ලබා ගැනීමට නො හැකි ය. මෙවැනි වාතාවරණයක් තුළ බ්‍රිතාන්‍යයේ ජීවත් වන පිටරටියන් අනිවාර්යයෙන් ම කොන් වෙන අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන් ඔවුන්ගේ සම්ප්‍රදායන් සහ චාරිත්‍ර ප්‍රධාන තැනක් ගනී. සුදු ජාතිකයින් අප්‍රිකානු ජාතිකයින් වෙත දක්වන ගරු සැලකිලි ඉතාමත් අල්ප ය. කරුණු එසේ වුව ද මහා බ්‍රිතාන්‍යය ස්ත්‍රී චර්මඡේදනයට විරුද්ධ ව නීත්‍යානුකූල පියවර ගත් මුල් ම රටවල් අතරින් එක් රටකි. එහෙත්, මෙම ප්‍රශ්නය නිරාකරණය කිරීමට නීතිය පමණක් ප්‍රමාණවත් නො වන්නේ ය. මහා බ්‍රිතාන්‍යය තුළ ස්ත්‍රී චර්මඡේදනය පළමු වරට නීතියෙන් තහනම් කරන ලද්දේ වර්ෂ 1985 දී ය. ඒ අනුව ස්ත්‍රී චර්මඡේදනය සාපරාධී ක්‍රියාවක් වන අතර, එය ක්‍රියාවට නංවන අය පමණක් නො ව, එයට අනුබල දෙන අයට විරුද්ධව ද නඩු පවරනු ලැබේ. වර්ෂ 2003 දී ස්ත්‍රී චර්මඡේදනය සම්බන්ධ නීතිය සංශෝධනයට ලක් කරන ලදු ව, චර්මඡේදනය ඔවුන්ගේ මව් රටවල්වල දී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කිරීම ද නීති විරෝධී බැව් ප්‍රකාශයට පත් කරන ලදී. එපමණ ද නො ව, අපරාධකරුවන්ට ලබා දෙන සිරදඬුවම් කාලය අවුරුදු පහේ සිට අවුරුදු පහළොව දක්වා දීර්ඝ කරන ලදී. මෙවැනි නීතිවලින් කිසි යම් හෝ ප්‍රගතියක් සිදු වී ඇත් ද? ඇත්තෙන් ම කිසි ම හෝ ප්‍රගතියක් සිදු වී නොමැති අතර, නීතිය පොතට පමණක් සීමා වී ඇත. බ්‍රිතාන්‍යය තුළ චර්මඡේදනය නිරන්තරයෙන් සිදුවන නමුදු මෙතෙක් එක ම එක අපරාධකරුවකු හෝ නීතිය ඉදිරිපිටට පමුණුවා නැත.

යුරෝපයේ අනෙකුත් රටවල මෙන් ම බ්‍රිතාන්‍යයේ ජීවත්වන අප්‍රිකානු ජාතිකයින් අතර, චර්මඡේදනය යනු තහනම් වචනයකි. අප්‍රිකානු කාන්තාවන් ලජ්ජාව නිසා නාරි වෛද්‍යවරයකු හමු වී තම ලිංගේන්ද්‍රයන් පරීක්ෂා කරවා ගැනීමට නො යති. චර්මඡේදනයේ දී භගශිෂ්නිකාව සහ යෝනි තොල් කපා ඉවත් කරන ලද ස්ථාන එක මැහුම් දමා ඇති බැවින් ඔසප් වීම, මුත්‍රා කිරීම මතු නො ව, දරු ප්‍රසූතිය ආදි අවස්ථාවල දී වේදනා විඳින්නට සිදු වන බැවින් පසුවට වෛද්‍යවරයකු හමු වී මැහුම් කපා ඉවත් කර ගැනීමට සිදු වේ. මෙවැනි කාන්තාවන් සඳහා දැන් විශේෂ චිකිත්සාගාර ඇත. ඔවුන් ලජ්ජාව පසෙක තබා එවැනි චිකිත්සාගාර වෙත ගියහොත් ඔවුනට නිසි වෛද්‍ය උපකාර ලබා ගැනීමට හැකි වනු ඇත.

හැරී ගෝර්ඩන් මේ සම්බන්ධ ඉමහත් ප්‍රසිද්ධියක් උසුලන නාරි වෛද්‍යවරයෙකි. ලන්ඩන් නගරයේ මිඩ්ල්සෙක්ස් ප්‍රදේශයේ චිකිත්සාගාරයක සේවය කළ ඔහු සේවයෙන් විශ්‍රාම ගොස් සිටින නමුදු "ෆෝවර්ඩ්" නමැති සංවිධානය මඟින් අප්‍රිකානු කාන්තාවන් සඳහා ස්ථාපිත කර ඇති චිකිත්සාගාරයක තවදුරටත් සේවයේ නියැළී සිටියි. චර්මඡේදනයට ලක් ව ඇති කාන්තාවන්ගේ

භගශිශ්නිකාව නැවත ප්‍රතිසංස්කරණය කිරීමේ ක්‍රමවේදය ප්‍රථම වතාවට සොයාගෙන ඇත්තේ වෛද්‍ය ගෝර්ඩන් විසිනි.

නාරි වෛද්‍ය ගෝර්ඩන් හමුවීමට මට අවස්ථාවක් නොමැති වීම ගැන මා කනගාටු වන අතර, කාන්තා චිකිත්සාගාරයක් පවත්වාගෙන යන නාරි වෛද්‍යාචාරියක් වන සාරා කෙරින්ග්ටන් පසු දින හමුවීමට නියමිත ව තිබුණි.

මධ්‍යම රාත්‍රිය පසු වී තිබුණ ද අවදියෙන් සිටි මම ලිංගාංගයේ චර්මඡේදනය සම්බන්ධ ව කරන ලද පර්යේෂණ පිළිබඳ රපෝර්තු කියවන්නට වීමි. වසර හයක් පමණ මා ලන්ඩන් නගරයේ පදිංචි ව සිටිය ද, මෙතරම් කරුණු දැන ගැනීමට නම් මා හට අවස්ථාවක් ඇති නැත. මා ලන්ඩන් නගරයේ ජීවත් වූ කාලය තුළ අප්‍රිකානු ප්‍රජාව සමග සමීප ව ජීවත් වූ බැවින් කාසියේ අනෙක් පැත්ත ගැන ද මම හොඳාකාර ව ම දනිමි. හන්නාදුනන රටක, ඒ රටේ භාෂාව මතු නො ව, සිරිත්-විරිත් පවා නො දැන හුදකලා වී ජීවත්වීම කෙබඳු ද යන්න මම අත්දැකීමෙන් දන්නෙමි. එවැනි සමාජයක චර්මඡේදනය සහ භගශිශ්නිකාව යන වචන ඇත්තෙන් ම තහනම් වචන ය. මගේ නිහුවක්කාර චරිතය සහ හෘදයේ තිබී යට අපූර්වත්වයක් හේතුකොටගෙන එවැනි සමාජයකින් පිටතට යන්නට මම වාසනා ලදිමි. එනමුදු මා මෙන් එසේ කරන්නට නො හැකි වූ දහස් ගණනක් අප්‍රිකානු කාන්තාවන් වෙන හැදවතින් මම සමීප ව සිටිමි. මගේ සහෝදර අප්‍රිකානු කාන්තාවන්ට මෙම පිළිකුල් සම්ප්‍රදායට විරුද්ධ ව නැගී සිටීමට ශක්තිය තිබෙන බව මම දනිමි.

අප්‍රිකානු කාන්තාවන් සඳහා වූ චිකිත්සාගාරය වෙත යන්නට මම මහමගට බැස්සෙමි. ලන්ඩන් විශ්වවිද්‍යාලය අසල වූ කට්ටු ගොඩනැගිල්ලක් සමීපයට ගිය මම එහි වූ නාම පුවරුවක් දුටුවෙමි. නාම පුවරුවේ පෙන්නා දී තිබූ ආකාරයට මම චිකිත්සාගාරය වෙත ගියෙමි. භගශිශ්නිකාව ප්‍රතිසංස්කරණ ශල්‍යකර්මය සඳහා ගත වන්නේ ඉතා කෙටි කාලයක් වූ නමුදු, එමගින් ඇති වන මානසික ප්‍රතිවිපාක සමනය කර ගැනීමට කලක් ගත වනු ඇත.

චිකිත්සාගාරය වෙත ගිය මා හට විෂය පිළිබඳ විශේෂඥ දැනුමක් ඇති මලිගයා බිකෝ (Maligaya Bikoo) නමැති හෙදිය මුණ ගැසුණි. ඇය මා ඇගේ කාමරයට කැඳවාගෙන ගියා ය. මොරිෂස් ජාතියට අයත් වූ ඇය කරුණාවන්ත කාන්තාවක් වූවා ය.

"අප වෙත එන කාන්තාවන්ගෙන් සියයට අනූවක් ම බලාපොරොත්තු වන්නේ සම්පූර්ණ නිර්වින්දනයකින් (Local anaesthetic) තොර ව භගශිශ්නිකා ප්‍රතිසංස්කරණ ශල්‍යකර්මය කරවා ගැනීමට යි... අනෙක ඔවුන් දන්නවා අපි ඒක රහසක් හැටියට තබා ගන්නා බව... වෙනත් ආරෝග්‍යශාලාවකට මේ සඳහා ගියොත් ඔවුන්ට ඒක රැයක් එහි නවතින්නට සිදු වෙනවා... මේ ශල්‍යකර්මය ගැන ඔවුන්ගේ පවුල් දැන ගන්නවට ඔවුන් කොහෙත්ම කැමැති නෑ" ඇය පැහැදිලි කිරීමක් කළා ය.

"මෙවැනි ශල්‍යකර්මයක් කරවා ගන්නට එන කාන්තාවන් තනියම ද එන්නෙ?" මම ඇසුවෙමි.

"ඔව්... සමහරක් දෙනා තනියම එනවා... හැබැයි බොහෝ දෙනෙක එන්නෙ එක්කො තමුන්ගෙ පෙම්වතා සමග. නැතිනම් මිතුරියක් එක්ක... පෙම්වතා එංගලන්තෙ පදිංචි ව සිටින කෙනෙක් නම් එවැනි අය තම පෙම්වතිය හෝ බිරිඳ හෝ මේ ශල්‍යකර්මය සඳහා උනන්දු කරවනවා... ඒ වගේ ම එවැනි අය චර්මඡේදනයට විරුද්ධ යි."

"කෙබඳු ශල්‍යකර්මය ද මෙහි දී සිදු වෙන්නෙ?"

"මෙහි දී කෙරෙන්නේ ස්ත්‍රී ලිංගේන්ද්‍රිය ආශ්‍රිත සියලු ම අවයව කපා දැමූ ස්ථානවල අපිළිවෙළකට දමා ඇති මැහුම් ගලවා නියම විධියට ඒ ස්ථාන මසා දැමීම යි... පළමුවෙන් ම අපි ශල්‍යකර්මය කර ගැනීමට එන කැනැත්තිය සමග ඒ සම්බන්ධ ව දීර්ඝ ව සාකච්ඡා කරනවා... ඊ ළඟට ඔවුන් පෝරමයක් පුරවා එමගින් ශල්‍යකර්මය සඳහා ඔවුන්ගේ කැමැත්ත දිය යුතුයි... මෙහි දී භගශිශ්නිකාව කපා ඉවත් කොට තිබේ නම් එය ප්‍රතිසංස්කරණය කිරීම අපි කරන්නෙ නෑ."

කොටින්නා විසින් යෝජනා කරන ලද හෙදිය හමුවීම ඊට පසු දිනට යෙදී තිබුණ බැවින් ඇය හමු වන්නට පෙර මෙම ශල්‍යකර්මය පිළිබඳ සියලු ම කරුණු දැන ගැනීමට මට අවකාශ විය. පැරිසියේ දී වෛද්‍ය පියා ෆෝල්ඩ්ස් විසින් පෙන්වන ලද ඡායාරූප නැරඹීමෙන් පසු ව තවදුරටත් මා භීතියට පත් කළ හැකි යමක් තිබිය හැකි යයි මම නො සිතමි.

"වෛද්‍ය උපකාර පතා මෙහි එන කාන්තාවන්ගේ ප්‍රධාන ප්‍රශ්න මොනවා ද?" මම ඇසුවෙමි.

මෙහි පැමිණෙන බොහොමයක් කාන්තාවන් විවාහ වීමට සිටින අය බවත්. චර්මච්ඡේදනයෙන් පසු අපිළිවෙළකට මැහුම් දමා තිබීම හේතුකොටගෙන ඇහිරී ඇති යෝනි විවරය නැවත යථා තත්ත්වයට පත් කර ගැනීම ඔවුන්ගේ අරමුණ බැව් මම දැන ගතිමි. ඒ අතර සමහර විවාහක කාන්තාවන්ට මැහුම් දමා තිබීම හේතුකොටගෙන සංසර්ගයේ දී විඳීමට සිදු වී ඇති වේදනාවෙන් මිදීම සඳහා ශල්‍යකර්මයක් කරවා ගැනීමට පැමිණෙති. තවත් සමහරක් මැහුම් දමා තිබීම දරු ප්‍රසූතියට බාධාවක් බැවින් මැහුම් ඉවත් කර ගැනීම සඳහා පැමිණෙති. ඒ අතර, බොහොමයක් කාන්තාවන් තමුන්ට අවශ්‍ය උපදේශ ලබා ගැනීමට පැමිණෙන බැව් මලිගයා මා සමඟ කීවා ය.

සාරා කැරින්ග්ටන්ගේ චිකිත්සාගාරය ලන්ඩන් නගරයේ අප්‍රිකානු ප්‍රජාව අතර මහත් ප්‍රසිද්ධියක් උසුලයි. ඉඩ ඇති සෑම අවස්ථාවක ම සාරා තම පර්යේෂණ කටයුතුවල නියැළෙන්නී ය. ස්ත්‍රී චර්මච්ඡේදනය සම්බන්ධ ව යම් තරමකින් හෝ පර්යේෂණ සිදුවීම සතුටට කරුණකි.

"ශල්‍යකර්මයෙන් පස්සෙ ඇති වන රෝග ලක්ෂණ ගැන අපි අවධානය යොමු කරනවා.. ශල්‍යකර්මයෙන් පසු බොහොමයක් කාන්තාවන් මුහුණ දෙන අපහසුකම් වශයෙන් දකින්නට ලැබෙන්නෙ මුත්‍රා පහ කිරීමේ දී ඇති වන අපහසුතා සහ නාරිවේදික ප්‍රශ්නයි." මලිගයා පැවැසුවා ය.

මෙවැනි ශල්‍යකර්මයක දී බොහොමයක් කාන්තාවන් මුහුණ දෙන ප්‍රශ්නය නම් පළමු වර චර්මච්ඡේදනයට මුහුණ දුන් අවස්ථාවේ ඇති වූ භීතියේ මතකය සිහිපත් වීමෙන් ඇති වන මානසික කම්පනය යි.

"එවැනි කාන්තාවන්ට අපේ මනෝවිද්‍යාඥවරිය උපකාර කරනවා." මලිගයා කීවේ ය.

ලන්ඩන් නගරයේ අප්‍රිකානු කාන්තා චිකිත්සාගාරයෙන් මා පිටවන විට දහවල් වී තිබුණි. ලන්ඩන් නගරයේ නිතර දක්නට ලැබෙන ගන බරිත අඳුරු දේශගුණය මතු නො වී. ඒ මොහොතේ වර්ෂාවක් ද කඩා හැලෙමින් තිබුණි. මලිගයා සමඟ කරන ලද සාකච්ඡාවෙන් පසු විභාගයක් සමත් වූ කලෙක මෙන් මට මහත් දිරියක් දැනෙන්නට විය. පැරිස් නගරයේ දී වෛද්‍ය පියා ෆෝල්ඩ්ස් ස්ත්‍රීයකගේ භගශිෂ්නිකාවට ප්‍රතිසංස්කරණය කිරීමේ ශල්‍යකර්මයේ දී වැඩි අවධානයක් යොමු කරන්නේ එහි විද්‍යාත්මක අංශයට බැව් ඔහු සමඟ මා කරන ලද සාකච්ඡාවෙන් මම දැන ගතිමි. එහෙත්, ලන්ඩන් නගරයේ අප්‍රිකානු කාන්තා චිකිත්සාගාරයේ දී කාන්තාවන්ට සිය මානසිකත්වය වර්ධනය කර ගැනීමට ද උපදෙස් ලැබෙනු ඇත.

ස්ත්‍රී චර්මච්ඡේදනය පිළිබඳ විශේෂඥ හෙදියක් වන Comfort Momoh පදිංචි ව සිටියේ ලන්ඩන් නගරයේ කටකුමේ වූ අතර, ලන්ඩන් නගරයේ සිට එහි යාමට සැලැකිය යුතු වේලාවක් ගත විය. මම ඇයගේ නිවස වෙත ගියෙමි. ඇය මා එනතුරු බලාගෙන සිටියා ය. මම ඇයත් සමඟ ඇගේ නිවසේ සාලයට ඇතුළු වූයෙමි. නයිජීරියාවේ නවීකරණය හුවා දක්වන පින්තූර කීපයක් ඇයගේ සාලයේ බිත්තිවල එල්ලා තිබුණි. ඇගේ කුඩා දරුවන් යාබද කාමරයට වී රූපවාහිනිය නරඹමින් සිටිනු මම දුටුවෙමි. සාලයේ අසුන් ගත් අපි සාකච්ඡාව පටන් ගත්තෙමු. කොම්ෆර්ට් කුඩා කාන්තාවක් වූවා ය.

කොම්ෆර්ට්ගේ චිකිත්සාගාරයේ දී කෙරෙන ශල්‍යකර්මය වෛද්‍ය පියා ෆෝල්ඩ්ස් කරන ශල්‍යකර්මයට වඩා වෙනස්

ශල්‍යකර්මයකි. "ස්ත්‍රියකගේ යෝනියේ පිටත සහ ඇතුළත යෝනි පතාල් කපා ඉවත් කිරීමෙන් පසු ව ඒ ස්ථානය මසා දමනවා... එසේ මසා දැමීමට පස්සේ මුත්‍රා පහ කරන්නට හෝ මසප් වන විට රුධිරය පහ ව යන්නට හෝ ඇත්තේ ගිනිකූරු හිසක් තරම් කුඩා සිදුරක්... අපි කරන්නෙ ඒ ස්ථානය කපා විවෘත කිරීම." ඇය ස්ත්‍රී යෝනියක කටු සටහනක් කොළයක සටහන් කරන ගමන් කතාව පටන් ගත්තා ය.

"එසේ කපා විවෘත කරන ස්ථානයෙන් විශාල ලෙස රුධිරය වහනය වීමක් සිදු වන්නෙ නෑ... අනෙක ඒ ස්ථානයේ හමට සම්බන්ධ ස්නායුවලට හානි වී තිබෙන නිසා වේදනාවක් දැනෙන්නෙ නෑ... ඊට අමතර ව අපි ඒ අයට කියලා දෙනවා යෝනිය ආශ්‍රිත ප්‍රදේශය පිරිසිදු ව තබා ගත යුතු බව... ස්ත්‍රී චර්මච්ඡේදනයේ දී ඔවුන් ලබා ඇති භයානක අත්දැකීම නිසා ඒ අය යෝනි ප්‍රදේශයට අත තියන්නට බියෙන් පසුවන බව අපට දැන ගන්නට ලැබිලා තිබෙනවා" ඇය කීවා ය.

"මේ රටෙත් අනෙකුත් රටවල්වල මෙන් ම ස්ත්‍රී චර්මච්ඡේදනය සම්බන්ධ ව එතරම් සැලකීමක් දක්වන්නෙ නැද්ද?" මම ඇසුවෙමි.

"ඔව්... ඒ සම්බන්ධ ව ඒ තරම් සැලකීමක් දක්වන්නෙ නෑ.. අඩු ම තරමින් හෙදියන්, වින්නඹු කාන්තාවන් සහ වෛද්‍යවරුන්වත් ඒ ගැන සැලකිලිමත් වෙනවා කියලා මම හිතන්නෙ නෑ... දරුවන් ලැබෙන්නට ඉන්න කාන්තාවන්ට වෛද්‍යවරුන් කියන්නෙ දරුවා එළියට ගැනීම සඳහා සිසේරියන් ක්‍රමය පාවිච්චි කළ යුතු යි කියලා... ඒක විකාර කතාවක්... ස්ත්‍රී චර්මච්ඡේදනය නිසා යෝනි මාර්ගයේ කුඩා වීමක් සිදු වන්නේ නෑ... ස්ත්‍රී චර්මච්ඡේදනයෙන් පසු කපා දමන ලද අවයව තිබූ ස්ථාන මසා දැමීම නිසා කාන්තාවන්ට මුත්‍රා කිරීමේ දී අපහසුතාම ඇති වෙනවා... එවැනි අයෙක් ඒ සඳහා වෛද්‍යවරයකු හමු වීමට ගියා ම ඔවුන් කිසි ම සොයා බැලීමකින් තොර ව ඒ කාන්තාවට මුත්‍රා ආසාදනය වැනි ලෙඩක් ඇතැ යි කියා බෙහෙත් නියම කරනවා."

මසප් වීමේ දී රුධිරය ගලා යාමට ඇති බාධාව හේතු කොටගෙන බොහොමයක් කාන්තාවන් වේදනාවට පත් ව සිටිනවා. එමෙන් ම යෝනිය මත මැහුම් දැමීම නිසා යෝනි විවරය කුඩා වීම හේතුකොටගෙන සංසර්ගයේ දී වේදනාවට ලක්වන කාන්තාවන් සිය පෙම්වතා හෝ ස්වාමිපුරුෂයා සමග හෝ ඇය හමුවීමට එන බැව් කොම්ෆර්ට් කීවා ය.

"කාන්තාවන් ගැබ්බර වීමෙන් පසු මෙම ශල්‍යකර්මය සිදු කළ යුත්තේ කිනම් අවස්ථාවක දැ? දරුවා ප්‍රසූත කිරීමට සතියකට පමණ කලින් මෙම ශල්‍යකර්මය කළ හැකි දැ?" මම ප්‍රශ්න කළෙමි.

"දරුවා ප්‍රසූත කිරීමට සතියකට කලිනුත් මෙම ශල්‍යකර්මය කළ හැකියි. නමුත්, දරු ගැබක් ඇති වූ මුල් අවධියේ දී මෙම ශල්‍යකර්මය කිරීම උචිත බව මගේ අදහසයි. දරු ගැබක් ඇති වීමෙන් පසු විසිවන සතිය මෙම ශල්‍යකර්මය සඳහා සුදුසු ම කාලය හැටියට සලකන්නට පුළුවන්."

දරු ප්‍රසූතියෙන් පසු පෙර තිබූ ආකාරයට යෝනිය මසා දමන ලෙස කාන්තාවන් ඉල්ලුම් කර ඇති අවස්ථා තිබෙනවා දැ?" මම ඇසුවෙමි.

"ඔව්... මම දැනට අවුරුදු අටක් මේ කාර්යයේ නියැළී සිටිනවා... ඒ කාලය ඇතුළත කාන්තාවන් දෙදෙනෙක් මගෙන් එය ඉල්ලීම කරලා තියෙනවා" ඇය කීවා ය.

මා ලන්ඩන් බලා එන්නට සූදානම් වන විට මා වෙත ලැබුණු ආරංචියක් ඒ මොහොතේ මට සිහි විය. එනම් දරු ප්‍රසූතියෙන් පසු අධික ලෙස රුධිරය වහනය වීම වළක්වාලීම සඳහා ජර්මනියේ ආරෝග්‍ය ශාලාවල පෙර තිබූ ආකාරයට යෝනිය මත මැහුම් දමන බැව් මට දැන ගන්නට ලැබුණි. ඒ සම්බන්ධ ව මම කොම්ෆර්ට්ගෙන් ඇසුවෙමි.

ඇගේ ඉරියව් ක්ෂණික ව වෙනස්වනු මම දුටුවෙමි. "ජර්මනියේ එය කියන දේ සිදු වෙනවා නම් ඒ වෛද්‍යවරුන්ට මේ විෂය සම්බන්ධ ව පූර්ණ දැනුමක් නැහැ... මම සතියකට

තුන් හතර වතාවක් මේ ශල්‍යකර්මය සිදු කරනවා... මේක ඉතා සුළු ශල්‍යකර්මයක්... ඉතා සුළු ප්‍රමාණයක රුධිරය වහනය වීමක් සිදු වෙනවා තමයි... ඉතා අධික රුධිර වහනය වීමක් සිදු වන්නේ චර්මච්ඡේදනයේ දී යි... දරු ප්‍රසූතියෙන් පස්සෙ නැවතත් පෙර තිබූ ආකාරයට මසා දැමීම ඇත්තෙන් ම වධකීම රහිත ක්‍රියාවක්... අප්‍රිකානු කාන්තාවක් දරුවන් හයදෙනකු ප්‍රසූත කළහොත් ඒ සෑම වාරයකම මැහුම් කපා නැවත මැහුම් දැමීමට සියහොත් ඒ කාන්තාවට ඉතුරු වෙන්න දෙයක් නැති ව යනවා" ඇය තරමක කෝපයෙන් කීවා ය.

"ජර්මනියෙ ස්ත්‍රී චර්මච්ඡේදනයට විරුද්ධ ව නීති නැත්ද?" මොහොතක නිහැඬියාවකින් පසු ව ඇය ප්‍රශ්න කළා ය.

"ස්ත්‍රී චර්මච්ඡේදනය සම්බන්ධ ව විශේෂ නීතියක් නැහැ... මනුෂ්‍ය ශරීරය සම්බන්ධ ව ඇති නීතිය චර්මච්ඡේදනයත් ඇතුළත් වෙනවා" මම පිළිතුරු දුනිමි.

"එහෙම නම් ඒ තත්ත්වය වෙනස් කළ යුතුයි" ඇය පැවසුවා ය.

ස්ත්‍රී චර්මච්ඡේදනය සම්බන්ධයෙන් ජර්මනියේ ඇති වී ඇති තත්ත්වය මහජනයාට දැන ගැනීම සඳහා හෙළිදරව් කිරීමට මම අධිෂ්ඨාන කර ගතිමි.

* * * * *

පසු දින අන්තර්ජාලය මඟින් හඳුනා ගත් කාන්තාවක් හමු වන්නට නියමිත ව තිබුණි. ඇයගේ නම බසහරා ය (මෙය ඇයගේ සත්‍ය නම නො වේ). බසහරාට ඇගේ කුඩා දරුවන් රැගෙන මා හමු වන්නට නගරයට එන්නට නො හැකි බැවින් ඇයගේ නිවසට එන ලෙස ඇය මට ආරාධනා කළා ය. ස්ත්‍රී චර්මච්ඡේදනයට විරුද්ධ ව අප ගෙන යන ව්‍යාපාරයට සම්බන්ධ වන්නට ඇයට ද

ගෙන් උවමනාවක් තිබුණ බැවින් ඇය මා හමුවන්නට උනන්දුවක් දැක්වූවා ය. ලන්ඩන් නගර සීමාව ආසන්නයේ වූ අලංකාර කුඩා ගමක ඇගේ කුඩා පියකරු නිවස පිහිටා තිබුණේ ය. මා එහි යනවිට ඇය මා එනතුරු මඟ බලා සිටියා ය. හින්දැරි සිරුරකින් හෙබි බසහරා අළු පාට ගවුමක් ඇඳ සිටි අතර, අළු පාට රෙද්දක් හිස වැසෙන සේ පැලඳ සිටියා ය.

"මම වාරිස් ඩයරි" ඇයට මම අත දෙමින් කීවෙමි.

ඇය සිනාසෙමින් මා හට අත දෙමින් නිවස ඇතුළට එන ලෙස කීවා ය. බසහරාට පිටුපසින් සිටගෙන සිටි ඇගේ කුඩා දියණිය පුදුමයෙන් මෙන් මා දෙස බලා සිටියා ය. "මට සමාවෙලා පොඩ්ඩක් වාඩි වෙලා ඉන්න මම මගේ දුව පාසලට ඇරලවලා එනකල්."

"මම එන්ට ද ඔබත් එක්ක යන්න" මම ඇසිමි.

තරමක චකිතයකින් මගේ ඉල්ලීම ඇය අනුමත කළා ය. අපි දෙදෙන කතා කරමින් දරුවා පාසල වෙත රැගෙන ගියෙමු. බසහරා සුඩාන් කාන්තාවක වන අතර. වසර පහකට පෙර ඇය සිය සැමියාත් සමඟ එංගලන්තයට පැමිණ දේශපාලන රැකවරණ ඉල්ලා ඇත. "මේ පැත්තෙ ඉන්න මිනිස්සු ඒ තරම් හොඳ නැහැ" ඇය කීවා ය.

අපි කතා කරමින් පාසල වෙත පැමිණියෙමු. ඇය සිය දියණියගේ හිසට හාදුවක් දී පාසල වෙත යන්නට හැරියා ය. ඇගේ මුහුණෙහි කනගාටුවක ඡායාවක් පෙනෙන්නට තිබුණි. "අපේ දුව කළු නිසා අනෙක් ළමයි ඇය ව කොන් කරයි ද කියලා මට හරි බයක් තියෙනවා."

ආපසු පැමිණි අපි ඇගේ සාලයේ අසුන් ගතිමු. මා සාලයේ වාඩි වී සිටින අතර, ඇය ගොස් තේ පිළියෙල කරගෙන පැමිණියා ය. "ස්ත්‍රී චර්මච්ඡේදනයට විරුද්ධ ව ඔබ ගෙන යන ව්‍යාපාරයට සම්බන්ධ වන්නට මමත් කැමතියි" ඇය එක්වර ම කීවා ය.

මා මෙන් ම බසහරා ද චර්මච්ඡේදනයට ලක් වී ඇත්තේ වයස අවුරුදු හයේ දී ය. "ඉස්ලාම් ධර්මයේ කොතැනකවත් ස්ත්‍රියට මෙවැනි දෙයක් සිදු කළ යුතු යි කියලා සඳහන් වෙලා නැහැ" ඇය කීවා ය. චර්මච්ඡේදනයෙන් පසු ඇයට මාස තුනක් ඇඳට වී සිටින්නට සිදු වී ඇත. චර්මච්ඡේදනයෙන් පසු පළමු වරට මට ඔසප් වීම සිදු වූ අවස්ථාවේ දී මා වින්ද වේදනාව ඇත්තෙන් ම වචනයෙන් විස්තර කරන්නට බැහැ. ඒ මොහොතේ චර්මච්ඡේදනයෙන් පසු මට විඳින්නට සිදු වූ වේදනාව මගේ මනසට නැගිණි.

"වාරිස් ඔබ දන්නවා ද මගේ ජීවිතයේ දී මට මුහුණ දෙන්නට සිදුවුණු ශෝකජනක ම සිද්ධිය මොකක් ද කියලා... මම කුඩා කාලෙ මගේ දෙමව්පියො මාවත් අරගෙන නයිජීරියාවට ගිහින් තියෙනවා පදිංචියට... එහි දී තමයි මම හැදිලා වැඩිලා තියෙන්නෙ... මට අවුරුදු විස්සෙදි විතර මම නයිජීරියානු කොල්ලෙක් එක්ක පෙම්සබඳකමක් ඇති කර ගත්තා... ඒ තමයි මගේ ස්වාමිපුරුෂයා. මගේ පෙම්වතා ජීවත්වුණු ප්‍රාන්තයෙ චර්මච්ඡේදනය සිදු කෙරෙන්නෙ නැ... අපි විවාහ වෙන්නට නියමිත ව තිබූ දවසට ඉස්සෙල්ලා දවසෙ ඔහු මට කිව්වා ප්‍රාන්තයේ චර්මච්ඡේදනය සිදු කරන බව අහලා තියෙනවා කියලා. එය මට සිදු වී නො තිබුණා කියලා දෙවියන්ට යාඥා කළ බව... මගේ ජීවිතය මම මුහුණ දුන්න අමිහිරි ම සිදුවීම තමයි වාරිස් මම චර්මච්ඡේදනයට ලක් වූ අයෙකු බව ඔහුට කියා සිටීමට සිදුවීම."

බසහරාගේ කතාව මගේ සිතට තදින් ම කා වැදුණේ ය. ඇය සිය දෙමව්පියන් සහ මිතුරු-මිතුරියන් සිටිවනු නොමැතිව එංගලන්තයේ කුඩා ගමක හුදකලාව ජීවත් වන්නී ය. තවත් නොපමණ ප්‍රමාණයක් අප්‍රිකානු කාන්තාවන් මේ ආකාරයෙන් තමන්ගේ ම නිවෙස් තුළ සිරකාරියන් වී ජීවත් වන්නේ ද යන්න මට සිතා ගන්නටවත් නො හැකි ය. ඊට ප්‍රධාන හේතුව වී ඇත්තේ අවට සමාජයත් සමඟ සම්බන්ධ වීමට තරම් භාෂා ඥානයක් ඔවුන් සතු නො වී ම ය.

එංගලන්තයේ ජීවත් වන බොහොමයක් අප්‍රිකානු කාන්තාවන්ට කිසි ම අධ්‍යාපන පසුබිමක් නොමැත. එංගලන්තය ඔවුන්ගේ මවුරට නො වේ. තම මවු රටවල් හැර දමා මෙවැනි රටවලට එන්නට ඔවුන්ට සිදු ව ඇත්තේ ඒ රටවල දී මුහුණ දෙන්නට සිදු ව ඇති ආර්ථික සහ දේශපාලන ප්‍රශ්න බැවි නො රහසකි. තම ගම් රටවල් බලා නැවත යන්නට ඔවුන් සිහින මවමින් සිටිය ද ඒ සමාජය ඔවුන් නැවත පිළිගනීවි ද යන්න ප්‍රශ්නයකි.

බසහරාට චර්මච්ඡේදනයට ලක් ව සිටින වෙනත් කාන්තාවන් සමඟ සාකච්ඡා කිරීමට බොහෝ දේ ඇති බැව් ඈ මා සමඟ කීවා ය. "සංසර්ගයේ දී මට කිසි ම තෘප්තියක් ලබන්නට බැ... මට කිසි ම ප්‍රබෝධයක් හෝ හැඟීමක්, දැනීමක් නැ... මම දැන් ඒ ගැන කල්පනා කරන්නෙත් නැ.. සංසර්ගය කියන්නෙ මට ඔහෙ කරන්නත් වාලෙ කරන දෙයක්.. මම කොහොම ද මේක විස්තර කරන්නෙ. මම මගේ ස්වාමිපුරුෂයාට ආදරෙයි.. චර්මච්ඡේදනය සම්පූර්ණයෙන් ම නවත්වා දැමිය යුතුයි.. කොහොම හරි මේ මෘග ක්‍රියාව නවත්වන්නට ඕනෑ..."

බසහරාගෙන් සමුගෙන හෝටලය වෙත ගිය මොහොතේ සිට මගේ මනස තුළ බසහරාගේ අවසාන වචන කීපය දෝංකාර දෙන්නට විය. චර්මච්ඡේදනය සංස්කෘතික චාරිත්‍රයක් වශයෙන් යුක්ති සහගත කිරීමට අනුබල දෙමින් කිනම් තර්ක ඉදිරිපත් කළත් ස්ත්‍රී චර්මච්ඡේදනය යනු ගැහැනිය මත පුරුෂාධිපත්‍යයේ බලය තහවුරු කිරීම හැර අන් කුමක්ද?

පසු දින මම වියානාවල සිටින මගේ සගයින්ට දුරකතන ඇමතුමක් දුන්නෙමි. ඔවුනු මා හට වැදගත් ආරංචියක් ලබා දුන්හ. දරු ප්‍රසූතියෙන් පසු ව පෙර යෝනිය මත මැහුම් දමා තිබූ ආකාරයට ම නැවතත් ඒ ස්ථානය මසා දැමීමේ ක්‍රියාදාමයක් ජර්මනියේ චිකිත්සාගාරයක සිදුවන බව මා හට දැන ගන්නට ලැබුණි. මෙම තත්ත්වයට ගොදුරු වූ කාන්තාවන්ගෙන් අප වෙත දුරකතන ඇමතුම් ලැබෙන බවත්. මේ සම්බන්ධ ව බලධාරීන් නිහඬ ව සිටින බවත් තවදුරටත් ඔවුනු මා සමඟ කීහ. "හොඳයි වෝල්ටර් මම හෙට වියානාවලට එනවා."

"ෆෝවර්ඩ්" නමැති සංවිධානය ගැන මම නිතර අසා ඇත්තෙමි. එංගලන්තයේ දී, ස්ත්‍රී චර්මඡේදනය සම්බන්ධ ව මා කළ සෑම සාකච්ඡාවක දී ම "ෆෝවර්ඩ්" සංවිධානය ගැන සඳහන් විය. "ෆෝවර්ඩ්" සංවිධානය ස්ත්‍රී චර්මඡේදනයට විරුද්ධ ව ප්‍රථමයෙන් ම ක්‍රියාත්මක වූ සංවිධානය මතු නො ව, මෙතෙක් ඒ සඳහා ක්‍රියාත්මක වන විශාලතම සංවිධානය ද වන්නේ ය. ඝානා ජාතිකයකු වූ Efua Dorkenoo නමැත්තා විසින් 1983 දී මෙම සංවිධානය පිහිටුවා ඇත. පළමුවෙන් ම ඔවුන් මානව හිමිකම් සම්බන්ධ සංවිධානයක් වූ "The Minority Rights Group" නමැති සංවිධානය සමඟ එක් ව වසර දෙකක් කටයුතු කොට පසු ව ස්වාධීන සංවිධානයක් වශයෙන් කටයුතු කිරීමට පටන් ගෙන ඇත. මහා බ්‍රිතාන්‍යය තුළ ස්ත්‍රී චර්මඡේදනයට විරුද්ධ ව මොන යම් අයුරකින් හෝ ක්‍රියාත්මක වූ එක ම සංවිධායම "ෆෝවර්ඩ්" සංවිධානය යි.

"ෆෝවර්ඩ්" සංවිධානය සේවකයන් ගණනාවකින් සමන්විත විශාල සංවිධානයක් නො වේ. 2003 වසරේ දී සංවිධානය පවත්වාගෙන යාම සඳහා පවුම් 330,672ක් වැය වී ඇත. "මැන්චෙස්ටර් යුනයිටඩ්" නමැති ආයතනය වාර්ෂික ව ලබන ලාභය මෙම සංවිධානය පවත්වාගෙන යාමට යොදවා ඇත. "ෆෝවර්ඩ්" සංවිධානයේ කළමනාකාර අධ්‍යක්ෂවරිය වන Adowa Kwateng - Kluvitts මහත්මිය මා හරසරින් පිළිගත්තා ය. ඇය විසින් මා ඇගේ කාමරයට කැඳවාගෙන යන ලද්දී ව, මා හට වාඩි වන්නට අසුනක් පනවා තේ කෝප්පයක් ද පිළිගැන්නුවා ය.

"බ්‍රිතාන්‍ය තුළ චර්මඡේදනය අහෝසි කර දැමීමට විරුද්ධ ව පනවා ඇති නීති ප්‍රමාණවත් නො වන බවයි ඔබ කියන්නේ" මම ඇසුවෙමි.

"ඔව්... පළමුවෙන් ම චර්මඡේදනයට විරුද්ධ ව නීතිය ස්ථාපිත කරන්නට අපි කටයුතු කළා... මෙතෙක් ක්‍රියාත්මක වෙමින් තිබූ සෑම ආකාරයක ම ස්ත්‍රී චර්මඡේදන 1983 දී අපි නීතියෙන් අවලංගු කළා... නමුත්, මෙය නතර කරන්නට නම් නීතිය පමණක් ප්‍රමාණවත් මදි... ඒ ප්‍රජාවන් ද දැනුවත් කළ යුතුයි. ඒ නිසා අපගේ මූලික අවධානය යොමු කළේ ඒ අදාළ කොටස් දැනුවත් කිරීමට යි... අපි හෙදියන්, සමාජ සේවකයන් විතරක් නො වෙයි පොලිසිය පවා මේ සම්බන්ධ ව දැනුවත් කළා" අඩොවා විස්තර කළා ය.

"චර්මඡේදනයට විරුද්ධ ව නීතිය ස්ථාපිත කළාට පසු ව බ්‍රිතාන්‍ය තුළ ඇති වන චර්මඡේදනයට එයින් බලපෑමක් ඇති කරන්නට හැකි වුණා ද?"

"ඒ ඒ ජන කොටස් තුළ චර්මඡේදනය තවමත් කෙරීගෙන යන බව අප දන්නවා" අඩොවා පිළිතුරු දුන්නා ය.

"ඒ කියන්නෙ දෙමව්පියන් තවමත් තම දූවරුන්ගේ චර්මඡේදනය කිරීමට කැමැත්තක් දක්වනවා කියන එකයි."

"අපි එක එක ජන කොටස් සම්බන්ධ ව අධ්‍යයනයක් කළා... නවතම පරීක්ෂණය අප කළේ බර්මින්හැම් නගරයේ යි. එමගින් අප සොයා ගත්තා එම ජන කොටස්වල සෑම තුන්වෙනි පවුලක ම තම දූවරුන්ට චර්මඡේදනය සිදු කරන්නට කැමැත්තෙන් සිටින බව."

ඔස්ට්‍රියාවේ තත්ත්වය ද මීට සමාන ය. මෙම නින්දා සහගත ක්‍රියාව ඔස්ට්‍රියාව තුළ නීතියෙන් තහනම් කොට වසර විස්සක් ගත වී තිබුණ ද, ඒ ඒ ජන කොටස්වල තුනෙන් එකක් මෙම චාරිත්‍රය තවමත් පවත්වාගෙන යති.

"මෙතෙක් මේ ක්‍රියාවට සම්බන්ධ කිසිවෙක් නීතිය ඉදිරිපිට ගෙනැවිත් තිබෙනව ද?" මම ඇසුවෙමි.

"දෙන්නෙකුට විරුද්ධ ව නඩු පවරලා තිබෙනවා... ඒ දෙන්න ම වෛද්‍යවරු. රහසිගත ව මේ ක්‍රියාව කරගෙන ගිය අරාබි වෛද්‍යවරයකුට 1994 දී නඩු පවරලා තිබෙනවා... ඔහුගේ වෛද්‍ය බලපත්‍රය අධිකරණයෙන් තහනම් කෙරුවා... නමුත් අවුරුදු තුනකට පස්සෙ ඒ බලපත්‍රය ඔහුට නැවතත් ලැබුණා... දැන් ඔහු නැවතත් වෛද්‍යවරයකු වශයෙන් කටයුතු කරනවා. 1999 ඉන්දියානු

ශල්‍යවෛද්‍යවරයකු වෙත චර්මච්ඡේදනය කරවා ගැනීමට පැමිණි අය සමඟ කළ සාකච්ඡාවක් රහසිගත ව රූපගත කරලා තිබෙනවා. ඔහු පවුම් 50කට ශල්‍යකර්මය කර දෙන්නට පොරොන්දු වෙලා තිබෙනවා... රහසිගත ව රූපගත කරන ලද වීඩියෝ පටය "රෝස මල කප්පාදු කිරීම" (Cutting the Rose) යන මැයෙන් රූපවාහිනිය මගින් විකාශය කෙරුණා."

4

දරුවන් ආරක්ෂා කළ යුතුයි

වර්ෂ 2004 දී ජර්මනියේ හැම්බර්ග් නගරයේ පිහිටා ඇති ලෝක කාන්තා සම්මාන පදනම විසින් මගේ සේවය අගයමින් මා සම්මානයකින් පුදන ලද අතර, මිහායල් ගොර්බචොෆ් (Mikhail Gorbachev) විසින් සම්මානය ප්‍රදානය කරන ලදී. නෙල්සන් මැන්ඩෙලා සහ දලයිලාමා මෙන් ම ගොර්බචොෆ් කර ඇති සේවය නිසා මා තුළ ඔවුන් කෙරෙහි ගෞරවයක් ඇති වී තිබේ. මෙවැනි සම්මාන උත්සව සඳහා මාධ්‍ය මගින් විශාල ප්‍රසිද්ධියක් ලබා දෙන අතර, ස්ත්‍රී චර්මච්ඡේදනය සහ ඊට විරුද්ධ ව මා ගෙන යන ව්‍යාපාරයට ප්‍රසිද්ධිය ලබා ගැනීම සඳහා මම මෙය අවස්ථාවක් කර ගතිමි. ඒ අවස්ථාවේ දී ප්‍රථම වතාවට ජර්මනිය තුළ ද චර්මච්ඡේදනය සිදුවන බැව් මම ප්‍රසිද්ධියේ ම ප්‍රකාශ කළෙමි. එහෙත්, ඒ අවස්ථාවේ දී ජර්මනියේ සිදු කෙරෙන ස්ත්‍රී චර්මච්ඡේදනය සම්බන්ධ ව දන්න කිසිවක් මම දැන නො සිටියෙමි.

නැවත වරක් මම ලී. කොරින්නා සහ ජූලියා වියානා නගරයේ අපගේ සුපුරුදු ආපන ශාලාවේ දී හමුවුණෙමි.

"මොනවා ද ඔබලා ජර්මනියෙ සිදු කෙරෙන චර්මච්ඡේදනය ගැන දන්නෙ" මම ප්‍රශ්න කෙළෙමි.

ජර්මනිය තුළ කෙතරම් ප්‍රමාණයක් දැරියන් මෙම ව්‍යසනයට ගොදුරු වී ඇත්ද, තවත් කොපමණ දැරියන් ඒ අන්තරාවට ගොදුරු වන්නට සිටින්නේ ද යන්න කිසිවකු දැන නො සිටියහ. වර්ෂ 2003 වන විට අප්‍රිකාවේ ස්ත්‍රී චර්මච්ඡේදනය චාරිත්‍රයක් වශයෙන් සිදු කෙරෙන රටවල්වල සිට පනස්හයදාහක් පමණ කාන්තාවන් ජර්මනියට සංක්‍රමණය වී ඇති බැව් Terre des Femmes නමැති සංවිධානය ප්‍රකාශ කර තිබෙනවා. අප දන්නා තරමින් නිශ්චිත වශයෙන් ම ස්ත්‍රී චර්මච්ඡේදනයට ගොදුරු වී ඇති විසිපන්දාහක් පමණ කාන්තාවන් ජර්මනිය තුළ වාසය කරති. ස්ත්‍රී චර්මච්ඡේදනයට විරුද්ධ ව පෙරමුණ ගෙන කටයුතු කරන පුද්ගලයකු වන Mariatu Rohde විසින් කරන ලද සංගණනයකට අනුව අප්‍රිකානු රටවල්වල සිට ජර්මනියට පැමිණෙන සංක්‍රමණිකයන්ගේ ප්‍රමාණය ඉහළ නැගීමත් සමග ඉදිරියේ දී ජර්මනිය තුළ චර්මච්ඡේදනයට ගොදුරු වී සිටින අයගේ ප්‍රමාණය ද දෙගුණ වනු ඇත.

ජර්මනිය තුළ ස්ත්‍රී චර්මච්ඡේදනයට ගොදුරු ව සිටින කාන්තාවන්ගේ නියම සංඛ්‍යාව බොහෝවිට දැනටමත් තක්සේරු කර ඇති ප්‍රමාණයට වඩා අධික වන්නට ඉඩ ඇත. ස්ත්‍රී චර්මච්ඡේදනය අප්‍රිකාවේ පමණක් නො වේ. ආසියා සහ අරාබි රටවල ද සිදුවේ. කාන්තා සුභසාධනය සඳහා කටයුතු කරන එක්තරා ස්වේච්ඡා කණ්ඩායමක් විසින් කරන ලද පරීක්ෂණයකට අනුව කුර්දිස්ථානයේ ගම් හැටක සියයට හැටක් පමණ කාන්තාවන් ස්ත්‍රී චර්මච්ඡේදනයට ගොදුරු වී ඇත. ලක්ෂ ගණනක් කුර්දිස්ථාන් වැසියන් ජර්මනියේ ජීවත් වන බැවින් මෙම සංඛ්‍යාලේඛන ඉතාමත් වැදගත් වනු ඇත.

බොහොමයක් යුරෝපීය රටවල්වල මෙන් ම ජර්මනියේ ද ස්ත්‍රී චර්මච්ඡේදනය සම්බන්ධ නීති-රීතිවල පැහැදිලි ස්ථාවරයක් නොමැත. ජර්මනියේ දණ්ඩ නීති සංග්‍රහයේ 224 සහ 226 වගන්තිවලට අනුව ස්ත්‍රී චර්මච්ඡේදනය ශාරීරික වශයෙන් ඉතා දරුණු හානි ඇති කරන ක්‍රියාවක් වශයෙන් හඳුන්වා ඇත. මෙම ක්‍රියාව සම්බන්ධ වරදකරුවකුට මාස හයේ සිට අවුරුදු දහයක සිරදඬුවමක් ලැබිය හැකි ය. එහෙත්, මෙතෙක් චර්මච්ඡේදනය සිදු කිරීමේ වරදට කිසිවකු දඬුවම් ලබා නැත. ස්ත්‍රී චර්මච්ඡේදනය සඳහා ජර්මනියේ දණ්ඩනීති සංග්‍රහයේ විශේෂ නීතියක් නොමැති හෙයින් රූපලාවණ්‍ය ශල්‍යකර්මයක (Plastic Surgery) මුවාවෙන් නෛතිකභාවය කල්පාදු කර දැමීමට හැකි ය. එහෙත්, එය ඕස්ට්‍රියාව සහ එංගලන්තයේ දණ්ඩ නීතියට අනුව දඬුවම් ලැබිය හැකි වරදකි. එපමණ ද නො ව, ස්ත්‍රී චර්මච්ඡේදනයෙන් පසු යෝනිය මසා දමනු ලැබේ. දරු ප්‍රසූතිය සඳහා බොහෝ අවස්ථාවල එම මැහුම් ඉවත් කරනු ලැබේ. දරු ප්‍රසූතිය සඳහා එසේ මැහුම් ඉවත් කිරීමෙන් පසු ව නැවතත් ඒ ස්ථානය මසා දැමීම නීති විරෝධී ක්‍රියාවක් වූ නමුදු ජර්මනිය තුළ එය එසේ නො වේ.

ස්ත්‍රී චර්මච්ඡේදනය සම්බන්ධයෙන් ඇති අනෙක් ප්‍රශ්නය නම් දෙමව්පියන් විසින් සිය දැරියන් නිවාඩුවක් ගත කිරීමට සිය මව් රටවල්වලට රැගෙන ගොස් එහි දී චර්මච්ඡේදනය සිදු කිරීම යි. මෙවැනි අවස්ථාවක දැරිය ජර්මන් පුරවැසියකු නම් පමණක් නීතිය ක්‍රියාත්මක වනු ඇත. මිනිසාගේ ආරක්ෂාව වෙනුවෙන් නීතිය අකුරට ම ක්‍රියාත්මක වන ජර්මනිය වැනි රටක ස්ත්‍රී චර්මච්ඡේදනය ගැන වපර ඇසින් බැලීම ඇත්තෙන් ම පුදුමයට කරුණකි. ස්ත්‍රී චර්මච්ඡේදනයට විරුද්ධ ව අප ගෙන යන ව්‍යාපාරය සාර්ථක කර ගැනීමට නම් ඒකාන්තයෙන් ම ජර්මනිය තුළ චර්මච්ඡේදනයට විරුද්ධ ව සටන ජයගත යුතු බව මම අවබෝධ කර ගතිමි.

ඒ අරමුණ පෙරදැරි කරගෙන මම බර්ලින් නගරයට ගියෙමි. බර්ලින් නගරයේ බ්‍රැන්ඩන්බර්ග් ප්‍රදේශයේ වෛද්‍ය චිකිත්සාගාරයක් පවත්වාගෙන යන මරියටු රොහෙඩ් (Mariatu Rohde) නමැති අප්‍රිකානු වෛද්‍යවරිය ඉතාලියානු ආපන ශාලාවක දී හමු වන්නට නියමිත ව තිබූ බැවින්, අපි කලට වේලාවට එම ආපන ශාලාව

වෙත ගියෙමු. එනමුදු ඇය එනතුරු අපිට හෝරා දෙකක් පමණ බලා සිටින්නට සිදු විය. ජර්මන් ක්‍රමයට රතු පාට හිස් වැස්මක් පැලඳ ගත් කාන්තාවක් ආපන ශාලාවට ඇතුළු වී අප සිටි දෙසට එනු අපි දුටුවෙමු. සාමාන්‍ය ප්‍රමාණයට වඩා ලොකු බෑගයක් අතින් ගෙන සිටි ඇය, ජීන්ස් කලිසමක් ඇඳ සිටි අතර, එහි නොයෙක් වර්ණයෙන් යුත් පටියක් ඉණ වටා පැලඳ සිටියා ය. අප වෙත පැමිණි ඇය ප්‍රමාදය ගැන වචනයකුදු නො දොඩා සිය හිස්වැසුම ගලවා මේසය මත තබමින් අප අසලින් අසුන් ගන්නා ය.

"කොහොම ද මගෙ තොප්පිය ලස්සනයි නේද?" ඇය අසුන් ගන්නා ගමන් සිනාසෙමින් කීවා ය. මරියටව් අන් අය ගැන එතරම් තැකීමක් නොමැති අයකු වූ අතර, ඇයට අවශ්‍ය දේ ගැන ඇය හොඳ අවබෝධයකින් සිටියා ය. ස්ත්‍රී චර්මච්ඡේදනයට ගොදුරු වූ කාන්තාවන් සඳහා උපදෙස් ලබා දෙන ආයතනයක් පවත්වාගෙන ගොස් ඇති ඇය වර්තමානයේ පූර්ණකාලීන වෛද්‍යවරියක් වශයෙන් කටයුතු කරන අතර, ඉඩ ඇති අවස්ථාවල දී කාන්තාවන්ට ස්ත්‍රී චර්මච්ඡේදනය සම්බන්ධ උපදෙස් ලබා දීම ද කරනු ලබන්නී ය. සිය බෑගයෙන් එළියට ගත් ළා කහපාට පත්‍රිකාවක් ඇය අප අත තැබුවා ය. ස්ත්‍රී චර්මච්ඡේදනයට විරුද්ධ ව ඇය දියත් කර ඇති නවතම ව්‍යාපාරය සම්බන්ධ ව එහි සඳහන් වී තිබුණි. ඇයගේ නව ව්‍යාපාරය "මිතුරාට කියන්න" (Tell a friend) යනුවෙන් ඇය නම් කර තිබුණි.

"බර්ලින් නගරයේ නොයි ක්ලෝන් (Neu Kölln) නමැති ප්‍රදේශයේ ජීවත් වන ගැහැනු ළමුන් අතර අපි මේ පත්‍රිකාව බෙදා හරිනවා... නොයි ක්ලෝන් කියන ප්‍රදේශයෙ තමයි බර්ලින් නගරයේ වැඩියෙන් ම අප්‍රිකානු ජාතිකයින් ජීවත් වන්නෙ... සාමාන්‍යයෙන් මංගල උත්සව පැවැත්වෙන අවස්ථාවල දී තමයි අපි ඒ ස්ථානයට ගිහිල්ලා මේ පත්‍රිකා බෙදන්නෙ... මංගල උත්සව පැවැත්වෙන ස්ථානය තමයි පත්‍රිකා බෙදන්න හොඳ ම තැන... නැත්නම් කොහොම ද පත්‍රිකා තුන් හාරසියයක් එක පාරට බෙදන්නෙ... අද මම පත්‍රිකා තුන්සීයක් බෙදුවොත් හෙට කාන්තාවන් සීයක් පමණ මාව හොයාගෙන එනවා" මරියටව් පැහැදිලි කිරීමක් කළා ය.

"ස්ත්‍රී චර්මච්ඡේදනය නමැති අනතුරට මුහුණ දී සිටින හෝ මුහුණ දෙන්නට සිටින කාන්තාවන්... ගැහැනු ළමුන් ඔබ හඳුනා ගන්නෙ කෙසේ ද? මොකද ඔවුන් නිකම් අප්‍රිකානු රටකින් එනවා ද කියන කාරණාව අනුව ඒක විනිශ්චය කරන්න බැහැ නේද?"

"හරියට ම හරි... එහෙම විනිශ්චයක් කරන්නට බැහැ... උදාහරණයක් හැටියට මම සියරාලියෝන් රටේ සිට එන අයෙක්... එහි අගනුවර වන ෆ්‍රීටවුන්... ඒ ප්‍රදේශයෙ ස්ත්‍රී චර්මච්ඡේදනය සිදුවන්නෙ නෑ... නමුත්, රට ඇතුළෙ මෙම ක්‍රියාදාමය සිදුවෙනවා... ඒ නිසා ගැහැනියක් අප්‍රිකානු රටකින් ආ පළියට ඒ ස්ත්‍රියට චර්මච්ඡේදනය සිදුකරලා තියෙනවා කියලා කියන්න බෑ" ඇය කීවා ය.

ජර්මනිය තුළ ස්ත්‍රී චර්මච්ඡේදනය පිළිබඳ ව දැනුවත් කිරීම සඳහා අධ්‍යාපන කවයක් ස්ථාපිත කිරීම සම්බන්ධ ව ගැඹුරින් කල්පනා කළ යුතු ව ඇත. මේ සම්බන්ධ ව වසර ගණනාවක් කටයුතු කොට අත්දැකීම් ඇති මරියටව්ගේ අදහසට අනුව ස්ත්‍රී චර්මච්ඡේදනය පිළිබඳ අප්‍රිකානු කාන්තාවන් සමඟ සාකච්ඡා කළ යුත්තේ අප්‍රිකානු කාන්තාවක් ම ය. "යම් හෙයකින් යුරෝපීය කාන්තාවක් අප්‍රිකානු ගැහැනු ළමයකුට කිව්වොත් චර්මච්ඡේදනය පහත් ක්‍රියාවක් කියලා අප්‍රිකානු ගැහැනු ළමයා යුරෝපයේ ඉපදී හැදුණු වැඩුණු ළමයකු වුවත් ඒක පිළි ගන්නෙ නෑ."

"ස්ත්‍රී චර්මච්ඡේදනය ගැන කතා කරමු" යන සටන් පාඨය යටතේ පිරිමි සහ ගැහැනු යන දෙපාර්ශ්වය ම කැඳවා මරියටව් විසින් සාකච්ඡා සංවිධානය කර ඇත. "ඇත්තෙන් ම ඒ සාකච්ඡාවලින් සෑම අයෙක් ම උද්යෝගිමත් වෙනවා... පුරුෂ පක්ෂය මෙම විෂය සම්බන්ධ ව කතා කරන්නට සූදානම්... ඇත්තෙන් ම ඔවුන්ගේ ඉදිරිපත්වීම මට මහ පුදුමයක්... සාමාන්‍යයෙන් අප්‍රිකානු පුරුෂයින් අප්‍රිකානු ස්ත්‍රීන් ඉදිරිපිට මෙවැනි විෂයක් ගැන කතා කරන්නට සූදානම් නෑ... එක දවසක් එවැනි සාකච්ඡාවක් අවසානයේ දී අවුරුදු හැත්තෑපහක් පමණ වයසැති පිරිමියෙක් නැගිටලා චර්මච්ඡේදනයට විරුද්ධව කතාවක් කළා" ඇය කීවා ය.

තවත් දිනක ඇය කාන්තාවන් පස් දෙනෙක් සමඟ සාකච්ඡාවක් පවත්වා ඇත. එම සාකච්ඡාවේ දී නයිජීරියාවේ සිට පැමිණි කාන්තාවක් මෙසේ පවසා ඇත. "යුරෝපීයයන් නිතර ම කියනවා චර්මඡේදනයෙන් ගැහැනියකගෙ ලිංගිකත්වය නැති වී යනවා කියලා."

"සංසර්ගයේ දී මට පුරතාන්තයට පැමිණෙන්නට බැරි වීම චර්මඡේදනය නිසා සිදුවන දෙයක් නො වෙයි... යුරෝපීයයන් මේ ප්‍රශ්නය සම්පූර්ණයෙන් ම ලිංගිකත්වයත් එක්ක සම්බන්ධ කරන්නට හදනවා" මරියටව් කීවා ය.

විශාලතම රාජ්‍ය නො වන සංවිධානයක් වන Terre des Femmes සංවිධානයේ වෙබ් අඩවියේ තිබී මා කියවූ පාඨයක් මම මරියටව්ට කියවීමි. එහි මෙසේ සඳහන් වී තිබුණි. "අප විසින් ස්ත්‍රී චර්මඡේදනයට විරුද්ධ ව කරගෙන යන ව්‍යාපාරය නිසා අපට විවේචන එල්ල වී තිබෙනවා. එසේ එල්ල වී ඇති එක විවේචනයක් නම් මෙසේ ය: "ජාතිවාදීන් පිරිසක් අන් ජාතීන්ගේ සංස්කෘතිය කෙලෙසීමට උත්සාහ කරනවා."

දෙමවුපියන් විසින් සිය දැරියන් තමුන්ගේ මවු රටවලට රැගෙන ගොස් චර්මඡේදනය සිදු කිරීම වැළැක්වීම සඳහා මරියටව් විසින් ගැහැනු ළමුන් සඳහා සාකච්ඡා වටයක් සංවිධානය කර ඇත. එමගින් පාසලේ එක පන්තියේ ඉගෙන ගන්නා දැරියන් එසේ රටින් පිටට රැගෙන ගොස් චර්මඡේදනය සිදුකිරීමේ අවදානමක් දැන ගන්නට ලැබුණොත් වහා ම එය නිසි බලධාරීන්ට දැන්වීමට අනෙකුත් දැරියන් දැනුවත් කරනු ඇත. "මේ සඳහා අපි ඒ දැරියන් මාර්ගයෙන් ඔවුන්ගේ දෙමවුපියන් හමුවෙනවා... විශේෂයෙන් ම අප්‍රිකානු ජාතිකයන් සමඟ විවාහ වී සිටින ජර්මන් කාන්තාවන් ගැන අප සැලකිලිමත් වෙනවා... බොහෝ විට දක්නට ලැබෙන දෙයක් නම් අප්‍රිකානු ජාතිකයින් සමඟ විවාහ වී සිටින ජර්මන් කාන්තාවන් පුරුෂයාගේ ආධිපත්‍යය නිසා මෙම චාරිත්‍රය විවේචනය කරන්නට නො හැකි තත්ත්වයක පසුවන බැවින් සිය දැරියන් චර්මඡේදනය සඳහා පුරුෂයාගේ මවුරටට ගෙන යන්නට ඉඩ දී බලා සිටින්නට ඔවුන්ට සිදු වී තිබෙනවා."

තමුන් ජීවත් වන රටේ සමාජයත් සමඟ ඒකාබද්ධ වීමේ වැදගත්කම අවධාරණය කිරීමට මරියටව්ගේ සංවිධානය විශේෂ අවධානයක් යොමු කරනවා. "ජර්මන් සමාජයත් සමඟ කිසි ම සම්බන්ධයක් නැති ව බර්ලින් නගරයේ හුදකලාව ජීවත්වන කාන්තාවන් මට නිතර ම හමුවෙනවා... එවැනි බොහොමයක් දෙනාහට මේ රටේ නීත්‍යානුකූල ව රැඳී සිටින්නට වලංගු වීසා බලපත්‍රයක් පවා නෑ... බොහොමයක් කාන්තාවන් ඉතා අවාසනාවන්ත ජීවිත ගත කරන්නෙ... සමහර නිවෙස්වල ජනෙල් පවා කැඩිලා... ඔවුන් ශාරීරික වශයෙන් ජර්මනියේ ජීවත්වෙනවා... එච්චරයි... අනෙකුත් සියල්ල ම සිදු වෙන්නෙ තමුන්ගෙ මවු රටවල්වල චාරිත්‍රවලට අනුව... ජර්මන් සමාජයත් සමඟ ජීවත්වන්නට අපි ඔවුන් ව දැනුවත් කළ යුතුයි.

යුරෝපයේ ජීවත්වන අප්‍රිකානු ප්‍රජාව ඔවුන් ජීවත්වන රටවල සමාජයෙන් හුදකලා වී ජීවත් වෙති. මනුෂ්‍යයන් වශයෙන් [illegible] ජීවත්වීමට අවැසි පහසුකම් සලසා දී ම සම්බන්ධ ව බලධාරීන්ගේ අවධානය යොමු විය යුතු කාලය දැන් පැමිණ ඇත. යුරෝපයේ ජීවත්වන අප්‍රිකානු ප්‍රජාව ඒ ඒ රටවල ප්‍රධාන සමාජ ප්‍රවාහයට අවශෝෂණය කර ගැනීමේ කර්තව්‍යය සිදුවිය යුත්තේ ඒ රටවල ආණ්ඩු මගිනි.

ජර්මන් පුවත්පතක මාධ්‍යවේදිනියක් සමඟ පුවත්පත් සාකච්ඡාවක් සඳහා මා හට ආරාධනයක් ලැබී තිබුණු අතර, මම ඇය හමුවන්නට බර්ලින් නගරයේ චර්ලොටන්බර්ග් දිස්ත්‍රික්කයේ පිහිටි ඉතා ප්‍රසිද්ධ ආපන ශාලාවක් වන Twelve Apostles නමැති ආපන ශාලාව තෝරා ගතිමි. පුවත්පත් සාකච්ඡාවලට මුහුණ දෙන්නට වූ සෑම අවස්ථාවක ම මෙන් මෙවර ද මා තුළ ඒ අනියත බියක් ඇති වී ඇති බැව් මට දැනෙන්නට විය. මා ලෝකයේ කීර්තිමත් විලාසිතා නිරූපණ ශිල්පිනියක් වුවත්, බොහෝදෙනා මා දෙස බලන්නේ ස්ත්‍රී චර්මඡේදනයේ ගොදුරක් බවට පත් වූ අයකු ලෙසට ය. මගේ ජීවිතය තුළ මා දහස් ගණනක් පුවත්පත් සාකච්ඡාවලට සහභාගි වී ඇත. මා මුහුණ දී ඇති වැඩි කොටසක් සම්බන්ධ සාකච්ඡාවල විෂය වූයේ ස්ත්‍රී චර්මඡේදනය යි.

මා ආපන ශාලාවට ඇතුළු වූ වහා ම ආපන ශාලාවේ කොනක අසුනක් ගෙන සිටි යුරෝපීය තරුණියක් මට අත වනනු මම දුටුවෙමි. මම ඇය වෙත ගොස් අසුන් ගතිමි. කෝපි කෝප්ප දෙකක් ඇණවුම් කළ අපි සාකච්ඡාව පටන් ගත්තෙමු. "ඔයාට මහත්මිය අපට කියන්න පුළුවන් ද කොහොම ද ඔබ මේ තියෙන මිනීමරු චාරිත්‍රයට මුහුණ දුන්නෙ කියලා?"

මේතෙක් මා තුළ වූ අනියත බිය කෝන්තියකට පෙරළෙන්නට පටන් ගැනිණ. "මගේ පොත් මගින් මට සිදු වූ දෙය මුළු ලෝකයට ම දැන ගන්න මං පැහැදිලි ව කියා තිබෙනවා. මම ලෑස්ති නෑ මං කාගෙවත් තුන්වෙනි පන්තියේ ආශාවල් සතුටු කරන්නට... මගේ එක ම අරමුණ ස්ත්‍රී චර්මච්ඡේදනය මේ මහපොළොවෙන් අතුගාලා දමලා ඊට ගොදුරු වෙන්නට ඉන්න දහස් ගණන් දැරියන් බේරා ගැනීම."

තරුණ පුවත්පත් කලාවේදිනිය තරමක් බියට පත් ව සිටිනු මම දුටුවෙමි. ඇය සමාව අයැද සිට දෙවැනි ප්‍රශ්නය මා වෙත ඉදිරිපත් කළා ය. "ඔබට දැන් කිසි යම් හැඟීමක් දැනීමක් තිබෙනවා ද? ඔබ ඔබගේ ලිංගික අවශ්‍යතාවයන් සපුරා ගන්නේ කෙසේ ද?"

"මම ඔබගේ ඔවැනි ප්‍රශ්නවලට පිළිතුරු දෙන්නට කොහෙත් ම සූදානමක් නැහැ" අසුනින් නැගී සිටි මම එතැනින් පිට වී යන්නට ගියෙමි.

යුරෝපීය ජාතිකයින් මෙතරම් අසංවේදී ව සහ ගරුත්වයකින් තොර ව මේ ආකාරයට කටයුතු කරන්නේ කෙසේ ද? ඔවුන්ට ඕනෑ කර තිබෙන්නේ මා ඔවුන් ඉදිරියේ හඬා වැටෙනු දැකීම යි. එවිට ඒ ඡායාරූප මුළුමහත් ලෝකයට ම දැන ගැනීම සඳහා ඔවුන්ගේ පුවත්පත්වල පළ කිරීමට ඔවුන්ට හැකි වනු ඇත. ඒ අවස්ථාවේ මා තුළ ඇති වූ කෝන්තිය මග හරවා ගනු වස් මම බර්ලින් නගරයේ වූ ටියර් ගාර්ඩන් නමැති උද්‍යානයේ වටයක් ඇවිදින්නට ගියෙමි.

පසු දින හේමන්තයේ ඉතා ප්‍රියකරු දිනයක් විය. එදින බර්ලින් නගරයේ දී පැවැත්වීමට නියමිත ව තිබූ "යටත් විජිතවාදයට විරුද්ධ අප්‍රිකානු සම්මේලනය" සඳහා මට ද ආරාධනයක් ලැබී තිබුණි. පාන්දරින් අවදි වූ මා එහි යන්නට සූදානම් වුණෙමි. සම්මේලනය පැවැත්වෙන ස්ථානයට කුලී රථයකින් නො යා, හේමන්තයේ ප්‍රියකරු කාලගුණය විඳිමින් පයින් යන්නට මම තීරණය කොට කොට්බිස්බර්ග් දක්වා පයින් ගියෙමි. එසේ ඇවිද යන අතර, මා තුළ නොයෙකුත් සිතුවිලි පහළ වන්නට විය. යුරෝපය තුළ අප්‍රිකානු කාන්තාවන්ට එතරම් ගෞරවයක් නො දක්වන්නේ මන්ද? ගොදුරක් දුටු වල් සතුන් මෙන් ඔවුන් අප දෙස බලන්නේ කුමන හේතුවක් නිසා ද? උගත්, එමෙන් ම උසස් සමාජ පසුබිමකින් පැමිණ සිටිය ද ඔවුන් අප ව දකින්නේ ඉතා පසුගාමී කොටසක් වශයෙනි.

අප්‍රිකානු කාන්තාවන් වෙත යුරෝපීයයන් දක්වන ආකල්පයට පසුබිම් වී ඇත්තේ යටත්විජිතවාදී යුගයේ අප්‍රිකානු රටවල් යුරෝපයේ කොලනි බවට පත් ව තිබීම හැර අන් කිසි කරුණක් නො වේ. මහා බ්‍රිතාන්‍යය සහ ප්‍රංශය අප්‍රිකානු රටවල් යටත් කොට කොලනි වශයෙන් තබාගෙන සිටි බැව් කවුරුත් දන්නා සත්‍යයකි. යටත්විජිතවාදී යුගය තුළ ජර්මනිය ද සමහර අප්‍රිකානු රටවල් අල්ලාගෙන කොලනි වශයෙන් තබාගෙන සිටි බවට ඉතිහාසය දෙස් දෙයි.

වර්ෂ 1848 බර්ලින් නගරයේ දී පවත්වන ලද බර්ලින්-අප්‍රිකා සම්මේලනයේ දී ගත් තීරණවලට අනුව ලෝකයේ බලවත් ජාතීන් විසින් අප්‍රිකාව එකිනෙකා අතර බෙදා වෙන්කර ගන්නා ලදි. ඒ අනුව නැමීබියාව, ටෝගෝ සහ කැමරූන් යන රටවල් ජර්මනියට අයත් විය. ඒ රටවල තිබූ වටිනා දේවල් ජර්මන් ජාතිකයින් විසින් ජර්මනියට රැගෙන ගොස් තිබූ අතර, මහජනතාව නිර්දය ලෙස සූරා කන ලදි. යටත්විජිතවාදීන්ට විරුද්ධ ව ඒ ඒ රටවල පැනනැගුණ කැරලි ඔවුන් විසින් ඉතා කෲර ලෙස යටපත් කරන ලදි. ජර්මන් යටත්විජිතවාදීන් විසින් ඉහත සඳහන් රටවල්වලට කරන ලද විනාශය ගැන බර්ලින් නගරයේ වෙසෙන බොහෝ දෙනෙක් නො දන්නේ ය. ඒ සම්බන්ධ ව ඔවුන් දැනුවත් කළ ද

කිසිවකු ඒ පිළිබඳ මෙතෙක් කිසි යම් හෝ අවධානයක් යොමු කර නැත. සුජනන විද්‍යාව සඳහා (eugenics) සඳහා පර්යේෂණ ඇතුළත්වීම අරමුණු කරගෙන ජර්මන් විද්‍යාඥයින් විසින් ජර්මනියට ගෙනෙන ලද අප්‍රිකානු ජාතිකයින්ගේ මළසිරුරුවල ඇටකටු ඒ මළසිරුරු අයත් අප්‍රිකානු රටවල්වලින් අදටත් ඉල්ලා සිටින නමුදු මෙතෙක් ඒ කිසිවක් ආපසු ලබා දී නැත. යටත්විජිත යුගයේ ජර්මන් ජාතිකයින් විසින් අප්‍රිකාව තුළ කරන ලද මිනිස් සමූල ඝාතනයේ සංවත්සරය සිහිකිරීම වස් හෙරෙරෝ (Herero) ගෝත්‍රයට අයත් කොටස් මෙම සම්මේලනයට සහභාගී වීම සඳහා බර්ලින් නගරයට පැමිණ සිටියහ.

ස්ත්‍රී චර්මච්ඡේදනයට ගොදුරු වූ කාන්තාවන්ගේ අවශ්‍යතාවයන් සඳහා ජර්මන් සෞඛ්‍ය සේවය තුළ කිසි යම් හෝ වැඩපිළිවෙළක් සකස් කොට හෝ නොමැත. මේ සම්බන්ධ ව ජර්මන් වෛද්‍යවරුන් දැනුවත් කළ යුතු නමුදු, මෙතෙක් මේ විෂය සම්බන්ධ කිසිවක් නොදන්නා වෛද්‍යවරුන්ට ස්ත්‍රී චර්මච්ඡේදනය සම්බන්ධ ව හඳුන්වා දී ඇත්තේ දැනට වසරකට පමණ පෙර ය. මේ සම්බන්ධ ව ජර්මන් වෛද්‍යවරුන් දැනුවත් කළ යුතු නමුදු, මෙතෙක් මේ විෂය සම්බන්ධ කිසිවක් නොදන්නා වෛද්‍යවරුන් සහ හෙදියන් බොහෝ සිටිති. එහෙයින් වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීම සඳහා ආරෝග්‍ය ශාලා වෙත යන මේ වැනි කාන්තාවන් වෙත වෛද්‍යවරුන් දක්වන ආකල්පය ඉතා නින්දිත ය. වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීම සඳහා පැමිණෙන ඒ වැනි කාන්තාවන්ට සැලකිය යුතු ආකාරය සම්බන්ධ කිසි යම් හෝ ආචාර ධර්ම පද්ධතියක් ජර්මන් වෛද්‍ය සේවය තුළ නොමැත. බර්ලින් නගරය තුළ ස්ත්‍රී චර්මච්ඡේදනයට ලක් වූ දෙදහස් පන්සියයක් පමණ කාන්තාවන් වාසය කරන අතර, ඔවුන් සඳහා අප්‍රිකානු සම්මේලනයට සහභාගී වූ අතර තුර ජුලියා සහ ලී, වෛද්‍ය සබිනා හමු වී තිබුණි. වෛද්‍ය සබිනා මුලර් නාරි වෛද්‍ය විශේෂඥවරියක් වූ අතර, ඇය පවුල් සැලසුම් කිරීමට සම්බන්ධ වෛද්‍ය ආයතනයක සේවය කළා ය. ඇය සිය වෛද්‍ය ආයතනය මඟින් ගැබ්ගත් කාන්තාවන්ට අවශ්‍ය උපදෙස් ලබා දීම,

ගැබ් ගැනීමෙන් වැළකී සිටීමට අවැසි උපදෙස් සහ ලිංගිකත්වය සහ ලිංගික සම්බන්ධතා සම්බන්ධ කාන්තාවන්ට උපදෙස් ලබා දෙන්නී ය. ඇය වෙත එන කාන්තාවන්ට අවශ්‍ය වෛද්‍ය ප්‍රතිකාර සහ උපදෙස් නොමිලේ ලබා දෙනු ලැබේ. මුදල් සහ අදාළ පෝරම පිරවීමට පෙර මනුෂ්‍යත්වයට මුල් තැන දී කටයුතු කරන ඒ වැනි වෛද්‍යවරියක් ගැන අසන්නට ලැබීමෙන් මම ප්‍රීතියට පත් වූයෙමි.

ජුලියා සහ ලී වෛද්‍ය සබිනා මුලර්ගේ වෛද්‍ය ආයතනය වෙත යන විට කාන්තාවන් තිදෙනෙක් සහ තරුණ යුවළක් එහි සිටිනු ඔවුන් දැක ඇත. ජුලියා සහ ලී දුටු වෛද්‍යවරියගේ ලේකම්වරිය මාධ්‍යවේදීන් දෙදෙනෙක් පැමිණ ඇති බව වෛද්‍යවරියට දන්වා ඇත. පැය භාගයකට පමණ පසු ජුලියා සහ ලී වෙත පැමිණි සබිනා මුලර් ඔවුන් දෙදෙනා ඇගේ කාමරයට කැඳවාගෙන ගොස් ඇත. අනතුරු ව දුම්වැටියක් දල්වා ගත් ඇය, ස්ත්‍රී චර්මච්ඡේදනය පිළිබඳ පළමු වරට දැනගත් ආකාරය පිළිබඳ කතාව ජුලියාට සහ ලීට විස්තර කරන්නට පටන්ගෙන ඇත. "වර්ෂ 1980 'එමා' (Emma) කියන සඟරාවෙ ස්ත්‍රී චර්මච්ඡේදනය ගැන ලිපියක් තිබිලා මම කියෙව්වා... එතකොට මම වෛද්‍ය විද්‍යාව හදාරන සිසුවියක්... විශ්වවිද්‍යාලයේ දී අපි මිනිස් ශරීරයේ ව්‍යුහය (human anatomy) ගැන ඉගෙන ගන්නා කොට ඔවැනි දෙයක් ගැන කවුරුවත් මට කියලා තිබුණෙ නෑ."

ඇය පළමු වරට ස්ත්‍රී චර්මච්ඡේදනයට ලක් වූ කාන්තාවක් දැක ඇත්තේ අවුරුදු දහයකට පමණ පෙර ය. 'ඇය ඉතියෝපියන් ජාතික කාන්තාවක්... ඇගේ භගශිෂ්නිකාව පමණක් නොවෙයි යෝනි තොල් ද සම්පූර්ණයෙන් ම කපා ඉවත් කර තිබුණා... ඇගේ ස්වාමිපුරුෂයා ජර්මනිය බලා එන්නට පෙර සිය බිරිඳට අන් අයකු සමඟ කායික සම්බන්ධයක් පවත්වන්නට බැරි වන ලෙසට යෝනි තොල් කපා දමා එම ස්ථාන නැවතත් මසා දමා තිබුණා... ඇය ජර්මනියට ආවට පස්සෙ ඒ දෙන්න ම මගේ චිකිත්සාගාරයට

ආවා... ඔවුන් දෙවැනි දරුවෙකු බලාපොරොත්තුවෙන් සිටින නිසා මැහුම් ඉවත් කර ගැනීමට යි එදා පැමිණ සිටියෙ... පළමුවෙනි දරුවාගේ උප්පත්තිය සිදුවෙලා තියෙන්නෙ සිසේරියන් ක්‍රමයට යි... ඊට හේතුව කවුරුත් ඉදිරිපත් වෙලා නෑ මැහුම් ඉවත් කරන්න."

"ඔවුන්ගෙ ඉල්ලීම ඉටු කිරීම ඔබට ප්‍රශ්නයක් වුණේ නැත්ද?"

"අප එමා කියන සහරාවෙ හිටිලා චර්මච්ඡේදනය සම්බන්ධ ව මා කියවූ ලිපියෙන් මේ සම්බන්ධ ව විස්තර මම දැන ගත්තා... ඒ වන විට මම මේ ගැන දැනගෙන සිටිය නිසා මට ඒ අයගෙ ඉල්ලීම ඉටු කරන්න ප්‍රශ්නයක් වුණේ නෑ."

"ස්ත්‍රී චර්මච්ඡේදනයට ලක් වූ කාන්තාවකට ප්‍රතිකාර ලබා දීමේ දී ඔබ හැසිරෙන්නෙ කොයි ආකාරයකට ද?"

"හරියට ම දූෂණයට ලක් වූ කාන්තාවක් සමග කටයුතු කරන පිළිවෙළට ඉතාමත් ප්‍රවේශමෙන් ස්ත්‍රී චර්මච්ඡේදනයට ලක් වූ කාන්තාවන් සමග කටයුතු කළ යුතු යි... මගෙ දෙවියනේ ඔයා මේ කරගෙන තියෙන්නෙ මොකක් ද වැනි ප්‍රතිචාර නො දැක්විය යුතු යි... ඔවුන් සමග කටයුතු කරන විට ආදරයෙන් සහ කරුණාවෙන් කටයුතු කළ යුතු යි."

එක්තරා නාරි වෛද්‍යවරයෙක් ස්ත්‍රී චර්මච්ඡේදනයට ලක් වූ කාන්තාවකට කතා කර තිබූ නොහොබිනා ආකාරය ගැන ඒ කාන්තාව මා සමග පවසා තිබෙනවා. වෛද්‍ය චිකිත්සාගාරයක් තුළ රෝගීන් පැමිණීමේ දී එවැනි නොහොබිනා වචන පාවිච්චි නො කළ යුතු බැවි ස්ත්‍රී චර්මච්ඡේදනය සම්බන්ධ වෛද්‍ය විශේෂඥයකු වන හැරි ගෝර්ඩන් අවධාරණය කර තිබෙනවා.

එහෙත්, අවාසනාවකට මෙන් ඒ දෙය නැවත නැවතත් සිදු වෙනවා. මේ සම්බන්ධ ව කැනඩාවේ දී කරන ලද සමීක්ෂණයකට අනුව, ඒ සඳහා සම්මුඛ සාකච්ඡා පැවැත්වූ කාන්තාවන්ගෙන් 83%ක් පවසා ඇත්තේ වෛද්‍ය ආයතන තුළ දී ඔවුන්ට කිසි යම් ගෞරවයකින් තොර ව සලකා ඇති බවයි. 47%ක් පමණ

වෛද්‍යවරු ස්ත්‍රී චර්මච්ඡේදනයට ලක් වූ කාන්තාවන්ට සලකා ඇත්තේ කෝපයෙන් සහ පිළිකුලින් බැව් වැඩි දුරටත් එම සමීක්ෂණයෙන් හෙළි වී තිබෙනවා.

"චර්මච්ඡේදනයට ලක් වූ කාන්තාවන්ට මෙහි දී ලබා දිය හැකි ප්‍රතිකාර මොනවා ද?" වෛද්‍ය සබිනා මුලර් හමු වූ අවස්ථාවේ දී ජූලියා ප්‍රශ්න කර ඇත.

"අප ළඟට එන කාන්තාවන්ගෙන් සියයට විස්සකගෙ පමණ භගශිෂ්නිකාව පමණක් නො වෙ. යෝනි තොල් ද සම්පූර්ණයෙන් ම කපා ඉවත් කර ඒ ස්ථාන මත මැහුම් දමා තිබෙනවා... අපි කරන්නෙ සුළු ශල්‍යකර්මයකින් අර මැහුම් කපා ඉවත් කිරීම යි."

"ඔබ විස්තර කළ ශල්‍යකර්මය තුළ දී භගශිෂ්නිකාව ප්‍රතිසංස්කරණය කිරීමක් සිදු වෙනව ද?" ජූලියා ප්‍රශ්න කර ඇත.

"භගශිෂ්නිකාව කපා දමා ඇත්නම් එය ප්‍රතිසංස්කරණය කරන්නට බැහැ... නමුත්, ඒ ස්ථානයේ සමට යටින් භගශිෂ්නිකාවේ ඉතුරු කොටස තිබෙනවා... අපිට පුළුවන් ඒ කොටස මතු කරලා දෙන්නට" සබිනා මුලර් පිළිතුරු දී ඇත.

"දරු ප්‍රසූතියකින් පස්සෙ නැවතත් පෙර සේ ම ඒ ස්ථාන මසා දමන ලෙස කාන්තාවන් ඔබගෙන් ඉල්ලුම් කරපු අවස්ථා තියෙනව ද?"

"මෙතෙක් නම් කවුරුවත් එහෙම ඉල්ලීමක් කරලා නැහැ... එහෙම ඉල්ලීමක් කරලා තිබුණත් ඒක මම ප්‍රතික්ෂේප කරනවා" වෛද්‍යවරිය පිළිතුරු දී ඇත.

5

ඕස්ට්‍රියාවේත් චර්මඡේදනය සිදුවෙයි

ස්ත්‍රී චර්මච්ඡේදනය සම්බන්ධ ව වෛද්‍යවරු සහ වෛද්‍යවරියන් හට ඉතා වැදගත් කාර්යයභාරයක් ඉටු කිරීමට ඇත. නිරන්තරයෙන් කාන්තාවන්ගේ සෞඛ්‍යය සම්බන්ධ ව දැන ගැනීමට ලැබෙන්නේ වෛද්‍යවරුන්ට පමණි. එහෙයින් විෂය සම්බන්ධ ව මහා අවබෝධයක් ඔවුන්ට තිබිය යුතු අතර, එ වැනි කාන්තාවන්ට වෛද්‍ය උපකාර ලබා දීමේ දී වෛද්‍යවරුන් රෝගීන් වෙත කාරුණික වීම මෙහි දී අතිශයින් ම වැදගත් කරුණක් බැව් සැලකිය යුතු ය. කිසි යම් සැක සහිත තත්ත්වයක් වෛද්‍යවරුන්ට දැන ගැනීමට ලැබුණහොත් ඒ සම්බන්ධ ව අදාළ බලධාරීන්ට දැන්වීම මගින් ස්ත්‍රී චර්මච්ඡේදනයට ලක්වීමට සිටින එක ම පවුලේ අනෙකුත් දැරියන් එම ව්‍යසනයෙන් බේරා ගැනීමට ද ඔවුන්ට හැකියාව ඇත. එහෙත්, වෛද්‍යවරුන් එම වගකීම නිසි ලෙස ඉටු කරනවා ද?

මේ සම්බන්ධ ව සොයා බැලීම සඳහා අදාළ වෛද්‍යවරුන් අප හට සම්බන්ධ කර දීමට හැකි අප්‍රිකානු කාන්තාවක් අපි සෙව්වෙමු. දින දෙකකට පමණ පසු අපට ඒ සඳහා නිසි කාන්තාව සොයා ගැනීමට හැකි විය. ඇගේ නම ෆ්ලෝරා ය (මෙය ඇගේ නියම නම නො වේ). නයිජීරියානු ජාතිකාවට අයත් ඇය ඔස්ට්‍රියාවට පැමිණ වසරක් පමණ ගත වී ඇති අතර, දේශපාලන සරණාගතයකු වශයෙන් එහි ජීවත් වන්නී ය. ස්ත්‍රී චර්මච්ඡේදනයට විරුද්ධ ව සිය ජීවිතය පවා පරදුවට තබා කටයුතු කරන්නට ඇය සැදී පැහැදී සිටින්නී ය.

ඇයගේ මාර්ගයෙන් අපගේ පරීක්ෂණය අපි දියත් කළෙමු. නාරි වෛද්‍යවරුන්ගේ දුරකතන අංක කීපයක් සොයා ගත් ඇය, පළමුවෙනි වෛද්‍යවරයාට දුරකතනය මගින් කාරණය පැහැදිලි කර සිටියා ය. දුරකතනය මගින් වෛද්‍යවරුන් සම්බන්ධ කර ගනිමින් ඔවුන් සමග කරන සංවාදය අපට ද අසා සිටින්නට ඇය සැලැස්සුවා ය. වෛද්‍යවරුන් කීපදෙනකු සමග පළමුවෙන් ම කරන ලද දුරකතන ඇමැතුම්වලින් නිසි ප්‍රයෝජනයක් නො වී ය. ඊට හේතුව ඔවුන් ඉංග්‍රීසි භාෂාව නො දැන සිටීම ය. අනතුරු ව ඇය ඉංග්‍රීසි බස වහරන්නට හැකි වෛද්‍යවරයකු දුරකතනය මගින් සම්බන්ධ කර ගත්තා ය.

"සුබ උදෑසනක් වේවා... මගේ නම තෙරේසා ඔකෙරෝ... මට පොඩි ප්‍රශ්නයක් තියෙනවා... මම හිතනවා ඔබට ඒකට උදව් කරන්නට පුළුවන් කියලා... මම නයිජීරියන් ජාතික කාන්තාවක්... මට දුවෙක් ඉන්නවා... එයාට වයස අවුරුදු දහසයයි."

"අවුරුදු දහසයයි." වෛද්‍යවරයා දුරකතනයේ අනෙක් පැත්තෙන් ප්‍රශ්න කළේ ය.

"ඔව් අවුරුදු දහසයයි... මට ඕනෑ එයාට ඔබ ලවා චර්මච්ඡේදනය සිදු කර ගන්න."

"මොකක්ද ඔබගේ දුවට තියෙන ප්‍රශ්නය" වෛද්‍යවරයා ප්‍රශ්න කළේ ය.

"මට අවශ්‍ය මගේ දුවගෙ චර්මඡේදනය සිදු කරගන්නට."

"හොඳයි... පොඩ්ඩක් ඔහොම ඉන්න.. මම බලන්නම් මට ඔබ ව හමු වන්නට පුළුවන් වෙලාවක් තියෙනව ද කියලා... (මඳ නිහැඬියාවක් ඇති විය) මට ඔබගෙ දුරකතන අංකය දෙන්න... මම ඔබට තව පොඩ්ඩකින් කතා කරන්නම්."

විනාඩි කීපයක් පසු ෆෝලෝරාගේ ජංගම දුරකතනය නාද විය.

"හෙට හැන්දෑවෙ හයට ඇවිල්ලා මාව හමුවන්න."

"ඔබ මේ සඳහා කොපමණ මුදලක් අය කරනව ද?"

"යූරෝ දෙසීයක් අරගෙන එන්න" එසේ පවසමින් ඔහු දුරකතනය විසන්ධි කළේ ය.

පසු දින 5.30 වන විට අපි ඔහුගේ චිකිත්සාගාරය වෙත ගියෙමු.

චිකිත්සාගාරය තුළට ගිය ෆෝලෝරා ඔහුට කාරණය පැහැදිලි කර ඇත. ඇයගේ අවශ්‍යතාවය ගැන ඇසූ වෛද්‍යවරයා පුදුමයට පත් වී ඇත. වෛද්‍යවරයා සිතාගෙන ඇත්තේ පිරිමි දරුවකුගේ චර්මඡේදනය කරවා ගැනීමට ෆෝලෝරා පැමිණ ඇති බව ය.

"දොස්තර මේ ගැන පොලීසියට පැමිණිලි කරන බවක් කීවා ද? එහෙමත් නැත්නම් ස්ත්‍රී චර්මඡේදනයේ ඇති ආදීනව ඔබට පැහැදිලි කරලා ඒ අදහස අත් හරින්නට ඔබ ව උනන්දු කළා ද?" පසු ව මම ඇයගෙන් ප්‍රශ්න කළෙමි.

එවැනි කිසිවක් වෛද්‍යවරයා පවසා නැති අතර, ඔහු මෙසේ පවසා ඇත.

"බොහොම කනගාටුයි... මට ඔබගේ ඉල්ලීම ඉටු කරන්නට බැහැ... මේ ශල්‍යකර්මය නීතියෙන් තහනම් ක්‍රියාවක්... මේක කරලා අහු වුණොත් බරපතළ වැඩ ඇති ව හය මාසයක සිර දඬුවමක් විඳින්නට සිදු වෙනවා" වෛද්‍යවරයා ෆෝලෝරාගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කරමින් පවසා ඇත.

ෆෝලෝරාගේ මවුරටේ නම් ස්ත්‍රී චර්මඡේදනය සාමාන්‍ය දෙයක් බැව් ඇය වෛද්‍යවරයාට පවසා ඇත.

"ඔව් මම දන්නවා ස්ත්‍රී චර්මඡේදනය අප්‍රිකානු රටවල්වල චාරිත්‍රයක් බව... ඒ නිසා එවැනි දෙයක් කරගන්නට නම් ඔබ ඔබගේ රටට ගොස් එය කරවා ගත යුතුයි. අපට මෙවැනි ශල්‍යකර්මයක් කිරීම සම්පූර්ණයෙන් නීතියෙන් තහනම්" වෛද්‍යවරයා තවදුරටත් කියා ඇත.

අනතුරු ව ෆෝලෝරා වෛද්‍යවරයාගෙන් සමුගෙන පැමිණියා ය.

වෛද්‍යවරයා මෙම සැහැසි ක්‍රියාව විවේචනයට ලක් කිරීමක් හෝ ඒ සම්බන්ධ ව ෆෝලෝරාට අනතුරු ඇඟවීමක් හෝ කර නොමැත. ඒ වෙනුවට වෛද්‍යවරයා කර ඇත්තේ ඇයට ඇගේ මවුබිමට ගොස් ඒ කර්තව්‍යය කරගන්නා ලෙස අනුබල දීමකි.

ප්‍රංශයේ වෛද්‍යවරයකු මෙවැනි අවස්ථාවකට මුහුණ දෙන්නට සිදු වූවා නම් මෙවැනි දේ සම්බන්ධ ව වෛද්‍යවරුන් බලධාරීන් වෙත දැනුම් දීමට බැඳී සිටින බැවින් ඒ සම්බන්ධ ව නීතිය ක්‍රියාත්මක වනු ඇත.

සතියකට පසු අපි වෙනත් වෛද්‍යවරයකුට දුරකතනය හරහා මේ සම්බන්ධ ව කතා කළෙමු. පෙර සේ ම ෆෝලෝරා වෛද්‍යවරයාට කාරණය විස්තර කළා ය. ෆෝලෝරාට වෛද්‍යවරයා හමුවීමට දිනයක් සහ වේලාවක් ලැබුණි. වෛද්‍යවරයා කතා කළ ආකාරයෙන් ඔහු ඊජිප්තියානු ජාතිකයකු නොවන බව අපි තේරුම් ගතිමු.

වෛද්‍යවරයා විසින් දෙන ලද වේලාවට අනුව පසු දින සවස පහට ඔහු හමුවීමට නියමිත ව තිබුණි. ඔහුගේ චිකිත්සාගාරය පිහිටා තිබුණේ වියානා නගරයේ සමෘද්ධිමත් පෙදෙසක ය.

අපි ෆෝලෝරාත් සමඟ නියමිත වේලාවට එහි ගියෙමු. අප චිකිත්සාගාරය වෙත යන විට එහි සිටියේ වෛද්‍යවරයා සහ ඔහුගේ පිළිගැනීමේ නිලධාරිනිය පමණි. වෛද්‍යවරයාට ඉංග්‍රීසි බස ගැන එ තරම් දැනුමක් නොමැති බැව් අපි එක වර ම තේරුම් ගතිමු. එහෙයින්, ෆෝලෝරාට ඇයගේ අවශ්‍යතාවය කීප වතාවක් කියා සිටින්නට සිදු විය.

"ආ... ඔබට අවශ්‍ය ඔබගේ දියණියට චර්මඡේදනය කරවා ගන්නවයි... ඒ කියන්නේ ඇගේ භගශිශ්නිකාව කපා ඉවත් කර ගැනීම යි."

"ඔව්" ෆෝලෝරා පිළිතුරු දුන්නා ය.

"වියනාවල නම් එවැනි ශල්‍යකර්මයක් කරන්නට බැහැ" වෛද්‍යවරයා කාරණය තේරුම් ගනිමින් කීවේ ය.

"ඒක ඔස්ට්‍රියාවේ නීතියෙන් තහනම් කරලා තියෙන්නෙ" පිළිගැනීමේ නිලධාරිනිය ද සාකච්ඡාවට සහභාගි වෙමින් කීවා ය.

"එවැනි ශල්‍යකර්මයක් කරනව නම් එය රහසිගත ව කළ යුතු යි... කොහොම උනත් මම එවැනි ශල්‍යකර්ම කරන්නෙ නැ... මේ සම්බන්ධ ව මම දන්න වෛද්‍යවරයෙක් ඉන්නවා. (ඔහු පිළිගැනීමේ නිලධාරිනිය දෙසට හැරෙමින්) කරුණාකරලා වෛද්‍ය එම්මගෙ දුරකතන නොම්මරය මට හොයලා දෙන්න."

"මෙවැනි ශල්‍යකර්මයක් ඔස්ට්‍රියාව තුළ කිරීමෙන් ප්‍රශ්න ඇති වන්නට පුළුවන්... මෙහෙ වෛද්‍යවරු ඒ ශල්‍යකර්මය කරන්න කැමති නැහැ... ඔවුන් කියා සිටින්නේ ඒක කාන්තාවන්ගෙ සෞඛ්‍යයට අහිතකර බවයි... අනෙක ඒක අප්‍රිකානු චාරිත්‍රයකට අනුව කෙරෙන දෙයක්" වෛද්‍යවරයා විස්තර කළේ ය.

"ඒක නීති විරෝධී ක්‍රියාවක්" පිළිගැනීමේ නිලධාරිනිය නැවත වරක් පැවසුවා ය.

"ඔබලාට අවශ්‍ය ව ඇත්තේ භගශිශ්නිකාවෙන් සුළු කොටසක් කපා ඉවත් කර දැමීමට නම් ප්‍රශ්නයක් නැ... අර දුරකතන අංකය මේ අයට ලියලා දෙන්න."

පිළිගැනීමේ නිලධාරිනිය දුරකතන අංකය සොයාගෙන සටහන් කොට එය ෆෝලෝරාට දුන්නා ය. අනතුරු ව අපි වෛද්‍යවරයාගෙන් සමුගෙන චිකිත්සාගාරයෙන් පිට වූයෙමු.

මෙහි දී ද වෛද්‍යවරයා ෆෝලෝරාට ස්ත්‍රී චර්මඡේදනයේ ආදීන ව කියා දීමට ඉදිරිපත් නො වී ය. ඒ වෙනුවට නාරි වෛද්‍යවරයකු වූ ඔහු, ඒ කාර්යය භාර ගැනීම සඳහා වෙනත් වෛද්‍යවරයකුගේ දුරකතන අංකය ඇයට ලබා දුන්නේ ය.

පසු දින ෆෝලෝරා වෛද්‍ය එම්මට දුරකතනයෙන් කතා කොට ඇගේ අවශ්‍යතාවය ඔහුට පැහැදිලි කළා ය. "මගේ දුව විවාහ වීමට බලාපොරොත්තුවෙන් ඉන්නෙ... අපේ චාරිත්‍රයන්ට අනුව චර්මඡේදනය කරගන්නයි මට ඕනෑ..."

"ඒ ගැන දුරකතනයෙන් කතා කරන්නට බැ... ඔබ මගේ චිකිත්සාගාරයට එන්නට ඕනෑ... මට ඔබගේ දුරකතන අංකය දෙන්න... මම ඔබට පැමිණිය යුතු දිනය සහ වේලාව දන්වන්නම්" වෛද්‍යවරයා තරමක පැකිළීමකින් කියා ඇත.

ෆෝලෝරා ඔහුට ඇයගේ ජංගම දුරකතන අංකය දුන්නා ය.

විනාඩි දහයකට පමණ පසු වෛද්‍යවරයාගෙන් ෆෝලෝරාගේ ජංගම දුරකතනයට ඇමතුමක් ලැබුණි. "ඔබගේ දුවත් එක්ක දැන්ම එන්න" ඔහු කීවේ ය.

"ඔබ මේකට කීයක් අය කරනව ද?"

"ඒ ගැන මට දුරකතනයෙන් කියන්න බැහැ" ඔහු දුරකතනය විසන්ධි කළේ ය.

ෆෝලෝරා ඇගේ දහහත් හැවිරිදි දියණියත් සමඟ වෛද්‍ය එම් හමුවීමට ගියා ය.

"මට මගේ දුවගෙ චර්මඡේදනය කරගන්නට ඕනෑ" ඇය කතාව ආරම්භ කරමින් කියා ඇත.

"කෝ ඔබගෙ දුව සමග විවාහ වන්නට සිටින එක්කෙනා... ඇයි එහෙම දෙයක් කරගන්නට ඔබගේ දුවට අවශ්‍ය වෙලා තියෙන්නෙ... ඇය තවම කන්‍යාවියක් ද?" වෛද්‍යවරයා ප්‍රශ්න කර ඇත.

අවසානයේ දී ඔහු එවැනි ශල්‍යකර්ම නො කරන බැව් කියමින් ගෝලෝරාට සිය දියණිය ආරෝග්‍ය ශාලාවකට රැගෙන යන ලෙස දන්වා ඇත. චර්මච්ඡේදනයේ ඇති භයානකත්වය හෝ එහි ආදීන ව හෝ කියා දීමට වෛද්‍යවරයා උත්සුක වී නොමැත.

අපගේ පර්යේෂණය අපි මෙතැනින් නතර කළෙමු. මෙම පර්යේෂණය තුළින් අපි සොයා ගත් කරුණු නම් මෑතක සිට යුරෝපීය වෛද්‍යවරුන් ස්ත්‍රී චර්මච්ඡේදනය කිරීමෙන් වැළකී සිටින බවයි. දහනව වන සිය වර්ෂයේ මැද භාගයේ දී ජීවත් වූ වියානා නාරි වෛද්‍යවරයකු වූ ගුස්ටාව් බ්‍රවුන් විසින් භගශිෂ්නිකාව කපා දැමීමේ ක්‍රමවේදය ගැන ප්‍රශංසා මුඛයෙන් කතා කොට ඇති අතර, එය ස්ත්‍රීන්ගේ රෝග සමනය කිරීමට උපකාර වන බව ද පවසා ඇත. එකල වියානා නගරයේ සතියකට වරක් ප්‍රසිද්ධ කෙරුණු ලැබූ "වියානා" නමැති සඟරාවට "ස්ත්‍රී චර්මච්ඡේදනය මගින් භගශිෂ්නිකාව සහ යෝනි තොල් කපා හැරීම යෝනියට කරන සත්කාරයකි" යන මැයෙන් ලිපියක් ද ලියා ඇත. එම ලිපිය මගින් ඔහුගේ මතය සනාථ කිරීම සඳහා එක් සිද්ධියක් මෙසේ විස්තර කර ඇත: එක්තරා කාන්තාවක් වැටීමෙන් හිස තුවාල වීම හේතුකොටගෙන ඇයට වලිප්පුව වැනි කම්පනයක් හටගෙන ඇත. වෛද්‍ය බ්‍රවුන් විසින් එම ස්ත්‍රිය පරීක්ෂණයකට භාජනය කිරීමෙන් පසු යෝනියේ මාංශපේශී තදවීම රෝගයට හේතු බැව් සොයාගෙන ඇත. වෛද්‍ය බ්‍රවුන් විසින් එම කාන්තාවගේ භගශිෂ්නිකාව සහ යෝනි තොල් ශල්‍යකර්මයකින් ඉවත් කර ඇති අතර, ශල්‍යකර්මයෙන් පසු සති හයක් රෝහලේ සිට පෙරළා නිවසට ගිය ඇයට පූර්ණ සුවය ලැබී ඇත.

එට වසරකට පසු වෛද්‍ය බ්‍රවුන් විසින් පෙර දක්වන ලද වියානා වෛද්‍ය සඟරාවට "ස්ත්‍රී යෝනියේ භගශිෂ්නිකාව

සහ යෝනි තොල් ඉවත් කිරීම මගින් ස්වයං ශුක්‍ර මෝචනයට (Masturbation) ප්‍රතිකාර කිරීම සඳහා නව සත්කාරයක්" යන මැයෙන් ලිපියක් සපයා ඇත. ඔහුගේ සොයා ගැනීම ඔප්පු කිරීම සඳහා ඉතා වැදගත් පවුලකට අයත් විසිහතර වැනි වියේ පසු වූ කාන්තාවක් සම්බන්ධ ව මෙවැනි සිද්ධියක් ගෙන හැර දක්වා ඇත: මෙම කාන්තාව පහළොස් වන වියේ සිට ස්වයං ශුක්‍ර මෝචනයේ යෙදීමට පුරුදු ව ඇත. ඇගේ දෙමව්පියන්ගේ සහ ඇගේ ද කැමැත්ත ඇති ව පසු කලෙක ඇගේ භගශිෂ්නිකාව සහ යෝනි තොල් ඉවත් කර දමා ඇත. ඉන් පසු ව ඇය ස්වයං ශුක්‍ර මෝචනයේ යෙදීමෙන් වැළකී ඇති අතර, දින කීපයකට පසු ආරෝග්‍යශාලාව හැර ගොස් ඇත.

නවදුරටත් ගුස්ටාව් බ්‍රවුන් වැනි වෛද්‍යවරුන් යුරෝපයේ නොමැති වීම ගැන අපි දෙවියන්ට ස්තුතිවන්ත වෙමු. ස්ත්‍රී චර්මච්ඡේදනය සිදු කිරීමට ඉදිරිපත් වන වෛද්‍යවරුන් සම්බන්ධ ව අප කරගෙන ගිය පර්යේෂණය නවතා ස්ත්‍රී යෝනියේ රූපාංගනයමෝස්තරනය (the designer vagina) සඳහා ලන්ඩන් නගරයේ ඇති කෘත්‍රිම රූපලාවන්‍ය (Plastic Surgery) පුද්ගලික චිකිත්සාගාර සම්බන්ධ ව මට දැන ගන්නට ලැබුණි. ඒ සඳහා වැය වන මුදල ගෙවන්නට හැකි ඕනෑ ම අයකුට එවැනි පුද්ගලික චිකිත්සාගාරයක දී ඒ කර්තව්‍යය කර ගැනීමට හැකි ය.

ඒ සම්බන්ධ ව සත්‍ය තතු දැන ගැනීමේ අරමුණ ඇති ව මම ලන්ඩනයට ගියෙමි. කෘත්‍රිම රූපලාවන්‍ය චිකිත්සාගාර සොයා ගැනීම එතරම් අපහසු නො වී ය. එවැනි සෑම චිකිත්සාගාරයක් ම ඉදිරිපිට සුරූපී කතකගේ ඡායාරූපයක් රැගත් විශාල පෝස්ටර් එල්ලා තිබෙනු දැකිය හැකි ය. "ස්ත්‍රීන්ගේ සියුරුවල සිට ඕනෑ ම ශරීර අංගයක් වෙනස්කොට තමුන්ට රුචි ආකාරයට සකසා දෙනු ලැබේ" යනුවෙන් එම පෝස්ටරය මත ලියා තිබෙනු දැකිය හැකි ය. එය දුටු මා තුළ මහත් කම්පනයක් ඇති විය. මා විලාසිතා නිරූපිකාවක් වශයෙන් කටයුතු කළ කාලය තුළ කාන්තාවන්ගේ රූපලාවන්‍ය උමතුව මම ඉතා සමීප ව අත්දැක ඇත්තෙමි. එහෙත්,

රූපාලංකාරයේ නාමයෙන් යුරෝපීය කාන්තාවන් තම ශරීරයට දෙන වධ ගැන සිතන විට මා හට කිසි යම් අප්‍රියාවක් දැනෙන්ට විය. මෙම චිකිත්සාගාර තුළ කාන්තාවන්ගේ අවශ්‍යතාවයට අනුව ස්ත්‍රී යෝනියේ අවශ්‍ය ප්‍රමාණයට වඩා වැඩි ඇති යෝනි තොල් සහ භගශිශ්නිකාවේ අනවශ්‍ය කොටස් ශල්‍යකර්මයක් මගින් කපා ඉවත් කිරීම ද කරනු ලැබේ. මෙවැනි ශල්‍යකර්ම කෙරෙන්නේ ඊට ඉල්ලුමක් ඇති නිසා බැව් අප අමතක නො කළ යුතු ය.

ජර්මන් නාරි වෛද්‍යවරියක් සහ ස්ත්‍රී චර්මඡේදනය පිළිබඳ විශේෂඥවරියක් වන සබීනා මුලර් මානව හිමිකම් සංවිධානයක් වන "ටෙරා ඩෙස් ෆෙමිස්" (Terre des Femmes) නමැති සංවිධානයට මේ සම්බන්ධ ව ලිපියක් ලියා ඇත. එම ලිපියෙහි මෙසේ සඳහන් වී ඇත. "කාන්තාවන්ගේ පියයුරු, උකුළ සහ කලව කෘත්‍රිම රූපලාවන්‍ය ශල්‍යකර්මයට භාජනය කරන බැව් අපි දනිමු... දැන් මෙම ශල්‍යකර්මය මගින් ස්ත්‍රී ලිංගේන්ද්‍රයේ වෙනස්කම් සිදු කිරීමට ද කාන්තාවන් පෙළඹී සිටිති. වෛද්‍ය උපදෙස් සහ ප්‍රතිකාර ලබා ගැනීමට මා වෙත එන බොහොමයක් ජර්මන් කාන්තාවන් භගශිශ්නිකාවේ උඩ කොටස කප්පාදු කරගෙන ඇති අතර, එමගින් ඔවුන් ඉමහත් තෘප්තියක් සහ සංවේදීතාවක් අත්විඳින බැව් මා සමග පවසා ඇත. එමතු ද නො ව, අභ්‍යන්තර යෝනි තොල්වල ප්‍රමාණය අඩු කර ගන්නේ කෙසේ ද යන්න ඔවුන් මගෙන් නිතර ප්‍රශ්න කරති. මෙම කාන්තාවන් රූපලාවන්‍යයේ වහලුන් බවට පත් වී ඇත.

කෘත්‍රිම රූපලාවන්‍ය ශල්‍යකර්ම ගැන ඕනෑ තරම් තොරතුරු ඔබට අන්තර්ජාලය මගින් ලබා ගත හැකි ය. මෙය එංගලන්තයේ පමණක් නො ව, ජර්මනියේ ද සිදු වේ. බොහොමයක් කෘත්‍රිම රූපලාවන්‍ය චිකිත්සාගාර මගින් මෙම ශල්‍යකර්ම කර දෙන බැව් දන්වා අන්තර්ජාලයට දැන්වීම් ද එවා ඇත. ඒ අනුව භගශිශ්නිකාවේ උඩ කොටස කපා දැමීම, යෝනි තොල් කුඩා කිරීම සහ ප්‍රතිත තලයෙහි (Pubic mound) වෙනස්කම් සිදු කර දෙන බැව් ඒ දැන්වීම්වල සඳහන් වී ඇත. ලෝක සෞඛ්‍ය සංවිධානයේ ව්‍යවස්ථාවට අනුව මෙකියන කෘත්‍රිම රූපලාවන්‍ය ශල්‍යකර්මය ද අයත් වන්නේ ස්ත්‍රී චර්මඡේදනයට ය. ස්ත්‍රී චර්මඡේදනය එංගලන්තයේ නීතියෙන් තහනම් කර ඇති නමුදු, රූපලාවන්‍ය සඳහා කෙරෙන මෙවැනි ශල්‍යකර්ම ගැන කිසිවකුගේ තැකීමක් නැත. මේ සම්බන්ධ ව තවදුරටත් කරුණු සොයා ගැනීමේ අරමුණ ඇති ව මම අන්තර්ජාලය පිරික්සීමට පෙළඹුණෙමි. විවිධ රූපලාවන්‍ය සැත්කම් ගැන ලැයිස්තුවක් එහි තිබී මම කියවූයෙමි. ඒ අනුව ස්ත්‍රී යෝනියේ අභ්‍යන්තර යෝනි තොල් ප්‍රමාණයට වඩා විශාල වීම හේතුකොටගෙන පිටතට එල්ලා වැටීම නිසා කාන්තාවන්ට නොයෙකුත් අපහසුතාවන්ට මුහුණ දෙන්නට සිදුවන බැව් මා කියැවූ එක් ලිපියක සඳහන් ව තිබුණි. උදාහරණයක් වශයෙන් එවැනි කාන්තාවන් පාපැදියක් පැද යාමේ දී නැතිනම් ශරීරයට තද වන සේ කලිසමක් ඇඳ යන විට අපහසුතාවයකට මුහුණ දෙන්නට සිදුවනු ඇත. එමතු ද නො ව, එය තමුන්ගේ ලිංගික ජීවිතයට ද බලපාන්නට ඉඩකඩ ඇත. කාන්තාවන්ගේ මෙකියන උද ලිංගික අවයවයන් යථා තත්ත්වයට පත් කිරීම සඳහා වෛද්‍යවරුන් උපයෝගී කරගන්නා විශේෂ ක්‍රමවේදයට අනුව සෑම කාන්තාවකගේ ම පවතින තත්ත්වය සැලකිල්ලට ගැනීමෙන් අනතුරු ව ශල්‍යකර්මය සිදු කරන බැව් අන්තර්ජාලයට එවා ඇති දැන්වීම්වල සඳහන් වී තිබුණි. ශල්‍යකර්මයේ දී රුධිරය වහනය වීම අවම කර ගැනීම සඳහා අවශ්‍ය ම උපකරණ පමණක් භාවිත කෙරේ. එමතු ද නො ව, සාර්ථක ප්‍රතිඵල ලබා ගැනීම සඳහා ප්‍රතිසංස්කරණය කළ යුතු කොටස් ශල්‍යකර්මයට පෙර මැන බලා නිසි මිනුම්වලට අනුව ශල්‍යකර්මය සිදු කරනු ලැබේ. ලිංගේන්ද්‍රය ආශ්‍රිත එම කොටස් අවශ්‍ය ප්‍රමාණයට වඩා ඉවත් කිරීමෙන් පසු ඒ ස්ථානවලට ස්වයංක්‍රීය ව දිය වී යන ඉතා තුනී නූලක් මගින් මැහුම් දමන බැව් ඒ දැන්වීම්වල තවදුරටත් සඳහන් ව තිබුණි.

ස්ත්‍රී ලිංගේන්ද්‍රිය ආශ්‍රිත ව ඇති අවයවයන්ගේ විවිධ අසාමාන්‍යතාකම් දක්නට ලැබේ. ඉතා සුලභ ව දක්නට ලැබෙන අසාමාන්‍යතාවයක් නම් ප්‍රමාණයට වඩා විශාල භගශිශ්නිකාවන් ය. භගශිශ්නිකාව කුඩා කිරීම සඳහා කරන ශල්‍යකර්මයේ දී

භගශිෂ්නිකාවට රුධිරය ගලා ඒමට බාධා නො වන ආකාරයට සහ භගශිෂ්නිකාවේ සංවේදිතාවට හානියක් නො වන ආකාරයට ශල්‍යකර්මය කිරීම යන කරුණු දෙක ගැන අවධානය යොමු කළ යුතු යි. ස්ත්‍රී ලිංගේන්ද්‍රියේ භගශිෂ්නිකාව නමැති අවයවය මතු පිටින් පෙනෙන ප්‍රමාණය ම හමට යටින් ද තිබේ. ස්ත්‍රී චර්මඡේදනයේ දී සිදු කරන්නේ භගශිෂ්නිකාවේ උඩ කොටස කපා හැරීම යි. හමට යටින් ඇති කොටස එලෙසින් ම පවතී. භගශිෂ්නිකාව කුඩා කිරීම සඳහා කරන මෙම ශල්‍යකර්මයේ දී කරනු ලබන්නේ භගශිෂ්නිකාවේ සංවේදීත්වයට බාධා නො වන ආකාරයට සම යට ඇති කොටස මතුකර ගැනීම යි.

ස්ත්‍රී යෝනියේ ප්‍රතිභ තලයෙහි සමහර නිවැරදි කිරීම සඳහා සුලභ ව කෙරෙන ශල්‍යකර්මයක් නම් එහි අවශ්‍ය ප්‍රමාණයට වඩා පතිත ව ඇති මේදය යන්ත්‍රයක් අනුසාරයෙන් අවශෝෂණය කිරීම මගින් ප්‍රතිභ තලයේ ප්‍රමාණය කුඩා කිරීමේ ශල්‍යකර්මය යි.

කාන්තාවන් මෙවැනි ශල්‍යකර්ම සඳහා පොලඹවනු ලබන්නේ කුමන කරුණක් හේතුකොට ගෙන ද යන්න ගැන දැන ගැනීම සඳහා මම තවදුරටත් මෙම විෂය සම්බන්ධ වෙබ් අඩවියේ ඇති සටහන් කියෙව්වෙමි. සියයට විසිපහක් පමණ ජර්මන් කාන්තාවන්ගේ ලිංගේන්ද්‍රියන් ආශ්‍රිත අවයව වන භගශිෂ්නිකාව, අභ්‍යන්තර යෝනි තොල් යන ඉන්ද්‍රියයන් උප්පත්තියෙන් හෝ අන් කිසි යම් හේතුවක් නිසා හෝ අවිධිමත් ආකාරයකට විහිදා තිබීම ගැන ඔවුන් අතිශයින් ම කනස්සල්ලට පත් ව සිටින බැව් එක්තරා වෛද්‍යවරයෙක් විසින් වෙබ් අඩවියට ලිපියක් එවා තිබුණි.

එවැනි කාන්තාවන්ට හුමාල ස්නානය (sauna) සහ නිරුවත් ස්නානය කිරීම සඳහා යුරෝපයේ ඇති මුහුදු තීරයන්හි ස්නානය කිරීමට යාම ඉතා දුෂ්කර කරුණක් වී ඇත. මෙම හේතුව කරණකොටගෙන පුරුෂ පක්ෂය සමග සම්බන්ධතාම ඇති කර ගැනීම ද දුෂ්කර වන බැවින්, ඒ නිසා ඇති විය හැකි භාවාත්මක ප්‍රශ්නයන්ට අනිවාර්යයෙන් ම ඔවුන්ට මුහුණ දෙන්නට සිදු වන බැව් සඳහන් කරමින් එක් ජර්මන් වෛද්‍යවරයෙක් අනතුරු අඟවා

එවා තිබූ ලිපියක් මම කියවූයෙමි. ස්ත්‍රියකගේ අභ්‍යන්තර යෝනි තොල් (Labia minora) කපා ඉවත් කිරීම අනෙකුත් ඉන්ද්‍රියයන් වන භගශිෂ්නිකාව සහ බාහිර යෝනි තොල්වලින් හුදකලා කොට බැලිය නො යුතු බැව් එම වෛද්‍යවරයා ම පවසා ඇති අතර, මෙකියන සෑම අවයවයක් ම එකිනෙකට සම්බන්ධ ව තිබීම එයට හේතුව වශයෙන් ඔහු පෙන්වා දී ඇත. එහෙයින් මෙවැනි ඉන්ද්‍රියයන් ප්‍රතිසංස්කරණය කිරීමේ දී සාර්ථක ප්‍රතිඵල ලබා ගැනීමට නැති බැව් ඔහු තවදුරටත් පෙන්වා දී ඇත. එහෙත්, මෙවැනි ශල්‍යකර්මයක දී බොහෝවිට ආසාදනයක් ඇති වීමට ඉඩ ඇති බවත්, එවැනි ආසාදනයක් හේතුකොටගෙන යෝනි ප්‍රදේශයෙන් ඉදිමුම් සහ නොයෙකුත් අපහසුතාවන් ඇති වන්නට හැකි බැව් සඳහන් කරමින් තවත් වෛද්‍යවරයෙක් කාන්තාවන්ට අනතුරු අඟවා ලිපියක් එවා තිබුණි.

කරුණු එසේ වුව ද, මෙවැනි ශල්‍යකර්මයන්ට මුහුණ දී ඇති කාන්තාවන් සිය අත්දැකීම් විස්තර කොට අන්තර්ජාලයට එවා ඇති ලිපි මගින් මෙවැනි ශල්‍යකර්මවල ආදීන ව පැහැදිලි ව පෙන්වා දී ඇත. ඒ අනුව සංවේදීත්වය හීන වී යාම, කාමාශාව නැති වී යාම සහ සම්භෝගයෙන් තෘප්තියක් ලැබීමට නො හැකි වීම ආදී ද ඔවුන්ගේ ලිපිවල සඳහන් වී ඇත. මා හට කියවන්නට ලැබුණ කරුණු කාන්තාවන් කීපදෙනකුගේ අත්දැකීම් පහතින් දක්වමි.

පෝලෝවර් - මගේ බාහිර යෝනි තොල් සාමාන්‍ය ප්‍රමාණයට වඩා දිග ය. එහෙයින් යෝනි තොල් මගේ යට ඇඳුමේ ඇතිල්ලීම නිසා මගේ යෝනි තොල්වල දැවිල්ලක් හට ගන්නේ ය. මට දැන ගැනීමට අවශ්‍ය කරුණ නම් අභ්‍යන්තර යෝනි තොල් ද ප්‍රමාණයට වඩා දික් වන්නට ඉඩ ඇත් ද යන්න යි.

විවි - යෝනි තොල් ප්‍රමාණයෙන් කුඩා කර ගැනීම සඳහා මම ශල්‍යකර්මයක් කළෙමි. ඊට දිනකට පසු මගේ සම්පූර්ණ යෝනි ප්‍රදේශය ඉදිමුණ අතර, මට මහත් වේදනාවක් දැනෙන්නට විය.

පෝලෝවර් - යෝනි තොල් කුඩා කර ගැනීම සඳහා මම ශල්‍යකර්මයක් කළෙමි. ඉන් පසු ව මා හට උසුලාගත නො හැකි

වේදනාවක් දැනෙන්නට වූ අතර, කොහෙත්ම වාඩි වන්නට නොහැකි තත්ත්වයක් ඇති විය. මුළු කාලය ම සයනයේ දිගා වී සිටින්නට සිදු විය. ප්‍රමාණයට වඩා දික් වූ යෝනි තොල් නිසි අවලක්ෂණයක් නොවන බව මම පසු ව සොයා දැන ගතිමි. මෙම ශල්‍යකර්මය නොකර සිටියා නම් මැනවයි දැන් මම කල්පනා කරමි.

ජෙනී - යෝනි තොල් කුඩා කර ගැනීම සඳහා සාමාන්‍ය නිර්වින්දනයක් යටතේ ලේසර් කිරණ මාර්ගයෙන් මා හට ශල්‍යකර්මයක් කරන ලදී. එහෙත් ශල්‍යකර්ම සඳහා පාවිච්චි කරන පිහියක් උපයෝගී කරගෙන මෙවැනි ශල්‍යකර්මයක් කළ යුතු බවත්, ලේසර් කිරණ මගින් පිලිස්සීමේ දී මහත් අවදානමක් ඇති බැවි වෙනත් වෛද්‍යවරයකු මා සමග පැවසුවේ ය. මෙනයින් බලන කල මේ සම්බන්ධ ව වෛද්‍යවරුන් අතර, පරස්පර විරෝධී මත තිබෙන බව පැහැදිලි කරුණකි.

ජෝයි - මාස තුනකට පෙර මෙම ශල්‍යකර්මය ම කරවා ගතිමි. ඉන් පසු මා හට වේදනාවක් නොදැනුණත් මගේ අභ්‍යන්තර යෝනි තොල්වල ඉදිමීමක් ඇති වී ඇත. සම්භෝගයේ දී දැන් මට වේදනාවක් දැනේ. ශල්‍යකර්මයට පෙර එවැනි වේදනාවක් මට දැනී නැත.

යසමින් - යූරෝ 1020 ගෙවා මම මෙම ශල්‍යකර්මය කරවා ගතිමි. දැන් මට පෙර මෙන් නුමාලය ස්නානය කිරීමට යන ස්ථාන ආදී තැන්වල දී තවදුරටත් මගේ යෝනිය කිසිවකුට නොපෙනෙන සේ හංගා ගැනීමට අවශ්‍යතාවක් නොමැත. ඒ ශල්‍යකර්මය කරවා ගැනීම ගැන අද මම සතුටු වෙමි.

මර්ටිනා - දැනට වසර පහකට පෙර බෙල්ජියමේ අගනුවර වන බ්‍රසල්ස් නගරයේ කෘත්‍රිම රූපලාවන්‍ය චිකිත්සාගාරයට ගොස් එහි දී මම ශල්‍යකර්මය කරවා ගත්තෙමි. එම චිකිත්සාගාරයේ ලිපිනය අන්තර්ජාලයේ තිබී සොයා ගතිමි. මගේ යෝනි තොල් ඉදිමී ඇති අතර, මට නිතර ම වේදනාවක් දැනේ. එහෙයින්,

ඒ ශල්‍යකර්මය ගැන මා තුළ කිසි ම සතුටක් නැත. ශල්‍යකර්මය නිවැරදි ව කළා ද යන්න ගැන දැන් මා තුළ සැකයක් ඇති වී ඇත. මෙවැනි අසාර්ථක ශල්‍යකර්මයකට මුහුණ දුන් කාන්තාවන් තවත් ඇත්දැයි දැනගැනීම සඳහා අන්තර්ජාලයේ මේ සම්බන්ධ ව ඇති පිටුව නිතර ම මම කියවමි.

අප්‍රිකානු කාන්තාවන් ඔවුන්ගේ චාරිත්‍රයකට අනුව චර්මච්ඡේදනයට ගොදුරු වෙති. යුරෝපීය කාන්තාවන් තමුන්ගේ වුවමනාවෙන් ම චර්මච්ඡේදනය කරවා ගනිති. අපගේ රටවල සිදු කෙරෙන ව්‍යභිචාරී චාරිත්‍රය ගැන අසා යුරෝපීයයන් ඒ සම්බන්ධ ව අප්‍රසාදයෙන් කතා කරන අතර, යුරෝපීය කාන්තාවන් රූපාලංකාරය සඳහා මෙම ශල්‍යකර්මය පිටුපස දුව යති. යුරෝපය තුළ අප ව ස්ත්‍රී චර්මච්ඡේදනයට ගොදුරු වූවන් වශයෙන් සලකන අතර. ප්‍රදර්ශනයට තබා ඇති වල් සත්තු වශයෙන් අප දෙස බලති. එමතු ද නොව, අප ව නොදියුණු එමෙන් ම පසුගාමී ම්ලේච්ඡ කොටසක් වශයෙන් සලකන මේ ශිෂ්ට සම්පන්න යැයි කියා ගන්නා යුරෝපීය කාන්තාවන් බුරුතු පිටින් වෛද්‍ය ආයතනයන්ට ගොස් නීත්‍යානුකූල ව චර්මච්ඡේදනය කරවා ගනිති. මෙම කාන්තාවන් උපතින් ලබා ඇති ලිංගේන්ද්‍රයන් අවලක්ෂණ යයි කල්පනා කරති.

අප්‍රිකාවේ කාන්තාවන් අනිවාර්යයෙන් ම මුහුණ දිය යුතු ව්‍යසනය, යුරෝපයේ සිදුවන චර්මච්ඡේදනයට කොහෙත්ම සම කළ නොහැකි ය. කිසි යම් හෝ ආරක්ෂාවක් නොමැති අප්‍රිකානු දැරියන් ඉතාමත් භයානක තත්ත්වයන් යටතේ මෙම ව්‍යසනයට ගොදුරු වෙති. යුරෝපයේ චර්මච්ඡේදනය සිදු කරනු ලබන්නේ වැඩිමහලු කාන්තාවන්ට ය. චර්මච්ඡේදනයෙන් පසු අප්‍රිකානු දැරියන්ගේ ඒ අවයව ඉවත් කරන ලද ස්ථාන මසා දැමීමට බල කෙරෙන අතර, මෙහි දී සාකච්ඡාවට ලක් ව ඇත්තේ ස්ත්‍රී යෝනියේ අභ්‍යන්තර යෝනි තොල්වල (inner labia) සහ භගශිශ්නිකාවේ (clitoris) ප්‍රමාණය අඩු කිරීම ගැන ය. අප්‍රිකාවේ දී සිදුවන්නේ භගශිශ්නිකාව සම්පූර්ණයෙන් ම කපා දැමීම ය.

මෙහි දී කෙරෙන්නේ යෝනියේ පිටතට පැමිණ ඇති අවයව නොපෙනෙන සේ ඊට පෙනුමක් ලබා ගැනීම සඳහා භගශිශ්නිකාවේ ප්‍රමාණය කුඩා කර තරමක් අනාවරණය කිරීම ය. ඒ සඳහා කරන ශල්‍යකර්මයන් හේතුකොටගෙන බොහෝ අවස්ථාවල කාන්තාවට දරුණු ප්‍රතිවිපාකයන්ට මුහුණ දෙන්නට සිදු වේ. අප්‍රිකාවේ දී හෝ වේවා යුරෝපයේ දී හෝ වේවා මෙහි අවසාන ප්‍රතිඵලය වශයෙන් දක්නට ලැබෙන්නේ කාන්තාවන් මෙහි ගොදුරු බවට පත් වීම ය.

යුරෝපීය කාන්තාවන් අතර සිදුවන ස්ත්‍රී චර්මච්ඡේදනය ගැන සොයා බැලීමේ දී පැහැදිලි ව පෙනෙන්නට තිබෙන කරුණ නම් ස්ත්‍රී ලිංගේන්ද්‍රයේ පෙනුම සම්බන්ධ ව කිසි යම් පරමාදර්ශයක් හැකිනම් කල්පිතයක් තිබෙන බවයි. අප්‍රිකාවේ තත්ත්වය ද යුරෝපයේ පවතින මෙම තත්ත්වයට වඩා වැඩි වෙනසක් නැත. කාන්තාවන් හැකි තාක් දුරට තරුණ ගැහැනු ළමයින් මෙන් පෙනී සිටීමට උත්සාහ කරති. මහලු වන බැව් දැකීමට ස්ත්‍රිය තුළ මහත් බියක් ඇත.

ස්ත්‍රී චර්මච්ඡේදනයට මුහුණ පාන්නේ ස්ත්‍රීන් වුව ද අප්‍රිකාව ගැන අපි කතා කරන බොහෝ අවස්ථාවල බොහොමයක් දෙනා සිතා සිටින්නේ ස්ත්‍රී චර්මච්ඡේදනය සිදු වන්නේ පුරුෂ පක්ෂයේ අවශ්‍යතාව මත බවයි. යුරෝපයේ තත්ත්වය කෙසේ ද? යුරෝපය තුළ ද මිනිසා තුළ ඇති සෞන්දර්ය සංකල්පය මත ස්ත්‍රිය ක්‍රියා කරන බැව් පෙනෙන්නට තිබේ. එසේ නැති නම් ස්ත්‍රී යෝනිය අලංකාර කර ගනු වස් මෙවැනි කෘත්‍රිම රූපලාවන්‍ය සඳහා වෛද්‍ය සායන පවතින්නේ කෙසේ ද? කරුණු කෙසේ වුව ද රූපාලංකාරය සඳහා තමුන්ගේ ලිංගේන්ද්‍රයේ කොටස් කපා දැමීමට ස්ත්‍රීහු පෙලඹෙන්නේ කෙසේ ද යි යන්න ගැන මම පුදුමයට පත් ව සිටිමි.

ගැහැනියකට කාම රස විඳ ගැනීමට ඇති ශක්තිය හීන කිරීම සඳහා ඇගේ කැමැත්තට අනුව හෝ කරන කුමන ශල්‍යකර්මයක් වුව ද ඔස්ට්‍රියාවේ සහ එංගලන්තය තුළ නීතියෙන් තහනම් කර ඇත.

අප්‍රිකාවේ චාරිත්‍රයකට අනුව කෙරෙන ස්ත්‍රී චර්මච්ඡේදනයත්, රූපාලංකාරය සඳහා ස්ත්‍රී ලිංගේන්ද්‍රියේ කොටස් කපා දැමීම අතරත් ඇති වෙනස කුමක් ද යන්න සම්බන්ධ ව මම වියානා විශ්වවිද්‍යාලයේ මහාචාර්යවරයෙක් සහ වියානා නගරයේ රූපලාවන්‍ය සායනයක් පවත්වාගෙන යන මහාචාර්ය ජඩ්වින් ධූර්කොව්ගෙන් විමසුවෙමි. ඔහුගේ පිළිතුර මේ සේ ය: කාන්තාවන්ගේ යෝනි තොල් ප්‍රමාණයට වඩා විශාල වී තිබීම හේතුකොටගෙන සමහරක් කාන්තාවන්ට එය කනස්සල්ලට කරුණක් බවට පත් ව ඇති බැවින්, ශල්‍යකර්මයක මගින් එය නිවැරදි කර ගැනීම මෙම සිද්ධියේ එක් පැත්තක් වන අතර, අනෙක් පැත්ත නම් භගශිශ්නිකාව කපා දැමීම යි. මෙම ශල්‍යකර්ම දෙකේ අරමුණ දෙස බලන විට එහි වෙනස තේරුම් ගැනීමට පුළුවන.

6

ස්ත්‍රී චර්මඡේදනය ආගමකට සම්බන්ධ ක්‍රියාවක් නො වේ

මම සිහිනෙන් එක්තරා දැරියක් දුටුවෙමි. ඇය වයස අවුරුදු පහක හෝ හයක හෝ දැරියකි. ඇය ඝන අන්ධකාරය මෙන් කළු ය. ඇයගේ නො පීරන ලද කෙස් කළඹ අවුල් වී තිබුණ අතර, ඇයට ලොකු ඇස් දෙකක් තිබුණි. යකඩ ඇඳක් මත වැතිර සිටි ඇයගේ ශරීරය කොළපාට රෙද්දකින් වසා තිබුණි. ඇය වැතිර සිටි කාමරය අන්ධකාර වූ අතර, කිසිවකු එහි දක්නට නො වී ය. දැරිය බියෙන් වෙව්ලමින් සිටියා ය. ඇය දුඹුරුපාට පටියකින් ඇඳට තබා බැඳ තිබුණ අතර, ඇගේ දෙපය දෙපසට විහිදී තිබුණි. මම කාරණය තේරුම් ගතිමි.

එසැණින් ම කාමරයේ දොර විවෘත විය. විවෘත වූ දොර තුළින් ගැහැනුන් පස්දෙනෙක් ඇතුළු වූහ. කිසිවකු වචනයකුදු නො දෙඩූ අතර, ඇය වැතිර සිටි ආකාරයට ඇයට කිසිවකුගේ මුහුණු දැකගත නො හැකි ය. එක් ගැහැනියක් අත වකුගඩුවක හැඩය ඇති තුවා

සඳහන් විය. ඒ තුළ බ්ලේඩ් තලයක් තිබුණි. ගැහැනුන් හතර දෙනෙක් ඇඳ වටා සිටි අතර, එක ගැහැනියක් දැරියගේ දෙපසට විහිදා තිබූ දෙපා මැද දණ ගසා ගත්තා ය. අනතුරු ව ඇය අත වූ වකුගඩු හැඩය ගත් තුවා බඳුන ඇඳ මත තබා එතුළ වූ බ්ලේඩ් තලය අතට ගත්තා ය. බ්ලේඩ් තලය අතැති ව ඇය සිරුරෙන් දැරියගේ ලිංගේන්ද්‍රිය වෙත සමීප වන්නට වූවා ය. එකෙනෙහි ම මුළු කාමරය ම ආලෝකවත් වූ අතර, කිසිවකු මෙසේ කියනු ඇසුණි. "වහාම ඔය කරන්නට යන දෙය නතර කරන්න... ඔය ක්‍රියාව අපගේ ආගමට විරුද්ධ ක්‍රියාවක්..."

ජනතාව වැඩියෙන් ම ඇහුම්කන් දෙන්නේ ලෝකයේ සිටින ආගමික නායකයින්ට බැව් මම තරයේ ම අදහමි. එහෙයින් ලෝකයේ සිටින විවිධ ආගමික නායකයින් ස්ත්‍රී චර්මඡේදනය ඒ ඒ ආගම්වල සදාචාරයට පටහැනි බැවින්, එය නතර කරන ලෙස ප්‍රකාශ කළහොත් මෙම අයහ ක්‍රියාව එක රැයක් ඇතුළත නවතා දැමීමට හැකි වනු ඇත. නීතිය, අධ්‍යාපනික වැඩසටහන්, පොලීසියේ මැදිහත්වීම සහ දේශපාලන උද්ඝෝෂණවලට වඩා ආගමික නායකයින්ගේ හඬ ප්‍රබල ය. "මෙම ක්‍රියාව අපගේ ආගමට පටහැනි ක්‍රියාවක්" යන වචන ස්වල්පය ආගමික නායකයින් ලොවට ප්‍රකාශ කරන්නේ නම් එමගින් මෙම සැහැසි ක්‍රියාව නවතා දැමීමට හැකි ය.

මා මුස්ලිම් භක්තියකු වන අතර, අදටත් මම එය අදහමි; විශ්වාස කරමි. එනමුදු මා කිසි දිනක බෝම්බයක් ඇඟ ලාගෙන ජනාකීර්ණ බස් නැවතුම්පොළකට හෝ උස් වූ ගොඩනැඟිල්ලක් තුළට හෝ ගොස් බෝම්බය පුපුරුවා හරින්නේ නැත. මගේ මනස නුරුස්සන කිසිවකු මරා දමන්නට කිසි දිනක මම උත්සුක නො වෙමි. ලෝකයේ සිටින මුස්ලිම් භක්තිකයින්ගෙන් වැඩි කොටස මා මෙන් ම සාමය ප්‍රාර්ථනා කරන ප්‍රචණ්ඩත්වය හෙළා දකින අය බැව් මම නිර්භය ව ප්‍රකාශ කරමි. එනමුදු යුරෝපය තුළ සාමකාමී ව ජීවත් වන නොයෙකුත් ආගම්වලට, සංස්කෘතීන්ට සහ චර්ම පැහැයන්ට අයත් කොටස් විනාශ කිරීමට අතළොස්සක් ත්‍රස්තවාදීහු ක්‍රියා කරති.

අද ලෝකය පාලනය කරන්නේ ප්‍රචණ්ඩත්වය යි. ඝාතකයෝ යුරෝපය තමාට නොකාට කිලි යාමේ තර්ජනයකට මුහුණ පා ඇත. වර්ෂ 2004 දෙවන දා නෙදර්ලන්තයේ ඇම්ස්ටර්ඩෑම් නගරයට වෙන දා මෙන් ම හිරු උදා විය. එය හේමන්ත සෘතුවේ පැහැබර දිනයක් වූ අතර, ඊට සරිලන උණුසුමක් ද තිබුණි. උදෑසන නවයට පමණ කොණ්ඩය පැසුණු මැදිවියේ තරමක තරබාරු පුද්ගලයෙක් ඇළ කණ්ඩිය මතින් පාපැදියකින් ගමන් කරමින් සිටියේ ය. තවත් පාපැදියකින් පැමිණි වෙනත් පුද්ගලයෙක් මැදිවියේ තරබාරු පුද්ගලයා පසුපස හඹා අවුත් මෙතෙක් ඉණේ සඟවාගෙන තිබූ පිස්තෝලයක් එළියට ගෙන තරබාරු පුද්ගලයාට වෙඩි හයක් තැබුවේය. වෙඩි වැදුණු තරබාරු පුද්ගලයා පලා යන්නට අසාර්ථක උත්සාහයක් ගත්තමුදු, ඔහු එතැන ම ඇද වැටුණේ ය. පාපැදිය පසෙකට දැමූ ඝාතකයා ඉණේ සඟවාගෙන සිටි කිණිස්සක් සියතට ගෙන වැටී සිටින තරබාරු පුද්ගලයා වෙත ගොස් ඔහුගේ ගෙල සිඳ දැමී ය. අනතුරු ව ඝාතකයා පිටු පහකින් යුතු පාපෝච්චාරණයක් කිණිස්සේ ද්වාරා එය මැරී වැටී සිටින තරබාරු පුද්ගලයාගේ පපුවෙහි රඳවූයේ ය. ඒ මොහොතේ මඟින් යන බස් රථයක් ධාවනය කරමින් සිටි බස් රියැදුරා සිය ජංගම දුරකතනයේ වූ කැමරාවෙන් මෙම සිද්ධිය ඡායාරූප ගත කළේ ය.

අරාබි ලෝගුවක් ඇද සිටි ඝාතකයා ජයග්‍රාහී ව මැරී වැටී සිටින පුද්ගලයා අසල මොහොතක් රැඳී සිට එතැනින් නික්ම ගියේ ය. ඊට හෝරා භාගයකට පමණ පසු ඝාතකයා සහ පොලීසිය අතර වූ වෙඩි හුවමාරුවකින් පසු පොලීසිය විසින් ඝාතකයා අත්අඩංගුවට ගන්නා ලදී. මොරොක්කානු පවුලකට අයත් විසිහය හැවිරිදි වූ මෙම ඝාතකයා නෙදර්ලන්තයේ පුරවැසියකු වූ අතර, නෙදර්ලන්තය තුළ ක්‍රියාත්මක වන ඉස්ලාම් ත්‍රස්තවාදී කණ්ඩායමක සාමාජිකයෙකි. ඝාතනයට ලක් වූ පුද්ගලයා නමින් තියෝ වෑන් ගෝග් (Theo van Gogh) නම් විය. දහනව වැනි සියවසේ පසු වූ [illegible] ලෝක පූජිත නෙදර්ලන්ත ජාතික චිත්‍ර ශිල්පියකු වූ වින්සන්ට් වෑන් ගෝග්ගේ මුනුබුරෙකි. තියෝ වෘත්තියෙන් චිත්‍රපට අධ්‍යක්ෂවරයෙකි. ඔහු සිය යන විට සිනෙරු දහනවයක් නිර්මාණය කර ඇති අතර, එයින් නිර්මාණ හයක් ඔහුගේ ම මුදලින් නිෂ්පාදනය කරමින් අධ්‍යක්ෂණය කර ඇත. තියෝ ඉස්ලාම් මූලධර්මවාදය නිර්දය ලෙස විවේචනය කරමින් ඊට විරුද්ධ ව මතයක් ගොඩ නැඟීමට කටයුතු කළ අයකු වශයෙන් අති විශාල කීර්තියක් ලබා සිටියේ ය. ක්‍රිස්තියානි සහ මුස්ලිම් දේවස්ථාන ගිනි තියමින් ඇති වී ඇති ත්‍රස්තවාදී ප්‍රචණ්ඩත්වය හේතු කොටගෙන නෙදර්ලන්තය තවත් බෙල්ෆාස්ට් නගරයක් බවට පත් වෙමින් තිබෙන බැව් ප්‍රකාශ කළ තියෝ ඒ කරුණ මත නෙදර්ලන්තය හැර යන්නට තීරණ කර ඇති බැව් ප්‍රසිද්ධියේ ම ප්‍රකාශ කොට ඇත. එපමණ ද නො වේ. තියෝ ඝාතනය වන්නට වසරකට පමණ පෙර හෙතෙම ප්‍රසිද්ධියේ ම මෙසේ පවසා ඇත. "මා ඉස්ලාම් මූලධර්මවාදයට විරුද්ධ ව කතා කරන බැවින්, කෙදිනක දී හෝ මා මඟ මාර්ගයේ දී ඝාතනය කර දමන්නට ඉඩ ඇත."

පිම් ෆෝර්චූයින් (Pim Fortuyn) නමැති දේශපාලනඥයා ගැන තියෝ විසින් නිර්මාණය කරන ලද වාර්තා චිත්‍රපටයේ අවසාන කටයුතු නිම කිරීම සඳහා චිත්‍රාගාරය වෙත යමින් සිටිය දී, 2004 නොවැම්බර් 2 දින ඔහු ඝාතනයට ලක් විය. නෙදර්ලන්තය නිදහසේ මතවාදයේ පාරාදීසය යනු ලොව පුරා ම ප්‍රචලිත කරුණකි. එදින නෙදර්ලන්ත ජාතිකයින් ඒ අභිමානය සමරන්නට සූදානම් විය. එනමුදු තියෝ ඝාතනය කර දැමීමෙන් අනතුරු ව ජාත්‍යන්තර පුවත්පත්වල මෙසේ පළ විය. "ඔහු සංස්කෘතික සමාජයකට අත හිත දුන් දේශය ගිනි ගනී."

"යටත්වීම" යනුවෙන් තියෝ විසින් නිර්මාණය කරන ලද විනාඩි එකොළහක වාර්තා චිත්‍රපටයේ පළමුවන කොටස වී.පී.ආර්.ඕ. නමැති නෙදර්ලන්ත රූපවාහිනී නාලිකාවේ සංස්කෘතික වැඩසටහන මස්සේ විසුරුවා හරින ලදී. "ඉස්ලාම් සමාජය තුළ ගැහැනිය මුහුණ දෙන ඛේදවාචකය" එම වාර්තා චිත්‍රපටයට තේමා වී ඇත. වාර්තා චිත්‍රපටයට තේමා වී ඇත්තේ තරුණ මුස්ලිම් කතුන් හතර දෙනකු සිය පියවරුන්ගේ කැමැත්ත අනුව විවාහ කර දීමෙන් පසු ඔවුන්ට මුහුණ දීමට සිදු වී ඇති

ඛේදවාචකය යි. ඕනෑ ම අයකුගේ නෙතට කඳුළක් නැංවීමට තරම් එහි දර්ශන බලවත් ය. එක් දර්ශනයක් මෙසේ ය: ස්වාමියාගෙන් පහර කෑ රෝස්තා ගැහැනියක් කඳුළු වගුරුවමින් දෙවියන් ඉදිරියේ ඇගේ අප්‍රමාණ දුක් කන්දරාව කියා සිටියි. පසුබිමින් ශබ්දපටය මගින් මිනිසකු ගැහැනියකට තළන හඬවල් ඇසේ. ඇය මෙසේ දෙවියන්ට කන්නලව් කරයි.

"අහෝ... සර්වබලධාරී දෙවියන්වහන්ස... මිනිසාට ඔබවහන්සේ මෙතරම් බලයක් දී තිබෙනුයේ ඔහු ගැහැනියකගේ ආරක්ෂකයා නිසා බැව් ඔබවහන්සේ අපට උගන්වා ඇත. ඔබගේ ඉගැන්වීම කෙසේ වුව ද අඩු ම වශයෙන් සතියකට වරක් ඔහුගේ තද ඇඟිලි තාලුවලින් මගේ මුහුණට එල්ල වන පහරවල්වලින් ඔහුට ඔබ ලබා දී ඇති ශක්තියේ ප්‍රමාණය මට පසක් කර දෙයි... අහෝ... සර්වබලධාරී දෙවියන්වහන්ස... මගේ ස්වාමිපුරුෂයාත් සමඟ මගේ ගෙවන දිවිය ඒ තරම් ම කටුක ය... නමුත්, මම කෙසේ හෝ ඔබවහන්සේගේ අණට කීකරු වෙමි... දැන් මට දැනෙන්නේ මා මරා දැමීමට ගෙන යන කොටු කූඩුවක හිර කර සිටින බැටළුවකු මෙන් ය."

තියෝගේ වාර්තා චිත්‍රපටය සඳහා තිරනාටකය රචනා කර ඇත්තේ ක්‍රියාකාරී දේශපාලනයට සම්බන්ධව එමෙන් ම මුස්ලිම් කාන්තා විමුක්තිය වෙනුවෙන් සහ සෝමාලියාවේ සංස්කෘතික අංගයක් වන ස්ත්‍රී චර්මඡේදනයට විරුද්ධ ව සටන් කරන සෝමාලි ජාතික අයාන් හිර්සි අලි නමැති තැනැත්තිය යි. වයස අවුරුදු තිහක් පමණ වූ අයාන්, සෝමාලියාවේ දී ජන්ම ලාභය ලැබූ අයෙකි. ඇයගේ මව සෝමාලි දේශපාලනඥයකුගේ හතර වන බිරිඳ වූ අතර, අයාන්ගේ පියා සිය දියණියන් ඔහු අදහන ඉස්ලාම් ධර්මයට අනුව හැඩ ගස්සවා ඇත. දේශපාලන කරුණක් මත සිය පියාට සෝමාලියාව අත හැර යන්නට සිදු වී ඇත. ඔහු සිය පවුලත් සමඟ පළමුවෙන් ම සවුදි අරාබියටත්, එතැනින් කෙන්යාවටත් ගොස් ඇත. තරුණ වියේ දී පියාගේ උවමනාවට අනුව අයාන්ට නොකැමැත්තෙන් වුව ද ඇගේ මස්සිනා වන අයකු සමඟ විවාහ වීමට සිදු වී ඇත. විවාහයෙන් පසු ඇයට භාර්යාවක් සහ එවන් වශයෙන් නිවසේ සිරකාරියක් වී සිටින්නට සිදු වී ඇත. එහෙයින් නිවසින් පලා ගොස් ඇති ඇය යුරෝපයට පැමිණ අවසානයේ දී නෙදර්ලන්තය සිය වාසස්ථානය කරගෙන ඇත. නෙදර්ලන්තයේ බස වන ඩච් භාෂාව ගැන කිසියම් හෝ දැනීමක් නො තිබුණ ඇය, මුල දී තැපැල් කන්තෝරුවක කාමර පිරිසිදු කිරීම රැකියාවක් වශයෙන් කර ඇත. ඩච් භාෂාව හැදෑරීමෙන් අනතුරු ව විශ්වවිද්‍යාලයකට ඇතුළත් ව දේශපාලන විද්‍යාව හදාරන ගමන්, ගබ්සා කිරීම සඳහා වූ වෛද්‍ය සායනයක රැකියාවක් කර ඇති අතර, එමගින් අධ්‍යාපනය සහ ජීවත් වීම සඳහා මුදල් සොයාගෙන ඇත. උපාධිය ලබා ගැනීමෙන් අනතුරු ව ඇය නෙදර්ලන්තයේ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ ක්‍රියාකාරී සාමාජිකාවක් වී ඇති අතර, ටික කලකට පසු ව එම පක්ෂය අත හැර ගොස් දක්ෂිණාංශික ලිබරල් පක්ෂයේ සාමාජිකාවක් වී ඇත. එම පක්ෂය මගින් 2003 පවත්වන ලද මැතිවරණයට ඉදිරිපත් වී ඇති ඇය එයින් ජයග්‍රහණය ලබාගෙන ඇත. එතැන පටන් ඇය නෙදර්ලන්ත පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරියක වශයෙන් කටයුතු කරන්නී ය.

වර්ෂ 2004 නොවැම්බර් 2 දින සිදු වූ තියෝගේ ඝාතනයෙන් පසු ඇගේ ජීවිතය සම්පූර්ණයෙන් ම වෙනසකට භාජනය වී ඇත. [illegible] තියෝගේ මළසිරුර මත තිබූ පාපෝච්චාරණය මගින් ඝාතකයින් විසින් ඇයට ද මරණීය තර්ජන එල්ල කර ඇත. උපාධාරණය නැති තරම් ඉවසීම ගැන කතා කරන විට නෙදර්ලන්තය ලෝකයට ආදර්ශයක් සැපයූ රටක් වශයෙන් දශක ගණනාවක් පුරා ප්‍රසිද්ධියට පත් ව තිබෙන රටකි. නෙදර්ලන්තයේ ජනගහනයෙන් තුනෙන් එකකට පිටහිර සම්භවයක් නොමැත. නෙදර්ලන්තය තුළ ඇති ආගම් අතරින් පුළුල් ලෙස පැතිරී ගොස් තිබෙන ආගම ඉස්ලාම් ආගම යි. නොයෙකුත් රටවලින් නෙදර්ලන්තයට සංක්‍රමණය වී සිටින සංක්‍රමණිකයින්ගෙන් වැඩි කොටස තම තමන්ගේ ප්‍රජාවන්ට කොටු වී ඇම්ස්ටර්ඩෑම්, රොටඩෑම් සහ හේග් වැනි මහා නගරවල හුදකලාව ජීවත් වෙති. ඔවුන් අතරින් සියයට හැත්තෑවක් පමණ දෙනා සිය රටවැසියන් සමඟ විවාහ වී සිටිති.

අනෙකුත් යුරෝපීය රටවල තත්ත්වය ද මීට වඩා වැඩි වෙනසක් නැත. මෙම සංක්‍රමණිකයින් ඒ ඒ රටවල ප්‍රධාන සමාජ ප්‍රවාහයට සම්බන්ධ ව ජීවත්වන බැව් සමාජ විද්‍යාඥයින් ප්‍රකාශ කර සිටියත්, ඔවුන් ප්‍රධාන සමාජ ප්‍රවාහයෙන් සම්පූර්ණයෙන් ම හුදකලා වී ජීවත් වන බව ඔවුන් සමඟ කතාබහ කරන විට ඔබට දැන ගැනීමට හැකි වනු ඇත. මුස්ලිම් කාන්තාවන් තරම් සමාජයෙන් හුදකලා වී ජීවත්වන වෙනත් ජාතියක් නොමැති බැව් අයාන් හිර්සි අලි පවසයි. සත්‍ය වශයෙන් ම මෙම තත්ත්වය එසේ නම් එය කුඩුවක සිර වී ජීවත්වනවාට වඩා වැඩි යම් දෙයක් නො වේ.

ස්ත්‍රී චර්මඡේදනයට විරුද්ධ ව ප්‍රංශයේ වර්තමාන නීතියට සමාන නීතියක් නෙදර්ලන්තය තුළ ද ක්‍රියාත්මක කරවීම සඳහා අයාන් හිර්සි අලි නොපසුබට සටනක් දියත් කර ඇත. ස්ත්‍රී චර්මඡේදනයට ගොදුරු වන්නට ඉඩ ඇති සෑම දැරියක් ම වසරකට වරක් වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කළ යුතු බවත්, එම වෛද්‍ය පරීක්ෂණය ඔවුනට අවුරුදු දහයට සම්පූර්ණ වන තෙක් ඉදිරියට ක්‍රියාත්මක කළ යුතු බැව් අයාන් හිර්සි අලි අවධාරණය කරන අතර, ස්ත්‍රී චර්මඡේදනය සිදුකරන හැනැත්තිය පමණක් නො ව, අදාළ දැරියගේ දෙමව්පියන් ද නීතිය ඉදිරියට ගෙන ආ යුතු බැව් ඇය තවදුරටත් කියා සිටින්නී ය.

ස්ත්‍රී චර්මඡේදනය ක්‍රියාත්මක වන රටවල සිට නෙදර්ලන්තයට පැමිණ සිටින කාන්තාවන්ගේ ප්‍රමාණය තිස්දහසක් වන අතර, ඔවුන්ගෙන් වැඩි කොටස අසූව සහ අනූව දශකයන් තුළ දී සෝමාලියාවේ සිට නෙදර්ලන්තයට සංක්‍රමණය වී ඇත. නෙදර්ලන්තය තුළ මෙසේ චර්මඡේදනයට ගොදුරු වී ඇති දැරියන්ගේ සංඛ්‍යාව කොපමණ ද යන්න ගැන කිසිවකු නො දනිති.

මම කෝරානය පරතෙරට අධ්‍යයනය කළ අයකු නො වෙමි. මා ලද අත්දැකීම්, අධ්‍යාපනය සහ මා සතු ස්වාභාවික ඥානය මත මගේ ජීවන රටාව සැකැසී ඇත. ප්‍රචණ්ඩත්වය, බහුභාර්යා සේවනය සහ ස්ත්‍රී චර්මඡේදනය මම ප්‍රතික්ෂේප කරමි. බොහෝ දෙනා ස්ත්‍රී චර්මඡේදනය යුක්ති සහගත කිරීම සඳහා එම සැහැසි ක්‍රියාව ශුද්ධ වූ කෝරානයේ ලියැවී ඇති බවට තර්ක කරන අතර, ස්ත්‍රී චර්මඡේදනය සම්බන්ධ ව වචනයකුදු කෝරානයේ සඳහන් වී නොමැති බැව් තවත් කොටසක් කියා සිටිති. මේ සම්බන්ධ නිසි කරුණු දැන ගැනීම සඳහා මම කෝරානයට සම්බන්ධ විශේෂඥවරියක් වන අමීනා බජාජ්ටි හමු වන්නට තීරණය කළෙමි.

අමීනා බජාජ්ටි ජර්මනියේ දී ජන්ම ලාභය ලැබූ අයකු වන අතර, ඇය සිය ස්වාමිපුරුෂයාගෙන් ඉස්ලාම් ධර්මය ඉගෙන ගෙන ඇත. වියානා නගරයේ පදිංචි ව සිටින ඇය, මානව හිමිකම් සංවිධානයක සභාපතිවරියක වශයෙන් කටයුතු කරන්නී ය. දරුවන් හතර දෙනකුගේ මවක් වන අමීනා ඉමහත් භක්තියකින් කෝරානය අධ්‍යයනය කිරීමට කැපවී සිටින අතර, ඇය ඊට මහත් රුචියක් දක්වන්නී ය. මම ඇය හමු වූයෙමි. අප සිය තොරතුරු මඳ වේලාවක් කතා කිරීමෙන් අනතුරු ව අපි අදාළ විෂය පිළිබඳ සාකච්ඡාව ආරම්භ කළෙමු.

“අපි අපගේ ආගමික භාවය තුළ ස්ත්‍රී චර්මඡේදනය ගැන සාකච්ඡා කරන්නට පටන් අරගෙන තියෙන්නෙ... නමුත් මේ තහනම් විෂය ගැන කතා කිරීමට ඇති බාධාවන් ඉතා ප්‍රවේසමෙන් ජය ගන්නට ඕනෑ” ඇය කතාව ආරම්භ කරමින් කීවා ය.

“ස්ත්‍රී චර්මඡේදනය සම්බන්ධ ව ඉස්ලාම් ධර්මයේ ස්ථාවරය කුමක්ද?” මම ප්‍රශ්න කළෙමි.

“ඉස්ලාම් ධර්මයට අනුව ස්ත්‍රී චර්මඡේදනය ස්ත්‍රියට විරුද්ධ ව කරන සැහැසි ක්‍රියාවක්... ඒ නිසා ම ඉස්ලාම් ධර්මය එම සැහැසි ක්‍රියාව තරයේ ම ප්‍රතික්ෂේප කරනවා.”

“එහෙම නම් ඇයි බොහොමයක් දෙනා ස්ත්‍රී චර්මඡේදනය යුක්ති සහගත කිරීම සඳහා ඉස්ලාම් ධර්මය ගාව ගන්නෙ” මම ඇසුවෙමි.

“බොහොමයක් රටවල ජනතාව තමුන්ගේ නො දැනුවත්කම නිසා මෙම සැහැසි ක්‍රියාව යුක්ති සහගත කිරීම සඳහා ඉස්ලාම්

ධර්මය යොදාගෙන තිබෙනවා... නමුත් ශුද්ධ වූ කෝරානයේ මේ සම්බන්ධ කිසිවක් සඳහන් වෙලා නැහැ."

"ගැහැනියට ගරු කළ යුතු බව කෝරානයේ සඳහන් වී තිබෙනවා ද?"

"ඔව්... ගැහැනියට ලැබී ඇති ශරීරය දෙවියන්වහන්සේගෙන් ලැබුණු ප්‍රසාදයක් වශයෙනුයි කෝරානයේ සඳහන් කරලා තියෙන්නෙ... අන්න ඒ කරුණ නිසා තමයි ඉස්ලාම් ධර්මය කාන්තා රූපලාවන්‍ය අනුමත නො කරන්නෙ... ලිංගික වශයෙන් ගැහැනියට තෘප්තිමත් වීමට අයිතියක් තිබෙන බව කෝරානයේ සඳහන් වෙලා තියෙනවා... විවාහය තුළ ගැහැනියට සම්භෝගයේ දී තෘප්තියක් ලැබෙන්නෙ නැති නම් ඇයට දික්කසාද වීමට අයිතියක් ඇති බව ද කෝරානයේ සඳහන් වෙලා තියෙනවා... ලිංගික තෘප්තිය ලබා ගැනීමට ඉස්ලාම් ධර්මයෙන් කිසි ම විරුද්ධත්වයක් නැහැ... විවාහය තුළ ලිංගික තෘප්තිය ලබා ගැනීම ඉතා හොඳ ක්‍රියාවක් බව කෝරානයේ අවධාරණය කර තිබෙනවා."

ස්ත්‍රී චර්මච්ඡේදනය ගැන දැනුවත් කිරීම අරමුණු කරගෙන අධ්‍යාපන සතියක් ආරම්භ කිරීමේ ඇති අවශ්‍යතාවය ගැන මම අමීනාට කීවෙමි. මගේ යෝජනාව සාලෝචිත බැව් වටහා ගත් අමීනා ස්ත්‍රී චර්මච්ඡේදනය නමැති සැහැසි ක්‍රියාවට ගොදුරු වී සිටින කාන්තාවන්ට සිය ජීවිතය ජය ගැනීම සඳහා ඔවුන් දැනුවත් කිරීමේ ඇති වැදගත්කම අවධාරණය කළා ය.

ඉස්ලාම් ධර්මය ගැන යුරෝපීයයන් එතරම් ම දැනුවත් ව සිටින බවක් පෙනෙන්නට නැත. ක්‍රිස්තියානි ආගමට දෙවනු ව ලෝකයේ වැඩි ම වශයෙන් අදහන ආගම වන්නේ ඉස්ලාම් ආගම යි. විශ්වයේ ජනගහනයෙන් සියයට දහනවයක් ඉස්ලාම් භක්තිකයින් ය. යුරෝපය තුළ සැලකිය යුතු ප්‍රමාණයක් ඉස්ලාම් භක්තිකයින් වෙසෙති. ප්‍රංශයේ ඉස්ලාම් භක්තිකයින් මිලියන හයක් වාසය කරන අතර, ජර්මනියේ මිලියන තුනක් ද, මහා බ්‍රිතාන්‍යයේ මිලියන දෙකක් සහ ඔස්ට්‍රියාවේ ලක්ෂ හතරක් පමණ වාසය කරති. පසුගිය දශක දෙක තුළ ජර්මනියේ මුස්ලිම් භක්තිකයින්ගේ ප්‍රමාණය දෙගුණ වී ඇති බැව් සංඛ්‍යා ලේඛන දෙස බලන විට පෙනී යයි.

ඉස්ලාම් ධර්මය යනු ඒකදේවවාදී (Monotheistic) ආගමකි. ඒ අනුව ඉස්ලාම් භක්තිකයින්ගේ ගැලවුම්කරුවා අල්ලා දෙවියන්වහන්සේ ය. ඔහුගේ ධර්මය ග්‍රන්ථ ගත කර ඇති කෘතිය කෝරානය යනුවෙන් හඳුන්වනු ලැබේ. කෝරාන ශ්ලෝක හය දහසකින් සමන්විත වෙයි. බයිබලයේ මෙන් කතාන්දර මෙහි දක්නට නොමැති අතර, උපදෙස් කතා සහ පොරොන්දු පැසසුම් ආදිය දක්නට ඇත. ඉස්ලාම් ධර්මයට අනුව එක් පුරුෂයකුට භාර්යාවන් සතර දෙනකු සමඟ ජීවත් වීමට අයිතියක් ඇත. විවාහය තුළ ගැහැනිය සහ මිනිසා අතර ඇතිවන සම්භෝගයට දෙවියන්ගේ ආශිර්වාදය ලැබෙන අතර, අනියම් ස්ත්‍රී සේවනය සම්පූර්ණයෙන් ම තහනම් ය. අල්ලා දෙවියන් ඉදිරියේ ගැහැනිය සහ මිනිසා එක සමාන ව පිළිගන්නා අතර, ගැහැනිය මිනිසාට අවනත විය යුතු ය.

ඉස්ලාම් භක්තිකයකු විසින් පිළිපැදිය යුතු කරුණු පහකි. එම කරුණු පිළිවෙළින් මෙසේ ය:

1. අල්ලා දෙවියන්වහන්සේ ගැන විශ්වාසය තැබීම
2. මොහොමඩ්, අල්ලා දෙවියන්ගේ නියෝජිතයා බැව් විශ්වාස කිරීම
3. ඉස්ලාම් භක්තිකයකු දිනකට පස් වතාවක් යාඥා කළ යුතු ය
4. ඉස්ලාම් භක්තිකයකුගේ වසරක ආදායමෙන් 2.5 දාන දීම සඳහා පාවිච්චි කළ යුතු ය
5. රාමදාන් සමය තුළ දහවල් කාලයේ දී ආහාර
   ගැනීමෙන් වැළකී සිටීම සහ
   මක්කම වෙත වන්දනාවේ යාම

ඉස්ලාම් ආගමේ නිර්මාතෘවරයා මොහොමඩ්තුමා ය. වර්ෂ 570 දී උන්වහන්සේ මක්කමහි දී ජන්මලාභය ලබා ඇත

අල්ලා දෙවියන්වහන්සේ ගබ්‍රියෙල් නමැති දේවදූතයාගේ මඟින් රාත්‍රී කාලයේ දී මොහොමඩ් ඉදිරියට පැමිණ ඇති බැව් ඉස්ලාම් භක්තිකයෝ විශ්වාස කරති. අල්ලා දෙවියන්වහන්සේට ලියන්නට හෝ කියවන්නට හෝ නො හැකි වූ බැවින්, ඔහුගේ දර්ශනය උන්වහන්සේ විසින් වාචික ව ප්‍රකාශකොට ඇති අතර, එය ධර්මාචාර්යවරයකු විසින් ලේඛන ගතකොට ඇත. ශුද්ධ වූ කෝරානය ලියැවී ඇත්තේ අරාබි භාෂාවෙන් ය. වර්ෂ 632 දී මොහොමඩ්තුමා මෙලොවින් සමු ගැනීමෙන් පසු ලේඛන ගත කරන ලද ඔහුගේ ධර්මය අඩංගු පත්‍රිකා සංශෝධනය කොට පරිච්ඡේද දහතරකට බෙදා සකස්කොට ඇත. එය "සූර්" නමින් හඳුන්වනු ලැබේ. එහෙත්, ඒ කිසිවක් තේමාවකට අනුව හෝ කාලානුක්‍රමික ව හෝ සකසා නොමැත. එහෙයින් සමහර ඉස්ලාම් භක්තිකයින් එහි අන්තර්ගතය පිළිගැනීමට පැකිළී වෙති. එමතු ද නො ව, ලෝකයේ ජීවත් වන මුස්ලිම් ප්‍රජාවන්ගෙන් 25% අරාබි භාෂාව නො දනිති. ඒ අනුව මිලියන 900ක් පමණ ඉස්ලාම් භක්තිකයින් කෝරානයේ ලියැවී ඇති ඉස්ලාම් ධර්මය වෙනත් විදෙස් භාෂා මඟින් අන්වාදානුකරණයෙන් කටපාඩම් කරගෙන සිටිති.

ඉස්ලාම් නීතිය කෝරානයේ සඳහන් ඉගැන්වීම් මත සැකසී ඇත. ඉස්ලාම් නීතිය සැකසී ඇති දෙවන වැදගත් මූලාශ්‍රය "හෙඩිත්" යනුවෙන් හඳුන්වනු ලැබේ. "හෙඩිත්" මඟින් මොහොමඩ් සාම්වරයාගේ ජීවිත කතාව සහ පිරිසිදු ඉස්ලාම් භක්තියකු වශයෙන් ජීවත් වන්නේ කෙසේ ද යන්න එක්තරා දුරකට විස්තර කොට ඇති අතර, එහි සඳහන් වී ඇති ඉගැන්වීම "සුන්නා" යනුවෙන් හඳුන්වනු ලැබේ. එහෙත්, මෙහි සඳහන් කොට ඇති ඉගැන්වීම් පිළිගැනීමට හෝ ඒ අනුව ජීවත්වීමට හෝ කිසිම ඉස්ලාම් භක්තිකයකුට බල කිරීමක් නො කෙරේ.

අරාබි බසින් "කාහෆ්ඩ්" යනුවෙන් හඳුන්වනු ලබන ස්ත්‍රී චර්මඡේදනය සම්බන්ධ ව ද හෙඩිත්හි සඳහන් වී ඇත. එහෙත්, ස්ත්‍රී චර්මඡේදනය පිළිබඳ එහි සඳහන් සමහර අදහස් සම්බන්ධ ව සැක ඇති බැව් ද අවධාරණය කර ඇත. "හෙඩිත්" මඟින් ස්ත්‍රී චර්මඡේදනය සම්බන්ධ ව කරුණු තුනක් ඉදිරිපත් කර තිබේ.

1. ස්ත්‍රී පුරුෂ සම්භෝගයෙන් පසු ව ලිංගේන්ද්‍රීන් පිරිසිදු ව තබා ගැනීම
2. චර්මඡේදනයේ දී ස්ත්‍රී ලිංගේන්ද්‍රිය ආශ්‍රිත අවයවවලින් කොපමණ ප්‍රමාණයක් කපා ඉවත් කළ යුතු ද යන්න ගැන සැලකිලිමත් විය යුතු ය. (මොහොමඩ් සාම්වරයා විසින් බාහිර යෝනි තොල් කපා ඉවත් කිරීම තහනම් කර ඇත.)
3. ස්ත්‍රී චර්මඡේදනය සිදු කළ යුත්තේ එය නො කර සිටීමට නො හැකි අවස්ථාවක දී පමණක් බවත්, එහි දී භගශිෂ්නිකාව සහ අභ්‍යන්තර යෝනි තොල්වලින් කුඩා කොටසක් කපා හැරීම අනුමත කර ඇත.

ඒ අනුව ස්ත්‍රී චර්මඡේදනයේ දී ස්ත්‍රී ලිංගේන්ද්‍රිය ආශ්‍රිත කොටස් අවශ්‍ය ප්‍රමාණයට වඩා කපා හැරීමෙන් වැළකිය යුතු බවත්, එම ශල්‍යකර්මයෙන් ලිංගේන්ද්‍රියන් විනාශ කර දැමීම සිදු නො විය යුතු බවත් මොහොමඩ් සාම්වරයා අවධාරණය කොට තිබේ.

සමහරක් ඉස්ලාම් ධර්මාචාර්යවරුන් යෝනි තොල් කපා හැරීම අනුමත කරන අතර, තවත් සමහරක් එය අනුමත නො කරති. එහෙත්, ඉස්ලාම් ශාස්ත්‍රඥයන් කියා සිටිනුයේ ඉස්ලාම් ධර්මය ස්ත්‍රී චර්මඡේදනය අනුමත නො කරන අතර, එය ගැහැනිය විසින් කළ යුතු ම කර්තව්‍යයක් වශයෙන් නො සලකන බව ය.

ඉස්ලාම් ධර්මය සහ ස්ත්‍රී චර්මඡේදනය සම්බන්ධ ව මා කොරින්නාට ලබා දුන් වාර්තාව කියවූ ඇය, දුරකතනය මඟින් ඇයගේ අදහස් මා සමඟ මෙසේ පවසා සිටියා ය. "වාරිස් ඔබ දුන්න වාර්තාව මම කියෙව්වා... නමුත් මේ සම්බන්ධ ව නිගමනයක් කරන්න තරම් ඒ වාර්තාවල තිබුණ කරුණු ප්‍රමාණවත් නෑ... මම හිතන්නෙ මේ සම්බන්ධ ව නිවැරදි නිගමනයකට එන්නට නම් අප්‍රිකාවේ සිටින ඉස්ලාම් ආගමික නායකයින් මේ ගැන ප්‍රකාශ කර ඇති කරුණු අධ්‍යයනය කළ යුතු යි... මොකද... යුරෝපයේ ජීවත් වන අප්‍රිකානු ප්‍රජාවන්ට ඔවුන්ගේ බලපෑම් අනිවාර්යයෙන් ම තිබෙන්නට ඕනෑ."

මගේ කණ්ඩායම විසින් අප්‍රිකානු ආගමික නායකයින්ගේ ප්‍රකාශන පිළිබඳ කරන ලද පර්යේෂණයේ වාර්තා අපි කියවන්නට වීමු. වර්ෂ 2000 දී ටැන්සානියාවේ දී පවත්වන ලද "අරුෂා" නමින් හඳුන්වනු ලැබූ සම්මේලනයට බොහොමයක් රටවල ආගමික නායකයින් සහභාගි වී ඇත. ස්ත්‍රී චර්මච්ඡේදනය සහ ඉස්ලාම් ආගම අතර සම්බන්ධයක් නොමැති බවත්, එය ස්ත්‍රීන්ගේ සහ දැරියන්ගේ මානුෂික අයිතිවාසිකම් බලහත්කාරයෙන් උදුරා ගැනීමක් බවත් එම සම්මේලනයේ දී ප්‍රකාශයට පත් වී ඇත. වර්ෂ 2002 දී ඝානා රටේ දී පවත්වන ලද සම්මේලනයේ දී ස්ත්‍රී චර්මච්ඡේදනය සම්බන්ධ ව කිසිවක් කෝරානයේ සඳහන් වී නොමැති බව සම්මේලනය නියෝජනය කරන ලද නායකයින් ඒකමතික ව ප්‍රකාශ කොට ඇත. එම වර්ෂයේ දී ම සෙනගාල්හි දී පවත්වන ලද සම්මේලනයේ දී ස්ත්‍රී චර්මච්ඡේදනය සම්පූර්ණයෙන් ම ප්‍රතික්ෂේප කොට ඇත. සමු අහුරු ළප තුළ බලාපොරොත්තුවක් ලියලා වැඩෙන්නට විය. කරුණු එසේ වුව ද, මෙම සම්බන්ධ ව තවදුරටත් අවධානයෙන් සිටිය යුතු බැව් අපි තේරුම් ගතිමු.

මෙම විෂය ගැන පූර්ණ දැනුමක් තවමත් අපි ලබා ගෙන නොමැති බැව් කොරින්නාගේ මතය විය. කොරින්නාගේ මතයට ගරු කළ අපි එංගලන්තයේ ලන්ඩන් නුවර ජීවත්වන ඉස්ලාම් ධර්මය පිළිබඳ විශේෂඥයකු හමුවීමට තීරණය කළෙමු. නයිජීරියානු ජාතිකයකු වන මහාචාර්ය ඩේවිඩ් නොයිබි ඉස්ලාම් ධර්මය පිළිබඳ විශේෂඥයෙකි. ඔහු පර්යේෂණයක් සඳහා ලන්ඩන් නගරයට එන්නට පෙර නයිජීරියාවේ ඉබඩන් නමැති විශ්වවිද්‍යාලයේ ඉස්ලාම් නීතිය පිළිබඳ කථිකාචාර්යවරයකු වශයෙන් කටයුතු කොට ඇත. මහාචාර්ය නොයිබි වසර දහයක් පුරා ලන්ඩනයේ ජීවත් වන අතර, බ්‍රික්ස්ටන් ප්‍රදේශයේ පුරුෂ පක්ෂය සඳහා පමණක් වෙන් වූ ඉස්ලාම් දේවස්ථානයක භාර ව කටයුතු කරන්නේ ය. මහාචාර්ය නොයිබි හමුවීම සඳහා යන ගමනට ස්ත්‍රී චර්මච්ඡේදනය සම්බන්ධ නයිජීරියානු විශේෂඥවරියක් වන රහමට් හසාන් මහත්මිය ද එක් වූවා ය.

මහාචාර්ය නොයිබිගේ වාසස්ථානය වන පුරුෂ පක්ෂය සඳහා වෙන් වූ ඉස්ලාම් දේවස්ථානය වෙත අපි ගියෙමු. මහාචාර්යතුමා අප ව සාදරයෙන් පිළි ගත්තේ ය. කෙසඟ සිරුරක් ඇති උස පුද්ගලයකු වූ මහාචාර්ය ඩේවිඩ් නොයිබි සිය රැවුල මනාව සකසාගෙන සිටි අතර, ඔහු රවුම් උපැස් යුවළක් පැළඳ සිටියේ ය. ඔහු ඇඳ සිටි ලෝගුව මහ පොළොවේ ගෑවෙන තරමට දිග්විය. නයිජීරියානු රජයට ඉදිරිපත් කිරීම සඳහා ලිංගික අධ්‍යාපනය යන මැයෙන් ලිපියක් සකස් කිරීම සඳහා පරීක්ෂණ කරගෙන යන අතර, ඔහු ස්ත්‍රී චර්මච්ඡේදනය ගැන ද ගැඹුරින් අධ්‍යයනය කර ඇත.

"ස්ත්‍රී චර්මච්ඡේදනය සිදු කෙරෙන්නේ එය ඉස්ලාම් ධර්මයට අනුකූල නිසා බැව් බොහෝ දෙනා පවසනවා... එහි සත්‍යයක් තිබෙනවා ද?" මම මගේ පළමුවෙනි ප්‍රශ්නය ඔහුට ඉදිරිපත් කළෙමි.

"කෝරානයේ ඒ සම්බන්ධ ව බලකිරීමක් කරලා නැහැ... මේ සම්බන්ධ ව කෝරානයේ සාකච්ඡා කරලත් නැහැ... සමහර දෙනා මෙය ඉස්ලාම් ධර්මය මගින් පනවා ඇති නියෝගයක් ලෙස දකින්නෙ මේ සම්බන්ධ ව හෙඩිත්වල සඳහන් වෙලා තිබෙන නිසයි... මෙවැනි දෑ සඳහන් වී තිබෙන්නෙ දුර්වල හෙඩිත්වලයි." අපි මේ සම්බන්ධ මෙතෙක් සොයාගෙන ඇති කරුණු අනුමත කරමින් ඔහු කීවේ ය.

"හෙඩිත් කියන වචනයේ අර්ථය කුමක්ද...? හෙඩිත්වල මොනවා ද අඩංගු වෙලා තිබෙන්නෙ?" මම ඇසුවෙමි.

"හෙඩිත් කියන්නෙ මොහොමඩ් නබිවරයාගේ ඉගැන්වීම් සහ ඉස්ලාම් ධර්මයේ චාරිත්‍රවිධිවලට... වසර ගණනාවක් පුරා වාචික ව තමයි මේ ඉගැන්වීම් ඉදිරියට ඇවිල්ලා තිබෙන්නෙ... එසේ වාචික ව පරම්පරාවෙන් පරම්පරාවට සංක්‍රමණය වන විට සමහර අවස්ථාවල නොයෙකුත් පුද්ගලයන් තමන්ගේ අවශ්‍යතාවයන් සඳහා ඉස්ලාම් ධර්මයට නොයෙකුත් දේ එකතු කරලා තිබෙනවා...

අන්න ඒවා තමයි දුර්වල හෙඩිත් යනුවෙන් හඳුන්වන්නෙ... අන්න ඒ නිසා පසු කාලෙක ශාස්ත්‍රඥයො මේ සම්බන්ධ ගවේෂණ කරලා තිබෙනවා..."

"කොහොම ද ගවේෂණය කරලා තිබෙන්නෙ?"

"ඒක වසර සිය ගණනක් අතීතයට දිවෙන දීර්ඝ ක්‍රියාවලියක්... වසර සිය ගණනක් පුරා හෙඩිත් සම්බන්ධ ව කරන ලද අධ්‍යයනයක්... මොහොමඩ් උතුමාණන්ගේ මරණයෙන් පස්සෙ ඉස්ලාම් ගුරුකුල හතරක් ඇති වෙලා තිබෙනවා... මොහොමඩ්තුමාගෙ ගෝලයො සහ ඉස්ලාම් භක්තිකයින් උන්වහන්සේ දේශනා කරන ලද ආකාරයට ම ඒ ඉගැන්වීම් ලියා තබන්නට උත්සාහ කරලා තිබෙනවා... ඔවුන් ජීවත් වූ ප්‍රදේශවල චාරිත්‍රවලට අනුව මොහොමඩ්තුමාගේ ඉගැන්වීම් සුළු වශයෙන් වෙනස් කරල තිබෙනවා... ඒ අනුව මා ඉහත සඳහන් කළ ගුරුකුලවලින් එකක් ස්ත්‍රී චර්මච්ඡේදනය අනුමත කරලා තිබෙනවා... අද අප්‍රිකාවේ විශාල කොටසක් සහ විශේෂයෙන් ම මලයාසියාව, ඉන්දුනීසියාව වැනි රටවල මෙම ගුරු කුලයේ ඉගැන්වීම් පිළිපදිනවා" මහාචාර්ය තොයිබ් විස්තර කළේ ය.

"ඒ කියන්නෙ ඉස්ලාම්වාදයේ සමහර ගුරුකුල තමයි ස්ත්‍රී චර්මච්ඡේදනය අනුමත කරලා තිබෙන්නෙ" මම ප්‍රශ්න කළෙමි.

"එක ගුරුකුලයක් තමයි ස්ත්‍රී චර්මච්ඡේදනය අනුමත කරලා තියෙන්නෙ... ඒ ගුරුකුලය ඉදිරිපත් කර ඇති හෙඩිත්වල සත්‍යතාවයක් ඇති කියලා අපි විශ්වාස කරන්නෙ නෑ... මේ සම්බන්ධ ව එංගලන්තයේ ජීවත් වන බොහොමයක් මුස්ලිම් භක්තිකයින් ඉස්ලාම් ධර්මයේ එක් ගුරුකුලයක් ස්ත්‍රී චර්මච්ඡේදනය අනුමත කර ඇති බැව් කියමින් මට නිතර ම චෝදනා එල්ල කරනවා... ඒ ගැන තර්ක කරලා පලක් නෑ... මොකද... අප්‍රිකාවෙ ඉස්ලාම් ආගමේ නායකයින් මේ අදහස ඒ රටවල පතුරවනවා... නමුත් සත්‍යය නම් ශුද්ධ වූ කෝරානයේ ස්ත්‍රී චර්මච්ඡේදනය ගැන සඳහන් වී නැතුවා පමණක් නො වෙයි. කිසි ම තැනක එය අනුමත කිරීමක් කරලා නෑ."

"මම දැන ගන්නට කැමැතියි ස්ත්‍රී චර්මච්ඡේදනය සම්පූර්ණයෙන් ම නවතා දැමීම සඳහා ඉස්ලාම් ප්‍රජාව කිසි යම් ක්‍රියා මාර්ගයක් අරගෙන තිබෙනව ද කියලා?"

"නැහැ... ඊට හේතුව කෝරානය කිනම් ආකාරයකට අර්ථ දැක්විය යුතු ද යන්න තීරණය කිරීමට හැකි බලය ලත් උත්තරීතර සංස්ථාවක් ඉස්ලාම් ආගමේ නැති වීම යි. ඒ නිසා සිදුවන්නෙ එක් එක් ඉස්ලාම් ශාස්ත්‍රඥයින් විසින් කෝරානය අර්ථ දක්වනවා... සමහර කොටස් ඒ අර්ථ දැක්වීම් පිළිපදිනවා."

"ස්ත්‍රී චර්මච්ඡේදනය සම්බන්ධ ව ඔබගේ පුද්ගලික මතය කුමක්ද? මෙම ඉස්ලාම් දේවස්ථානයේ ඔබ ස්ත්‍රී චර්මච්ඡේදනයට විරුද්ධ ව හඬක් නගනවා ද?"

"මෙහෙ ජීවත් වන කිසිවෙක් තව ම ස්ත්‍රී චර්මච්ඡේදනයට අසුවෙලා නෑ."

ඔහුගේ පිළිතුරු මා පුදුමයට පත් කළේ ය. මෙය නයිජීරියානු ඉස්ලාම් දේවස්ථානයකි. ලෝකයේ වැඩි ම වශයෙන් ස්ත්‍රී චර්මච්ඡේදනය සිදුවන්නෙ නයිජීරියාවෙ බව ප්‍රකට කරුණකි.

"මෙහෙන් බොහෝ දෙනෙක් චර්මච්ඡේදනයට ලක් වෙලා තියෙනවා" මා සමඟ සිටි රහමට් හසාන් මෙන්මිය කීවා ය.

එවදන් ඇසූ මහාචාර්ය තොයිබ් පුදුමයට පත්විය.

විශාරදයින්ට ද මේ විෂය සම්බන්ධ ව පැහැදිලි අවබෝධයක් නොමැති වීම සත්‍ය වශයෙන් ම සැලකිය යුතු ප්‍රශ්නයකි. ඇත්තෙන් ම ස්ත්‍රී පක්ෂයට මෙම ව්‍යසනය හේතුකොටගෙන විඳින්නට සිදු වන භයානක දුක්ගැහැට ගැන පුරුෂ පක්ෂය කිසිවක් නො දනිති.

වර්ෂ 2004 හේමන්ත සතුවේ නයිරෝබි නගරයේ දී ස්ත්‍රී චර්මච්ඡේදනයට විරුද්ධ ව පවත්වන ලද සම්මේලනයට සහභාගී වීමට මා සිය අයුරු මගේ මතකයට නැඟිණි. එම සම්මේලනයට සහභාගී වීමට මුළු මහත් අප්‍රිකානු මහාද්වීපයෙන් ම කාන්තාවන්

පැමිණ සිටි අතර, ඔවුන් ස්ත්‍රී චර්මඡේදනයට විරුද්ධ ව කතා කළ ආකාරය මා මීට පෙර කිසි ම දිනක දැක නො තිබුණි. කෙන්යාවේ මුස්ලිම් කවුන්සලය නියෝජනය කරමින් සම්මේලනයට සහභාගී වූ කසාන් මිගල් හාජි නමැති තරුණයා සම්මේලනය අමතා මෙවැනි ප්‍රකාශයක් කළේ ය. "මුස්ලිම් ආගමට අනුව ස්ත්‍රීන්ගේ භගශිෂ්නිකාව සහ යෝනි තොල් කප්පාදු කිරීම තහනම් ක්‍රියාවක්... ස්ත්‍රී චර්මඡේදනයට විරුද්ධ ව අප විසින් ගෙන යනු ලබන අරගලයේ දී ස්ත්‍රී චර්මඡේදනය යුක්ති යුක්ත කිරීමට ඇති වී ඇති ආගමික විශ්වාස පමණක් නො ව, ඕනෑ ම බලපෑමකට විරුද්ධ ව සටන් කිරීම අපගේ අරගලයේ කොටසක් බැවි අප අමතක නො කළ යුතුයි... ඉස්ලාම් පූජකවරුන් තමුන්ගේ දේවස්ථානවල දී ස්ත්‍රී චර්මඡේදනය නමැති මෙම පැහැදිලි ක්‍රියාව හෙළා දකිමින් බණ දේශනා පැවැත්විය යුතුයි. ලෝකය පුරා ම සිටින ඉස්ලාම් පූජකවරුන් මේ ඉල්ලීම ඉටු කළහොත් ස්ත්‍රී චර්මඡේදනය ඉතා ඉක්මනින් මේ පොළොව මතින් අතු ගා දමන්නට හැකි වනු ඇත."

7

නඩුව

ලින්ඩා වයිල් කුරියල් මා මිතු නීතිඥවරිය ස්ත්‍රී චර්මඡේදනය සඳහා වරදකරුවන් බවට සැක කරන යුවළකට විරුද්ධ ව නඩු පවරා ඇති අතර, එම නඩුව නරඹන්නට එන ලෙස ඇයගෙන් මා හට ආරාධනයක් ලැබිණ. ආරාධනය ලැබුණු විගස ම මම පැරිසිය බලා යන්නට ගුවන් බලපත්‍රයක් මිල දී ගෙන අහස් යානයේ ආසනයක් වෙන් කරවා ගතිමි.

මා පැරිසියට පැමිණි විගස ම ඇය පැරිසියේ ස්ත්‍රී චර්මඡේදනය පිළිබඳ නව තොරතුරු මා හට දන්වා සිටියා ය. මා නැරඹීමට පැමිණ සිටින නඩුවේ කතාව ඈ මට විස්තර කළා ය. (මෙයට සම්බන්ධ පුද්ගලයාගේ නියම නම සඳහන් කිරීමට නො හැකි බැවින් ඔහු එන් යනුවෙන් නම් කර ඇත.) එන් නමැති පුද්ගලයෙකු මාලි රටේ දී උපත ලද කාන්තාවක් සමඟ විවාහ වී පසු ව ඇය පැරිසියට ගෙන්වාගෙන ඇත. ඔවුන්ට පිරිමි දරුවන් දෙදෙනෙකු

සහ ගැහැනු දරුවකු ලැබී ඇත. වර්ෂ 1981 දී එන් විසින් ප්‍රංශයේ පුරවැසි භාවය ඉල්ලා සිටින ලද ව, ඔහුට පුරවැසි භාවය ලැබී ඇත. ප්‍රංශයේ නීතියට අනුව බහුභාර්යා විවාහ නීතියෙන් තහනම් ව තිබිය දී ප්‍රංශ පුරවැසි භාවය හිමි එන් 1992 දී නැවතත් මාලි රටට ගොස් තවත් ගැහැනියක සමඟ විවාහ වී ඇය ද පැරීසියට කැඳවාගෙන විත් ඇත. එන් සිය බිරින්දෑවරුන් දෙදෙනා සහ දරුවන් තුන්දෙනා සමඟ පැරීසියේ කාමර තුනකින් සමන්විත නිවෙස්නකක ජීවත් ව ඇත. එන්ට දාව ඔහුගේ නව බිරිඳට පළමුවෙන් ම පුතෙකු සහ ඊට පසු වර්ෂ 1996 දී දියණියක් ලැබී ඇත. ඔවුන් සිය දියණියට ෆනටා (මෙය ඇයගේ සත්‍ය නම නො වේ) යනුවෙන් නම් තබා ඇත. වර්ෂ 1997 දී එන් සිය දෙවැනි බිරිඳ සහ දරුවන් දෙදෙනා සමඟ නිවාඩුවකට මාලි රටට ගොස් ඇත. එයින් වසරකට පසු ප්‍රංශ රජය විසින් පවත්වාගෙන යනු ලබන දැරියන්ගේ සෞඛ්‍ය කටයුතු සම්බන්ධ ව කටයුතු කරන චිකිත්සාගාරයක් මඟින් වසරකට වරක් දැරියන් සඳහා කළ වෛද්‍ය පරීක්ෂණයක දී ෆනටා චර්මඡේදනයට ලක් කර ඇති බැව් හෙළි වී ඇත. ඇයට චර්මඡේදනය සිදු වූ ආකාරය ගැන එන්ගේ බිරිඳ වෛද්‍යවරයාට පවසා ඇති කතාව මෙසේ ය: "නිවාඩුවක් සඳහා මාලි රටට ගිය අවස්ථාවේ අපි නැවතිලා හිටියෙ මගේ ස්වාමිපුරුෂයාගෙ ගෙදර. ඒක ගමක්. ඒ ගම තිබුණෙ ප්‍රධාන නගරය වන බමකෝවලින් කිලෝමීටර් 600ක් පමණ දුරින්. මමත්, මගේ ස්වාමිපුරුෂයත් පමණක් බමකෝවලට ගොස් දින කීපයක් නතර කරන්නට තීරණය කරලා දරුවන් දෙදෙනා මගේ ස්වාමිපුරුෂයගෙ අම්මා ළඟ තබා අප ඒ ගමන ගියා. නමුත් අපි ආපසු එන විට අපගේ කිසි යම් හෝ අනුදැනුමක් නැති ව මගේ ස්වාමිපුරුෂයාගේ අම්මා ෆනටාට චර්මඡේදනය සිදු කරලා තිබුණා."

වෛද්‍යවරයා සිය වෛද්‍ය වාර්තාව අදාළ බලධාරීන්ට භාර දී ඇත. ප්‍රංශයේ පළමුවන වතාවට දැරියකට චර්මඡේදනය සිදු කිරීම පිළිබඳ වරදකරුවන් උසාවියකට ගෙන එනු ලැබුවේ ඒ ආකාරයට ය. ඕනෑ ම පිටරට ස්ත්‍රියක් ප්‍රංශය තුළ දී දරුවකු බිහි කළහොත් එම දරුවාට හෝ දැරියට හෝ අනිවාර්යයෙන් ම ප්‍රංශ පුරවැසි

භාවය හිමි වේ. එහෙයින්, ෆනටාගේ මවු ප්‍රංශ ජාතික කාන්තාවක් නො වුවත්, ඇය ප්‍රංශ ජාතිකයකුට අපරාධයක් කිරීමේ වරදට ප්‍රංශ දණ්ඩ නීති සංග්‍රහයට අනුව ඇයට විරුද්ධ ව නඩු පැවරිය හැකි ය. එහෙත්, ස්ත්‍රී චර්මඡේදනය සම්බන්ධ ව ස්වාමිපුරුෂයාට වගකීමක් නොමැති බවත්, එහි වගකීම සම්පූර්ණයෙන් ම ස්ත්‍රී පාර්ශ්වයට එනම් භාර්යාවට අයත් කර්තව්‍යයක් බවත් කියමින් දැරියගේ පියා වන මිස්ටර් එන් කරන ලද ප්‍රකාශය මත විශ්වාස තැබූ නඩුකාරවරයා පැමිණිල්ල එතරම් සැලකිල්ලකට නො ගත්තේ ය.

දෙවන වතාවට නඩුව විභාග කිරීම සඳහා අධිකරණය විසින් දින දෙකක් වෙන් කරගෙන තිබුණි. උසාවියට ඇතුළු වූ මම අමුත්තන් සඳහා වෙන් කර ඇති මැදිරිය වෙත ගියෙමි. මා එහි යනවිට අමුත්තන් සඳහා වූ මැදිරිය නඩුව නැරඹීමට පැමිණ සිටි අමුත්තන්ගෙන් පිරී තිබුණි. අමුත්තන් අතර පාසල් ළමුන්, විශ්වවිද්‍යාල ශිෂ්‍යාවන් සහ අප්‍රිකානු කාන්තාවන් කිහිපදෙනෙක් ද වූහ.

චෝදනා ලැබ සිටි කාන්තාව සහ පිරිමියා විනිසුරුවරයාගේ අසුන අසලට මුහුණ ලා වාඩි වී සිටිනු මම දුටුවෙමි. පළමුවෙන් ම තෝල්කයා විසින් වෛද්‍යවරිය සාක්ෂි කූඩුවට කැඳවන ලදී. ෆනටා නමැති දැරියට චර්මඡේදනය සිදු කර ඇති බැව් සොයා ගනුලැබ ඇත්තේ මෙම වෛද්‍යවරිය විසිනි. චෝදනා ලැබ සිටි දැරියගේ මව වන "ඇම්" නඩුකාරවරයා විසින් කැඳවන ලදී. කළු පාට ගවුමකින් සැරසී සිටි ඇය තුළින් උදාසීන ගතියක් දෘශ්‍යමාන වූ අතර, සමහර විට ඇය බියකින් පසු වූවා විය හැකි ය. ඇය පහත් හඬකින් කතා කළ අතර, සමහර අවස්ථාවල ඇය කියන දේ කිසිවකුට නො ඇසුණු තරම් ය. "චර්මඡේදනය ප්‍රංශයේ නීතියෙන් තහනම් කර ඇති බව මම දැනගෙන හිටියෙ නෑ... මම ඒ බව දැනගෙන හිටියා නම් මම මගේ දියණියට කොහොමත් චර්මඡේදනය සිදු කරන්නෙ නෑ" ඇය පැවසුවා ය.

නඩුකාරවරයා විසින් නොයෙකුත් කාන්තාවන් සාක්ෂිකාරියන් වශයෙන් කැඳවන ලදී. එසේ කැඳවූ අප්‍රිකානු කාන්තාවන්ට

බොහෝ ප්‍රශ්නවලට පිළිතුරු දීමට සිදු වූ අතර, නඩුකාරවරයා විසින් අසන ලද මෙවැනි ප්‍රශ්නයකට ද පිළිතුරු දෙන්නට සිදු විය. "ඔබට චර්මච්ඡේදනය සිදු කර තිබේ ද?" නඩුකාරවරයා විසින් කැඳවන ලද සෑම කාන්තාවකට ම චර්මච්ඡේදනය සිදු කර ඇති බව ඔවුන් දෙන ලද පිළිතුරුවලින් සනාථ විය.

නඩුකාරවරයා චෝදනා ලැබ සිටි ඇන්ගේ පළමු බිරිඳගෙන් මෙසේ ප්‍රශ්න කළේ ය. "ස්ත්‍රී චර්මච්ඡේදනය සිදු නො කළ, මාලි රටෙන් පැමිණ සිටින ඔබ දන්නා දැරියන් හෝ කාන්තාවන් හෝ සිටිනවා ද?"

"මම දන්නෙ නෑ... අපි එවැනි විෂයන් ගැන කතා කරන්නෙ නෑ" ඇය පිළිතුරු දුන්නා ය.

සාක්ෂි ඉදිරිපත් කිරීම සඳහා කැඳවූ කරුණු පොලිස් නිලධාරිනියක් සාක්ෂි ඉදිරිපත් කරමින් කියා සිටියේ නිවාඩුවක් ගත කිරීමට කියා මාලි රටට රැගෙන ගිය දැරියක් ඇගේ අත්තම්මා විසින් ඇයට චර්මච්ඡේදනය සිදු කිරීමෙන් පසු ව ඇය මිය ගොස් ඇති බව ය. සෙනගාලයේ ඉපදී මාලි රටේ හැදුණ වැඩුණ කාන්තාවක් සාක්ෂි දෙමින් චර්මච්ඡේදනය සිදු කිරීම නිසා ඇයට මුහුණ පාන්නට සිදු වී ඇති ප්‍රශ්න ගැන ඇය උසාවියට පැහැදිලි කරමින් මෙසේ පැවසුවා ය. "බොහොමයක් දෙනා තුළ වැරදි අවබෝධයක් තියෙනවා ස්ත්‍රී චර්මච්ඡේදනය ඉස්ලාම් ධර්මයට අනුකූල ව සිදු කරන දෙයක් බව... ඒක සම්පූර්ණයෙන් ම වැරදියි."

සාක්ෂි ඉදිරිපත් කිරීම සඳහා නඩුකාරවරයා විසින් තවත් වෛද්‍යවරියක් කැඳවන ලදී. ස්ත්‍රී චර්මච්ඡේදනය හේතුකොටගෙන ස්ත්‍රී ලිංගේන්ද්‍රියට සිදුවන භයානක හානි පිළිබඳ විස්තරයක් ඇය නඩුකාරවරයා ඉදිරියේ තැබුවා ය. අනතුරු ව නඩුකාරවරයා නඩුව පසු දිනට කල් තැබුවේ ය.

මා උසාවිය තුළ සිට එළියට එන අතරතුර දී මිස්ටර් එන් මම දුටුවෙමි. ඔහු උස දේහධාරී පුද්ගලයකු විය. ඔහුගේ නළල රැලි ගැසී තිබුණ අතර, ඔහුගේ මුහුණෙන් කෲර පෙනුමක් දෘශ්‍යමාන විය.

ඇත්තෙන් ම ඔහු කෙබඳු පුද්ගලයකු ද යන්න මට කිව නො හැකි ය. ඔහු සිය දියණියට සිදු කරන ලද අපරාධය ගැන ඔහුට කිසි යම් හෝ හැඟීමක් තිබේ ද? සිය දියණිය චර්මච්ඡේදනයට ලක් කිරීම සඳහා උපදෙස් දෙන ලද්දේ ඔහු විසින් ද? හිස බිමට නැඹුරු කරගත් ඔහුගේ බිරිඳ ඔහු පසුපසින් ගමන් කරමින් සිටියා ය. ඇත්තෙන් ම ඒ දර්ශනය මා තුළ කිසි යම් ශෝකජනක සිතුවිල්ලක් ඇති කිරීමට සමත් විය.

පසුදින උදෑසන 9.30 වන විට මම උසාවිය වෙත ගොස් අසුන් ගත්තෙමි. මෙවර මට ඉදිරිපෙළේ අසුනක් ලබා ගැනීමට හැකි විය. මා මිතුරිය වන නීතිඥ ලින්ඩා මා සිටි තැන සිට පුටු පෙළි දෙකකට ඉදිරියෙන් අසුන්ගෙන සිටිනු මම දුටුවෙමි. එදින පළමුවෙන් ම මනෝවිකිත්සකයකු තවත් සගයකු සමඟ පැමිණ චෝදනා ලබා සිටි යුවළ සම්බන්ධ ව ඔහු සොයා ගෙන ඇති දත්ත අඩංගු වාර්තාවක් උසාවියට ඉදිරිපත් කිරීමට පටන් ගත්තේ ය. ඔහු විද්‍යාත්මක කෝණයකින් ප්‍රශ්න විග්‍රහ කරන්නට වූ අතර, එය තේරුම් ගැනීම මා හට තරමක් අපහසු වූයෙන්, මම අරමුණකින් තොර ව හිස් අවකාශය දෙස බලාගෙන වාඩි වී සිටින ෆනටාගේ මව සහ පියා දෙස බලා සිටින්නට වීමි. මිස්ටර් එන්ගේ මුහුණ පෙර දිනටත් වඩා බැරෑරුම් ස්වභාවයක් ගෙන තිබුණ අතර, මනෝවිකිත්සකයා ඉදිරිපත් කරන කරුණු පිළිබඳ ඔහු තුළ කිසි යම් නොරිස්සුම් ස්වභාවයක් ඇති වී තිබෙනු මම දුටුවෙමි.

එකවර ම ඔහුගේ බිරිඳ වෙත මගේ නෙත් යොමු විය. ඒ මොහොතේ මට මගේ මව සිහියට නැඟිණ. මගේ මව විසින් මා හට කරන ලද චර්මච්ඡේදනය සම්බන්ධ ව චෝදනා ලැබ ඇය මේ උසාවියට කැඳවා තිබුණා නම් ඇයගේ තත්ත්වය කෙබඳු ද? මට විඳින්නට සිදු වූ වේදනා සහ හානිය සම්බන්ධ ව මගේ අම්මාට වරද පැවරිය හැකි ද? අම්මා සතු ව තිබූ දැනුමට අනුව හොඳක් කිරීමේ චේතනාව පෙරදැරි කරගෙන මා හට චර්මච්ඡේදනය සිදු කිරීම ගැන ඇය වරදකාරියක කොට සිරගෙට යැවීමට හෝ ඇයට විශාල දඩ මුදලක් හෝ නියම කළ හැකි ද? සත්‍ය වශයෙන් ම ඇයට

උවමනා වී තිබුණේ මගේ සුභ සිද්ධිය සඳහා හොඳක් කිරීම බැව් දැනුදු මම මෙනෙහි කරමි. අද මම ද මවක් බැවින් මට මගේ මව හොඳාකාරව ම තේරුම් ගැනීමට පුළුවන. මිහිපිට ඕනෑ ම මවකගේ අභිප්‍රාය වන්නේ තම දරුවන් සතුටෙන් සිටිනු දැකීම යි. මා හට චර්මච්ඡේදනය සිදු කිරීමෙන් ඇය අවංක ව ම බලාපොරොත්තු වන්නට ඇත්තේ මා වැඩිහිටියකු බවට පත් කිරීමත්, එමගින් හොඳ ස්වාමිපුරුෂයකු ලබා ගැනීමට මඟ සැලැස්වීම සහ මා සතුටින් සිටිනු දැකීම යි. ඇත්තෙන් ම ගැහැනියකට ස්වාමියකු නොමැති ව අප්‍රිකානු සමාජයක ජීවත් වීම උභතෝකෝටික ප්‍රශ්නයකි. මෙම උසාවිය තුළ වරදකරුවකු බවට චෝදනා ලැබ නඩුකාරවරයා ඉදිරිපිට වාඩි වී සිටින මෙම ගැහැනියට ද අවංකව ම අවශ්‍ය වී තිබෙන්නට ඇත්තේ තම දියණිය සතුටුදායක දිවියක් ගෙවනවා දකින්නට නො වන්නේ ද?

මම නැවතත් මිස්ටර් එන් දෙස බැලුවෙමි. මෙම තරුණ ගැහැනියට තම ස්වාමිපුරුෂයාට පටහැනි ව කිසිවක් කිරීමට නො හැකි බැව් මම පසක් කළෙමි. සිය දියණියට කරන ලද චර්මච්ඡේදනයට විරුද්ධ ව හඬක් නැඟීමට ඇයට අවස්ථාවක් නො තිබුණා ද? ඇයගේ අභිප්‍රාය ඇය ප්‍රකාශ කරන්නට ඇත් ද? සිය දියණියගේ අනාගත සුභ සිද්ධිය පතා මෙය සිදු වූවා ද? එසේත් නැතිනම් දැරියගේ පියා ඔහුට අවශ්‍ය තීරණය ගෙන මෙය සිදු කෙරුවා ද? ඇත්තෙන් ම සිය නිවස තුළ ඇය වහලියක් ද?

නඩුකාරවරයාගේ කටහඬින් මම අවදි වීමි. ඒ වන විට මනෝචිකිත්සකයා සිය දේශනය අවසන් කර තිබුණි. මා පළමුවරට පැරිසියට පැමිණි අවස්ථාවේ සාකච්ඡා පවත්වා තිබූ මවුවරුන් සහ දරුවන් සඳහා වූ සායනයක වෛද්‍යවරියක් වූ එම්මැනුවෙලා පිට සාක්ෂි ඉදිරිපත් කිරීම සඳහා කැඳවන ලදී.

"ප්‍රංශයේ නීතියට අනුව ස්ත්‍රී චර්මච්ඡේදනය තහනම් බැව් නො දන්නා කිසි ම රෝගියකු මට නම් පසුගිය වසර කීපය තුළ හමු වී නැහැ" ඇය ඉතා සංක්ෂිප්ත ව සිය අදහස ප්‍රකාශ කර සිටියා ය. මා මිතු නීතිඥවරිය ලින්ඩා සිය හිස දෙපසට වනමින්

එම්මැනුවෙලාගේ අදහස අනුමත කරන අයුරු මම දුටුවෙමි. ඒ ගැන නිසැකයෙන් ම ඇය සතුටට පත් ව සිටිනු ඇත.

අනතුරු ව පවුල් සංවිධානයේ කාන්තාවක් අදහස් ප්‍රකාශ කිරීම සඳහා කැඳවන ලදී. පවුල් සංවිධානයට එන බොහොමයක් කාන්තාවන්, ස්ත්‍රී චර්මච්ඡේදනයට ලක් ව සිටියත් ඔවුන්ට චර්මච්ඡේදනය සිදු කර ඇති බව ඔවුන් නො දැන සිටින බව ඇය පැවැසුවා ය.

මම දිගට ම ෆතාටාගේ අම්මා දෙස බලා සිටියෙමි. එකිනෙකා පැමිණ නඩුකාරයා වෙත ලබා දෙන සාක්ෂි ගැන මෙම කාන්තාව කුමක් සිතන්නේ ද? ඇය සිය දියණියට කරන ලද චර්මච්ඡේදනය මෙන් ම තමාට සිදු කර ඇති චර්මච්ඡේදනය ගැන සිතනවා විය හැකි ද? ඒ සම්බන්ධ ව තමා වරදක් කළ ඇති බැව් ඇය කල්පනා කරනවා ද? එසේ නැති නම්, ඇය ඒ ගැන කනගාටු වෙනවා ද?

නඩුකාරවරයා ඇයට නැඟී සිටින ලෙස සැල කළ විට, ඇය ඔහු දෙස බලා හෙමින් සීරුවේ නැඟී සිටියා ය. එසේ නැඟී සිටි ඇය නඩුකාරවරයා අමතා මෙසේ පැවැසුවා ය. "දැන් මම දන්නවා කුඩා ගැහැනු ළමයකු චර්මච්ඡේදනයට ලක් කිරීම වරදක් බව."

"ඇයි ඒක වරදක් කියලා ඔබ සිතන්නෙ" නඩුකාරවරයා ප්‍රශ්න කළේ ය.

"පසු ගිය දින දෙක තුළ ස්ත්‍රී චර්මච්ඡේදනය ගැන මා නො දැන සිටි කොතෝ දේ දැන ගන්නට ලැබුණා... චර්මච්ඡේදනය හේතුකොටගෙන ඇති වන ශාරීරික ප්‍රතිවිපාක පමණක් නො වෙයි මෙම ක්‍රියාව නවතා දැමීමට ගෙන ඇති ක්‍රියාමාර්ග ගැන මම දැන ගත්තා... මම මේ කිසිවක් මීට පෙර දැනගෙන හිටියෙ නෑ."

"ඔබ මෙම ක්‍රියාව නැවත වරක් ඔබගේ දරුවකුට කරන්නට බලාපොරොත්තු වෙනව ද?" නඩුකාරවරයා පෙරළා ප්‍රශ්න කළේ ය.

"නැහැ."

මට නො දැනුවත්ව ම මගේ දෙනෙතින් කඳුළු රූරා ගලා හැලෙන්නට විය. මා තුළ ඇය ගැන මහත් කනගාටුවක් ඇති විණ. ඇය නඩුකාරවරයා ඉදිරිපිට හිස නැමී සිටගෙන සිටියාය. ඇයගේ සැමියා වන මිස්ටර් එන් නඩුකාරයා විසින් නැවතත් කැඳවන ලදී.

"ඔබගේ බිරිඳ මෙම අධිකරණය ඉදිරිපිට දැන් කරන ලද ප්‍රකාශය ගැන ඔබට මොනවා ද කියන්නට තිබෙන්නේ?" නඩුකාරයා ප්‍රශ්න කළේ ය.

ඔහු පැකිළෙමින් යමක් තොල් මතුළේ ය.

"ඔබ කියූ දේ මට හරියට තේරුණේ නැහැ" නඩුකාරයා කීවේ ය.

අනතුරු ව නඩුකාරයා විසින් තෝල්කයාව කැඳවන ලදී.

"මේක නම් විහිළුවක්" මම මට ම කියා ගතිමි.

"මේ අධිකරණය ඉදිරිපිට ඔබගේ භාර්යාව කළ ප්‍රකාශය ඔබට ඇසුණ ද?" නඩුකාරයා නැවතත් ප්‍රශ්න කළේ ය.

බොහෝ විට උසාවිය තුළ කෙරුණු කිසි ම කතාබහකට ඔහු සවන් දී නො සිටින්නට ඉඩ ඇත. අවසානයේ දී නඩුකාරවරයා ඔහුගේ අදහස ප්‍රකාශ කරවා ගැනීමට සමත් විය. ඔහුගේ ප්‍රකාශය මෙසේ ය: "ස්ත්‍රී චර්මච්ඡේදනය හොඳ දෙයක් නො වෙයි."

මෙතෙක් අධිකරණය තුළ සිදුවන කිසි ම කතාබහකට ඔහු ඇහුම්කන් දී නොමැති බව පැහැදිලි ව පෙනෙන්නට විය. සමහර පුද්ගලයින් කිසි ම දෙයක් ඉගෙන ගැනීමට උත්සාහ කරන්නේ නැත. එවැනි අය ඔවුන්ගේ දරුවන්ට ආරක්ෂාව සලසන්නේ කෙසේ ද?

අනතුරු ව මා මිත්‍ර නීතිඥවරිය ලින්ඩා ස්ත්‍රී චර්මච්ඡේදනයට විරුද්ධ ව කරගෙන යන කටයුතු සම්බන්ධවත් කරුණු ඉදිරිපත් කිරීම ආරම්භ කළා ය. චර්මච්ඡේදනයට විරුද්ධ ව ඇය දියත් කර ඇති අරගලය සඳහා සූදානම් කර ඇති පෝස්ටරයක් ඇය විනිශ්චයකරුවාට සහ ජූරි සභාවට පෙන්නුවා ය.

නඩුව අවසානයට එළඹෙමින් තිබුණ අතර, උසාවි ශාලාව තුළ තරමක නො සන්සුන්තාවයක් ඇති වන්නට විය. මෙතෙක් ලින්ඩා අසල අසුන් ගෙන සිටි නීතිඥවරියගේ වාරය වූ බැවින් ඇය නැගී සිට උසාවිය අමතන්නට පටන් ගත්තා ය.

"අද මා මෙම උත්තරීතර අධිකරණ ශාලාව තුළ නැගී සිටින්නේ හුදෙක් නීතිඥවරියක් වශයෙන් පමණක් නො වේ. ස්ත්‍රියක් සහ මේ රටේ පුරවැසියකු වශයෙනි... නීතිඥවරියක් වශයෙන් මම මේ රටේ දරුවන්ට ඇති අයිතිය සුරක්ෂිත කරමි. ස්ත්‍රියක් වශයෙන් මේ දැරියන් කෙරෙහි මා තුළ අනුකම්පාවක් ඇති ව ඇත... පුරවැසියකු වශයෙන් මිනිස් අයිතිවාසිකම් උල්ලංඝනය වන දෙස බලා සිටීම පමණක් මට කරන්නට නො හැකිය... මේ දැරියගේ අයිතීන් උදුරා ගැනීම සම්බන්ධ ව ඇගේ මවුපියන් දෙදෙනා විශාල අපරාධයක් කර ඇත... ඔවුන් දෙමවුපියන් වශයෙන් තම දරුවා හිංසාවෙන් ගලවා ගැනීමට අසමත් වී ඇත... එපමණක් නො වෙයි ඔවුන් මේ රටේ නීතිය ද උල්ලංඝනය කර ඇත... ස්ත්‍රියකගේ ලිංගේන්ද්‍රිය ආශ්‍රිත අවයව කපා දැමීමෙන් පසු කිසිවකුට ඒවා ඒ ආකාරයෙන් ම ආපසු ලබා දෙන්නට නො හැකි ය."

ප්‍රංශයේ ස්ත්‍රී චර්මච්ඡේදනය නීතියෙන් තහනම් කොට ඇති බව දැන නො සිටි බව කියමින් දැරියගේ දෙමවුපියන් විසින් කරන ලද ප්‍රකාශනයේ සත්‍යතාවය ගැන ඇය ප්‍රශ්න කළා ය. චර්මච්ඡේදනය ප්‍රංශය තුළ තහනම් බව මිස්ටර් එන්ගේ පළමු බිරිඳ දැන සිටි බැව් නීතිඥවරිය අධිකරණයට මතක් කර දෙමින් මෙසේ පැවසුවා ය.

"උතුමාණනි... ඔවුන් අප්‍රිකාවට යන විට මිස්ටර් එන්ගේ පළමු බිරිඳ ප්‍රංශයේ චර්මච්ඡේදනය නීතියෙන් තහනම් බව දැන සිටියා... ඒ වගේ ම දැරියගේ මව දැනුවත් ව තමයි මේ සිද්ධිය සිදු වෙලා තියෙන්නෙ."

නීතිඥවරියගේ පැහැදිලි කිරීම ගැන වරදකරුවන් වශයෙන් චෝදනා ලැබ සිටින දෙදෙනාගෙන් කිසිවෙක් ඊට ප්‍රතිචාරයක් නො දැක්වූවේ ය. එනමුදු ඈ සිය කතාව දිගට ම කරගෙන ගියා ය.

"මේ දැරියගේ මවුපියන් දෙදෙනා අතර විශාල වෙනසක් තිබෙනවා. වරදකරු වශයෙන් චෝදනා ලැබ සිටින මේ කාන්තාව තම ස්වාමිපුරුෂයාට වඩා වයසින් අවුරුදු තිහක් බාලයි... මේ පුද්ගලයා සමඟ විවාහ වීමෙන් පසු ඇය පැරිසියට එන විට ඇගේ වයස අවුරුදු දහතුනයි... එපමණක් නො වෙයි, ඇය එන විට පළමු බිරිඳ ඒ නිවසේ සිටියා... ඇයට මුහුණ දෙන්නට සිදු ව ඇති දුෂ්කරතා අපට හිතා ගන්නට පුළුවන්... ඇයට මුහුණ දෙන්නට වූ දුෂ්කරතා ගැන සිතා තම ස්වාමිපුරුෂයාගෙන් වෙන් වූවා නම් ඇයට ප්‍රංශයේ නීත්‍යානුකූල ව ඉන්නට ඇති අයිතිය නැති ව යනවා... ඒ නිසා වහලු වශයෙන් සලකන්නට හැකි තම ස්වාමිපුරුෂයාගේ අණට කීකරු ව ඇයට ජීවත් වන්නට සිදු ව තිබෙනවා... නමුත් ඇයට ඇයගේ දියණිය මේ ව්‍යසනයෙන් ගලවා ගන්නට හොඳට ම අවකාශය තිබුණා... ඇයට මීට වඩා පරීක්ෂාකාරී ව කටයුතු කරන්නට තිබුණා... එහෙයින් උතුමාණෙනි මේ දැරියට සිදු ව ඇති අපරාධයට ඇයත් වගකිව යුතු යි."

ඊට පසු දැරිය වෙනුවෙන් පෙනී සිටි නීතිඥයා අධිකරණය අමතන්නට පටන් ගත්තේ ය. අනෙකුත් නීතිඥයන් විසින් ප්‍රකාශ කරන ලද කරුණු අනුමත කරමින් ඔහු සිය කතාව ආරම්භ කළේ ය. "කෙසේ හෝ මම ඉල්ලා සිටිනවා මේ පවුලට දරන්නට බැරි දඩ මුදලක් නියම නො කරන ලෙස... එවැනි දඩ මුදලක් සැබෑ වශයෙන් ම මෙවැනි පවුලකට විශාල ප්‍රශ්නයක්."

අනතුරු ව රජයේ නීතිඥයා සිය කතාව ආරම්භ කළේ ය. ඔහු අප්‍රිකාවේ සහ යුරෝපයේ සංස්කෘතීන්වල ඇති නො ගැළපීම් සහ ප්‍රතිවිරෝධතාවයන් විග්‍රහ කරමින් කතා කළේ ය. "මෙහි දී දෙමවුපියන් තම දියණිය බාධාවකින් තොර ව චර්මඡේදනය කිරීමට හැකි වාතාවරණයක් තිබෙන රටකට ගෙන යෑමෙන් දැනුවත් ව ම මේ අපරාධයට හවුල් වී තිබෙනවා."

"ස්ත්‍රී චර්මඡේදනය නීතියෙන් තහනම් කර ඇති බව මේ දෙමවුපියන් දැනගෙන සිටියා කියලා ඔබ හිතනවා ද?" පැමිණිලි මෙහෙයවන නීතිඥයා අතුරු ප්‍රශ්නයක් නැඟුවේ ය.

"දෙමවුපියන් ඒ කාරණය ගැන දැනගෙන සිටි බවට මා තුළ කිසි ම සැකයක් නැහැ. දැරියගේ මව ස්ත්‍රී චර්මඡේදනය නීතියෙන් තහනම් කර ඇති බව නො දැන සිටි බැව් කියමින් කරන ලද ප්‍රකාශය සම්බන්ධව මා තුළ සැකයක් තිබෙනවා." රජයේ නීතිඥවරයා පිළිතුරු දුන්නේ ය.

අනතුරුව රජයේ නීතිඥවරයා ලබා දිය යුතු දඬුවම සම්බන්ධව සිය අදහස් ප්‍රකාශ කරන්නට පටන් ගත්තේ ය. "ෆනටා නමැති දැරිය ප්‍රංශයේ පුරවැසියෙක්... එහෙයින් මෙරටේ නීතිය මඟින් ඇගේ අයිතිවාසිකම් සුරැකිය යුතුයි... තමුන්ගේ ශරීරය සම්බන්ධව ඕනෑ ම තීරණයක් ගැනීමට මේ රටේ පුරවැසියන්ට අයිතිය තිබිය යුතුයි. කිසි යම් අයකු බලහත්කාරයෙන් වෙනත් අයකුගේ ශරීරයට හානියක් සිදු කර ඇත්නම් ඔහුට හෝ ඇයට හෝ දඬුවම් කළ යුතුයි... ෆනටා නමැති දැරියට කර තිබෙන ශාරීරික හානිය හේතුකොටගෙන ඇයට ලිංගික තෘප්තිය විඳීමට නො හැකි තත්ත්වයකට ඇය ව පත් කර තිබෙනවා... ඒ ක්‍රියාව කිසිසේත් ම අනුමත කරන්නට බැහැ... එහෙයින් මා විසින් පෙන්වා දෙන ලද කරුණුවලට අනුව මිස්ටර් එන්ට වසර පහක සිරදඬුවමක් සහ ඔහුගේ සිවිල් අයිතීන් තහනම් කළ යුතු බව මා යෝජනා කර සිටිනවා" ඔහු සිය කතාව සමාප්ත කරමින් කියා සිටියේ ය.

ඒ මොහොතේ අධිකරණය තුළ ඇති නිසලතාවක් රජයන්නට විය. මිස්ටර් එන්ට ලබා දිය යුතු දඬුවම් ගැන ඇසීමෙන් මම සැහැල්ලු සුසුමක් හෙළුවෙමි. එහෙත්, දැරියගේ මව සම්බන්ධව සාධාරණ විය යුතු ය. මගේ පුද්ගලික මතයට අනුව ඇය අපරාධකාරියකට වඩා කිසි යම් සංස්කෘතියක ගොදුරක් පමණි. මෙම නඩුව ඔප්පු කිරීමට අවශ්‍ය ප්‍රමාණයටත් වඩා සාක්ෂි තිබෙන වාතාවරණයක් තුළ ෆනටාගේ දැරියගේ පියා වෙනුවෙන් පෙනී සිටින නීතිඥයාගේ කතාවට මම සාවධානව කන් දුනිමි.

"ස්ත්‍රී චර්මඡේදනය හොඳ චාරිත්‍රයක් වශයෙන් කිසිවෙක් පිළිගන්නෙ නෑ" ඔහු කතාව ආරම්භ කරමින් කියා සිටියේ ය.

විත්තිකරුවන්ට වාසි ගෙන දෙන අන්දමට කිසි යම් සැක සහිත වාතාවරණයක් නිර්මාණය කිරීමට ඔහු උත්සාහ ගත්තේ ය. අප්‍රිකානු රටවල පවතින සංස්කෘතික චාරිත්‍රවල සමාජීය පදනම සහ මුල් උපදා දක්වමින් ඒවායේ ඇති වටිනාකම් විග්‍රහ කරමින් අධිකරණයේ අවධානය ලබා ගැනීමට විත්තියේ නීතිඥවරයා උත්සාහ කරන්නට විය. මාලි රටේ ජනතාව ඇස්බැන්දුම් සහ මෝහන ඇදී ද පිළිගන්නා වාතාවරණයක් තුළ ප්‍රංශ නීතිය සහ අප්‍රිකානු චාරිත්‍ර අතර තිබෙන සංඝට්ටනය වළක්වන්නේ කෙසේ ද යන්න ඔහු ප්‍රශ්න කළේ ය.

ඉන් පසු ෆනටාගේ මව වෙනුවෙන් පෙනී සිටින නීතිඥවරිය සිය කතාව ආරම්භ කළා ය. නීතිඥවරිය ද ෆනටාගේ මවගේ වයසේ ම තරුණියක් වූවා ය. ඇය සිය ස්වාධීනතාව සහ ඇය අතර ඇති සමානකම් ගැන කතා කරන්නට වූවා ය. ෆනටාගේ මව මෙන් ම නීතිඥ වරියට ද දියණියක් සිටියා ය. දෙවනුව ඇය ඔවුන් දෙදෙනා අතර ඇති වෙනස්කම් පිළිබඳව කතා කරන්නට වූවා ය. මෙම නඩුවේ චූදිතාවිය බවට පත් ව සිටින තරුණිය කිසි ම දිනක පාසලකට ගොස් නො තිබුණි. ලියන්නට හෝ කියවන්නට හෝ හැකියාවක් නො තිබුණි. මේ තරුණියට වයස අවුරුදු 13 දී තමාට වඩා බොහෝ වැඩිමල් මිනිසකු සමග විවාහ වන්නට සිදු විය. පසුව සිය ස්වාමිපුරුෂයාත් සමග පැරිසියට එන්නට සිදු විය. එහි දී ඇයට තම ස්වාමිපුරුෂයාගේ පළමුවෙනි බිරිඳගේ එදිරිවාදිකම්වලට නිසැකයෙන් ම මුහුණ දෙන්නට සිදුවන්නට ඇත. කිසිවකු නොමැතිව අසරණ වූ ඇයට බාහිර ලෝකය හා කිසි ම සම්බන්ධතාවක් පැවැත්වීමට අවකාශයක් නො වී ය. එවැනි වාතාවරණයක ඇයට සිය ස්වාමිපුරුෂයාට අවනතව ජීවත් වනවාට වඩා වෙන කරන්නට දෙයක් නැත.

සියලු ම කතා අවසාන වූ පසු ජූරිය තීන්දුව ගැනීම සඳහා විසිර ගියේ ය. මේ වන විට සන්ධ්‍යා භාගය එළඹී තිබුණ අතර, මට

තරමක සීතලක් දැනෙන්නට විය. වරදකරුවන් වශයෙන් චෝදනා ලැබ සිටි මිස්ටර් එන් සහ ඔහුගේ බිරිඳ ගැඹුරු කල්පනාවක නිමග්න ව සිටිනු මම දුටුවෙමි. තීන්දුව ගැනීම සඳහා ජූරිය කොපමණ වේලාවක් ගනී ද යන්න ගැන අප කිසිවක් නො දැන සිටි අතර, විනිශ්චයකරු ඒකමතික තීරණයක් පමණක් අනුමත කරන බැව් අප දැන සිටියෙමු. රජයේ නීතිඥයා විසින් කරන ලද රෙකමදාරුව මත විනිශ්චයකරුවා විසින් තීන්දුව ප්‍රකාශයට පත් කරන ලදී. ඒ අනුව මිස්ටර් එන් සිරදඬුවමින් නිදහස් කොට අවුරුදු පහකට ඔහුගේ ඇප බැඳීමට නියම කළ අතර, ඔහු සතු සියලු ම සිවිල් අයිතිවාසිකම් අහෝසි කර දමන ලදී. එමෙන් ම සිය බිරිඳට ද එම තීන්දු ම ලබාදෙන ලදී.

මෙතෙක් කිසි ම දිනක මට හමු වී නොමැති එහෙත්, අන්තර්ජාලය තුළින් මා හඳුනාගෙන සිටින ස්ත්‍රී චර්මඡේදනයට විරුද්ධ ව මා ගෙන යන අරගලයට මහත් පන්නරයක් වූ කඩී එදින හමුවීමට ඇති බැව් මට මතක් විය. හෝටලයට ගොස් කඩිනමින් ඇඳ පැලඳ ගත් මම ඇය හමුවීමට අප යොදා ගත් අවන්හල වෙත ගියෙමි. එහි ගිය මම ප්‍රධාන දොරටුවට මුහුණ ලා අසුන් ගත්තෙමි. ඇය සිය මිතුරියකුත් සමග එන බැව් කීවා මට මතක ය. වාසනාවට මෙන් එහෙත් ඔවුහු පැමිණ නො සිටියහ. මඳ වේලාවකට පසු කාන්තාවන් දෙදෙනෙක් ප්‍රධාන දොරටුවෙන් ඇතුළු වනු මම දුටුවෙමි. ඔවුන් දෙදෙනාගෙන් එක් අයකු මම මෙතෙක් කිසිදා දැක නොමැති කඩී සහ අනෙක් පුවනිය ඇගේ මිතුරිය බැව් මම අනුමාන කළෙමි. ඔවුන් දෙදෙනා කෙළින් ම මා ළඟට පැමිණියහ. අපි එකිනෙකා හඳුනා ගත්තෙමු. කඩී පෙනුමෙන් අවුරුදු විස්සක් පමණ වයස වූ කිඳුරී තරුණියකි. ඇය සිය දිගු කොණ්ඩය පිට මත වැටෙන සේ පීරා තිබුණි. ඇගේ මිතුරිය පවා (එය ඇයගේ නියම නම නො වේ) කඩී මෙන් ම හැඩකාර තරුණියක් වූ අතර, ඇය සෙනගාල් නමැති රටේ සිට ප්‍රංශයට සංක්‍රමණය වී සිටින්නියකි.

'ඔයගොල්ලන්ට මෙතන සොයා ගන්නට අපහසු උනා ද?" මම ඇසුවෙමි.

"නෑ හරිම ලේසියෙන් ම සොයා ගත්තා... ඒක නෙමෙයි වාරිස් ඔයා කවද ද පැරිසියට ආවෙ?"

"මම ආවෙ ගිය සෙනසුරාදා... ස්ත්‍රී චර්මච්ඡේදනයට විරුද්ධකරුවන් වූ දෙන්නෙකුට විරුද්ධ ව නඩුවක් තිබුණා ඒක බලන්නයි ආවෙ" මම පිළිතුරු දුනිමි.

"සමහරවිට ඔයා විශ්වාස කරන එකක් නෑ ඇත්තෙන් ම අපිට ඕනෑ වෙලා තිබුණෙ ඔයා හමුවෙලා මේ චර්මච්ඡේදනය ගැන කතා කරන්න... අපි දෙන්නා බොහෝ කල් ඉඳන් මිතුරියො. ඒත් අපි මේ සම්බන්ධ ව කවදාවත් කතා කරලා නෑ... අපි දෙන්නට ම චර්මච්ඡේදනය සිදු කරලා තියෙන්නෙ" ඇය විස්තර කළා ය. සටා ද කඩීගේ අදහස් අනුමත කරමින් හිස වැනුවා ය.

කඩී පුහුණුව ලද සමාජ සේවිකාවක් වශයෙන් කටයුතු කරන අතර, සටා පාසල් අධ්‍යාපනය අවසන් කොට ආර්ථික විද්‍යාව සම්බන්ධ පාඨමාලාවක් හදාරන්නට බලාපොරොත්තුව සිටින්නී ය.

කඩී ඇගේ නෑනා කෙනකු සම්බන්ධ ව කතාවක් කියන්නට පටන් ගත්තා ය. "අපේ නෑනට දරුවන් හතරදෙනෙක් ඉන්නවා... දෙන්නෙක් ඉන්නෙ පැරිසියෙ. අනෙක් දෙන්නා තවමත් ඉන්නෙ මාලිවල... වැඩිමල් දූවරු දෙන්නට චර්මච්ඡේදනය කරලා තියෙන්නෙ. අනිත් දෙන්නා තාම කුඩයි. අපේ නෑනා විශ්වාස කරනවා භගශිශ්නිකාව තියන එක දරු ප්‍රසූතියට බාධාවක් කියලා... පස්සෙ මම එයාට ස්ත්‍රී චර්මච්ඡේදනයෙ ඇති විපාක විස්තර ඇති ව පහදලා දුන්නා... පස්සෙ එයා ඒක පිළිගත්තා."

"අන්න දැක්ක ද... නො දන්න කාන්තාවන් මේ සම්බන්ධ ව දැනුවත් කරන්නට ඕනෑ" මම කීවෙමි.

"මගේ නංගි කෙනෙක් ඉන්නවා... එයාගෙ වයස අවුරුදු දහඅටයි. එයාට චර්මච්ඡේදනය කරලා නෑ... මේ සැරේ ගිම්හාන නිවාඩුවට එයා ගියා මාලිවලට... එහෙ ඉන්නවා මගේ බැඳපු අක්කා කෙනෙක්... එයාට වයස අවුරුදු තිස්පහයි... එයා නංගිට කියලා

තියෙනවා ගැහැනු ලිංගේන්ද්‍රියේ පුරුෂ ලිංගයක් තියෙන අයට කවදාවත් කසාද බඳින්න කෙනෙක් සොයා ගන්නට බෑ කියලා."

අප අතර මොහොතකට ගැඹුරු නිසලතාවයක් පැතිරී යන්නට විය.

අනතුරුව සටා ඇගේ කතාව මට කීවා ය. සටා චර්මච්ඡේදනයට ලක් ව ඇත්තේ වයස අවුරුදු අටේ දී ය. දාහතරවැනි වියේ දී චර්මච්ඡේදනය සම්බන්ධ වාර්තා චිත්‍රපටයක් රූපවාහිනිය මඟින් ඇයට දැක ගැනීමට ලැබී ඇත. එය දැකීමෙන් පසු මෙතෙක් හිතේ තද කරගෙන සිටි චර්මච්ඡේදනය ගැන ඇගේ අත්දැකීම් නැවතත් ඇයගේ මතකයට නලා විත් ඇත.

"චර්මච්ඡේදනය සිදු කරන විට දැනුණ වේදනාව ගැන මට එච්චර මතකයක් නෑ... නමුත් ඒක සිදු වූ වාතාවරණය ගැන මට හොඳට මතකයි... ගැහැනු දෙන්නෙක් මාව තිර කරලා අල්ල ගත්තා... පසු ව මට මතකයි හරියට රුධිරය වහනය වුණා."

"ඔය දෙන්නට මතක ද කවුද චර්මච්ඡේදනය සිදු කළේ කියලා" මම ඇසුවෙමි.

"අතක එක ඇඟිල්ලක් නැති මහලු ගැහැනියක්" කඩී පැවැසුවා ය.

"සටා... ස්ත්‍රී චර්මච්ඡේදනය වැරදි ක්‍රියාවක් බව ඔබ දැනගන්නකොට ඔබගෙ වයස කීය ද?"

"මට අවුරුදු දාහතරයි... ඊට පස්සෙ මට මහ නපුරු සිහින පෙනෙන්නට පටන් ගත්තා."

"මොන වගේ චර්මච්ඡේදනයක් ද ඔය දෙන්නට සිදු කරලා තියෙන්නෙ" මම ප්‍රශ්න කළෙමි.

"මගේ භගශිශ්නිකාව විතරයි කපා දමලා තියෙන්නෙ" සටා කීවා ය.

"මගේ අම්මා කැපිය යුතු කොටස් ගැන තීරණය ගැනීම ඒ ගෑනිට භාර දුන්නා... මගේ භගශිශ්නිකාව සහ අභ්‍යන්තර යෝනි තොල් කපා දමලා තියෙන්නෙ" කඩී පිළිතුරු දුන්නා ය.

අප තිදෙනා ටික වේලාවක් කතාබහකින් තොර ව සිටියෙමු.

"ඔයගොල්ලන්ට තව මොනව හරි බොන්න ඕනෑ ද?" මම ඇසුවෙමි.

"නැහැ... බොහොම ස්තූතියි" හාවි කීවා ය.

අනතුරු ව බිල රැගෙන එන ලෙස මම වේටර්ට දැන්වූයෙමි.

"දැන් ඔයගොල්ලන්ට බඩගිනිත් ඇති නේද?" මම ඇසුවෙමි.

ඔවුන් දෙදෙනා එකිනෙකාගේ මුහුණ බලා ගනිමින් සිනාසුණහ.

"පේන විදියට ඔයගොල්ලන්ට බඩගිනියි වගෙ... අපි යමු හොඳ ආපන ශාලාවකට."

අතිශයින් ම වෙහෙසට පත් ව සිටි මම හෝටල් කාමරය වෙත ගොස් ඇඳේ වැතිරුණෙමි. පසුගිය මාස කිහිපය තුළ වූ වෙහෙස මහන්සිය හේතුකොටගෙන ම විඩාවක් දැනෙන්නට විය. විඩාව අතරින් චිත්‍රපටයක රාමු මෙන් දහසක් සිතුවිලි මා තුළ ඇදී ඇදී යන්නට විය. යුරෝපයේ හුදකලාව ජීවත් වන අප්‍රිකානු ප්‍රජාව ගැනත්, එමෙන් ම චර්මච්ඡේදනයේ ගොදුරු බවට පත් වූවන්ගේ අධිෂ්ඨානය සහ ධෛර්යය මට මැවී පෙනෙන්නට විය. ඇත්තෙන් ම තරුණ කාන්තාවන් සහ දැරියන් වෙනුවෙන් මා ගෙන යන අරගලයේ ඇති වැදගත්කම මම තේරුම් ගතිමි.

8

මගේ සිහිනය

මගේ ජීවිතයේ ඉතිරි කාලය එක ම එක අරමුණක් වෙනුවෙන් මම කැප කරමි. සමහර විට මගේ ජීවිතයේ දී මට මුහුණ දෙන්නට ඇති විශාලතම අභියෝගය ද එය වන්නට පුළුවන.

ස්ත්‍රී චර්මච්ඡේදනය අප්‍රිකාවට පමණක් සීමා වූ දෙයක් නොවන බැව් අද මම දනිමි. ජර්මනිය තුළ ද බොහෝ තරුණියන් ස්ත්‍රී චර්මච්ඡේදනයට ගොදුරු වී සිටින බව අද මම දනිමි. ඉදිරි දශකය තුළ එය දෙගුණ තෙගුණ වනු ඇත. සෑම යුරෝපීය රටක ම ස්ත්‍රී චර්මච්ඡේදනය සිදුවෙයි. පොහොසත් දෙමවුපියෝ තම දියණියන් පෞද්ගලික වෛද්‍යවරු වෙත හෝ පෞද්ගලික සායන වෙත හෝ ගෙන ගොස් මුදල් ගෙවා ඔවුනට චර්මච්ඡේදනය සිදුකරති. දුගී දෙමවුපියෝ සිය දියණියන් තමුන්ගේ මවුබිම්වලට රැගෙන ගොස් හෝ අනියම් ක්‍රම මගින් හෝ ඒ කර්තව්‍යය කර ගනිති.

ස්ත්‍රී චර්මච්ඡේදනය පිළිබඳ මනා අවබෝධයක් ඇති අය සිටින්නේ ඉතා සුළු කොටසක් බැව් අද මම දනිමි. මේ සම්බන්ධ ව වෛද්‍යවරුන්ට, හෙදියන්ට සහ සමාජ සේවකයින්ට නිසි පුහුණුවක් නොමැති බව ප්‍රත්‍යක්ෂය.

ස්ත්‍රී චර්මච්ඡේදනයේ ගොදුරු බවට පත් වූවන්ට අපගේ සහයෝගය සහ උපකාර අවශ්‍ය ය. මම ඔවුන්ට උදව් උපකාර කිරීමට සූදානමින් සිටිමි. විශේෂයෙන් ම යුරෝපය මඟින් ස්ත්‍රී චර්මච්ඡේදනය අතුගා දැමීමට මගේ මුළුමහත් ශක්තිය ම යොදවන බවට මම අද දිවුරා පොරොන්දු වෙමි.

වාරිස් ඩයරිගේ ප්‍රකාශනය

සල්මන් රශ්ඩි *"The Gr.und Beneath her Feet"* නමැති සිය කෘතියෙහි ඔහු මෙසේ සඳහන් කර ඇත. *"ඔබ චිත්‍රරූපයෙන් එළියට එන තුරු ඔබට සම්පූර්ණ චිත්‍රරූපය දැක ගැනීමට නො හැකි වනු ඇත."*

චිත්‍රරූපය තුළින් එළියට පැමිණෙන්නට දැන් කාලය එළඹ ඇත. මා ඉදිරියේ ඇති දීර්ඝ මාවතට මම අවතීර්ණ ව සිටිමි. ස්ත්‍රී චර්මච්ඡේදනයට විරුද්ධ ව යුරෝපය තුළ මා ගෙන යන අරගලය තුළින් සාක්ෂාත් කරගත යුත්තේ කුමක්ද යන්න ගැන මම පූර්ණ අවබෝධයකින් සිටිමි.

මගේ අරමුණු පහත සඳහන් කරමි.

- යුරෝපයේ සෑම රටක ම කෙරීගෙන යන ස්ත්‍රී චර්මච්ඡේදනය මුළු ලෝකයට ම බලපාන වසංගතයක් බැවින් එම සැහැසි ක්‍රියාව සෑම අයකුට ම හඳුනා ගැනීමට මාර්ගය පාදා දීම
- සෑම ආගමකට ම අයත් පූජකවරුන්ට ස්ත්‍රී චර්මච්ඡේදනයට විරුද්ධ ව සටන් කිරීමට අවැසි පසුබිම සකසා දීම
- ස්ත්‍රී චර්මච්ඡේදනයේ ගොදුරු බවට පත් ව සිටින සෑම අයකුට ම අවැසි උපකාර ලබා දීම
- ස්ත්‍රී චර්මච්ඡේදනයෙන් ළමයින් බේරා ගැනීම සඳහා අවශ්‍ය නීති-රීති සම්පාදනය කරන ලෙස යුරෝපීය රටවල ආණ්ඩුවලට පමණක් නො ව, ලෝකයේ අනෙකුත් රටවල රාජ්‍යයන්ට ද ඇනුම් දීම
- මෙම සැහැසි ක්‍රියාව කරන්නන්ට සහ ඊට අනුබල දෙන අය නීතිය ඉදිරිපිටට ගෙන ඒමට හැකි නීති සම්පාදනය කරන ලෙස ආණ්ඩුවලට ඇනුම් දීම

- තුන්වන ලෝකයේ දේශපාලන වධ හිංසාවන්ට ගොදුරු වූ අයට පමණක් නොව, ස්ත්‍රී චර්මච්ඡේදනයට ලක් වූවනට ද යුරෝපය තුළ දේශපාලන රැකවරණ ලබා ගැනීමට ඇති අයිතිය තහවුරු කිරීම
- ස්ත්‍රී චර්මච්ඡේදනයට ලක් වූ සෑම අයකුට ම උපකාර කිරීමේ දී ගෞරවයෙන් කටයුතු කිරීම
- ස්ත්‍රී චර්මච්ඡේදනයට හසු වූ කාන්තාවන් සහ දැරියන් සමඟ කටයුතු කරන සෞඛ්‍ය සංවිධානවල සේවකයන්ට ස්ත්‍රී චර්මච්ඡේදනය පිළිබඳ මනා අවබෝධයක් ලබා දීම
- ස්ත්‍රී චර්මච්ඡේදනයට හසු වූ කාන්තාවන් සිය කැමැත්තෙන් එය නිවැරැදි කර ගැනීම සඳහා ශල්‍යකර්මයකට මුහුණ දෙන්නේ නම් ඔවුන්ට අවැසි උපකාර ලබා දීම
- ස්ත්‍රී චර්මච්ඡේදනයට විරුද්ධ ව කටයුතු කරන සියලු ම සංවිධාන අතර ඇති ප්‍රතිපත්ති සම්බන්ධ ව එකඟතාවයකට පැමිණීම
- ස්ත්‍රී චර්මච්ඡේදනයට විරුද්ධ ව සටන් කරන සෑම සංවිධානයකට ම තම කර්තව්‍යයන් කාර්යක්ෂම කර ගැනීම සඳහා අවැසි අරමුදල් සොයා ගැනීමට උපකාර වීම
- සෑම යුරෝපීය ජාතිකයකු ම මේ සම්බන්ධ ව දැනුවත් කරමින් ඔවුන් ස්ත්‍රී චර්මච්ඡේදනයට විරුද්ධ ව සටන්වලට අවතීර්ණ කොට එමඟින් ස්ත්‍රී චර්මච්ඡේදනය මහ පොළොවෙන් අතුගා දැමීම තුළින් මගේ සිහිනය සැබෑ කර ගැනීම

මෙම කාතියෙන් ස්ත්‍රී චර්මච්ඡේදනයට විරුද්ධ සටනට තිබි යම් පන්නරයක් ලැබෙන්නේ නම් මේ ලෝකයේ සිටින භාග්‍යමත් ම පුද්ගලයා මම වෙමි.

නිමි.

කාන්තාරයේ දරුවෝ

පරිවර්තනය

රංජිත් කුරුප්පු

'කාන්තාරයේ දරුවෝ' [illegible]

[illegible]

[illegible]

[illegible]

ISBN 978-955-1822-66-8

මිල රු.275/=

ෆාස්ට් පබ්ලිෂින් (ප්‍රයිවට්) ලිමිටඩ්
165, දේවානම්පියතිස්ස මාවත, කොළඹ 10
දුරකථන: 2682274, 5833320 ෆැක්ස්: 2682274